# මව්බිම

ඉරිදා
2022 ජනවාරි 23
කාණ්ඩය 11
10 වැනි කලාපය
පිටු 64
රු. 80/-



## බෝලවත්ත පල්ලියෙන් හමු වූ සොහොන් ගැබේ රහස

▸ 10 පිටුවට



## බුදුන්ගේ චිතකය දැවෙද්දී මතු වුණු රන් පිළිමය දැන් තියෙන තැන

▸ 19 පිටුවට



## නොස්ට්‍රඩාමුස් වගේ අනාගතය දිවැසින් දැකපු ලංකාවේ පණ්ඩුරුවන

- තරුපති



### ශ්‍රී ලාංකික සුදුස්සන් 20ක් සිටිද්දී

# බහරේන් එයාර්ලයින්ස් වට්ටපු ලොක්කා ශ්‍රීලන්කන් එකට රිංගෙව්වේ කවුද?

### පඩිය කෝටියකට ළඟයි !

කුමුදු ජයවර්ධන, තාරක සම්මාන්, සුලෝචනා රාමයියා මෝහන්

▸ 02 පිටුවට



## කලාකරුවෝ වටකරගෙන අගමැති කියපු දේ

ක්‍රිෂාන් පතිරත් ජයසූරිය ▸ 02 පිටුවට



## බැඳුම්කර ගෙව්වේ කළු සල්ලි සුදු කරන්න

සවනි ශේෂාධි ▸ 02 පිටුවට



## ජනපතිට-මැතිසබයට ඩයනා නව වසර දෙකක් ඉල්ලයි

අනුරාධා හේරත්, නිපුනි ඒකනායක ▸ 02 පිටුවට

## පාට-පක්ෂ නැති අලුත් මහජන බලයක් කරළියට

බිඟුන් මේනක ගමගේ ▸ 02 පිටුවට



## මේ ආණ්ඩුවට දෙයියන්ගේ හාල් කැවිලා

නිර්මාණී ගුණරත්න ▸ 02 පිටුවට



## බොරැල්ල පල්ලියේ බෝම්බෙ තිබ්බෙ පිස්සෙක්ද?

කීර්ති මෙන්ඩිස්, සවනි ශේෂාධි ▸ 02 පිටුවට

## ඇඹිලිපිටියෙන් ඇල්ලූ සැකකරු රහසේ කට අරී

හංසි නානායක්කාර ▸ 02 පිටුවට

## පෙබරවාරියේ එන රීළඟ තෙල් අර්බුදය

චාමර අමරසූරිය ▸ 2 පිටුවට

## ලොකු බලාගාර 4ක් ළඟදීම ඩවුන්

චාමර අමරසූරිය ▸ 02 පිටුවට

## දින 21ට ඩෙංගු රෝගීන් 5723ක්

සඳුනි ගමාරච්චි ▸ 02 පිටුවට



## අනාගතයට ඇඟිලි දිගු කරන මහජන නියෝජිතයන් ලෙස අපි එකට වැඩ කරමු

▸ 2 පිටුවට

අනුරාධා හේරත්, නිපුනි ඒකනායක



## වයඹ සරසවියටත් දේශපාලන සෙල්ලමක්

අනුරාධා හේරත් ▸ 2 පිටුවට



## හිට්ලර් කියලා හිතුවට එහෙම නෑ

▸ 2 පිටුවට

අනුරාධා හේරත්, නිපුනි ඒකනායක

## දෙමළ සන්ධානයට එදිරිව දෙමළ පෙරමුණ

එම්. එස්. ෆාරුක් ▸ 02 පිටුවට

රජයේ
පොලී රහිත
ණය ක්‍රමය ඔස්සේ ඔබටත්
IT සහ BUSINESS උපාධි
වැඩි විස්තර සඳහා අමතන්න
නටාෂා : 076 6 550 550 දිනූෂා : 076 4 770 096
ESOFT METRO CAMPUS
www.esoft.lk
උපාධි ප්‍රදානය සඳහා අනුමැතිය අධ්‍යාපන අමාත්‍යාංශය

දියවැඩියාවද?
එසේ නම් මේ වකවානුව තුල ඔබ වඩා
සැලකිලිමත්ව, අවධානයෙන් හා අවබෝධයෙන් කටයුතු කරන්න.
සුපිරි බව තහවුරු කර ගන්න... දියවැඩියාව පරද්දන්න...
කරලක් රු. 49/-
දිනකට කරලක් උදෑසන ආහාරයෙන් පසු
ජින්සොමින් හි ප්‍රධාන සංඝටකය වන නියම කොරියන් පැනැක්ස් ජින්සෙන් ශාඛයේ මූලයෙන් උකහා ගන්නා සාරය, ශරීරයේ නිපදවෙන ඉන්සියුලින් හි ක්‍රියාකාරීත්වය වර්ධනයට මහා පිටුවහලක් වන බව බොහෝ සායනික පරීක්ෂණ වලින් තහවුරු කර ඇත.
මිලදී ගැනීමේදී මෙගා වී කෙයා ජින්සොමින් කියලම ඉල්ලන්න.
077 34 10071
011 43 66609
Find us on Facebook Ginsomin Sri Lanka
GINSOMIN ක්‍රියාශීලී ජවසම්පන්න සව්මත් නිරෝගී දිවියක් සඳහා

ඔබේ ජීවිතයේම කෙනෙක්
DFCC ආලෝකා වෙතින් පිරිනැමෙන සුවිශේෂී ප්‍රතිලාභයන්
වැඩිවෙන ඉතිරියත් සමඟ ඉහළ යන ආකර්ෂණීය පොලී අනුපාතයන්
ජීවිතයේ සුවිශේෂී අවස්ථාවන් සමරන සෑම විටකදීම වටිනා තිළිණපත්
නොමිලේ ජීවිතාවරණයක් සහ DOC 990 ඩිජිටල් වෛද්‍ය උපදේශන සේවාවන්
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් සමඟ සහනදායි පොලී අනුපාත, අවම සැකසුම් ගාස්තු සහ උපදේශන සේවා
සතියේ සෑම දිනකම, පැය 24 පුරා ඔබ වෙනුවෙන් කැපවූ ක්ෂණික ඇමතුම් සේවා අංකය 0112 350055
0112 350000 www.dfcc.lk
*කොන්දේසි අදාළ වේ
DFCC ආලෝකා
DFCC බැංකුව



1>>

# බහරේන් එයාර්ලයින්ස්...

ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස බ්‍රිතාන්‍ය ජාතික රිචර්ඩ් නටාල් නමැත්තකු පත් කිරීම සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය සහ ඉන්ටර්නෙට් මාධ්‍ය ඔස්සේ දැඩි විවේචන එල්ල වෙමින් තිබේ.

රිචර්ඩ් නටාල් 2011 වසරේදී බහරේන් ගුවන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස වැඩ භාරගත් අතර 2013 වසරේදී එම ගුවන් සමාගම වසා දැමීමට සිදුව ඇත.

මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර මාධ්‍ය ඔස්සේද තොරතුරු වාර්තා කර තිබිණි.

ඇතැම් මාධ්‍ය වාර්තාවල සඳහන් වන්නේ, මේ වනවිට වැඩබලන ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස රිචර්ඩ් නටාල් රුපියල් ලක්ෂ 90ක වැටුපක් ලබන බවය. එය සත්‍යයක් නම් ඔහු ලබන වැටුප ඇමෙරිකානු ඩොලර්වලින් ගතහොත් ඩොලර් 45,000කි.

මේ අතර, අප කළ විමසුමකදී සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපති උපුල් ධර්මදාස මහතා ප්‍රකාශ කළේ මීට පෙර ප්‍රධාන විධායක ධුරයේ කටයුතු කළ පුද්ගලයා ඇමෙරිකානු ඩොලර් 20,000ක් වැටුප් ලෙස ලබා ගත් බවය.

වත්මන් වැඩබලන ප්‍රධාන විධායක නිලධාරියාගේ වැටුප කොපමණ මුදලක් වුවද, ඔහු ලබන වැටුපෙන් වැඩි කොටසක් ඩොලර් වශයෙන් රටින් පිටට යන බවට සැකයක් නැත.

මේ අතර, වැඩබලන ප්‍රධාන විධායක ධුරය සඳහා ශ්‍රී ලාංකික සුදුස්සන් 20 දෙනකු අයැදුම් කර තිබූ අතර එම විශේෂ තනතුරට විදේශිකයකු පත් කෙරෙන්නේ කිසිදු සම්මුඛ පරීක්ෂණයකින් පවා තොරව බවට අදාළ සෙසු අයැදුම්කරුවෝ චෝදනා කරති.

බොහෝ රටවල සාමාන්‍යයෙන් රජයේ උසස් තනතුරක් සඳහා විදේශිකයකු බඳවා ගන්නේ, එම තනතුර දැරීම සඳහා සුදුස්සන් අදාළ රට තුළින් සොයා ගැනීමට නොහැකි නම් පමණි.

මේ වන විට 73 වැනි වියේ පසු වන රිචර්ඩ් නටාල් නමැත්තා ශ්‍රීලන්කන් ගුවන් සේවයේ ප්‍රධාන වාණිජ නිලධාරී ධුරයට පත් කර ඇත්තේ, පසුගිය වසරේ නොවැම්බර් 01 වැනිදාය.

පසුව පුරප්පාඩු වූ ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ධුරයේ වැඩබැලීම සඳහා මේ වසරේ ජනවාරි මස 01 වැනිදා සිට ඔහු පත් කෙරිණි.

වසර 25ක පමණ පළපුරුද්දක් සහිත නටාල් මීට පෙර Royal Jordanian Airlines, Cathay Pacific Airways, Philippine Airlines, Kenya Airways සහ Polar Air Cargo ආදී ගුවන් සමාගම් රැසක සේවය කර තිබිණි.

ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ගණිතය පිළිබඳ උපාධිධාරියකු වන ඔහු London Business School වෙතින් පශ්චාත් උපාධිය ද ලබාගෙන තිබේ.

කෙසේ වෙතත්, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා අයැදුම් කළ ශ්‍රී ලාංකිකයන් චෝදනා කරන්නේ, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ප්‍රධාන විධායක ධුරය විදේශිකයකුට පැවරීම නීත්‍යනුකූල නොවන බවය. සමාගමේ උසස් තනතුරු සඳහා විදේශිකයන් පත් කරන ලද්දේ, ගුවන් සමාගම විදෙස් සමාගමක් පාලනය කරන සමයේ පමණක් බවද ඔවුහු පෙන්වා දුන්හ.

එවැනි වාතාවරණයක් තුළ දැවැන්ත ගුවන් සමාගමක් කඩා වැට්ටවූ වයස්ගත විදේශිකයකු ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ උසස් තනතුරකට බඳවා ගැනීම කිසිසේත් පිළිගත නොහැකි බව ඔවුන්ගේ අදහස ය.

මෙම චෝදනා සම්බන්ධයෙන් ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ මාධ්‍ය සබඳතා කළමනාකාර දීපාල් පෙරේරා මහතාගෙන්ද අපි විමසීමක් කළෙමු.

ඔහු ප්‍රකාශ කළේ, රිචර්ඩ් නටාල් මහතා ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස පත්කර ඇත්තේ, නිත්‍ය ප්‍රධාන විධායක නිලධාරීවරයකු පත්කරන තෙක් පමණක් බවය.

රිචර්ඩ් නටාල් මේ වනවිටත් ප්‍රධාන වාණිජ නිලධාරී ධුරයේ කටයුතු කරන අතර ප්‍රධාන විධායක නිලධාරී ධුරයේ වැඩබලනුයේ තාවකාලිකව බවද ඔහු පැවැසීය.

රිචර්ඩ් නටාල් ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස සේවය කරමින් සිටියදී බහරේන් එයාර් ගුවන් සමාගම වසා දැමීමට සිදුවුවද, ඔහු ක්ෂේත්‍රයේ දිගු පළපුරුද්දක් සහිත දක්ෂ නිලධාරියකු බවද මාධ්‍ය සබඳතා කළමනාකාර දීපාල් පෙරේරා මහතා සඳහන් කළේය.

"ගුවන් සමාගම්වල උසස් තනතුරුවලට බඳවා ගැනීමේදී විදෙස් ජාතිකයන් ඕන තරම් බඳවාගෙන තිබෙනවා. ගුවන් නියමුවන් ඇතුළු විවිධ තනතුරුවලට විදේශිකයන් බඳවා ගන්නවා. ඒ අයගේ දක්ෂතා මතයි ඔවුන් බඳවා ගන්නේ. සමාජ මාධ්‍යවල පළවෙන දේවල් නිවැරදි ඒවා නෙවෙයි" යනුවෙන් ඔහු පැවැසීය.

ශ්‍රීලන්කන් ගුවන් සමාගම උසස් තනතුරු සඳහා විදේශිකයන් පත් කළ පළමු අවස්ථාව මෙය නොවේ. මෑතම නිදසුන වන්නේ මින් පෙර 2019දී යහපාලන රජය විසින් ප්‍රධාන වාණිජ නිලධාරියා ලෙස ජොෂුවා බුස්ටෝස් පත් කිරීමය. ඔහු ඇෆ්ගන් ගුවන් සේවය බංකොලොත් කිරීමට බලපෑ ඇමෙරිකානු ඩොලර් මිලියන 11ක වංචාවට හවුල් වූ බවට චෝදනා ලත් අයකු විය.

# පාට-පක්ෂ...

රටේ පවතින අර්බුදයට දීර්ඝකාලීන සමාජ ආර්ථික දේශපාලන ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළක් සකස් කිරීමේ අරමුණෙන් දේශපාලන පක්ෂවල අතකොළුවක් නොවන පුළුල් සමාජ ව්‍යාපාරයක් ගොඩනැඟීමට දේශපාලන කණ්ඩායම් රැසක් සාකච්ඡා ආරම්භ කර ඇත.

ස්වාධීන වෘත්තීය සමිති, වාමාංශික කණ්ඩායම්, වෘත්තියවේදීන්, පරිපාලන නිලධාරීන්, කලාකරුවන්, ජනමාධ්‍යවේදීන් ඇතුළු ක්ෂේත්‍ර රැසක ප්‍රවීණයන් එක්ව මීට අදාළව පසුගිය දිනවලදී කොළඹදී සාකච්ඡා වට කීපයක්ම පැවැත්වී යැයි එම සාකච්ඡාවලට සහභාගි වූ වෘත්තීය සමිති නායකයෙක් 'මව්බිම' ට පැවැසීය.

රටේ පවතින දේශපාලන අරාජිකත්වය හමුවේ ජනතාව ඉදිරියට පැමිණ ඇති නමුත් එම වේගයට සරිලන අයුරින් දේශපාලන උපක්‍රම තෝරන්නට සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ අපොහොසත්ව ඇතැයි එම වෘත්තීය සමිති නායකයා චෝදනා කළේය.

එහෙත් සාම්ප්‍රදායික ප්‍රධාන පක්ෂ වම දකුණ භේදයකින් තොරව එසේ ඉදිරියට පැමිණෙන ප්‍රගතිශීලී සමාජ ව්‍යාපාර සිය පක්ෂවල දේශපාලන ව්‍යාපෘති තුළට කැඳවාගෙන, ඒවා යටපත් කිරීමට උත්සාහ කරන්නේ යැයි කී හෙතෙම, යෝජිත ඒකාබද්ධ දේශපාලන වැඩපිළිවෙළ මුළුමනින්ම සංවිධානය වන්නේ එම මහජන බලය දේශපාලන පක්ෂවලට කොල්ලකෑමට නොහැකි අයුරින් යැයි අවධාරණය කළේය.

ඉකුත් 1994දී හා 2015දී මේ අයුරින්ම මහජන බලය පෙරට පැමිණි නමුත් හුදු ආණ්ඩු මාරුවකට සීමා වෙමින් අවසානයේදී ප්‍රධාන දේශපාලන පක්ෂ විසින් ඒවා කොල්ලකනු ලැබී යැයි හෙතෙම චෝදනා කළේය.

එම නිසා යෝජිත දේශපාලන වැඩපිළිවෙළේදී පක්ෂ බල ව්‍යාපෘතියකට එහා ගිය බහුජන ව්‍යාපාරයක මුහුණුවරකින් යුතුව උපක්‍රම තෝරන්නට සාකච්ඡා කරන්නේ යැයි ද ඔහු කීය.

ඒ අනුව කවරකු ආණ්ඩු බලයට පත්වුවද එහි කොටස්කරුවන් නොවී පොදු ජනයා නියෝජනය කරමින් ප්‍රතිපත්තිමය වෙනස්කම් වෙනුවෙන් සටන් කළ හැකි අයුරින් වැඩපිළිවෙළ සකස් කිරීමට සාකච්ඡා කර ඇතැයි ද ඔහු කීවේය.

මේ අතර පරිපාලන ක්ෂේත්‍රයේ විශ්‍රාමික නිලධාරීන් රැසක්ම එක්ව පවතින දේශපාලන ආර්ථික අර්බුදය ගැන සාකච්ඡාවක් පවත්වා ඇතැයි වාර්තා වේ.

කොළඹදී පසුගිය සතියේ පවත්වා ඇති මෙම සාකච්ඡාවට පරිපාලන ක්ෂේත්‍රයේ නාමධාරී කීර්තිමත් නිලධාරීන් කීපදෙනකුම සහභාගි වී ඇති අතර ඉදිරි දේශපාලන ප්‍රතිසංස්කරණවලදී සිදුවීමට නියමිත හා සිදුකළ යුතු වෙනස්කම් ගැන එහිදී දීර්ඝ ලෙස සාකච්ඡාවට බඳුන් වී තිබේ.

ආරම්භ කිරීමට නියමිත පුළුල් සමාජ ව්‍යාපාර වැඩපිළිවෙළට උපදේශාත්මකව දිය හැකි සහාය ගැනත් මෙම නිලධාරීන් සාකච්ඡා කර ඇති බව විශ්වසනීය ආරංචි මාර්ග වැඩිදුරටත් සඳහන් කරයි.

# කලාකරුවෝ...

වසර 75ක් පමණ ජන ආකර්ෂණ කලාවක් ලෙස පැවැති මෙරට සිනමාව වාණිජ වශයෙන් උසස් තත්ත්වයකට ගෙන ඒම සඳහා සිනමාව 'කර්මාන්තයක්' ලෙස පත්කරලීමට අවශ්‍ය සහන ලබාදීමට ආණ්ඩුව සූදානම් යැයි අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ පැවැසීය.

කලාවට සහ කලාකරුවාට සීමා පනවන්න තම ආණ්ඩුව කටයුතු නොකරන බවද අග්‍රාමාත්‍යවරයා කීවේය.

රටේ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස අත්විඳීමට කලාකරුවාට අයිතියක් ඇතැයිද එම අයිතිය කලාකරුවාගෙන් උදුරා ගැනීමට කිසිවිටකත් කටයුතු නොකරන බවද අග්‍රාමාත්‍යවරයා පැවැසීය. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂගේ උපදෙස් මත ප්‍රථමවරට කලාකරුවන්ට නොමිලේ රක්ෂණාවරණයක් ලබාදීමට සහ සියලුම කලාකරුවන් වෙනුවෙන් දත්ත පද්ධතියක් ආරම්භ කිරීමටද රජය පියවර ගෙන තිබේ. අග්‍රාමාත්‍යවරයා එසේ පැවැසුවේ නොමිලේ පිරිනමන වෛද්‍යාධාර හදිසි අනතුරු රක්ෂණ ඔප්පු ප්‍රදානය සහ කලාකරු දත්ත පද්ධතිය ස්ථාපිත කිරීමේ අවස්ථාවේදීය. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී මෙම උත්සවය පැවැත්විණි. මෙම රක්ෂණ ඔප්පු සොෆ්ට්ලොජික් රක්ෂණ ආයතනය පිරිනමන අතර රක්ෂණ ඔප්පු 50ක් ඒ අනුව සංකේතාත්මකව කලාකරුවන්ට මෙහිදී පිරිනැමිණි.

ජාතික උරුම ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලාශිල්පි ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.heritage.lk වෙබ් අඩවිය ආරම්භ කිරීමද මීට සමගාමීව කෙරිණි.


## ජීවිතයක් යදිමි.

57 හැවිරිදි වැන්දඹුවක් වූ මව පහත සඳහන් රුධිර කාණ්ඩවලින් වකුගඩුවක් සොයයි: O+O- (ඉතා මැනවින් O+) සහ වයස අවුරුදු 30 - 60 අතර විය යුතුයි. හැකි ඉක්මනින් බද්ධ කළ යුතු බවට විශේෂඥ වෛද්‍යවරුන් නිර්දේශ කර ඇත.

පින් කැමති දායකයකු වේ නම් 0771631937/ 0773333433 අංකයට අමතන්න. සියලු වෛද්‍ය හා බෙහෙත් සඳහා වන වියදම් දැරීමට අප කැමැත්තෙමු.



සංවේගයෙන් දැනුම් දීමයි.

උපත 1937 11 19



විපත 2022 01 21

මීගමුව උදාර පුවත්පත් අලෙවි නියෝජිත
**පියල් කුලසිංහ මහතාගේ**
ආදරණීය මෑණියන් වූ,

**මේරි ජෝසපින් පෙරේරා**

**මහත්මියගේ අභාවය පිළිබඳව**
සිලෝන් නිව්ස් පේපර්ස් ආයතනයේ
**අලෙවි හා බෙදාහැරීම් අංශයේ ශෝකය**
පළකර සිටිමු.

අවසන් කටයුතු 2022 ජනවාරි 23 ඉරිදා සවස
මීගමුව මක්කේදොක්කා පොදු සුසාන භූමියේදී සිදුකෙරේ


# ජනපතිට-මැතිසබයට...

කොවිඩ් වසංගතයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට සහ පාර්ලිමේන්තුවට අහිමි වූ අවුරුදු දෙකක කාලය ඉදිරියට ලබාගත යුතු යැයි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පාර්ලිමේන්තු මන්ත්‍රිනි ඩයනා ගමගේ පාර්ලිමේන්තුවට යෝජනාවක් කළාය.

පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලය යොදාගෙන එය සිදුකළ යුතු යැයිද ඇය යෝජනා කළාය.

"විරුද්ධ පක්ෂය කතා කරන්නේ අලුතින් ඉපදිලා වගේ. අප සියලුදෙනා මේ ගැටලු ගැන දන්නවා. මුළු ලෝකයම මේ ගෝලීය ගැටලුවට මුහුණ දෙමින් සිටිනවා. අපට එයින් බැහැර වන්නට බැහැ. අපට අවශ්‍ය වන්නේ විසඳුම්. ගැටලු අවශ්‍ය නැහැ සංඛ්‍යාලේඛනවලින් වැඩක් නැහැ ඒවායින් රටේ ජනතාවට සේවයක් වන්නේ නැහැ. ජනාධිපතිතුමාට නැති වූ අවුරුදු දෙකක කාලය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක යෝජනාවකින් ලබාදිය යුතු බවට මා යෝජනා කරනවා. එහෙම වුණා නම් ඉතිරි අධිවේගී මාර්ග ටිකක් හදන්න තිබුණා යැයිද මන්ත්‍රිවරිය වැඩිදුරටත් පැවැසුවාය.

# මේ ආණ්ඩුවට...

"මේක දෙයියන්ගේ හාල් කැවුණ කප්පම් ආණ්ඩුවක්" යැයි විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස පැවැසීය.

ආණ්ඩුවට රටේ ගොවියාට වඩා පිටරට ගොවියා විශේෂ වී ඇති බවද විපක්ෂ නායකවරයා සඳහන් කළේය.

අත්තනෝමතික පාලනය තුළ සමස්ත ගොවි ජනතාව අනාථ වී ඇති අතර ආණ්ඩුව බිහිවී ඇත්තේ ජනතාව වනසා දැමීමට බවද ඔහු අවධාරණය කළේය.

# පෙබරවාරියේ එන...

ලබන පෙබරවාරි මස වන විට ලෝක වෙළෙඳපොළේ බොර තෙල් බැරලයක මිල ඩොලර් සියයට ආසන්න විය හැකි බවට ඉන්ධන පිළිබඳ විශේෂඥයෝ අනාවැකි පළ කරති.

යුරෝපයට බලපාන සීත ඍතුව නිසා ඒ රටවල ඉන්ධන භාවිතය ශීඝ්‍ර ලෙස වැඩිවීම මීට එක් ප්‍රධාන හේතුවක් බව එම විශේෂඥයන් පෙන්වා දෙයි.

ගෙවුණු සතියේද බොර තෙල් බැරලයක මිල ඩොලර් 87 දක්වා ඉහළ ගිය අතර එම වැඩිවීම වසර හතරහමාරකට පසු වාර්තා වූ ඉහළම අගය බව වාර්තා වේ.

මේ අනුව ලෝක වෙළෙඳපොළේ බොර තෙල් බැරලයක මිල අසීමිත ලෙස ඉහළ ගියහොත් ලබන පෙබරවාරි වන විට මෙරටේ දැඩි ඉන්ධන අර්බුදයක් හට ගන්නා බවද විශේෂඥයෝ පෙන්වා දෙති.

ඩොලර් අර්බුදය හමුවේ මිරිකී ඇති මෙරට ආර්ථිකයට මේ තත්ත්වයෙන් බාධා ඇති වුවොත් ඉහළ යන ඉන්ධන මිල හමුවේ මෙරට ඉන්ධන මිල වැඩි නොකළහොත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අසීමිත ලෙස පාඩු ලැබිය හැකි බවද එම විශේෂඥයෝ වැඩිදුරටත් අවධාරණය කරති.

# බැඳුම්කර ගෙව්වේ...

ජනතාව ගැන කිසිදු තැකීමක් නොකොට තම හිතවතුන් පිනවීම උදෙසා ආණ්ඩුව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක් බැඳුම්කර ගෙවා දමා ඇතැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස චෝදනා කළේය.

මෙවන් අර්බුද සමයක ණය ගෙවා දැමීමට ලෝකය කල් ඉල්ලද්දී රටේ අවාසනාවට හිතවතුන්ට විශාල ලාභයක් අත්කර දීමට ආණ්ඩුව කළු සල්ලි සුදු කරමින් සිටින බවද මහාචාර්යවරයා 'මව්බිම'ට පැවැසීය.

"මේ ද්විතීය බැඳුම්කරනේ. ලංකාව ඇතුළේ සල්ලි දාපු අයනේ. දැන් ඒගොල්ලෝ කළු සල්ලි තමා මුදා හරින්නේ. ඒගොල්ලන්ට ඕන වෙලාවක ඕකට කල් ඉල්ලන්න තිබ්බා. ලෝකේ සාමාන්‍යයෙන් මේ වගේ ආර්ථික අර්බුදයක් තියන වෙලාවක බැඳුම්කරේ ජාත්‍යන්තර වේවා දේශීය වේවා කල් ඉල්ලනවා. නමුත් අවාසනාවට අපේ රටේ හිත මිතුරන්ට ගෙවනවා. මේ අය කවුද කියන එක ගැන ලැයිස්තු ඉදිරියේදී හෙළි වෙයි. ප්‍රධාන පෙළේ දේශීය ව්‍යාපාරිකයෝ කණ්ඩායම් තමා මේ ඉන්නේ. ඒ අය කෙරෙහි විශ්වාසය තියලා උනන්දු වුණා මිසක් ජනතාව ගැන හිතලා නැහැ. නැව්වල තියෙන කෑම ටික ගෙනාවා නම් ජනතාවට ඊට වඩා වටිනවා. කල් ඉල්ලනවා කියන්නේ ගෙවන්නේ නැහැ කියන එක නෙවේ. ගෙවනවා. ඒත් කල් ඉල්ලනවා" යැයිද මහාචාර්යවරයා තවදුරටත් පැවැසීය.

# ඇඹිලිපිටියෙන් ඇල්ලූ...

බොරැල්ල සියලු ශාන්තුවරයන්ගේ දේවස්ථානයට ජීව අත්බෝම්බයක් තැබීමේ සිද්ධියට අදාළ සැකකරුවකු කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් රජින්ද්‍රා ජයසූරිය මහත්මිය ඉදිරියේ 21දා පැය එකහමාරකට ආසන්න කාලයක් රහස් ප්‍රකාශයක් ලබාදුන්නේය.

බෝම්බ තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් තමාට රහස් ප්‍රකාශයක් ලබාදීමට අවශ්‍ය බවට මීට පෙර අධිකරණයෙන් කරනු ලැබූ ඉල්ලීමකට අනුව අධිකරණයේ අවසරය මත සැකකරු මහෙස්ත්‍රාත්වරිය හමුවේ මෙලෙස රහස් ප්‍රකාශයක් ලබාදුන්නේය.

කඩවත පදිංචි ලියනගේ දයාසේන යන වයස අවුරුදු 65 වන මෙම සැකකරු සිද්ධිය සම්බන්ධයෙන් ඇඹිලිපිටියේදී අත්අඩංගුවට ගෙන කොළඹ දකුණ කොට්ඨාස අපරාධ ඒකකය භාරයේ රැඳවුම් නියෝග මත රඳවා සිටියේය.

මෙම සැකකරු එම දේවස්ථානයට පැමිණ බෝම්බය තබා පලාගිය පුද්ගලයා බවට අනාවරණය වී ඇති බව පොලිසිය මීට පෙර අධිකරණය හමුවේ කරුණු වාර්තා කර තිබිණි.

මෙම සිද්ධියට අදාළව මේ වන විට විශ්‍රාමික වෛද්‍යවරයෙක් ඇතුළු සැකකරුවන් අටදෙනකු පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත.

# බොරැල්ල පල්ලියේ...

බොරැල්ල සියලු සාන්තුවරයන්ගේ දේවස්ථානය තුළ ජීව අත්බෝම්බයක් තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනුණු වෛද්‍යවරයා මානසික වෛද්‍යවරයකු වෙත යොමු කිරීමට පොලිසිය අදහස් කර ඇත.

75 වැනි වියේ පසුවන මෙම විශ්‍රාමික වෛද්‍යවරයා ප්‍රශ්න කිරීමේදී හෙළි කරන ප්‍රකාශ මත ඔහු මානසික පීඩාවකට ලක්ව ඇති බව පෙනෙන්නට ඇති නිසා මෙලෙස මානසික වෛද්‍යවරයකු වෙත ඉදිරිපත් කොට වාර්තාවක් ලබා ගැනීමට නියමිත බව පොලිස් ආරංචි මාර්ග සඳහන් කරයි.

මීට වසර 48කට පෙර බොරැල්ල සාන්තුවරයන්ගේ දෙව්මැඳුරේදී බෞද්ධ කාන්තාවක් සමඟ විවාහ වූ දා ඇතිවූ සිත්තැවුලක් මත ඉකුත් දින එම දේවස්ථානයට බෝම්බයක් තැබීමට උපදෙස් ලබාදීමත්, තමාගේ බිරිය අසනීප වූ අවස්ථාවේ හොඳින් ප්‍රතිකාර කළ නාරාහේන්පිට පෞද්ගලික රෝහල ජනප්‍රිය කිරීමේ අරමුණෙන් එම රෝහලෙහි බෝම්බය තැබූ බවත් සැකකරු ප්‍රකාශ කර ඇත.

එමෙන්ම නාරාහේන්පිට රෝහලේ බෝම්බ සිද්ධිය හා බොරැල්ල දෙව්මැඳුරේ අත්බෝම්බය හමුවීම සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් කළ විමර්ශනවලද ගැටලුකාරී තත්ත්වයක් මතුවී ඇති බවත් ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූ පුද්ගලයන් නිවැරදි අයද යන්න ප්‍රශ්නයක් බවත් මේ පිළිබඳ කළ විමසීමේදී ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙක් කීය. මේ අතර බෝම්බ තැබීමේ සිද්ධියට සැකපිට අත්අඩංගුවට ගත් පුද්ගලයා තම විවාහ මංගල පූජාව පිළිබඳව පවසන කරුණු පිළිබඳව සොයා බැලීමට කතෝලික සභාව තීරණය කොට ඇතැයි එහි ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයෙක් පැවැසීය.

තමන් විවාහ වන අවස්ථාවේදී තම බිරිය බෞද්ධ වීම හේතුවෙන් එවකට දේවස්ථානයේ සිටි පූජකවරයා තමන්ට විවාහ මංගල්‍යයට අදාළ මංගල පූජාව ලබා නොදුන් බවට පාපෝච්චාරණය කළ බවට වාර්තා වේ.

එම පුද්ගලයා පවසන එම කරුණු පිළිබඳව සත්‍ය අසත්‍යතාව පරීක්ෂා කිරීමට අදාළ දේවස්ථානයට හැකියාව ඇති බවද එම ප්‍රකාශකයා කීය.

දේවස්ථානය සතුව වසර සිය ගණනක් වුවද පැරණි ලේඛන සුරක්ෂිතව පවතින නිසා ඒ ප්‍රකාශවල නිරවද්‍යතාව සොයා බැලිය හැකි බවද හෙතෙම තවදුරටත් සඳහන් කළේය.

# දෙමළ සන්ධානයට...

දෙමළ ජාතික සන්ධානය ඇතුළු දෙමළ දේශපාලන පක්ෂ රැසක් ඒකාබද්ධව සකස් කර ඉන්දීය අගමැතිවරයාට යොමුකළ දේශපාලන යෝජනාවලියට එරෙහිව විරෝධතා ව්‍යාපාරයක් දියත් කිරීමට දෙමළ ජාතික මහජන පෙරමුණ තීරණය කර ඇත.

13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මුළුමනින්ම ක්‍රියා කළත් ජාතික ගැටලුවට එයින් විසඳුමක් නොලැබෙන බැවින් අදාළ යෝජනාවලියට එරෙහිව මෙසේ විරෝධය පළ කරන්නේ යැයි එම පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් 'මව්බිම'ට පැවැසීය.

ඒ අනුව ලබන 30 වැනිදා යාපනයෙන් ආරම්භ කරන මෙම විරෝධතාව උතුරු නැඟෙනහිර දෙපළාතේම ආරම්භ කරන්නේ යැයිද මන්ත්‍රීවරයා කීය.

13 වැනි සංශෝධනය යනු ඒකීය රාජ්‍යයක් යටතේ ලාංකික දෙමළ ප්‍රජාව මර්දනය කර පාලනය කිරීමට ඉන්දියාව විසින් කරන ලද කුමන්ත්‍රණයක් යැයි චෝදනා කළ හෙතෙම දෙමළ ජනතාව වසර තිස් හතරක් තිස්සේ සිටින්නේ එම උගුලට හසු වී යැයි අවධාරණය කළේය.

එහෙත් දෙමළ ජාතික සන්ධානය ඇතුළු දේශපාලන පක්ෂ කීපයක් එක්ව ඉන්දීය අගමැතිවරයාට යොමුකළ ලියැවිල්ලෙන් එකී 13 වැනි සංශෝධනයත් ඒකීය රාජ්‍යයත් පිළිගෙන ඇතැයිද දෙමළ ජාතික මහජන පෙරමුණ එවැනි විසඳුමකට එකඟ නැතැයිද පොන්නම්බලම් මන්ත්‍රීවරයා පැවැසීය.

ඒ අනුව සිය විරෝධතා ව්‍යාපාරයේදී දෙමළ ජාතික සන්ධානය ඇතුළු පක්ෂවල දේශපාලන සැලසුම් අනාවරණය කිරීමටත් සිය පක්ෂයේ අදහස සෘජුව ප්‍රකාශ කිරීමටත් කටයුතු කරන්නේ යැයිද පොන්නම්බලම් මන්ත්‍රීවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

# අනාගතයට ඇඟිලි...

13 අසුබ බවට ඇති ජනප්‍රිය මතය සේම 225 ඉලක්කම අසුබ යැයි ලංකා සමාජයේ මතයක් ගොඩනැඟී ඇතැයි ජනමාධ්‍ය ඇමැති ඩලස් අලහප්පෙරුම ඊයේ (21දා) පාර්ලිමේන්තුවේදී පැවැසීය. පාර්ලිමේන්තුවේ 225 අසුබ යැයි මතය අවබෝධ කරගතහොත් තරුණ පරම්පරාව ඉදිරි දේශපාලන අවකාශයෙන් විතැන් වන බවද ඇමැතිවරයා පෙන්වා දුන්නේය.

"ලෝක පිළිගත් දෙයක් තියෙනවා 13 අසුබයි කියලා. 13 අසුබ අංකයක් කියලා ජනප්‍රිය මතයක් තිබෙනවා. අපේ රටේ තුළත් 225 කියන ඉලක්කම ගැනත් අසුබවාදී මතයක් තිබෙනවා. ඒක අපි පිළිගත යුතුයි. අපි මේ අවස්ථාව පාවිච්චි කරන්න ඕනේ සාමූහිකව කොහොමද ව්‍යවස්ථාවෙන් උත්තරීතරයි කියන මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය රැකගන්නේ කියන එක ගැන. අපි අවධානය යොමු කළ යුතුයි. එළියෙ ජනප්‍රිය මතය බැලුවම ආණ්ඩුවේ මම විපක්ෂයේ ඔබ සහ අපි සියල්ල දක්ෂ බව පෙන්වන්නේ එකිනෙකාට හෝ ඉතිහාසයට ඇඟිලි දිගු කරමින්. මේ 225 අංකය අසුබයි කියන එක ගැන අවබෝධයක් නොගත්තොත් තරුණ පරම්පරාව ඉදිරි දේශපාලන අවකාශයේ විතැන් වන බව අනිවාර්යයෙන්ම සිදුවන දෙයක්. ඒ නිසා ඉතිහාසයට ඇඟිල්ල දිගු නොකර අනාගතයට ඇඟිලි දිගු කරන මහජන නියෝජිතයන් ලෙස අපි එකට කටයුතු කරමු කියන අධිෂ්ඨානයකට ආ යුතුයි. ඒක අපේ පරම වගකීමක්" යැයිද ඔහු වැඩිදුරටත් පැවැසීය.

# වයඹ සරසවියටත්...

පුරප්පාඩුවක්ව පවතින වයඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරය වෙනුවෙන් නම් කළ එක් පුද්ගලයකු පත්කර ගන්නැයි ඉල්ලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 5 දෙනෙක් සහ තවත් පුද්ගලයන් දෙදෙනෙක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට බලපෑම් කරමින් ලිපි යොමු කර ඇතැයි ජාතික ජන බලවේගයේ ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් අනාවරණය කළේය.

එම මන්ත්‍රීවරුන් අතර සමන්ප්‍රිය හේරත්, සනත් නිශාන්ත පෙරේරා, බී. වයි. ජී. රත්නසේකර, නාලක බණ්ඩාර කෝට්ටේගොඩ, ඩී. බී. හේරත් හා ශ්‍රී ලංකා පොදුජන ආචාර්ය සංගමයේ කැඳවුම්කරු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්මික වීරතිලක හා වියත්මග කුලියාපිටිය සභාපති යන හත් දෙනා එම ලිපි යොමු කර ඇති බව මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේදී අනාවරණය කළේය.

වයඹ විශ්වවිද්‍යාලයේ කටයුතු කරන මහාචාර්ය එච්. එම්. ඒ. හේරත් යන පුද්ගලයා මෙසේ උප කුලපති සඳහා නම් කර ඇති බව එම ලිපිවලින් තහවුරු වී ඇති බවත් තමා සතුව ලිපි පවතින බවත් විජිත හේරත් මහතා කීය.

ධම්මික වීරතිලක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයා මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහතාගේ නඩුවක ඇපයට අත්සන් කළ පුද්ගලයෙක් බවද මන්ත්‍රීවරයා අනාවරණය කළේය.

ඔහු පැවැසුවේ විශ්වවිද්‍යාලයක උපකුලපතිවරුන් පත් කරන ක්‍රමවේදයක් පවතින අතර ඒ ක්‍රමවේදයට පටහැනිව දේශපාලනඥයන් පෝලිමේ ලිපි ගැසීම ඉතාමත් අශිෂ්ටසම්පන්න ක්‍රියාවක් බවය.

"මහාචාර්ය එච්. එම්. ඒ. හේරත් මහතා අප සමඟ වර්තමාන ආණ්ඩුව පිහිටුවීමට විශාල කැපවීමක් කළා" යැයි එම ලිපිවල නිර්ලජ්ජිතව සඳහන් කර ඇති බවත් දේශපාලනඥයන්ගේ ලිපිවලට උපකුලපතිවරු පත් කරනවා නම් එය කනගාටුවට කාරණයක් බවත් හේරත් මහතා සඳහන් කළේය.

ඔහු ප්‍රශ්න කළේ මෙම පත්වීම් සඳහා මන්ත්‍රීවරුන්ගේ ලිපි අවශ්‍යද යන්නය.

# ලොකු බලාගාර...

උද්ගතව ඇති දැවි තෙල් හිඟය මත ජාතික විදුලි බල පද්ධතියට විශාල දායකත්වයක් ලබාදෙන සපුගස්කන්ද, බත්තල, උතුරු ජනනී සහ කෙරවලපිටිය පිහිටි West Coast යන ප්‍රධාන පෙළේ විදුලි බලාගාර හතර ඉදිරි දින කිහිපයේදී ඇනහිටීමේ අවදානමක් මතුව ඇතැයි ලංකා විදුලිබල මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයෙක් "ඉරිදා මව්බිම" ට හෙළිදරව් කළේය.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව පැවැති දැවි තෙල් තොග සෙනසුරාදා (22දා) දිනයෙන් අවසන් වීමට තිබූ බවත් නැවත ලබන පෙබරවාරි 04 වැනිදා දකුණු අප්‍රිකානු සමාගමකින් මෙරටට දැවිතෙල් මෙට්‍රික් ටොන් 30,000ක් ලැබෙන තෙක් ප්‍රමාණවත් දැවි තෙල් තොග තෙල් සංස්ථාවෙන් විදුලිබල මණ්ඩලයට ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගතව ඇති බවද එම ප්‍රකාශකයා පැවැසීය.

විදුලි ජනන යන්ත්‍ර ඇනහිටීමේ වැඩි අවදානමක් මතුව ඇත්තේ සපුගස්කන්ද හා බත්තල විදුලි බලාගාර දෙකට බවද හෙතෙම කියා සිටියේය. මෙම බලාගාර දෙක සඳහා දැවි තෙල් සපයනු ලබන්නේ නළ පද්ධතියක් මාර්ගයෙනි.

උතුරු ජනනී විදුලි බලාගාරය සඳහා දැවි තෙල් තොග ගබඩා කොට ඇත්තේ තව දින තුනකට පමණක් බවත් බවුසර් මඟින් දැවි තෙල් ප්‍රවාහනය කර ගත හොත් මෙම අර්බුදය තාවකාලිකව සමනය කර ගත හැකි බවද එම ප්‍රකාශකයා පැවැසීය.

# හිට්ලර් කියලා...

අද යන තත්ත්වයට අනුව රටට අවශ්‍ය වන්නේ හිට්ලර් කෙනෙක් යැයි ඉඩම් ඇමැති එස්.එම්. චන්ද්‍රසේන 21දා පාර්ලිමේන්තුවේදී පැවැසීය. දරුවන්, වැඩිහිටියන් පාරට ඇදදමන වෘත්තීය සමිති රටේ තිබෙන අතර එම වෘත්තීය සමිති අද අනවශ්‍ය ලෙස තමන්ගේ අයිතීන් පාවිච්චි කරන බවත් එවැනි පුද්ගලයන් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා හිට්ලර් කෙනෙක් ලෙස කටයුතු කරනු ඇතැයි හැඳින්වූ නමුත් ඔහු එලෙස ක්‍රියා කරන්නේ නැතැයි ඇමැතිවරයා පෙන්වා දුන්නේය.

කෙසේ නමුත් මේ තියෙන තත්ත්වය දෙස බැලුවම මේ රටට අවශ්‍ය හිට්ලර් වැනි කෙනෙක් වුවත් ජනාධිපතිවරයා හිට්ලර් කෙනෙක් නොවන බවත් ඔහු ඉතාම හොඳ ප්‍රජාතන්ත්‍රවාදියෙක් හැටියට මේ රට පාලනය කරන බවත් ඒ මහතා කීය.

රජයක් හැටියට ඉතිරි අවුරුදු තුනේදී ඉතුරු වෙලා තිබෙන වැඩ ටික වගකීමෙන් කරන බවද ඔහු වැඩිදුරටත් පැවැසීය.

# දින 21ට...

බස්නාහිර පළාත ඇතුළු දිස්ත්‍රික්ක රැසක ඉකුත් දින 21 තුළ ඩෙංගු රෝගීන්ගේ 5723 දෙනකු වාර්තා වීම නිසා ඩෙංගු රෝගීන්ගේ ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන බව වසංගත රෝග විද්‍යා ඒකකයේ ප්‍රධානි විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර අවධාරණය කළේය. වැඩිම රෝගීන් සංඛ්‍යාව වන 1,506ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ ඩෙංගු රෝගීන්ගේ සංඛ්‍යාව 1,195ක් බව විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර සඳහන් කළේය. කළුතර දිස්ත්‍රික්කයෙන් ඩෙංගු රෝගීන් 460ක්ද, මහනුවර 250, ගාල්ල 287, කුරුණෑගල 365, පුත්තලම 339ක් වශයෙන් වැඩිම ඩෙංගු රෝගීන් වාර්තා වූ දිස්ත්‍රික්ක බවත් සෙසු දිස්ත්‍රික්කවලින් රෝගීන් 1321 දෙනෙක් හමුවී ඇති බවත් විශේෂඥ වෛද්‍යවරයා සඳහන් කළේය. ලැබෙන තොරතුරු අනුව ඩෙංගු රෝගය ශීඝ්‍රයෙන් වැලදීමේ දැඩි අවදානමක් පවතින බවද විශේෂඥ වෛද්‍යවරයා සඳහන් කළේය.



## දවසේ පද 4

**පෝර නැතත් ලොකු මුදලක් හෙව්වේය**
**චීන පෝර නැව හරවා යැව්වේය**
**නැවතත් මේ රටට එන බව කිව්වේය**
**ගොවිකම් ඇමැති නාගෙන තද අව්වේය**

විදුර අබේනායක


හදවතේ නිවහන
“ සමස්ත ශ්‍රී ලාංකිකයන් හට
උසස් ජීවන තත්ත්වයක් උරුමකරදීමේ
ප්‍රමුඛයා බවට පත්වීම
අපේ අරමුණයි.
SINGER®
www.singer.lk

# විත්තිකරු අසනීප වී රෝහල්ගත වීම

# අධිකරණය මඟ හැරීමේ උප්පරවැට්ටියක්

## ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස්

## චම්පික අධිකරණයට පැමිණිය හැකි තත්ත්වයකින් සිටි බව JMO වාර්තාව තහවුරු කරයි





**2016 පෙබරවාරි මස 28 වැනි දින රාත්‍රි 9.55ට පමණ එවකට අමාත්‍යවරයකු වූ වත්මන් සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක මන්ත්‍රීවරයා පදවාගෙන ගියා යැයි කියනු ලබන ජීප් රථයට යටවීමෙන් සංදීප් සම්පත් ගුණවර්ධන තරුණයා අද රෝද පුටුවේය.**

ඒ සම්බන්ධයෙන් නඩුව මේ වන විට කොළඹ මහාධිකරණයේ ප්‍රධාන අධිකරණ ශාලාවේදී ප්‍රධාන මහාධිකරණ විනිසුරු දමිත් තොටවත්ත මහතා හමුවේ විභාගයට ගැනෙමින් පවතී.

මෙකී රිය අනතුර සම්බන්ධයෙන් මෙම විත්තිකාර පාඨලී චම්පික රණවක නම් අය ඇමැති ධුරය දරන සමයේදී නඩුවක් පවරා තීන්දුවක්ද දී තිබිණි. එහෙත් ඔහුගේ ඇමැති ධුරය අහිමිව යෑමෙන් පසු වින්දිත තරුණයාගේ පාර්ශ්වය විසින් කරන ලද පැමිණිල්ලක් අනුව එකී ආන්දෝලනාත්මක රිය අනතුර සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශනයේදී හෙළි වී ඇත්තේ සියල්ල උඩුයටිකුරු කරමින් ජීප් රිය පැදවූයේ තමා විසින් යැයි පිළිගත් විත්තිකාර හිටපු ඇමැතිවරයාගේ රියැදුරුට දඬුවම්ද නියම වී ඇති බවය.

අනතුර සිදුකර පලා ගිය ජීප් රථය පැදවූයේ, 'පාඨලී චම්පික රණවක ඇමැතිතුමා' විසින් යනුවෙන්ද වූ වින්දිතයාගේ ප්‍රකාශයට අගට තවත් අකුරු 5ක් එකතු කරමින් ('ගේ රියැදුරු') යන්න එකතු කොට) එය "පාඨලී චම්පික රණවක ඇමැතිතුමාගේ රියැදුරු" ලෙස වෙනස් කරනු ලැබූ ආකාරය ඇතුළුව සිදුකරන ලද වෙනස්කම් සියල්ල විමර්ශනයේදී අනාවරණය කර ගැනීමට විමර්ශන නිලධාරීන්ට හැකි වී ඇත.

එකී වෙනස්කම් සිදුකරන ලද්දේ කාගේ නියමය පරිදිද කවුරුන්ගේ බලපෑම මතද යනාදී සියලු කරුණු අනාවරණය කරමින් වැලිකඩ පොලිස් ස්ථානයේ එම කටයුතුවලට සම්බන්ධ වූ අය විසින්ම ලබාදෙන ලද කටඋත්තරද ඇමුණුම් ලෙස ඉදිරිපත් කරමින් නීතිපතිවරයා විසින් ගොනුකළ එකී ආන්දෝලනාත්මක 'රිය අනතුර' පමණක් නොව එය විකෘති කිරීම, සාක්ෂි වෙනස් කිරීම, විමර්ශන වාර්තා වෙනස් කිරීම යනාදී චෝදනා රැසක් යටතේ විත්තිකාර පාර්ලිමේන්තු මන්ත්‍රී චම්පික රණවක හිටපු ඇමැතිවරයා 2019 දෙසැම්බර් මස 18 වැනි දින කොළඹ අපරාධ කොට්ඨාසය විසින් අත්අඩංගුවට ගනු ලැබීය.

පාඨලී චම්පික රණවක හිටපු ඇමැතිවරයා එලෙස 2019 දෙසැම්බර් මස 18 වැනි දින ඔහුගේ නිවෙසේම සිටියදී කොළඹ අපරාධ කොට්ඨාසය විසින් අත්අඩංගුවට ගන්නා ලද්දේ නීතිපතිවරයා විසින් ලබාදුන් උපදෙස් පරිදිය.

එම උපදෙස ලබාදී ඇත්තේ මෙම විත්තිකරු විසින් තමා පදවාගෙන ගිය ජීප් රථය නොසැලකිලිමත් ලෙස හා අධික වේගයෙන් පැදවීම මඟින් රාජගිරිය ප්‍රදේශයේදී සංදීප් සම්පත් නමැති තරුණයකු අනතුරට ලක් කොට බරපතළ තුවාල සිදුකිරීම, අනතුරට භාජනය වූ වින්දිතයාගේ ජීවිතය ගැන නොතකා එම ස්ථානයෙන් පලායෑම, තමා ඉදිරිපත් නොවී රථය පැදවූ අය ලෙස අන් අයකු (තම රියැදුරු) ඉදිරිපත් කිරීම, අනතුර ආසන්නතම පොලිස් ස්ථානයට වාර්තා නොකිරීම, සත්‍ය තොරතුරු වසන් කරමින් පොලිසියට අසත්‍ය තොරතුරු සැපයීමෙන් පොලිසිය නොමඟ යැවීම යන වරදවල් සිදුකොට ඇති බවට විමර්ශනයේදී කරුණු අනාවරණය වී තිබීම මතය.

අත්අඩංගුවට ගනු ලැබූ පාඨලී චම්පික රණවක හිටපු ඇමැතිවරයා එදිනම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව පසු දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබූ අතර පසු දිනයේදී වැඩිදුරටත් විමර්ශන වාර්තා ගොනු කිරීමෙන් අනතුරුව ඔහු දෙසැම්බර් මස 24 වැනි දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබීය.

දෙසැම්බර් මස 24 වැනි දින නඩුව යළි කැඳවනු ලැබූ අවස්ථාවේදී රුපියල් 25,000ක මුදල් ඇපයක් හා රුපියල් ලක්ෂ 5ක් බැගින් වූ ශරීර ඇප 2ක් මත රක්ෂණ භාරයෙන් ඔහු මුදා හැරීමට නියෝග විය.

ඊට අමතරව සෑම මසකම අවසන් ඉරිදා දිනයේ කොළඹ අපරාධ කොට්ඨාසය හමුවේ පෙනී සිටින ලෙසට කොන්දේසියක්ද පැනවිණි.

මෙදිනම, තමා අනතුර සිදු කළ රථය පැදවූ බවට අසත්‍ය කරුණක් අධිකරණය හමුවේ ප්‍රකාශ කිරීම් මත චෝදනා ලැබ සිටින රියැදුරු දිලුම් තුසිත කුමාර යන අය මෙම නඩුවේ 2 වැනි විත්තිකරු ලෙස නම් කරමින් ඔහුද රක්ෂිත බන්ධනාගාර ගත කරනු ලැබීය.

ඊළඟ නඩු දිනයේදී 2020 ජනවාරි 6 දින දෙවැනි සැකකාර දිලුම් තුසිත කුමාර ඇප මත මුදා හරින ලද අතර පසුව ජනවාරි මස 13 වැනි දිනත්, ජනවාරි 22 වැනි දිනත් යන දින දෙකකදීම නීතිඥවරයකු මඟින් මෝසමක් ගොනු කරමින් අධිකරණය හමුවට පැමිණි ඔහු අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වැනි වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරිය හමුවේ රහස්‍ය ප්‍රකාශයක් ලබාදීමට අවසරය ඉල්ලා සිටියේය.

ඒ සඳහා ලද අවසරය පරිදි 2020 ජනවාරි මස 29 වැනි දින මහෙස්ත්‍රාත්වරිය හමුවේ පැයක පමණ කාලයක් තිස්සේ නිල මැදිරිය තුළදී එම රහස්‍ය ප්‍රකාශය කරනු ලැබීය.

ඉන් අනතුරුව මෙම ආන්දෝලනාත්මක රිය අනතුරු සිද්ධිය සම්බන්ධයෙන් බොරු සාක්ෂි අධිකරණයට ඉදිරිපත් කරනු ලදැයි එවකට වැලිකඩ පොලිසියේ ස්ථානාධිපතිවරයායව සිටි වත්මන්හි සහකාර පොලිස් අධිකාරිවරයකු වන සුදත් අස්මඩල යන අයද නඩුවේ 3 වැනි විත්තිකරු ලෙස නම් කිරීමට නීතිපතිවරයා විසින් පියවර ගනු ලැබීය.

ඒ අනුව 2020 ජුනි මස 24 වැනි දින කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් අධිකරණය හමුවේ කැඳවනු ලැබූ අවස්ථාවේදී පැමිණිල්ල මහෙස්ත්‍රාත්වරියට දන්වා සිටියේ මෙම සිද්ධියේ සියලු විමර්ශන අවසන් කොට ඇති බවත් එබැවින් සැකකාර පාඨලී චම්පික රණවක යන අයට එරෙහිව කොළඹ මහාධිකරණය හමුවේ අධිචෝදනා ගොනු කිරීමට නීතිපතිවරයා විසින් පියවර ගනු ලැබ ඇති බවත්ය.

එහිදී මහෙස්ත්‍රාත්වරිය විත්තිකාර පාඨලී චම්පික රණවක හිටපු ඇමැතිවරයා අමතමින් මහාධිකරණයෙන් නියම කරනු ලබන දියන්හිදී නියමිත පරිදි මහාධිකරණය හමුවේ පෙනී සිටින ලෙසට අවවාද කර සිටියේය.

2016 වසරේ පෙබරවාරි මස 20 වැනි දින WP-KT/7545 අංක දරන ජීප් රථයේ රියැදුරුව සිටිමින් එම රථය පැදවීමේදී අපරීක්ෂාකාරීවත්, නොසැලකිලිමත් ලෙසත් කටයුතු කිරීම, එමඟින් මහාමාර්ගයේ ගමන් කරමින් සිටි පුද්ගලයකුට බරපතළ තුවාල සිදු කිරීම, එම අනතුර පොලිසියට වාර්තා නොකර සිටීම, අනතුර සිදුකොට පලායෑම, අනතුරට ලක්වූ තැනැත්තාගේ ජීවිතය ආරක්ෂා කිරීම සඳහා පියවර නොගැනීම, වේගය පාලනයෙන් තොරව රථය ධාවනය කිරීම යන වරදවල් සම්බන්ධයෙන් මෝටර් රථ වාහන ආඥාපනතේ 149, 216 වගන්තිය සමඟ කියැවිය යුතු 224, 161 (4) (ආ) සමඟ කියැවිය යුතු 224 හා ශ්‍රී ලංකා දණ්ඩනීති සංග්‍රහයේ 329 වගන්තිය යටතේ ප්‍රධාන චෝදනා 4ක් ලෙස පාඨලී චම්පික හිටපු ඇමැතිවරයාට එරෙහිව නීතිපතිවරයා විසින් කොළඹ මහාධිකරණය හමුවේ අධි චෝදනා ගොනු කොට ඇත.

මෙකී අධිචෝදනා විභාගය ඉකුත් දෙසැම්බර් මස 2 වැනි දින ඒ අනුව ආරම්භ වූ අතර පැමිණිල්ලේ ප්‍රථම සාක්ෂිය වශයෙන් අනතුරින් ආබාධිතව සිටින සංදීප් සම්පත් ගුණවර්ධන තරුණයාගේ පියාගේ සාක්ෂිය කැඳවනු ලැබූ අතර ඊළඟ නඩු දිනය වූයේ ඉකුත් (ජනවාරි) 11 වැනි දිනය.

පළමුවන විත්තිකරු පාඨලී චම්පික රණවක හිටපු ඇමැතිවරයා මෙකී මහාධිකරණ නඩුවට එරෙහිව එම නඩු විභාගය අත්හිටුවන ලෙසට ඉල්ලා සිටිමින් අභියාචනාධිකරණය හමුවේ 'රිට්' පෙත්සමක් ගොනු කරනු ලැබූ අතර, එම 'රිට්' පෙත්සම ඉකුත් 10 වැනි දින අභියාචනාධිකරණය හමුවේ කැඳවනු ලැබිණි.

එහිදී අධිකරණයෙන් ඔහු සිය නීතිඥවරයා මඟින් ඉල්ලා සිටින ලද්දේ පසු දින එනම් 11 වැනි දින මහාධිකරණය හමුවේ විභාගයට නියමිතව ඇති මෙම නඩුව විභාග කිරීම අත්හිටුවමින් අතුරු ආඥාවක් නිකුත් කරන ලෙසටය.

එහෙත් එම ඉල්ලීම අභියාචනාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලද්දේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් දිලීප පීරිස් මහතා කරන ලද කරුණු දැක්වීමෙන් අනතුරුවය.

එදින මහාධිකරණයේ ප්‍රධාන විනිසුරු දමිත් තොටවත්ත මහතා හමුවේ නඩුව කැඳවනු ලැබ තිබුණද නඩුවේ ප්‍රධාන (පළමුවැනි) විත්තිකරු වන පාඨලී චම්පික රණවක හිටපු ඇමැතිවරයා අධිකරණය හමුවේ පෙනී නොසිටි අතර, ඔහු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න මහතා විශේෂඥ වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කරමින් කියා සිටියේ, තම සේවාදායක චම්පික රණවක නම් විත්තිකරු පෙරදින හදිසියේ හටගත් ආබාධ තත්ත්වයක් හේතුවෙන් රෝහල්ගතව ඇඳ විවේකයෙන් (Bed Rest) පසුවන බවත් තවත් මාසයක් පමණ කාලයකට ඔහුට අධිකරණයට පැමිණීමට නොහැකි තත්ත්වයක පසුවන බව වෛද්‍ය විශේෂඥවරයා ප්‍රකාශ කොට ඇති බවත්ය.

එහිදී නීතිපතිවරයා නියෝජනය කරමින් පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි රජයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා අධිකරණය අමතමින් කියා සිටියේ විත්තිකාර හිටපු ඇමැතිවරයා උපරිමාධිකරණ සංකීර්ණ පරිශ්‍රයට පැමිණ සිය නීතිඥ මහත්වරුන් සමඟ කිසිදු අපහසුතාවකින් තොරව එහා මෙහා ඇවිදිමින් හා එකදිගට සිටගෙන සිටිමින් සිටින අයුරු මා සියැසින්ම දුටු බවත්, මෙය අධිකරණය මඟහැර නඩු විභාගයෙන් වසන් වී සිටීමට විත්තිකරු විසින් ගනු ලබන උත්සාහයක් බවට තදබල සැකයක් උපදින බවත්ය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතාගේ කරුණු දැක්වීමෙන් අනතුරුව ප්‍රධාන මහාධිකරණ විනිසුරු දමිත් තොටවත්ත මහතා අධිකරණය අමතමින් කියා සිටියේ එම ඉල්ලීම සාධාරණ බව තමාටද හැඟී යන බවත්, අදාළ වෛද්‍ය වාර්තාව පරීක්ෂා කර බැලීමේදී වෛද්‍ය විශේෂඥවරයා ලබාදී ඇති වාර්තාව ඔහුගේ අත් අකුරින් ලියන ලද්දක් බවත්, කරුණු පැහැදිලිව කියවා ගැනීමට පවා අපහසු බවත් තවද විත්තිකරුට අධිකරණයට පැමිණීමට නොහැකි තරම් බරපතළ හේතුව පිළිබඳව පැහැදිලි නිගමනයක් එමඟින් ප්‍රකාශ නොවන බවත්ය.

ඒ අනුව ප්‍රධාන අධිකරණ වෛද්‍යවරයාට උක්ත රෝහලට ගොස් විත්තිකරුගේ රෝගී තත්ත්වය පිරික්ෂා කර බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසටත්, මෙම වාර්තාව දී ඇති විශේෂඥ වෛද්‍යවරයා හමුවී ඔහුගේ ප්‍රකාශයක් ලබාගෙන ඉදිරිපත් කරන ලෙස කොළඹ අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයාටත් නියෝග කරමින් එම නියෝග අදම ක්‍රියාත්මක කරන ලෙසටද අධිකරණ ලේඛකාධිකාරිවරයාට නියම කළේය.

පැමිණිල්ලේ ඉල්ලීම පරිදි සතියක කාලයක් ලබා දෙමින් 21 වැනි දින නඩුව යළි කැඳවීමටද එහිදී නියම විය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා මෙම නඩුව කැඳවූ අවස්ථාවේදී විශේෂයෙන්ම අධිකරණයේ අවධානයට යොමු කරවා සිටියේ මහාධිකරණ නියෝගය මත විත්තිකාර චම්පික රණවක හිටපු ඇමැතිවරයා නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටි පෞද්ගලික රෝහලට ගොස් රෝගියාගේ තත්ත්වය පිළිබඳව පරීක්ෂණ 10ක් සිදුකොට ලබාදී ඇති ප්‍රතිඵලය පිළිබඳවයි.

ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා අධිකරණයට ඉදිරිපත් කරන ලද වාර්තාව ඉදිරිපත් කරමින් ඔහු කියා සිටියේ, පවත්වන ලද පරීක්ෂණ 10න්ම තහවුරුව ඇත්තේ විත්තිකාර හිටපු ඇමැතිවරයා නියත වශයෙන්ම 'සාමාන්‍ය' තත්ත්වයේ පසුවන බවත්, අධිකරණයට නොපැමිණ සිටීමට හෝ විවේක ලබාගැනීමට හෝ අවශ්‍ය කිසිදුම හේතුවක් පිළිබිඹු නොවන බවත්ය.

මේ අනුව විත්තිකාර හිටපු ඇමැතිවරයා මෙහිදී සිදුකොට ඇත්තේ නඩු කටයුත්තෙන් මඟහැර යෑමට තවත් උප්පරවැට්ටියක් යෙදීම මඟින් අධිකරණයත් නීතිපති දෙපාර්තමේන්තුවත් නොමඟ යැවීමට උත්සාහ කිරීමක් බවද ඔහු කියා සිටියේය.

විත්තිකාර පාඨලී චම්පික රණවක හිටපු ඇමැතිවරයා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ අනුජ ප්‍රේමරත්න මහතා මෙහිදී අධිකරණ වෛද්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාවේ සඳහන් පරීක්ෂණ 10න් එකක් ගැන සඳහන් කරමින් කියා සිටියේ, එම පරීක්ෂණයෙන් ලැබී ඇති ප්‍රතිඵලය සාමාන්‍යයෙන් ලැබෙනුයේ, මත්පැන් පානය කරනු ලබන අයකුගේ බවත් එහෙත් තම සේවාදායකයා මත්පැන් පානය නොකරන අයකු බවත්ය.

සියලු කරුණු දැක්වීම් අවසානයේ අධිකරණය අමතමින් කොළඹ ප්‍රධාන මහාධිකරණ විනිසුරු දමිත් තොටවත්ත මහතා මෙලෙස ප්‍රකාශ කර සිටියේය. විත්තිකරුවකු නීත්‍යනුකූල පටිපාටියක් අනුගමනය කරමින් තම නඩුව පසුවට කල් තබාගැනීමට උත්සාහ කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බවත්, එය ඔවුන්ගේ අයිතියක් බවත්. එහෙත් මෙවැනි ආකාරයෙන් අයුතු ක්‍රියාමාර්ග ඔස්සේ එවැනි ඕනෑකම් ඉටුකර ගැනීමට ඉඩදිය නොහැකි බවත්, අධිකරණයට නොපැමිණ ඒ සඳහා ඉදිරිපත් කරන ලද වෛද්‍ය වාර්තාව ප්‍රශ්නගත බව අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති වාර්තාවෙන් තහවුරු වන බවත්ය.

## නඩුව කල් තබාගැනීමට අයිතියක් තියෙනවා; ඒත් මෙවැනි අයුතු ක්‍රියාමාර්ග ඔස්සේ එය කරන්න ඉඩ දෙන්න බෑ

## වෛද්‍ය වාර්තා ප්‍රශ්නගත බව අධිකරණ වෛද්‍ය නිලධාරි වාර්තාවෙන් තහවුරු වනවා

- මහාධිකරණ විනිසුරු

මහාධිකරණ විනිසුරු තොටවත්ත මහතා වැඩිදුරටත් කියා සිටියේ, නඩුවක් හැකි ඉක්මනින් කඩිනමින් නිම කිරීම අධිකරණයේ මුඛ්‍ය අරමුණ වන බවය.

මෙහිදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා කියා සිටියේ, විත්තිකරු අධිකරණය මුළා කොට තම නඩුව විභාග කිරීම අතපසු කිරීමට උත්සාහ දරන ලද බව අධිකරණ වෛද්‍ය නිලධාරී වාර්තාවෙන් තහවුරුව ඇති බවත් එබැවින් මෙම නඩුව නිමවන තුරු විත්තිකරු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට හෝ නඩුව දිනපතා අසා අවසන් කිරීමට පියවර ගත යුතු බවය.

එහිදී විනිසුරුවරයා කියා සිටියේ, අධිකරණයේත්, පෙනී සිටින නීතිඥවරුන්ගේත් පහසු අපහසුතාවන් සැලකිල්ලට ගනිමින් හැකිතරම් කඩිනමින් නඩු විභාග කොට අවසන් කිරීමට තමා හැමවිටම කටයුතු කරන බවය.

තවද නීතිඥවරුන්ද එකඟවන්නේ නම් උදේ පාන්දරම සිට හෝ වඩාත් සවස්වන තෙක් හෝ වැඩි පැය ගණනක් නඩු විභාග කිරීමට තමා හැමවිටම සූදානමින් සිටින බවද ප්‍රධාන විනිසුරු තොටවත්ත මහතා කියා සිටියේය.

නඩ විභාගය පෙබරවාරි මස 18 හා 23 දිනවල පැවැත්වීමට නියම විය.

අධිකරණයට ඉදිරිපත් කළ අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව මෙසේය.

මෙම තැනැත්තා රෝහල්ගතව ඇත්තේ, පපුව වම් පැත්තේ වේදනාව, අධික දහදිය දැමීම, බඩේ කැක්කුම, හුස්ම ගැනීමේ අපහසුතාව යන තත්ත්වයන්ගෙන් පෙළෙන බැව් ප්‍රකාශ කරමිනි.

ETU පරීක්ෂණයකින් පසුව රෝහල් වාට්ටුවකට ඇතුළත් කොට ඇත. ඔහු දියවැඩියාව රෝගය සඳහා ඖෂධ භාවිත කරන්නෙක් බැව් ප්‍රකාශ වේ.

රුධිර ධාවනය 150/80කි.

පරීක්ෂණ 10ක් සිදු කොට ඇත.

(i) ECG – (සාමාන්‍ය)

(ii) ට්‍රොපොනින් මට්ටම - සාමාන්‍ය (ඒ අනුව දැඩි හෘදයාබාධ තත්ත්වයක් නොමැත)

(iii) කොවිඩ් -19 - නෙගටිව්

(iv) මුත්‍රා - (සාමාන්‍ය)

(v) HBAGC - දියවැඩියා පාලනය යහපත්

(vi) D-Dimer Plasuna – ඉතා යහපත්

(vii) FBC – කිසිදු සැලකිය යුතු වෙනසක් නැත.

(viii) Serum (creatinine) - සුළු වශයෙන් වැඩියි.

(ix) Serum/ Amylase - සුළු වශයෙන් වැඩියි.

(x) MRI – යහපත්

මගේ පරීක්ෂණ අනුව ඔහුට පපුවේ කැක්කුම නැත.

බඩේ කැක්කුම පමණක් ඇත.

ප්‍රතිකාර කළ වෛද්‍යවරයාගේ මතය වූයේ, සිදුකළ බොහෝ පරීක්ෂණ සාමාන්‍ය වන අතර රෝගියා රෝහලෙන් මුදා හැරිය හැකි බවය.

**නිර්දේශය:**

මේ සියලු තත්ත්වයන් මත,

(a) රෝගියා හට ජීවිත තර්ජනයක් ගෙන දෙන රෝගයක් හෝ තත්ත්වයක් නැත.


(b) අධිකරණයට පැමිණීමට හැකි තත්ත්වයේ සිටී.

## මගේ සේවාදායකයා මත්පැන් නොබිව්වත් එක් පරීක්ෂණ ප්‍රතිඵලයක් මත්පැන් පානය කළ අයකුගේ ප්‍රතිඵලයකට සමානයි

- විත්තියේ නීතිඥ

## අධිකරණයත් නීතිපති දෙපාර්තමේන්තුවත් නොමඟ යවලා





■ කමල් මහේන්ද්‍ර වීරරත්න






# විස්කි පාටි දැම්ම බොරිස්ට ගෙදර යන්න වෙයිද?

කොවිඩ් හේතුවෙන් රට තුළ අගුළුලෑම් ක්‍රියාත්මක වූ කාලයේ ජනතාවට සෞඛ්‍ය සීමාවන් අනුගමනය කරන ලෙස නියෝග පනවා අනෙක් අතට අගමැති කාර්යාලයේ මත්පැන් සාද පැවැත්වීම පිළිබඳ චෝදනා මත එක්සත් රාජධානියේ අගමැති බොරිස් ජොන්සන් මේ වනවිට ලොකු අමාරුවක වැටී සිටිනු පෙනේ. මෙම අර්බුදය දුරදිග ගියහොත් සමහර විට ඔහුගේ අගමැතිකම පවා අහිමි වීමට ඉඩ තිබේ. එරට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් පමණක් නොව ඔහුගේ කොන්සර්වේටිව් පක්ෂයේම මන්ත්‍රීවරුන් පවා ජොන්සන් අගමැති ධුරයෙන් ඉල්ලා අස්විය යුතු බවට බලපෑම් කරන්නට පටන්ගෙන ඇත.

මෙම ආන්දෝලනයට ප්‍රධාන වශයෙන්ම පසුබිම් වූයේ 2020 වසරේ කොවිඩ් වසංගතය හේතුවෙන් රට තුළ දැඩි සීමාවන් ක්‍රියාත්මක වෙමින් තිබූ කාලයේ අගමැති කාර්යාල පරිශ්‍රයේ පවත්වා තිබූ මත්පැන් සාදයකි. එය පවත්වා තිබුණේ 2020 මැයි මාසයේ බව සඳහන් වේ. මෙම සිද්ධිය සිදු වූ කාලයේ රට තුළ කොවිඩ් පාලනය සඳහා ඉතා දැඩි සීමාවන් පනවා තිබිණි. ජනතාවට ඔවුන්ගේ නිවෙස්වලින් පිටතට යෑමට හැකි වූයේ අත්‍යවශ්‍යම කටයුතු සඳහා පමණි. හැකි සෑම අවස්ථාවකම රැකියා කටයුතුද නිවෙස්වල සිටම කළ යුතු විය. එකම නිවෙසේ නොවන අයට එළිමහනේදී හමු වීමට අවසර තිබුණේ දෙදෙනකුට පමණි. අත්‍යවශ්‍යම අවස්ථාවල පමණක් රැකියා ස්ථානයන්හි යම් යම් සීමාවන් යටතේ රැස්වීම් පැවැත්වීමට ඉඩ ලැබිණි. කෙසේ නමුත් අගමැති කාර්යාල පරිශ්‍රයේ පැවැති මත්පැන් සාදයට සියයකට වැඩි පිරිසකට ආරාධනා කර තිබූ බව සඳහන් වේ. නමුත් ඊට සහභාගි වී තිබුණේ 30කට ආසන්න සංඛ්‍යාවකි. මෙම සාදයට බොරිස් ජොන්සන් මෙන්ම ඔහුගේ බිරියද සහභාගි වී තිබූ බව වාර්තා විය. අගමැතිවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ අය වයින් බෝතල අතැතිව සිටින අයුරු දැක්වෙන ඡායාරූපයක් ද ප්‍රසිද්ධියට පත්ව තිබිණි. මේ ගැන විමසූ අවස්ථාවක ජොන්සන් පවසා තිබුණේ එය රාජකාරි කටයුතු ගැන සාකච්ඡා කළ 'රාජකාරි හමුවක්' වූ බවකි. කෙසේ හෝ වේවා, මේ පිළිබඳව අගමැතිවරයා කළ ඇතැම් ප්‍රකාශ මාධ්‍ය තුළ හාස්‍යයට ලක්කර තිබෙනුද දැකිය හැකි විය. මෙම සාදය සම්බන්ධයෙන් ජනතාවගෙන් සමාව ගැනීමට පසුගියදා බොරිස් ජොන්සන් පාර්ලිමේන්තුවේදී පියවර ගත්තේය. මෙම සාදයට අමතරව 2020 අවසන් භාගයේද, 2021 අප්‍රේල් මාසයේද තවත් සාද පවත්වා තිබූ බව වාර්තා වේ. මහ රැජනගේ සැමියා වූ පිලිප් කුමරුගේ අවමඟුල් උත්සවය පැවැති දිනට පෙර දිනයේ රාත්‍රියේ පවා එවැනි සාදයක් පවත්වා තිබූ බැව් සඳහන්ය. ඒ වෙද්දීත් කොවිඩ් තත්ත්වය නිසා ගෘහස්ථ ඒකරාශිවීම් සීමා කර තිබිණි. මෙම සාදවලට අගමැතිවරයා සහභාගි වී නොතිබුණත් අගමැති කාර්යාලය ඒ සම්බන්ධයෙන් මහ රැජනගෙන් සමාව ඉල්ලා සිටියේය. ඔවුන්ගේම රජය පැනවූ නියෝග ඔවුන් විසින්ම කඩ කරනු ලැබීම සම්බන්ධයෙන් බොහෝ පාර්ශ්ව චෝදනා එල්ල කර තිබෙනු දැකිය හැකි විය.

කෙසේ හෝ වේවා, මෙම සිදුවීම් සම්බන්ධයෙන් මේ වනවිට විමර්ශනයක් පැවැත්වෙමින් තිබේ. එය මෙහෙයවන්නේ ජ්‍යෙෂ්ඨ සිවිල් සේවිකාවක වන සූ ග්‍රේය. මෙම විමර්ශනයේ වාර්තාව බොහෝ දුරට ලබන සතියේ නිකුත් වීමට ඉඩ ඇති බව සඳහන් වේ.

අගමැතිවරයා ධුරයෙන් ඉවත් කිරීමේ ක්‍රියාදාමයකට මේ වනවිටත් ජොන්සන්ගේ පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් මුලපුරා ඇත. ඒ, ඔහු පිළිබඳ විශ්වාසය පලුදු වී ඇති බවට 1922 කමිටුව නමැති පාර්ලිමේන්තු කමිටුවකට ලිපි ඉදිරිපත් කිරීම මඟිනි. කොන්සර්වේටිව් පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 54 දෙනකුට වැඩි සංඛ්‍යාවක් මෙවැනි ලිපි එම කමිටුවට ඉදිරිපත් කළහොත් එයින් ජොන්සන්ගේ අගමැති ධුරයට විශාල අභියෝගයක් එල්ල වේ. ඒ, පක්ෂය තුළ ඔහු පිළිබඳ ඇති විශ්වාසය උරගා බැලෙන ඡන්ද විමසීමක් පැවැත්වීමට සිදුවන බැවිනි. එම ඡන්ද විමසීමෙන් ජොන්සන් පරාජය වුවහොත් ඔහුට පක්ෂ නායකත්වයද, අගමැති ධුරයද අහිමි වේ. ඉන්පසු අලුත් නායකයකු තෝරා ගැනීම සඳහා පියවර ගැනෙනු ඇත. එහිදී එක් අයකුට වඩා ඒ සඳහා ඉදිරිපත් වුවහොත් නැවතත් ඡන්ද විමසීමක් පවත්වා නායකයා තෝරා ගැනේ.

■ සනත් වික්‍රමගේ

15 >>

**පානදුර පිහිටි කර්මාන්තශාලාවක**

පළපුරුදු ලියවන පට්ටල් ක්‍රියාකරුවන් සහ වෑද්දුම්කරුවන් අවශ්‍යව ඇත.
පුහුණුවීම් සඳහා ඇබෑර්තු ඇත.

**විමසන්න: 0777260557**






# මව්බිම

සිලෝන් නිවුස්පේපර්ස් (පෞද්:) සමාගම,
101, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 07.

- **දුරකතන, කර්තෘ මණ්ඩලය** 011-7566511 011-7566512
- **ෆැක්ස්** 011-7566514
- **වෙබ් අඩවිය** www.mawbima.lk
- **ඊ.මේල්** news@mawbima.lk
- **බෙදාහැරීම්** 011-7566583 011-7566584
- **ෆැක්ස්** 011-7566587
- **දැන්වීම්** 011-7566568 011-7566572
- **ෆැක්ස්** 011-7566569


## සුරංගනා කතාවලින් අර්බුද ජය ගන්න බෑ

ශ්‍රී ලංකාවේ අර්බුද කෙළවරක් නැත. ලංකාව ආර්ථික අර්බුදය, ඛනිජ තෙල් අර්බුදය, පොහොර අර්බුදය, විදුලි අර්බුදය, ගෑස් අර්බුදය, විනිමය අර්බුදය ආදී එකී මෙකී නොකීත් අර්බුදවල කෙළ වරක් නැතුව පැටලී අඳුරේ අතපත ගාන රාජ්‍යයකි. එකක් පස්සේ එකක් වශයෙන් එන අර්බුද නිසා රට දවසින් දවස පරිහානියට පත් වන අතර රට කරවන උදවියට කරල පැහේ.

මේ දිනවල රට මුහුණ දෙන බරපතළම අර්බුදය විදුලිය හා ඛනිජ තෙල් අර්බුදයයි. විදුලි ඇමැති කියන්නේ තෙල් දුන්නොත් විදුලිය දෙන බවය. ඛනිජ තෙල් ඇමැති කියන්නේ ඩොලර් දුන්නොත් තෙල් දෙන බවය. ප්‍රවාහනයට ඇති ඩීසල් විදුලියට දුන්නොත් ප්‍රවාහනය ඇනහිටින බවටද තෙල් ඇමැති අනතුරු අඟවයි.

විදුලිය ඉතිරි කර නොගතහොත් සති කිහිපයකින් රට අඳුරට යන බවටද විදුලි ඇමැති අනතුරු අඟවයි. රටේ ජනතාව අල්ලපු අත්තත් පය ගහපු අත්තත් දෙකම නැති වන තැනට පත්ව තිබේ. අර්බුද ගැන ජනතාව කලබල විය යුතු නැති බව පවසන ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අර්බුද ගැන කලට වෙලාවට රජය වගබලා ගන්නා බවද කියයි.

කඩිනම් මහවැලිය දියත් කරමින් හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන 1978 දී ප්‍රකාශ කළේ තවත් වසර 5කින් ශ්‍රී ලංකාව දකුණු ඉන්දියාවටද විදුලි බලය සපයන බවය. නමුත් දැන් සිදුවන්නේ විදුලිය සඳහා ඉන්ධන ලබා ගැනීමට මෙරට දේශපාලනඥයෝ ඉන්දියාවට හිඟමනේ යෑමය.

ශ්‍රී ලංකාවේ 2022 වසරේ විදුලිය අවශ්‍යතාව මෙගවොට් 2900 කි. එම අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීම සඳහා ජල විදුලි බලාගාරවලින් අපේක්ෂිත දායකත්වය මෙගවොට් 1400කි. තෙල්වලින් දුවන තාප බලාගාරවලින් 1200ක්ද ගල් අඟුරු තාප බලාගාරවලින් 900ක්ද ලැබෙන අතර සුළං බලාගාර සහ වෙනත් පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් තවත් 1000ක් අපේක්ෂා කෙරේ. නමුත් මේ කිසිවක් අපේක්ෂා කළ ඉලක්ක සපුරාගත හැකි පරිදි ලැබෙන්නේ නැත.

බලයේ සිටි කිසිදු රජයකට බලශක්ති ප්‍රභවයන් සඳහා නිශ්චිත සැලසුමක් තිබුණේ නැත. ගෙවුණු වසර 40 තුළ බලශක්ති විශේෂඥයන් රජයන්ට ඉදිරිපත් කළ විදුලිය සඳහා වූ පුරෝකථන සපුරන්නට බලයේ සිටි ආණ්ඩු ක්‍රියා කළේද නැත. දැන් රජය සිටින්නේ විදුලිය සහ ඉන්ධන අර්බුදය පිළිබඳව බිත්තියට හේත්තු වූ තැනය.

ආණ්ඩුව ඛනිජ තෙල් ගැනීම සඳහා ඩොලර් සොයමින් සිටී. එහෙත් රටේ මහජන මුදල් වැය කර ගෙන්වන ඉන්ධන අරපරෙස්සම ගැන කිසිදු බලධරයකු කතා කරන්නේ නැත. නාස්තිය ඉහවහා ගොස් තිබේ. විදුලිබල මණ්ඩලය සතු ඇතැම් තාප බලාගාරවල විදුලිය නිෂ්පාදනය ඩීසල් ලීටරයට යුනිට් 2 1/2 කි. එවිට යුනිට් 1ක් රුපියල් 65කි. අලෙවි කරන්නේ රුපියල් 17ටය.

රජයේ මැති ඇමැතිවරු සහ ඔවුන්ගේ ආරක්ෂක අංශ පාවිච්චි කරන ප්‍රාඩෝ, ඩිෆෙන්ඩර්, බෙන්ස්, බී.එම්.ඩබ්ලිව් ආදී සුඛෝපභෝගී වාහනවල ඉන්ධන දහනය ලීටරයකට කිලෝමීටර් 4කට, 5කට වඩා වැඩි වන්නේ නැත. රජය සතු එවැනි වාහන සංඛ්‍යාව අති විශාලය. ඒවා ලංකාව වැනි ආර්ථික අර්බුදයේ කරවටක් එරී සිටින රටකට කිසිසේත්ම ගැළපෙන්නේ නැත.

රජය කළ යුත්තේ ඩොලර් සොයා හිඟමනේ යෑමට අමතරව රට තුළ ඉන්ධන පරිභෝජනය අවම කර ගැනීම සඳහා සැලසුමක් සකස් කිරීමය. එය ආර්ථිකයට බරක් නොවන ආකාරයට සකස් කළ යුතුය.

ඉන්ධන පරිභෝජනයේදී ප්‍රමුඛත්වය දිය යුත්තේ රටට විදේශ විනිමය ගෙනෙන අපනයන කර්මාන්ත, සංචාරක ව්‍යාපාරය, වැවිලි ආර්ථිකයට අදාළ ආයතන සහ විදේශ විනිමය උත්පාදනය කරන අනිකුත් අංශ සඳහාය. රාජ්‍ය අංශයේ ඉන්ධන නාස්තිය තරම පෙන්වන හොඳම උදාහරණයද පසුගියදා කුරුණෑගල පැවැති මධ්‍යම අධිවේගී මාර්ගය විවෘත කිරීමේ උත්සවයට කොළඹ සිට ගිය රාජ්‍ය අංශයේ මහා රිය පෙරහරය.

ලංකාවේ රජයේ ආයතන විශාල ප්‍රමාණයක අවම වශයෙන් 50% ක්වත් ඔන්ලයින් සේවාවේ යෙදවීමෙන් විදුලිය නාස්තිය හා ප්‍රවාහන ඉන්ධන නාස්තිය පාලනය කරගත හැකිය. ඒ කිසිදු සැලසුමකින් තොරව "ලයිට් කපනවා, ලයිට් කපනවා" යැයි කෑගැසීම පිස්සුවකි.

කවුරු මොනවා කිව්වත් පොහොර අර්බුදයට පාදක වූයේ, රසායනික පොහොර සඳහා අවුරුද්දකදී වැයවන ඇ. ඩො. මිලියන 400 ඉතිරි කර ගැනීමේ ප්‍රශ්නයයි. එහෙත් ඛනිජ තෙල් ආනයනය සඳහා ආණ්ඩුව එක් මසකදී වැය කරන මුදල ඇමෙරිකන් ඩොලර් මිලියන 400කි. ආණ්ඩුව ඒ ගැන කිසිවක් නොකියයි.

වත්මන් අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ගොඩ පෙරකදෝරුවන්ගෙන් උපදෙස් පැතීමෙන් තවදුරටත් ඵලක් නැත. ප්‍රශ්නය බලශක්ති විශේෂඥයන්ට භාර දිය යුතුය. බලශක්ති අර්බුදයෙන් ගොඩ ඒම සඳහා කෙටි කාලීන සහ දීර්ඝ කාලීන සැලැස්මක් සම්පාදනය කිරීම ඔවුන්ට පවරා රට ඒ ඔස්සේ ඉදිරියට ගෙන යනවා හැර වෙනත් විකල්පයක් නැත. සුරංගනා කතාවලින් අර්බුද ජයගත නොහැක.



# තීරණාත්මක වන්නේ ඉදිරි දෙසතිය පමණක්ද?

මව්බිම අයිති වර්තමානයට හා අනාගතයට බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පාර්ලිමේන්තු නව සැසිවාරය ආරම්භ කරමින් ප්‍රකාශ කළේය. අනාගතය තීරණය වන්නේ අද ගන්නා තීරණ අනුව ඔහු ඉදිරිපත් කළ වැදගත් කාරණයකි. සමහර තීරණ අත්‍යවශ්‍යයෙන්ම ගත යුතු ජනප්‍රිය තීරණ නොවන බව මතක් කරන්නටද ජනාධිපතිවරයා මෙහිදී අමතක නොකළේය.

රට සංවර්ධනය කරගැනීම අපගේ ඉලක්කයකි. අප පසුවන ස්ථානය ගැන අපට ප්‍රසන්නභාවයක් නැත. අපගේ දරුවන්ට අනාගතයක් ගොඩනඟාගන්නට අපට වුවමනා කර තිබේ. ජනතාව ඉල්ලන්නේ සහන නොවේ, සාධාරණ අවස්ථා බව දේශපාලනඥයෝ මතක තබා ගත යුතු කරුණකි.

### ඉදිරි කාලය තීරණාත්මකද යන ගැටලුව

ශ්‍රී ලංකාවේ සංවර්ධන අභිලාෂයන් අභිමුවෙහි ඉදිරි සති කිහිපය තීරණාත්මකද යන ප්‍රශ්නය පැනනැඟී ඇත. තීරණාත්මක තීන්දු ගත යුතුව තිබුණ කාලය අවසන්ය. අප අවස්ථා හිමි කරගෙන තිබේ. සැනසිලිදායක තීර්ථයක් කරා පා වී නතර වන තෙක් බලාසිටින්නට රටට සිදුවී ඇත. ධෛර්යයක් ඇති අයවලුන් ලෝකයේ කොතැනකට හෝ පලාගොස් අලුතින් ජීවිතය අරඹන තීරණයකය. එක කාලයක හටගෙන තිබුණ ගැටුම්වලින් දක්ෂතම තරුණ පිරිස අහිමි කරගත් ශ්‍රී ලංකාව දැන් සාමය ඉදිරියේ මෙරට මානව සම්පත අහිමි වන තැනකය. ශ්‍රී ලංකාව වයස්ගත වන රටකි. ජනගහනයෙන් වැඩි කොටස අතරින් වැඩි කොටසක් දරුවන් හා විශ්‍රාමිකයන් වන දිනය නුදුරුය. ශ්‍රම බළකාය සීමා වන බව පෙනේ. ආණ්ඩුවේ උත්තරය රජයේ විශ්‍රාම යන වයස දිගු කිරීම බව පෙනේ. අලුත් පැතිවලින් ආර්ථිකයේ හැඩතල වෙනස් කිරීම අවශ්‍යය. නිෂ්පාදනය වැඩි කරන පියවර අවශ්‍යය.

විරෝධතා, වර්ජන, අරගලවලින් රටට අද ලැබෙන සුගතිය කුමක්ද? අද වැඩ කළහොත් හෙට දීප්තිමත් වනු ඇත. ආණ්ඩුව කළ යුතු වැඩ වර්ජනවලට හිස නමාගෙන සිටීම නොවේ. ප්‍රජාතන්ත්‍රවාදයේ සීමා මායිම් සලකුණු කිරීමය. ආණ්ඩුව බිත්තියට හේත්තු කරන අරමුණ ඇතිව දේශපාලන පක්ෂ ගෙන යන අරගල අවසානයේ දී අනතුරකට පත් කරන්නේ පොදු ජනතාවගේ පැවැත්ම හැර අනෙකක් නොවේ. ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පසුබිම ඉතිහාසයේ නොතිබුණ ප්‍රපාතයකය. ආදායම පිරිහී ඇති අතර වියදම බරපතළ ලෙස නැඟ තිබේ. රාජ්‍ය ආදායම සීමිතය. විදේශ විනිමය හිඟ බව මූල්‍ය වාර්තා සනාථ කරයි. අත්‍යවශ්‍ය ආහාර, ඖෂධ සහ ඉන්ධන යනාදිය ආනයනයට පවා වත්කමක් නැති කාලයකි. මෙම පසුබිම ශ්‍රී ලංකාවේ තීරණාත්මකභාවය ගැන විවාදයක් තිබිය යුතුද?

### දුප්පතුන් පීඩාවට පත් කරන ක්‍රමයක්

ශ්‍රී ලංකාවේ ආර්ථිකය අන්තිම තැනක බව ප්‍රකාශ වෙමින් තිබේ. එහෙත් කොටස් වෙළෙඳපොළ වර්ධනයකය. සමාගම්වල කොටස්වල ඉල්ලුම වර්ධනය වී ඇති බව පෙනේ. ඉඩම් හා දේපොළ මිල පහත වැටී නැත. ධනවත් පිරිස් කොටස් වෙළෙඳාමේද ඉඩම් මිල දී ගැනීමේද නිරතය. සංචාරක හෝටල්වලට දේශීය පිරිස ප්‍රතික්ෂේප නොකරන ලෙස අවවාද කරන්නේ ඇයි? දේශීය සංචරණය වැඩි වී ඇත. වරාය නගරය, සත්ත්වෝද්‍යානය නරඹන්නට එන පිරිස මැදි ආදායම් ජන කොටස ගැන සාක්ෂියකි. විදේශ සංචාරකයෝ පවා ලංකාවට පැමිණෙන ප්‍රමාණය වර්ධනයකය. වාහන මිල ගැන සලකන්න. රත්රන් වෙළෙඳාම අඩු වී නැත. බැංකුවල තැන්පත් අඩු වී නැති බව පසුගිය වසරේ අවසාන කාර්තුවේ මූල්‍ය වාර්තා දක්වයි. රට තුළ ඇති ඩොලර් ඉල්ලුම ගැනද අවධානයට ගත යුතුය. දරුවන් වෙනත් රටවලට යවා ඇති පිරිස් අධික මිලකට හෝ ඩොලර් මිලදී ගෙන අවශ්‍යතා ආවරණය කරගන්නට තැත් දරන බව සඳහන් කළ යුතුය.

ගැටලුව කොතැනකද? සමාජයේ පහළ ආදායම් ලබන ස්තරය දරුණු පීඩාවකට මුහුණ දී සිටිති. එදිනෙදා ආදායමෙන් ජීවත් වූ පිරිස අසරණය. සුළු ව්‍යවසායකයන්, සුළු සේවකයන්ගේ ආදායම පිරිහී ඇති බව පෙනේ. උද්ධමනය වැඩි වී ඇත. භාණ්ඩ හිඟය, ගෑස්, කිරිපිටි ඇතුළු දේ ගැන ප්‍රශ්න තිබේ. ඒවායේ මිල මෙම පහළ ස්තරයෙහි අපේක්ෂා විනාශ කර ඇත. රට තුළ ඇති විරෝධතා සහ වැඩ වර්ජන එදිනෙදා අවශ්‍යතා සඳහා පාරට බහින ජන කොටස අතරමං කර තිබේ. මෙම කොටස විරුද්ධ දේශපාලන කණ්ඩායම් ඩැහැ ගෙන ඇත. රටට අවශ්‍ය මෙම කණ්ඩායම නඟාසිටුවන පිළිවෙළකි. පොහොසත් පිරිස වඩා සුරක්ෂිත තැනකට තල්ලු කර ඇති අතර දුප්පතුන් තවත් දුප්පත් කර ඇති බව පෙනේ. එය මෑත කාලීන ආර්ථික පරිහානිය ඇති කරන ලද දරුණු ඛේදවාචකය බව සඳහන් කළ යුතුය. ආර්ථික පර්යේෂකයෝ මෙම විභවය ගැන අධ්‍යයනය කර තිබේ.

### වෙනත් තැනෙකින් ලැබෙන තෙක් බලාසිටීම

පහළ හා පහළ මධ්‍යම පන්තියේ ආර්ථිකය නඟා සිටුවන්නට ආණ්ඩුවට ඇති ඕනෑකම සාක්ෂාත් කරගන්නේ කෙසේද? රටට ධනය බැහැරින් එන තෙක් බලා සිටීම අරමුණ බව පෙනේ. තමන්ගේ ව්‍යුහය වෙනස් නොකර බැහැරින් විනිමය එනතෙක් අපේක්ෂා සහගතව සිටීම සාර්ථක උපායයක් නොවේ. සංචාරක කර්මාන්තය දියුණු වනු ඇතැයි ආණ්ඩුවේ අභිප්‍රාය වී ඇත. දැනට පැමිණෙන ලක්ෂ ගණන මිලියනය දක්වා නංවා ගත හැකිවුවහොත් රටට ඇමෙරිකානු ඩොලර් බිලියන හතරක පමණ ශුද්ධ විනිමය ආදායමක් අපේක්ෂා කළ හැකිය. එය දැනට පවතින පීඩාවලින් ඉක්මනින් ගැලවෙන එකම ක්‍රමය බව සඳහන් කළ හැකිය. විනිමය සංචිත තර වන අතර සංචාරකයන් රට තුළ කරන වියදම් දේශීය ව්‍යවසාය ශක්තිමත් කරනු ඇත. එන්නත්කරණය වේගවත් කර රට විවෘත කිරීම සංචාරකයන් කැඳවීම බව පැහැදිලිය. 2022 වසරේ ලෝකයේ සංචාරයෙහි නිරත වන පිරිස අවම වශයෙන් බිලියන 17 ඉක්මවනු ඇතැයි සැලකේ. එය 2019දී ලෝක සංචරණ වාර්තා අභිභවයි. අවුරුදු දෙකක් පමණ නිස්කාන්සුවේ සිටි පිරිස් යුහුසුලු වෙන්නට ප්‍රයත්න දරනු ඇති බව සැලකේ. ඩුබායි, ඊජිප්තුව, මාලදිවයින, ඉන්දියාව යනාදී රටවල් සංචාරකයන් කැඳවන්නට සූදානම්ය.

අනෙක් අතට ඉන්දියාවෙන් හා චීනයෙන් ලැබෙන පිටිවහල කෙරෙහි බලාපොරොත්තු තබා තිබේ. ඉන්දියාව දැනට අංශ හතරකින් යුතු සැලැස්මක් යටතේ ආධාර පැකේජයක් ප්‍රකාශයට පත්කර ඇත. ආධාර හා සමාන්තරව ආයෝජනවලට අවස්ථාව පාදා ගැනීම මෙරට ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ වගකීමකි. ආහාර මිල දී ගැනීමට, ඉන්ධන සඳහා ලැබුණ පැකේජයට ආපසු ගෙවිය යුතුය. ඉන්ධන පැකේජය ක්‍රෙඩිට් කාඩ් පතක් හා සමාන බව පෙනේ. මිලියන 500ක සංචිතය භාවිත කළ හැකිය. එයට සියයට දෙකක පොලියක් අය කෙරේ. එම පොලිය සමඟ කලින් භාවිත කළ ප්‍රමාණය ගෙවූ පසු නැවතත් ඉන්ධන මිල දී ගත හැකිය.

චීනයද යුවාන් බිලියන 15ක මුදලක් ණය වශයෙන් ලබා දී ඇත. සහල් තොගයක්ද පරිත්‍යාග කර තිබේ. විනිමය හිඟයෙන් සහ අත්‍යවශ්‍ය දේ ගෙන්වීමේ අපහසුවකින් පවා පෙළෙන ශ්‍රී ලංකාවට එය ඉතා ප්‍රයෝජනවත්ය. එහෙත් මෙම ආධාර සමඟ ආයෝජන අවස්ථා සඳහා මඟපාදා ගැනීම හැර අනෙක් පිළිවෙළක් නැත. විදේශ වත්කම් සීමාව පමණක් නොව ශ්‍රේණිගත කිරීමේ සමාගම් ජාත්‍යන්තර ණය අවදානමක් ගැනද අනතුරු අඟවා තිබේ.

### අනාගතය ගැන විශ්වාසයකින් තීරණ


වසරේ පළමු මාසයේ ගෙවිය යුතුව තිබුණ ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක ජාත්‍යන්තරය බැඳුම්කරය ගෙවා ඇත. එහෙත් තවත් ඇමෙරිකානු ඩොලර් මිලියන 6500ක ණය සහ පොලිය මෙම වසර තුළ ගෙවන්නට අවශ්‍යය. ජනාධිපතිවරයා බලශක්ති අංශයේ ප්‍රධානීන් සමඟ කළ සාකච්ඡාවේ දී 2022 වසර තුළ ඉන්ධන මිල දී ගැනීමට අවශ්‍ය ඇමෙරිකානු ඩොලර් බිලියන හතරක මුදල ගැන සඳහන් කර තිබේ. මෙම ඉලක්කම්වලින් කියැවෙන අනතුර අප අවබෝධ කරගත යුතුය. ණය ගෙවන අතරවාරයේ රටට අවශ්‍යම දේ ගෙන්වා ගැනීම කළ නොහැකිවුවහොත් පත්වන අසරණභාවය තීරණාත්මකය. වසර දෙකක් කොවිඩ් වසංගත භීතිය මැත අන්තිම මොහොත දක්වා ඉවසාගෙන සිටි පහළ මධ්‍යම පෙළැන්තිය පුපුරනු නිසැකය. මුලින් සඳහන් කරන ලද පරිදි මෙරට ඉහළ සමාජ ස්තරයේ පැවැත්ම ඔවුන් ජීවත්වන ආකාරය වෛරය අවුළුවන හේතුවකි. ධනවත් සමාජයට ඉඩම් දේපොළ හා කොටස් වෙළෙඳපොළ තිබිය දී සාමාන්‍ය ජනතාවගේ නිවෙසේ ගෑස් පුපුරායන තරමට පත්ව තිබීම අනතුරුදායකය.

පසුගිය කාලය තුළ ආණ්ඩුව ආර්ථික වේගය අඩු කරන තීරණ ගණනාවක පිහිටියේය. ආනයන සීමා කරන ලද අතර පොලී අනුපාත අඩු කළේය. සෘණ අගයකට ගිය ආර්ථිකය නැවත සියයට පහ ඉක්මවන තැනකට හරවන ප්‍රතිසංස්කරණ ඉතාම අවශ්‍යය. එවැනි වෙනසකින් සමාජයට එන ලිහිල, දැනට පවතින පීඩනය අඩු කරනු ඇත. රටට ලබා ගත හැකි අඩුම පොලිය සහිත අවස්ථා මඟහැර, වැඩිම නරකක් ඇති කරන සංවර්ධන බැඳුම්කර එයට නිසි මාවත නොවේ. පසුගිය සතියේ ආණ්ඩුව සිංහල පුවත්පත්වල පවා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක් දක්වා ණයක් ඉල්ලා සිටියේය. දුප්පත් ජනතාව කියවන සිංහල පත්‍රවල එම දැන්වීම පළ කිරීම පවා ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අනුවණ බව දක්වයි. අදට අවශ්‍ය අඩුම පොලියකට තාවකාලික සංචිතයක් සම්පාදනය කරගැනීමකි.

### ජාත්‍යන්තර ආයතනික සහාය නොතකන ගමනක්

ජාත්‍යන්තර මිතුරන් හා සංවර්ධන මූල්‍ය ආයතන එහිලා වැදගත්ය. ජපානය, ඇමෙරිකාව හා යුරෝපා රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති ගැන අධ්‍යයනය කරති. ආර්ථිකය හසුරුවන අවිධිමත් ආකාරය ගැන ඉවසිල්ලකින් සිටිති. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතනයක නිශ්චිත රාමුවක් අනුව වැඩපිළිවෙළක් ඉදිරිපත් කළහොත් ආධාර කළ හැකි බව ජපානය කෙළින්ම ප්‍රකාශ කර තිබේ. ජපානය කලක් ශ්‍රී ලංකාවේ ආධාර රටවල ඉහළම තැන සිටි බව අමතක කළ යුතු නැත. සියයට 1.5ක සුළු පොලියකට ඇමෙරිකානු ඩොලර් බිලියන දෙක ඉක්මවන සංචිතයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගැනීමට අපට අවස්ථාවක් තිබේ. එවැනි යෝජනාවකට එකඟවුවහොත් එය මූල්‍ය අරමුදලෙන් ණයක් ගන්නා දහ හත්වැනි අවස්ථාව වශයෙන් ඉතිහාසයට එකතුවනු ඇත. එහෙත් එවැනි ලිහිල් සහ හොඳ මූල්‍ය උපදේශ පනවන ආයතනයකට නොයන ශ්‍රී ලංකා ආණ්ඩුව ණය ගෙවීම සඳහා ජාත්‍යන්තර වාණිජ මාධ්‍යයෙන් සියයට 6-7 අතර වාර්ෂික පොලියකට ණය ගනිමින් සිටී. සිංහල පුවත්පත්වල පළ කරන ලද දැන්වීම ප්‍රකාරව ණය ගන්නේද එම පොලියටය. මෙම තීරණ අනාගතය ගැන විශ්වාසයකින් ගන්නා ඒවාදැයි අපට පැහැදිලි නැත.

නිසි මූල්‍ය උපදෙස් අනුව ආදායම හා සමාන වියදම සහිත තැනකට රට පත්කරගත යුතුය. දේශීය හෝ විදේශීය විද්වත් උපදෙස් අනුගමනය කිරීම වැදගත්ය. දේශපාලන ප්‍රලාපවලින් රට මෙතෙක් දුර කැඳවාගෙන පැමිණ ඇත. පවතින ආණ්ඩුව පමණක් නොවේ. නිදහස ලැබුණ දිනයේ සිට මෙරට පැවැති සියලු ආණ්ඩු මෙම නරක ව්‍යුහයේ කොටස්කරුවෝය. යමක් නිෂ්පාදනය කර පිටරටකට විකුණා එයින් ආදායමක් ගෙන ජීවත්වීම ගැන පාඩම අනුගමනය කර නැත. ශ්‍රී ලංකාවේ අපනයන පහළ වැටී තිබේ. රට විරුවන් එවන විනිමය ජාතික විනිමය උත්පාදනයේ ඉහළම තැනට පත්ව ඇත. එම වාක්‍ය පමණක් ශ්‍රී ලංකාවේ ආර්ථික සිද්ධාන්ත ගැන හිතන්නට ප්‍රමාණවත්ය.




**ශාමින්ද වත්තේගෙදර**

C M Y K

## සීනි-ප්‍රෙෂර් ගැන මීට පස්සෙ හොයන්නේ නෑ

## ආබාධිත අය ගැනත් සලකා බලනවා

## පෙනීම දුර්වල අයටත් ලිහිලක් දෙනවා

## ගොළු-බිහිරි අයටත් වෙනම වැඩ පිළිවෙළක්



ජාතික ප්‍රවාහන වෛද්‍ය අධිකාරියේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී වෛද්‍ය ශවින්ද්‍ර ගමගේ

# අඩුපාඩු ඇති අය දුක්වෙන්න එපා: 'ඩ්‍රයිවින් ලයිෂන්' දෙන අලුත් නීති ඇවිත්..!

මාර්ග නීති රෙගුලාසිවලට අනුව රියැදුරු අසුනේ වාඩිවී සුක්කානම කරකවන ඕනෑම තරාතිරමක පුද්ගලයකු රියැදුරෙකි. මිල මුදල්, බලපුළුවන්කාරකම් කොතෙක් තිබුණත් ඒ න්‍යාය එසේය.

මේ නිසාම ඊට අදාළ බලපත්‍රය ලබාදීමේදී ඕනෑම රටක අනුගමනය කරන්නේ පොදු නීති රීති මාලාවන්ය. ඊට සියල්ලෝම අවනත විය යුතුය.

එහෙත් කාලයක් පුරාවට අපේ රටේ මේ පිළිබඳව ඇති අපටම ආවේණික වූ නීති රීති කිහිපයක් නිසා ඇතැමුන්ට ඒ අයිතිවාසිකම ලබා ගැනීමට යෑමේදී ගැටලු රාශියක් ඇති බව පෙනෙන්නට තිබිණි. උදාහරණයක් ලෙස වාහන පැදවිය හැකි යම් යම් දුබලතා තත්ත්වයන් තුළ සිටින පුද්ගලයන්ට වාහන බලපත්‍රයක් ලබා ගැනීමට යෑමේදී ඇතිවන ගැටලු සහගත බව මෙහිදී පෙන්වා දිය හැකිය. එහෙත් ලෝකයේ බොහෝ රටවල මේ අයිතිවාසිකම ඔවුනට ලබාදී ඇත්තේ අලුත් තාක්‍ෂණය උපයෝගී කොට ගෙනය.

"ඔබ කියන දේ හරි. දැන් අපේ රටෙත් එවැනි ආබාධිත අයට වාහන පැදවීමේ බලපත්‍රය ලබාදීමට කටයුතු කරනවා. මේ වෙද්දී පාද දෙකම නැති අයත් රියැදුරු බලපත්‍ර අරන් තිබෙනවා."

ඔවුන් පදවන ඒ වාහනවලට ආබාධිත තත්ත්වය ගැටලුවක් වී නැහැ. රිය ධාවනය අතින් පාලනය කරගත හැකියි. ඒක තමයි ලෝකයේ ඇති අලුත් තාක්‍ෂණය යටතේ නිපදවී ඇති වාහනවල විදිහ.

මෙසේ කියන්නේ ජාතික ප්‍රවාහන වෛද්‍ය අධිකාරියේ සභාපතිවරයා මෙන්ම ප්‍රධාන විධායක නිලධාරී හැටියට කටයුතු කරන වෛද්‍ය ශවින්ද්‍ර ගමගේ මහතාය.

ඔහු පවසන ආකාරයට දැන් රියැදුරු බලපත්‍ර ලබා ගැනීම පහසුය. ඒ පහසුකම ලැබ ඇත්තේ ආයතනය තුළ සකස් වී ඇති නව ක්‍රමවේදවල ඇති ක්‍රමානුකූල බව නිසාය. "ඇත්තටම මේ ක්‍රමවේද මේ විධියට හැදුනේ ජනාධිපතිතුමාගේ මැදිහත්වීම නිසයි. එතුමා මට පහදා දුන්නා නව රියැදුරු බලපත්‍ර ලබාදෙන විට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවාද කියලා. ඒ අනුව අපි දැන් අලුත් නීතිරීති රැසක් මේ වෙනුවෙන් හඳුන්වා දී තිබෙනවා.

වෛද්‍ය ශවින්ද්‍ර ගමගේ මහතා එසේත් නැත්නම් ප්‍රවාහන වෛද්‍ය අධිකාරියේ ප්‍රධානියා පවසන ආකාරයට දැන් දියවැඩියාව හා අධික රුධිර පීඩනය ඇතුළු නිදන්ගත රෝගවලින් පීඩා විඳින අයවලුන්ටද වෙනදා මෙන් රියැදුරු බලපත්‍ර ලබා ගැනීමේදී මතුවන ගැටලු සංකීර්ණ වී නැත.

මීට පෙර මේ වගේ ලෙඩ රෝග තිබෙන අය අදාළ පරීක්‍ෂණයට යොමු වෙන්න එන්නේ හොඳ පෙර සූදානමකින්. ඔවුන් ඖෂධවලින් ඒ ලෙඩ රෝග පාලනය කරගෙන ඇවිත් තමයි අපි කරන වෛද්‍ය පරීක්‍ෂණයට පෙනී සිටින්නේ. ඉතින් පෙතිවලින් සීනි ප්‍රමාණය, අධික රුධිර පීඩනය අඩු කරගෙන ඇවිත් රියැදුරු බලපත්‍රයට අවශ්‍ය පරීක්‍ෂණය සමත් වෙනවා. ඊළඟ දවසේ ඉඳලා ආපසු පරණ පුරුදු විධියටම ඔවුන් මහ පාරේදී ලෙඩ්ඩු. ඇත්ත තත්ත්වය ඕකයි.

දැන් අපි ඒ නිසාම මෙහෙම ලෙඩ රෝග තිබෙන අයව ගෙන්වලා මුලින්ම කරන්නේ ඔවුන්ට ඔවුන්ගේ තත්ත්වය පහදා දෙන එකයි. ඊළඟට රියැදුරු මහත්තුරු විධියට මහා මාර්ගයේ රිය ධාවනය කරන විට ඇතිවන ගැටලු සහගත තත්ත්වය පහදාදීලා ඔවුන්ට අවශ්‍ය නම් පරීක්‍ෂණය සමත් කරවනවා. ජීවන ගමන කෙටි කරගන්නේ නැතිව තමන් තුළ ඇති නිදන්ගත රෝග පාලනය කර ගැනීමේ හැකියාවත් කියා දෙනවා.

ඒ නිසා දැන් අපි කිසිම කෙනකුට වාහන බලපත්‍ර නොදී ඉන්න කටයුතු කරන්නේ නැහැ. නමුත් ඔවුන් පුරවැසියන් හැටියට රටටත් සමාජයටත් හානි නොවන විදියට ඒ තීරණ තීන්දු ඔවුන් විසින්ම ලබාගත යුතු තිබෙනවා.

සාමාන්‍යයෙන් රියැදුරු බලපත්‍ර ලබා ගැනීමට යෑමේදී අපේක්ෂිත පුද්ගලයන් මුහුණ දෙන ඊළඟ ගැටලුව වන්නේ දෙනෙත්වල ඇති පෙනීමේ දුබලතාවයි. මෙවැනි අයටද රියැදුරු බලපත්‍ර ලබා ගැනීමට දැන් පහසුය. ඒ පහසුකම ගැනත් සභාපතිවරයා කතා කළේ මේ අයුරින්ය.

අපේ රටේ හුඟක් දෙනා ඇස් දෙක හරි හැටි නොපෙනෙන කාලවලදී රියැදුරු බලපත්‍රය ලබා ගන්නේ විවිධ අයථා ක්‍රමවලින්. ඔවුන් මෙතැනට ඇවිත් මුදල් දීලා ටෙස්ට් එකේදී පෙන්වන ඉලක්කම් හා ඉංග්‍රීසි අකුරු ගැන කලින් දැනුවත් වෙනවා. ඉතින් අපේ කෙනා මුලින්ම ලයිට් එක පත්තු කරලා පෙන්වන අකුරේ ඉලක්කමේ ඉඳලම ඔවුන් ගිරව් වගේ කියලා පරීක්‍ෂණය සමත් වී යනවා.

වෛද්‍ය ශවින්ද්‍ර ගමගේ සභාපතිවරයා මේ පරීක්‍ෂණය තමන් අතට ගත්තේය. ඒ අනුව ඔහු ඒ පරීක්‍ෂණය දැන් සිදු කරන්නෙත් අදාළ පුද්ගලයාගේ පෙනීමේ දුබලතාව හොඳින් හඳුනාගත හැකි ආකාරයටය.

මම දැන් මට ඕන විධියට ලයිට් එක පත්තු කරලා ඒ පුද්ගලයාගේ පෙනීමේ හැකියාව හඳුනා ගන්නවා.

ඇත්තටම දැන් එහෙම අයට රියැදුරු බලපත්‍රය ලබා දෙන්නේ සීමා සහිතවයි.

උදාහරණයක් විදිහට කිව්වොත් ඇස් පෙනීමේ අඩු අයට බයිසිකල් හා ත්‍රීවීලර් බලපත්‍රය ලබාදෙන්නේම නැහැ. නමුත් බොනට් එකක් සහිත කාර් එළවන්න රියැදුරු බලපත්‍රය ලබාදෙනවා. මොකද කෙනකුගේ වම් ඇස හරි හැටි පෙනෙන්නේ නැහැ කියමු. එතකොට කොහොමද හතරමං හන්දියකදි හරි හැටි රිය ධාවනය කරන්නේ. ඒ ඇස ටිකක් වහලා බලන්න. පැත්තක්ම පෙනෙන්නේ නැහැ.

"ඉතින් එහෙම අයට බොනට් සහිත වාහන එළවන විට කණ්ණාඩියක් සවි කරලා ඒ රිය ධාවනය කළ හැකියි. අපි ඒ විදිහට බලපත්‍රය ලබාදෙන්න කටයුතු කරනවා."

ඇස් පෙනීමේ දුබලතාව ඇති අයට රියැදුරු බලපත්‍රය ලබාගැනීමේදී මේ ගැටලුව මතුවුවත් නව ක්‍රමවේදය අනුව ගොළු හා බිහිරි පුද්ගලයන්ට රියැදුරු බලපත්‍ර ලබාදීම සම්බන්ධව රජය අනුගමනය කරන්නේ මානව හිතවාදී ප්‍රතිපත්තියක් බව සභාපතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය. මේ ඒ පිළිබඳව ඇති නව නීති තත්ත්වයයි.

"අපි පසුගිය නොවැම්බර් මාසේ ඉඳලා ඒ සම්බන්ධවත් අවධානය යොමු කළා. මේ අනුව මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පිරිසකට මේ රියැදුරු බලපත්‍රය ලබාදෙන්න අපි ක්‍රමවේදයක් සකස් කළා.

අපි මුලින්ම මේ පිරිස ගෙන්වලා ඊ.එන්.ටී. පරීක්ෂණයක් සිදුකළා. ඊළඟට වාහනයක් ධාවනය කිරීමේදී ඊට අදාළ තත්ත්වය ඔවුන් තුළ ඇත්දැයි නිරීක්ෂණය කළා.

ඇත්තටම කිව්වොත් අපි හුඟාක් වෙලාවට දකිනවා මෙහෙම ගොළු, බිහිරි අය ගත්තත් ඔවුන්ගෙන් සමහර උදවියට යාන්නම් හරි ඇහෙනවා. ඒ වගේම කතා කරන්න බැරි අයට කන හොඳින් ඇහෙනවා. තවත් අයට හොඳින් කතා කරන්න පුළුවන් නමුත් කන ඇහෙන්නේ නැහැ.

ඉතින් දැන් අපි හිතාගෙන ඉන්නවා මේ අයට හොඳ පුහුණුවක් ලබාදීලා මහ පාරේ වාහන පදවන විට ඔවුන් විශේෂයෙන්ම අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව දැනුවත් කරලා රියැදුරු බලපත්‍රය ලබාදෙන්න."


■ සමන් ප්‍රියංකර නම්මුනිගේ

13>>






# ආණ්ඩුව බේරගන්න වලිකන ශ්‍රීලනිප ජ්‍යෙෂ්ඨයා කවුද?




**පසුගිය සතියේ රටේ දේශපාලන ක්ෂේත්‍රයේ වැදගත් සිදුවීම් දෙකක් විය. එකක් ඉකුත් 18 වැනිදා පාර්ලිමේන්තු සැසිවාරය විවෘත කරමින් ජනාධිපති ගෝඨාභය ඔහුගේ ඉදිරි වසර තුනට අදාළව ප්‍රතිපත්ති ප්‍රකාශය පාර්ලිමේන්තුව හමුවේ තැබීමයි. අනෙක් වැදගත් සිද්ධිය වූයේ ජනාධිපති ලේකම් මෙන්ම අග්‍රාමාත්‍ය ලේකම් ජනාධිපතිගෙන් පත්වීම් ලිපි භාරගෙන නව තනතුරුවල වැඩ භාර ගැනීමයි.**

## ජනපති - අගමැති ලේකම්වරු එකම දවසේ පත්වෙති

ජනාධිපති ලේකම් හා අගමැති ලේකම් එකම දින [illegible]

## වෙල්ගම ටී පාටියේ

[illegible]

... අධ්‍යාපනය පැවැති බණ්ඩාරනායක සැමරුමටද සහභාගි වූයේ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා සමඟයි. චන්ද්‍රිකාද මේ දිනවල ශ්‍රී.ල.නි.ප. විකල්ප දේශපාලන පක්ෂයක් බිහිකිරීමේ කටයුත්තේ තිරයෙන් පිටුපස සිටිමින් යම් කාර්යභාරයක් ඉටු කරමින් සිටී. එවැනි තත්ත්වයක් යටතේ සුසිල් චන්ද්‍රිකාගේ ප්‍රධානත්වයෙන් පැවැති බණ්ඩාරනායක සමරුවට සහභාගි වූයේ කිසියම් අනාගත දේශපාලන අරමුණක් ඇතිව දැයි දන්නේ නැත.

## අගමැති ප්‍රසන්න රණතුංගව සොයයි

කොළඹ - නුවර මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා වූ කොටස ඉකුත් සෙනසුරාදා ජනතා අයිතියට පත්වූයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ හා අගමැති මහින්ද රාජපක්ෂගේ ප්‍රධානත්වයෙනි.

මීරිගම සංවිධායක කෝකිලා හර්ෂණී ගුණවර්ධන මන්ත්‍රීවරිය සමඟ එක්ව මෙම උත්සවය සංවිධානය කිරීමේ වගකීම පැවරී තිබුණේ ගම්පහ දිස්ත්‍රික් නායකත්වය උසුලන ප්‍රසන්න රණතුංග ඇමැතිවරයාටයි. මේ නිසා ඔහු තරමක් කාර්යබහුල විය.

හරියටම සවස 4 වනවිට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මීරිගම අධිවේගී පිවිසුමට පැමිණියේය. ඒ සමඟම අගමැති මහින්ද රාජපක්ෂ, නාමල් රාජපක්ෂත් එහි පැමිණියහ. ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇතුළු තවත් මහජන නියෝජිතයන් පිරිසක් ඒ වනවිටත් ජනාධිපතිවරයා සහ අගමැතිවරයා බලාපොරොත්තුවෙන් එහි රැඳී සිටියහ.

අධිවේගී පිවිසුමේ සමරු ඵලකය නිරාවරණය වූයේ අගමැතිවරයාගේ සුරතිනි.

මේ සෑම අවස්ථාවකම අගමැතිවරයා ආසන්නයේම රැඳී සිටියේ ප්‍රසන්න රණතුංගයි.

ජනාධිපතිවරයාත් අගමැතිවරයාත් එක්ව පීත්ත පටිය කපා මාර්ගය ජනතාවට විවෘත කිරීමෙන් අනතුරුව පිරිස අධිවේගී මාර්ගය ඔස්සේම කුරුණෑගල සංවිධානය කර තිබූ උත්සවය සඳහා සහභාගි වීමට පිටත් වූහ.

නාමල් ජනාධිපතිවරයා නැඟි වාහනයේ රියැදුරු විය. ජොන්ස්ටන් අගමැතිවරයා නැඟි වාහනයේ රියැදුරු විය.

නාමල් වාහනයට නැඟීමට යන අතරේ "අයියේ, එන්න අපිත් එක්ක යමු" යි ප්‍රසන්න රණතුංග ඇමැතිවරයාට කීවේය.

"ඔව්.. ඔව්.. ප්‍රසන්න අපිත් එක්ක යමු" ජනාධිපතිවරයා ද කීවේය.

ප්‍රසන්න ඇමැතිවරයා ජනාධිපතිවරයාගේ වාහනයේ පිටුපස අසුනට ගොඩවිය.

අධිවේගී පිවිසුමේදී නියමිත මුදල් ගෙවූ වාහන කුරුණෑගල දක්වා ගමන් ඇරඹීය.

වාහන ගමන් ඇරඹීමත් සමඟ අගමැතිවරයා "කෝ අපේ ප්‍රසන්න" යි ජොන්ස්ටන්ගෙන් විමසුවේ ආපසු හැරී පිවිසුම දෙස බලන අතරේයි.

"ප්‍රසන්න ජනාධිපතිතුමාගේ වාහනයට නැග්ගා."

"ආ.. කමක් නැහැ. කමක් නැහැ. මං බැලුවේ කෝ කියලා" අගමැතිවරයා කීවේය.

ඒ සමඟම ආරක්ෂක රථ පසු කරමින් අගමැතිවරයා ගමන් ගත් වාහනය වේගයෙන් ඉදිරියට ගෙන ගිය ජොන්ස්ටන් ඇමැතිවරයා ජනාධිපතිවරයා ගමන් ගත් වාහනයට සමාන්තරව අගමැතිවරයාගේ වාහනයද ධාවනය කළේය. ඒ අතරතුර ප්‍රසන්න ඇමැතිවරයාට අතින් සංඥා කළේ වාහනයේ වීදුරුව පහත් කරන ලෙසයි.

"අයියාට මොකක් හරි කියන්න යන්නේ"යි නාමල් ඇමැතිවරයා කීමත් සමඟ ජනාධිපතිවරයා ද එදෙස බැලුවේ එය අනුමත කරමිනි.


ප්‍රසන්න ඇමැතිවරයා වාහනයේ වීදුරුව පහත් කළේය. ඒ සමඟ ප්‍රසන්නව දුටු අගමැතිවරයා සිනහසුනේ "ආ ඔය ඉන්නේ" කියන්නා සේය.

## සජබ ජනපතිගේ තේ පාටිය වර්ජනය කරයි

ජනාධිපතිවරයා ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන අවස්ථාවේ සජබය කරන්නේ මොකක් දැයි තීරණයක් ගන්නට එම පක්ෂයේ නායක සජිත්ගේ ප්‍රධානත්වයෙන් මන්ත්‍රී කණ්ඩායමේ රැස්වීම් දෙකක් පාර්ලිමේන්තු සංකීර්ණයේදී පැවැත්විණි. මෙයින් එක් සාකච්ඡාවක් වූයේ පාර්ලිමේන්තු සතියේදී කටයුතු කළ යුතු ආකාරය ගැන තීන්දු තීරණ ගැනීමටය.

මේ සාකච්ඡා දෙකෙන් ප්‍රමුඛත්වය ලැබුණේ ජනාධිපතිගේ ප්‍රතිපත්ති ප්‍රකාශය සම්බන්ධයෙනි. සජබ නායක සජිත් ජනාධිපතිගේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන අවස්ථාවේ අපි මොකද කරන්නේයි මන්ත්‍රී කණ්ඩායමෙන් විමසුවේය.

"ජනාධිපතිවරයා හිතුවක්කාරී ලෙස පාර්ලිමේන්තුව වහලා දැම්මා. එහෙම වහලා අලුතින් විවෘත කරන්න තියෙන්නේ මොකක්ද? මේක උත්සවාකාරයෙන් විවෘත කරන්න තියෙන දෙයක්දැයි" ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීවරයා ප්‍රශ්න කළේය.



"ඉරාන් මන්ත්‍රීතුමා කියන කතාව ඇත්ත. අපි කණ්ඩායමක් විදියට පාර්ලිමේන්තුව රැස්වන දවසේ උදේ හමුවෙලා තීරණයක් ගනිමු" සජිත් තීරණය ගැනීමේ වගකීම පාර්ලිමේන්තු කණ්ඩායමට පැවරුවේය.

ඒ අනුව පාර්ලිමේන්තුව රැස්වූ දිනයේ උදෑසන කණ්ඩායම් රැස්වීම පැවැත්විණි.

"අපි මේ වෙලාවේ පාර්ලිමේන්තුව වර්ජනය කරන්න ඕන නෑ. ජනතාවගේ ප්‍රශ්න ගැන කතා කරන්න පාර්ලිමේන්තුව පැවැත්වීම වැදගත්" සජිත්ගේ මතය විය.

එහෙත් ජනාධිපතිවරයා විසින් ලබාදෙන තේ පැන් සංග්‍රහය වර්ජනය කිරීමට මන්ත්‍රී කණ්ඩායම තීරණය කෙළේය.

හේෂා විතානගේ සහ චමින්ද විජේසිරි මන්ත්‍රීවරුන්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක සමගි විහිදුම් බළකායේ ප්‍රධාන කාර්යාලය සජිත් අතින් විවෘත වුණේ පසුගිය සතියේදීය. ඒ අතර රට වටා පැවැත්වෙන සම්මන්ත්‍රණ මාලාවක ආරම්භක සම්මන්ත්‍රණය පැවැත්වුණේ රත්නපුරයේය.

"මේ ආණ්ඩුව ගෙනයන ආර්ථික ගමන වැරැදියි. ඒ බව ලෝකයේම ආර්ථික විශේෂඥයන් කියන විට ආණ්ඩුව ඒ කිසිවක් මායිම් නොකර සුපුරුදු වැරැදි ගමනේම ආණ්ඩුව යන විට ශ්‍රී ලංකාව ණය ශ්‍රේණිගත කිරීම්වල පහළට ඇද වැටිලා. අද ලෝකයේ කිසිදු රටකින් හරිහමන් ණයක් ගැනීමටවත් බැරි තැනට රට පත්වෙලා.

අද වෙනකොට තවදුරටත් ශ්‍රේණිගත කිරීම්වල පහළ අඩියටම වැටෙමින් සිටින තත්ත්වයක් තුළ මේ රටට ආයෝජකයන් කිසිවකු පැමිණෙන්නේ නෑ. අඩු පොලියට ණයක් හෝ ලබාගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වෙලා. එපමණක් නොව අත්‍යවශ්‍ය ඖෂධ ටික, අත්‍යවශ්‍ය ආහාර හෝ කර්මාන්තවලට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය, තෙල් ටික ගෙන්වා ගැනීමට බැහැයි" රට පත්ව තිබෙන සැබෑ තත්ත්වය ගැන සජිත් කීවේය.

## වතු කම්කරුවෝ සජිත්ට දුක කියති

හැටන් නගරයේ පැවැති තෛපොංගල් උත්සවයකට සහභාගි වීමට සජිත් පසුගියදා හැටන් බලා පිටත්ව ගියේය. දිගම්බරන් මන්ත්‍රීවරයා විසින් සංවිධානය කර තිබූ එම උත්සවයට ඉන්දීය මහ කොමසාරිස්වරයාද සහභාගි වී සිටියේය.

"සෑම වතු කම්කරුවකුටම ශ්‍රී ලාංකික පුරවැසිකම ලැබුණු ආකාරය මට මතකයි. ඒ සඳහා වන සටන දිනවූයේ රණසිංහ ප්‍රේමදාස මැතිතුමා. ඒ වගේම වතු කම්කරු ජනතාව ඉහළට ගෙනඒමට මමත් හැකි සෑම පියවරක්ම ගන්නවා" සජිත් සහතිකයක් දුන්නේය.

ගෑස් පිපිරීම් නිසා පීඩාවට පත්වූ පුද්ගලයන්ට වන්දි ගෙවීම සඳහා විපක්ෂ නායකවරයා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබුණේය. සිය බිරිය සහ දරුවන් තිදෙනාම ගෑස් පිපිරීමකින් මිය යෑමෙන් පීඩාවට පත්වූ අයෙක් එතැනට පැමිණ සිටියේය.

"අපි කුලී ගෙදරක හිටියේ සර්. ගෑස් ටැංකිය පිපිරිලා මගේ නෝනයි, දරුවෝ තුන්දෙනයි මැරුණා. ඒ අය නැතිවුණා විතරක් නෙවෙයි ගේත් කැඩුණා. දැන් අපිට ගේත් හදලා දෙන්න වෙලා" එම පුද්ගලයා කීවේ හැඬූ කඳුළිනි.

"ගෑස් පිපිරෙන එක කුමන්ත්‍රණයක් කියලා ඇමැතිවරු කියනවා. මේ වගේ අසරණ මිනිස්සු තව අසරණ වෙන එකටද ඇමැතිවරු කුමන්ත්‍රණ කියලා කියන්නේ" සජිත් කීවේ තරමක ආවේගයකින් යුතුවය.

## සජිත්ගෙන් ජනාධිපතිට තවත් ලිපියක්

සිරගත කර සිටින රන්ජන් රාමනායක හිටපු මන්ත්‍රීවරයාගේ සුවදුක් විමසීමට සජිත් පසුගිය සතියේදී බන්ධනාගාරයට ගියේය. රන්ජන්ගේ සුවදුක් විමසූ ඔහු රංජන්ට පොරොන්දුවක් දුන්නේය.

"අපි ඔයාව නිදහස කරගන්න කොහොම හරි කටයුතු කරනවා. ඔයා නිදහස් කරගන්න සටන හරින් ප්‍රමුඛ තරුණ මන්ත්‍රීවරුන්ට භාර කරනවා" සජිත් කීවේ රට පුරාම රන්ජන් නිදහස් කරන ලෙසට වන සටනට ශක්තියක් දෙමිනි.

මේ අතර විපක්ෂ නායකවරයා සිකුරාදා දිනයේදී ජනාධිපතිවරයාට තවත් ලිපියක් යැව්වේය. ඒ රන්ජන්ට සමාව ලබාදෙන ලෙසට ඉල්ලමිනි. රන්ජන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටිමින් ඔහු ජනාධිපතිවරයාට යැවූ තෙවැනි ලිපියයි මේ.

## ජාතික ජන බලවේගයත් ගමට

ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභාව පසුගිය සති අන්තයේ කොළඹට කැඳවා තිබිණි. මේ දිනවල ග්‍රාමීය මට්ටමෙන් එම බලවේගයේ ග්‍රාමීය කොට්ඨාස ගොඩනැඟීමේ වැඩසටහන හා එහි ප්‍රගතිය ගැන මෙහිදී සාකච්ඡා විය. එළැඹෙන මාර්තු මාසය අවසන් වනවිට එම ග්‍රාමීය කොට්ඨාස ගොඩනැංවීමේ කාර්යය සියයට 50කින් සාර්ථක කර ගැනීමට ක්‍රියා කළ යුතු ආකාරය ගැනද මේ විධායක සභා රැස්වීමේදී සාකච්ඡාවට බඳුන් විය.

පසුගියදා මහනුවරින් ඇරැඹූ මෙම වැඩසටහන ලබන මාර්තු මාසය අවසන් වන විට දිස්ත්‍රික් 15ක කමිටු පිහිටුවීමට තීරණය වූ අතර එය සාර්ථක කිරීම සඳහා දිස්ත්‍රික් නියෝජිතයන් වන නීතිඥ, වෛද්‍ය අධ්‍යාපනවේදීන්, තරුණයන් ඇතුළු වෘත්තීයවේදීන්ට වැඩකටයුතු පවරාදීමද මෙහිදී සිදුවිය.

මෙම ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභාව රැස්වීමේදී රටේ ආර්ථික තත්ත්වය ගැන විධායක සභාවේ සාමාජිකයන් සඳහා මහාචාර්ය අනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු විසින් විශේෂ කරුණු දැක්වීමක්ද සිදුකරන ලදී.

## රනිල් සමඟ අලි පෙරහර

රනිල් වික්‍රමසිංහ එජාප නායකයා ලෙස පාර්ලිමේන්තුව තුළ තනි අලියකු ලෙස පෙනුණත් ඔහු අලි ඇතුන් පිරිවරාගෙන දේශපාලන සටනක යෙදී සිටින බව දේශපාලන අංශවල කතාබහට ලක්වෙමින් තිබේ. මේ තත්ත්වය හමුවේ ඔහු පාක්ෂිකයන් හා ආධාරකරුවන් විශාල පිරිසක් නිරන්තරයෙන් හමුවන කාර්යබහුල දේශපාලනඥයකු සේ පෙනේ. ඉකුත් සතිය ඔහු කාර්යබහුල වූයේ සිතාගත නොහැකි පිරිසක් සිරිකොතට පැමිණීම නිසාය. ඊට අමතරව කොළඹ තෝරාගත් ස්ථාන කීපයකදී තවත් කණ්ඩායම් ගණනාවක්ම හමුවීමට ඔහු කාලය වෙන්කර ගෙන තිබිණි. මේ වාතාවරණය හමුවේ රනිල්ට ඉකුත් සතියේ නිවෙසේ රැඳී සිටින්නට ලැබුණේ සුළු කාලයකි.



මෙම හමුවීම් අතර විශේෂ පුද්ගලයන් කිහිපදෙනෙක්ද වූහ. මීට මාසයකට දෙකකට පමණ පෙර වෙළෙඳාමට සම්බන්ධ රජයේ ආයතනයකින් ඉල්ලා අස්වූ ආන්දෝලනාත්මක ප්‍රකාශ රැසක් කළ අයකුද ව්‍යාපාරිකයන් කිහිපදෙනකු සමඟ සිරිකොත පක්ෂ මූලස්ථානය වෙතම පැමිණ රනිල් හමුවූයේ සඟවන්නට දෙයක් නැතැයි කියමිනි.

ඔහු වියත්මඟ නියෝජනය කළ ජනාධිපතිවරයාට සමීප අයකු වුවද අදාළ රාජ්‍ය ආයතනයෙන් ඉවත් වූවේ එහි දූෂණ වංචා ගැන විශේෂ හෙළිදරව්වක්ද කරමිනි. ඔහු ඇතුළු ව්‍යාපාරිකයන් කණ්ඩායම නායකයා හමුවී ප්‍රධාන කරුණු 3ක් ඇතුළත් යෝජනාවලියක්ද භාර දුන්නේය. එම යෝජනා රජයට ඉදිරිපත් කළද මෙතෙක් ඊට කිසිදු ප්‍රතිචාරයක් නැතැයි ඔවුන් කීවේ කනගාටුවෙනි.

"එක්සත් ජාතික පක්ෂයට තමයි මේ රටේ ආර්ථිකය හදන්න පුළුවන්. නායකතුමා ගැන අපට මාධ්‍යයෙන් පෙන්නලා තිබෙන චරිතය නොවෙයි ඇත්ත කෙනා බව තේරුණේ මේ කතා කළ සුළු මොහොතේදීයි. එම ව්‍යාපාරිකයන් රනිල් මුරුංගා අත්තේ තබමින් එසේ කීවේ කනස්සලු ගතිකිනි.

රනිල් සමඟ මෙම සාකච්ඡාවට නියෝජ්‍ය නායක රුවන්ද එක්ව සිටි අතර ඔහු කීවේ නායකතුමා ඉදිරිපත් කර තිබෙන ආණ්ඩු මාරුවන විට වෙනස් නොවන ජාතික ප්‍රතිපත්ති මාලාවට මෙම යෝජනාද ඇතුළත් කළ හැකි බවය. රුවන්ගේ යෝජනාව රනිල්ද හිස සලා අනුමත කළ අතර පැමිණ සිටි ව්‍යාපාරිකයෝද ඊට එකඟතාව පළ කළහ.

ඊට අමතරව වාහන ආනයනය කරන්නන් පිරිසක්ද සිරිකොතදී නායකයා හා නියෝජ්‍ය නායකයා හමුවූහ. සඳුදා සිට බදාදා දක්වා දින හතරම නායකයා, නියෝජ්‍ය නායකයා හා මහලේකම් සිටියේ පක්ෂ මූලස්ථානයේය. ඒ පක්ෂ ප්‍රතිසංවිධානය යටතේ පාක්ෂිකයන්, පක්ෂ ක්‍රියාකාරීන් හා වෙනත් පිරිස් සිරිකොතට පැමිණීමට පටන් ගෙන තිබීම නිසාය.

සිරිකොත පක්ෂ මූලස්ථාන නිලධාරීන්ද කතා බහ කරන්නට වූයේ යළිත් 2013 - 2014 කාලයේ මෙන් සිරිකොත යළිත් පිරී ඉතිරී ගොස් ඇති බව කියමිනි. පක්ෂ ප්‍රතිසංවිධාන කටයුතු සම්බන්ධයෙන් නායකයා ඇතුළු පක්ෂ ක්‍රියාකාරීහු මෙහිදී සාකච්ඡා කරන්නට වූහ.

ජනවාරි මාසයේ අවසන් සතියේදී පක්ෂය සමඟ ඉදිරියට යන තරුණ නායකයන් හඳුන්වාදීමේ වැඩසටහන් සම්බන්ධයෙන්ද සාකච්ඡා කෙරිණි. පක්ෂ මූලස්ථානයේ කොටසක් ඒ වෙනුවෙන් වෙන් කිරීමටද මහලේකම් රංගේ බණ්ඩාර ඉකුත් සතියේ පියවර ගත්තේය.

තරුණ තරුණියන්ට එහි පැමිණ ක්‍රීඩා, කලා හා සංස්කෘතික නිර්මාණ කටයුතු කිරීමට අවස්ථාව සැලසෙන ලෙස නවීකරණ කටයුතු කිරීමට ඉදිරිපත් වූවේ පක්ෂ උප සභාපති සාගල රත්නායකය. නායක රනිල් නියෝජ්‍ය නායකයා කැඳවා උපදෙස් දුන්නේ කොළඹ දිස්ත්‍රික් සංවිධානය ශක්තිමත් කිරීමේ කටයුතු වෙනුවෙන් උරදෙන ලෙසටය. රංගේ, සාගල සමඟ එකතු වී එම කටයුතු ඉදිරියට ගෙනයන ලෙසටද නායකයා උපදෙස් දුන්නේය.

රාජකාරි කටයුතු අතර මඳ විවේකයක් ගත් නායකයා සිය බිරිය මෛත්‍රී වික්‍රමසිංහයන් සමඟ ලයනල් වෙන්ඩ්ට් රඟහලට ගියේ අශෝක හඳගමගේ ගේ, 'ඇන්ටික් කඩේ', වේදිකා නාට්‍ය නැරඹීමටය. නාට්‍යය අවසානයේ හඳගම හා නාට්‍ය ශිල්පීන් සමඟ කතාබස් කොට යෑමටද රනිල් අමතක නොකළේය.

මේ අතර චීන විදේශ ඇමැතිවරයා පැමිණි ගෝටි සිටියේ කොටසක් මහජනතාවට විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමටද නායකයාට සිදු වූවේ චීන තානාපති කාර්යාලයෙන් ලද ආරාධනාවකට අනුවය. රබර් - සහල් ගිවිසුමට වසර 65ක් සපිරීම වෙනුවෙන් උත්සවයක්ද එහි පැවැති අතර එම ගිවිසුමට මූලික වූවේ එක්සත් ජාතික පක්ෂය බැවින් නායකයාට එම අවස්ථාවට ආරාධනා කර තිබිණි. චීන, ශ්‍රී ලංකා රබර් - හාල් ගිවිසුම අස්සන් තැබුණේත් ඩී.එස්. අගමැති ධුරය දැරූ එජාපය ආණ්ඩුවක් යටතේය.

එක්සත් ජාතික පක්ෂ ක්‍රියාකාරීන් ඉකුත් බදාදාද සිරිකොත පක්ෂ මූලස්ථානයේදී නායකයා හමුවී සාකච්ඡා කිහිපයක්ම පවත්වා තිබුණේ පක්ෂ ප්‍රතිසංවිධාන කටයුතු සම්බන්ධයෙනි.

'ජනවාරි අන්තිම සතියේ එයාලගේ වැඩ ටික පටන් ගන්නවා නම් හොඳ දෙයක් කරන්න වේවි. ඕන නම් ශ්‍රමදානයක් වගේ දෙයකින් මේ කට්ටිය එකතු කරගන්නත් පුළුවන් කියලා තරුණ කණ්ඩායම් අතරින් අදහසක් ඉදිරිපත් වෙලා තියෙනවා.' රුවන් ද කතාවට එකතු විය.

"යෝජනා අදහස් ගණනාවක් ඉදිරිපත් වෙලා තියෙනවා. අපි ඉදිරි සතියෙත් කතා කරලා අලුත් දෙයක් කරන්න බලමු.' නායකයා කීවේය.

'පළාත් පාලන මැතිවරණයත් කල් ගියා. ජාතික මැතිවරණයකට මෙපිටින් මැතිවරණයක් එන පාටක් නෑ. මොකද මෙයාලා කරලා තියෙන දේවල්වල හැටියට ඡන්දයකට යන්න බෑනේ." සන්දිත් සමරසිංහ කීවේය.

"විදුලිය කපනවා කියන්නේ ජලයත් කපන්න වෙනවා කියන එකයි. දැන් ආණ්ඩුවට ඡන්දය දුන්නු කෙනෙක් හොයා ගන්නත් නෑ. මම බඩු මල්ලකුත් අරන් අද ප්‍රවෘත්ති සාකච්ඡාවකුත් කරනවා" වජිර ජනතා ප්‍රශ්න ඉදිරිපත් කළේය.

"ඔව් ජනතාවට අද ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදාවෙලා. ආණ්ඩුව මොනවා කරන්න හදනවාද කියලා හිතා ගන්න බෑ සාගල ද කතාවට හවුල් විය.

'ඉදිරියට එන ආණ්ඩුවකටත් කරන්න අමාරු තැනකට මේ රට ගෙන එන බව තමයි පේන්න තියෙන්නේ. අපි ඉදිරිපත් කර තිබෙන ආණ්ඩු මාරු වුණාට ප්‍රතිපත්ති මාරු නොවන ස්ථිර ප්‍රතිපත්තියක් නැතුව මේ රට ගොඩගන්න බැරිවෙයි. ඒකට අපි සූදානම් වෙමු. මේ වසර අපි බැහැලා වැඩ කරමු.' රනිල් කීවේ දැඩි විශ්වාසයකිනි.

තමන්ට රූපවාහිනී වැඩසටහනකට සහභාගි වීමට තිබෙන බව කියමින් නායකයා සිරිකොත පක්ෂ මූලස්ථානයෙන් ඉවත්ව ගියේය.

## ජ.වි.පෙ. බළමුළු තර කරයි

රටේ දේශපාලනයේ සුවිශේෂ භූමිකාවක යෙදී සිටින ජනතා විමුක්ති පෙරමුණ සිය දේශපාලන බලමුළු සවිමත් කිරීමේ පුළුල් ව්‍යාපාරයක් මේ දිනවල දියත් කොට තිබේ. පසුගියදා සිය දිස්ත්‍රික් සංවිධායකවරුන් කොළඹට කැඳවා " ගමෙන් පටන් ගමු" දේශපාලන වැඩසටහන ඉදිරියට ගෙනයෑම ගැන මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළේය. ආර්ථික වශයෙන් රට අගාධයට පත්වීම රටේ සම්පත් විකිණීම රට ඉදිරියට ගෙනයෑමට තිබෙන බාධක සහ ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය ගැන ජනතාව දැනුවත් කිරීමේ ගම් මට්ටමේ රැස්වීම් මාලාවක් පැවැත්වීම මේ හමුවේදී තීරණය කෙරිණි. ගම්වල සිටින පොහොට්ටුවේ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආධාරකරුවන් ජවිපෙ දේශපාලනයට සහාය දීමට හා එම දේශපාලන ප්‍රවාහයට එක්වීමට දිස්ත්‍රික් සංවිධායකයන් පෞද්ගලිකව හමු වී කැමැත්ත පළ කර තිබීම ගැන සංවිධායකයන් මෙම සාකච්ඡාවේදී තොරතුරු දක්වා තිබේ. එම ආධාරකරුවන් ජවිපෙට සෘජුව සම්බන්ධ කර ගන්නවාද යන්න ගැන මේ හමුවේදී තීරණයක් ගෙන නැතත් ඉදිරි හමුවලදී මේ පිළිබඳව සාකච්ඡා කිරීමට එකඟත්වය පළකොට තිබේ.

මේ අතර ත්‍රිකුණාමලය තෙල් ටැංකි ඉන්දියාවට පැවරීමට ආණ්ඩුව ගිවිසුම්වලට එළැඹීමට විරෝධය දැක්වීමට හා ඒ ක්‍රියාදාමය අත්හිටුවා ගැනීමට දැනට ආරම්භ කොට ඇති විරෝධතා ව්‍යාපාරය අඛණ්ඩ රට පුරාම ක්‍රියාත්මක කිරීමටද මේ හමුවේදී තීරණය කොට තිබේ. එසේ මහ නායක හිමිවරුන්, කාදිනල් හිමියන් සහ සෙසු ආගමික නායකයන් ඉදිරි දිනවලදී හමුවී මෙම විරෝධතා ව්‍යාපාරයට සහාය ලබා ගැනීමටද මෙහිදී තීරණය කොට ඇත.

## ආණ්ඩුව විවේචනය කරනවාට අකැමැති ශ්‍රීලනිප ජ්‍යෙෂ්ඨයා කවුද?

තමා සහභාගි වන ශ්‍රීලනිප රැස්වීමකදී ආණ්ඩුවට දැඩි ලෙස පහර දෙමින් විවේචනය කරන්නේ නම් තමා එම රැස්වීමේදීම එවැනි ප්‍රකාශ කරන අයට පිළිතුරු දෙන බව ශ්‍රීලනිප ජ්‍යෙෂ්ඨයෙක් පක්ෂයේ ප්‍රධානීන් කිහිපදෙනකුට දැනුම්දීමක් කර තිබේ.

මේ ජ්‍යෙෂ්ඨයා ආණ්ඩුවේ තනතුරක්ද දරන්නෙකි.

පසුගිය සතියේ අඟුණුකොළපැලැස්ස පුරහලේදී පැවැති හම්බන්තොට ශ්‍රීලනිප දිස්ත්‍රික් සම්මේලනයේදී ප්‍රකාශයක් කර ඇති එම ජ්‍යෙෂ්ඨයා, "ආචාර්ය, මහාචාර්යවරුන් කරන දේවල් වැදගත් වන්නේ නෑ. ඒ අයට පුළුවන් නම් ඡන්දයකට ඉල්ලා ජයගෙන එන්නැයි කියනවා" යි ප්‍රකාශ කොට ඇත.

එම ප්‍රකාශය කරන අවස්ථාවේ පක්ෂ නායක මෛත්‍රීපාල සිරිසේනද රැස්වීමේ සිට ඇත. රැස්වීම ඇමතූ ශ්‍රීලනිප ජ්‍යෙෂ්ඨයාට පිළිතුරක් දෙමින් කියා තිබෙන්නේ, "ආචාර්ය, මහාචාර්යවරු කරුණු විග්‍රහ කරනවා. ඒ අය මඟපෙන්වීමක් කරන්න පුළුවන්, විග්‍රහයක් කරන්න පුළුවන්. ඒ අය ප්‍රතික්ෂේප කළ යුතු නෑ. එහෙම කරනවා නම් රටක්, පක්ෂයක් විධියට දියුණු කරන්න බෑ" කියායි.

## විමල්ගෙන් නව නිපැයුම්කරුවන්ට අතහිත

නව නිපැයුම්කරුවන්ට අනාගතය සාර්ථක කරගන්නට උදවු නොකරන තත්ත්වයක් හමුවේ කර්මාන්ත ඇමැති විමල් වීරවංශ, යන්ත්‍රසූත්‍ර නිර්මාණය කර නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යන දෙදෙනකුට කොළඹින් ඉඩමක් ලබාදීමට හා පොලී රහිත රුපියල් මිලියන 10ක ණය මුදලක් එම කර්මාන්තය ප්‍රවර්ධනය කර ගැනීමට ලබාදීමට කටයුතු කෙළේය.

රවීන්ද්‍ර දේවසිංහ සහ විරාජ් සංජීව යන මේ කර්මාන්තය පවත්වාගෙන යන දෙදෙනා කොල්ලුපිටියේ පිහිටි අමාත්‍යාංශයට ගොස් කර්මාන්ත ඇමැතිවරයා හමුවී තම අවශ්‍යතාව දැනුම් දීමේදී ක්ෂණිකව ක්‍රියාත්මක වූ ඇමැතිවරයා මේ විශේෂ සහනය ඔවුන්ට ලබා දුන්නේය.

දැනට නාවලපිටිය, රඹුක්පිටිය ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන තම කර්මාන්ත ශාලාව බස්නාහිර පළාතේ ස්ථාපිත කළහොත් එමගින් මෙරට කුඩා, මධ්‍ය හා මහා පරිමාණ කර්මාන්තකරුවන්ට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර කාර්යක්ෂමව නිපදවීමට තමන්ට හැකි බවත් යන්ත්‍රසූත්‍ර නිපදවීම සඳහා අවශ්‍ය කරන නවීන තාක්ෂණයෙන් යුත් මෙවලම් කිහිපයක් මිලදී ගැනීමට හැකි වුවහොත් තම නිෂ්පාදන ධාරිතාව වැඩි කළ හැකි බවත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය බලාපොරොත්තු වන බවත් රවීන්ද්‍ර දේවසිංහ අමාත්‍ය විමල් වීරවංශ මහතාට දන්වා සිටියේය.

ඒ මොහොතේම බස්නාහිර පළාතෙහි කර්මාන්ත පුරයකින් ඔවුන්ගේ කර්මාන්ත ශාලාවට සුදුසු ඉඩමක් ලබාදීමට පියවර ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් දුන් කර්මාන්ත අමාත්‍යවරයා, කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා දුරකථන ඇමතුමක් මඟින් සම්බන්ධ කර ගනිමින් උපදෙස් දුන්නේ පවත්නා ණය පහසුකම් යටතේ මිලියන 10කට වැඩි පොලිය රහිත ණය මුදලක් මෙම කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ලබාදීමට පියවර ගන්නා ලෙසය. එසේම පෙබරවාරි 03, 04, 05, 06 යන දිනවල කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට නියමිත කර්මාන්ත 2022, ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයේ කුටියක් මෙම කුඩා, මධ්‍ය හා මහා පරිමාණ කර්මාන්ත සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර නිර්මාණය කර නිෂ්පාදනය කරන (Andrix Pvt Limited) ආයතනය සඳහා වෙන් කර දීමට කටයුතු කරන ලෙසද අමාත්‍යවරයා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයාට දැනුම් දුන්නේය.

## ල.ස.ස.ප. තිස්ස විතාරණට රතු එළියක්

ආණ්ඩුවේ හවුල්කාර පක්ෂ හා ආණ්ඩුව අතර පවතින අර්බුදය තවත් දිග්ගැස්සෙන සිද්ධියක් පාර්ලිමේන්තුවෙන් වාර්තා විය.

පාර්ලිමේන්තුවේ මුදල් කාරක සභාව කථානායක මහින්ද යාපා අබේවර්ධන ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් මන්ත්‍රීවරු අතර කතාබහට ලක්වූයේ මුදල් කාරක සභාවය. ඒ එම කාරක සභාවේ කලින් වාරයේ සභාපති ධුරය දැරූ මහාචාර්ය තිස්ස විතාරණ මන්ත්‍රීවරයා මෙවර මුදල් කාරක සභාවෙන් ඉවත් කර තිබීමයි. කාරක සභාවේ සාමාජික ධුරයකටවත් පත්කිරීමට තරම්වත් විතාරණ මන්ත්‍රීවරයාට සුදුසුකම් නැතිදැයි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මෙවර මුදල් කාරක සභාවේ සභාපති ධුරය තියා සාමාජික ධුරයකටවත්, තිස්ස විතාරණ මන්ත්‍රීවරයාගේ නම ඇතුළත් නොවීම කාගේත් කතාබහට ලක්විය.

'අළුයට ගිනි එළියට එනවා' ස.ජ.බ. මන්ත්‍රීවරයෙක් කියනු ඇසිණි.

## එන්නත අතහැරියොත් ජීවිතයත් අතහරින්න වේවි

### - විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත්

■ සඳුනි ගමාරච්චි

කොවිඩ් ඔමික්‍රෝන් වයිරසය ශීඝ්‍රයෙන් රටපුරා පැතිර යමින් පවතින බැවින් එන්නත්කරණය ලබා ගැනීම පිළිබඳ ජනතාව උනන්දුවක් නොදැක්වුවහොත් මීට වසරකට ඉහත දී රටේ පැවැති තත්ත්වය වැනි තත්ත්වයක් උදාවීම කිසිසේත් වැළැක්විය නොහැකි යැයි සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත් අවධාරණය කළේය.

රටේ හමුවන කොවිඩ් ආසාදිතයන් අතරින් ඔමික්‍රෝන් වයිරසය ආසාදිත වූ සියයට 30කට අධික රෝගීන් සංඛ්‍යාවක් අදාළ පරීක්ෂණවල ප්‍රතිඵල අනුව වාර්තා වන බව විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත් පැවැසීය.

මේ වනවිට කොවිඩ් ආසාදිතයන් දිනකට 800 ඉක්මවා වාර්තා වන බව පෙන්වා දෙන විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත් මේ තත්ත්වය යටතේ දිනකට කොවිඩ් ආසාදිතයන් 1000 ඉක්මවා යෑමේ තත්ත්වයක් නිර්මාණ වීමට ඉඩ ඇති බව අවධාරණය කළේය. එවැනි තත්ත්වයක් උද්ගත වුවහොත් කොවිඩ් ආසාදිතයන් සඳහා ප්‍රතිකාර මධ්‍යස්ථාන, දැඩි සත්කාර ඒකක, ඔක්සිජන් පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් සැලසීමට රජයට සිදුවන බව පැවසූ විශේෂඥ වෛද්‍යවරයා සෞඛ්‍ය උපදෙස් නොසලකා හැර පසුගිය දීර්ඝ නිවාඩුවක් සහිත සති අන්තයේ විවිධ සංචාරවල යෙදුණු සියලු දෙනාම මේ තත්ත්වයට වගකිව යුතුව ඇතැයි පෙන්වා දුන්නේය.

## ලංකාවේ ඉතිහාසය කණපිට ගැහුව සාක්ෂිය

■ සවනි ශේශාධි

ලංකාවේ දැනට වාර්තා වන අලි විශේෂය හැරුණු කොට තවත් අලි උප විශේෂ දෙකක් හා හිපපොටේමස් සතුන් මෙරට ජීවත් වූ බවට අනුමාන කළ හැකි සාක්ෂි සාධක හමුව ඇතැයි සත්ත්ව විශේෂඥ කැලුම් නලින්ද මනමේන්ද්‍රආරච්චි 'මව්බිම'ට පැවැසීය.

කඟවේනුන්ගේ බවට අනුමාන කරන දත් කිහිපයක් මින් වසර විසි ගණනකට පෙර හමු වූ බවද හෙතෙම සඳහන් කළේය.

ලොව අන් රටවල තවමත් ජීවමානව සිටින ලොව දුර්ලභ සතුන් මින් වසර දහස් ගණනකට පෙර ලංකාවේද ජීවත් වූ බවට කිව හැකි සාක්ෂි සාධක පැහැදිලිව හමුව ඇති බවද ඒ මහතා කීය.

ඒ පිළිබඳව නිශ්චිතව සනාථ කළ හැකි අයුරින් පරීක්ෂණ කිරීමට මූල්‍යමය නොහැකියාව මත පාෂාණ භූතවිද්‍යා අධ්‍යයන කටයුතු දිගින් දිගටම කිරීමට බාධා වී ඇතැයිද හෙතෙම අවධාරණය කළේය. මින් වසර විසි පහකට කලින් හමු වූ සත්ත්ව දත් කිහිපයක කළ විශේෂ පරීක්ෂණවලදී මින් සියවස් ගණනාවකට පෙර මෙරට කඟවේනුන් හෙවත් රයිනෝසිරස් සතුන් ජීවත් වූ බවට අනාවරණය වූ බවද හෙතෙම පැවැසීය.

අවුරුදු 80,000කට පමණ පෙර මෙරට සිටි බව පර්යේෂණ දත්ත ඔස්සේ අනාවරණය වූ කඟවේනා හෙවත් රයිනෝසිරස් සතුන් දෙදෙනකුගේ හිස් කබල් දෙකක් තවමත් බදුල්ල - මඩොල්සිම, ලුණුගල, අඩාවත්තේ අඩි 62ක් පමණ පොළොව අභ්‍යන්තරයේ පවතින බව තහවුරු වී තිබියදීත්, ඒවා ගොඩගෙන කාල නිර්ණ පරීක්ෂණවලට හෝ පොසිල පරීක්ෂා සඳහා මේ වනතුරුත් ලක් කිරීමට අවස්ථාවක් හිමිවී නැතැයිද හෙතෙම කීය.

මින් වසර 26කට පෙර 1996 වසරේ පතලක් හෑරූ පිරිසකට හිස් කබල් දෙකක් හමුව ඇති අතර අධික වර්ෂාවත් සමඟ පතල කඩා වැටීමේ අවදානමක් ඇති වූ නිසා එම හිස් කබලේ දත් පමණක් ගලවාගෙන එම පිරිස ගොඩට පැමිණ ඇතැයි ඔහු පැවැසුවේය.

මෙසේ හමු වූ දත් කොටස් එවකට පුරාවිද්‍යා අධ්‍යක්ෂවරයා වූ ශිරාන් දැරණියගල මහතා තමන් ඇතුළු පිරිසට පොසිල පරීක්ෂණ සඳහා යොමුකළ බවත් එහිදී ඒවා වසර 80,000කට පෙර ප්ලයිස්ටෝසීන යුගයේ ජීවත් වූ කඟවේනා හෙවත් රයිනෝසිරස් සතුන් දෙදෙනකුගේ දත් කොටස් බවට හෙළි වූ බවත් ඒ මහතා පැවැසීය. මේ දත් කොටස් ඔස්සේ අනාවරණය වූ තොරතුරු මත එම හිස් කබල් දෙක ගොඩට ගෙන පරීක්ෂණ සඳහා යොමු කළහොත් එය මෙරට පාෂාණ භූතවිද්‍යාවට අදාළ පරීක්ෂණවල සන්ධිස්ථානයක් වනු ඇතැයිද සත්ත්ව විශේෂඥ කැලුම් නලින්ද මහතා තවදුරටත් සඳහන් කළේය.

## එන්නත ගැන බොරු කියන අයට දඬුවම් දෙන්න

### රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

■ ජේ.ටී. ද සිල්වා

කොවිඩ් බූස්ටර් එන්නත ලබාගැනීම වැළැක්වීමට මිථ්‍යා මත පළකරන අය සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ සහ නිරෝධායන නීතිය යටතේ නඩු පැවරීමට පියවර ගත යුතුව ඇතැයි රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය රජයට යෝජනා කරයි. මේ වනවිට රටේ ජනගහනයෙන් සියයට 75ක් එක් එන්නතක් ලබාගෙන සිටින අතර එන්නත් දෙකම ලබාගත් පිරිස සියයට 65ක් වන බව පෙන්වාදෙන එම සංගමයේ ප්‍රධාන ලේකම් වෛද්‍ය සෙනාල් ප්‍රනාන්දු බූස්ටර් එන්නත ලබාගෙන ඇති පිරිස සියයට 22ක් බව අවධාරණය කළේය.

බූස්ටර් එන්නත සඳහා අවශ්‍ය 'ෆයිසර්' එන්නත ප්‍රමාණවත් තරම් ගෙන්වා තිබියදී එම එන්නත් ජනතාවට ලබාදීමට නොහැකි වන තත්ත්වයක් නිර්මාණය වී තිබෙන්නේ ඇතැම් පිරිස් බූස්ටර් එන්නත සම්බන්ධයෙන් ගෙනයන මිථ්‍යා මත නිසා යැයිද වෛද්‍ය සෙනාල් ප්‍රනාන්දු සඳහන් කළේය.


ඔමික්‍රෝන් වයිරසය ශීඝ්‍රයෙන් රට පුරා පැතිර යෑමේ තත්ත්වයත් සමඟ කොවිඩ් ආසාදිතයන්ගේ අනපේක්ෂිත වැඩිවීමක් දිනෙන් දින දක්නට ලැබීම නිසා යළිත් රට තුළ කොවිඩ් හිස එසවීමට ඉඩ ඇති බැවින් එවැනි තත්ත්වයක් ඇතිවුවහොත් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සෞඛ්‍ය අංශ වෙත යෝජනා තුනක් තම සංගමය විසින් ඉදිරිපත් කිරීමට විවිධ ක්ෂේත්‍රවලට අයත් විශේෂඥ වෛද්‍යවරු 12 දෙනකුගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති බවද හෙතෙම පැවැසීය. එම කමිටු වාර්තාව 24 වැනි සඳුදා ලබාදුන් පසු අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කරන බවද වෛද්‍ය සෙනාල් ප්‍රනාන්දු පැවැසීය.






ජුසේවාස් පියතුමා





ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා

# බෝල්වත්ත දේවස්ථාන බිමෙන් මතුවුණේ ජුසේවාස් පියතුමන්ගේ සොහොන් ගැබද?

**හලාවත පදවියට අයත් බෝල්වත්ත පරලෝක රාජේශ්වරී කතෝලික දේවස්ථාන සුසාන භූමියෙන් පුරාණ සොහොන් ගැබක් හමුවී තිබේ. දේවස්ථාන භූමියේ සිදු කළ නව ඉදිකිරීමක් සඳහා කරන ලද කැණීමකදී මෙම පුරාණ සොහොන් ස්මාරකය හමුවී ඇත.**

මෙම ප්‍රවෘත්තිය ප්‍රදේශයේ කතෝලික ජනතාව අතර ආන්දෝලනයට හේතු වී ඇති අතර බෝල්වත්ත මීසම් පාලක නෙවිල් සෙබෙස්තියන් පියතුමාගේ දැඩි අවධානයටද යොමුවී තිබේ. දැනටමත් සුසාන භූමිය තුළ සිදු කරමින් තිබූ අභිනව ඉදිකිරීම නවතා දමා ඇති අතර සුසාන භූමිය තුළ පැවැති එම සොහොන් ගැබ ආරක්ෂාකාරීව සංරක්ෂණය කරගැනීම සඳහාද පියවර ගනිමින් සිටී.

මෙම පුරාවිද්‍යාත්මක සොයා ගැනීම කෙරෙහි ශ්‍රී ලංකාවේ කතෝලික ජනතාව දැඩි උනන්දුවක් යොමු කරනුයේ ශ්‍රී ලංකාවේ කතෝලික සාහිත්‍යයේ පියා ලෙස සැලකෙන ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා පරලෝක රාජේශ්වරියගේ කතෝලික දේවස්ථානයේ වැඩ විසූ නිසාය. කතෝලික බැතිමතුන් විශ්වාස කරන්නේ මෙලෙස හමුවී තිබෙන්නේ ගොන්සාල්වේස් පියතුමාණන්ගේ සොහොන් ගැබ බවය.

ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගේ 280 වැනි සංවත්සරය මෙම වසරේ ජූලි 17 දිනට යෙදී තිබේ. මෙම සොහොන් ගැබ උන්වහන්සේගේ නම් එය හමුවීම ප්‍රාතිහාර්යයක් ලෙස කතෝලික බැතිමතුන් විශ්වාස කිරීම සාධාරණය.

පුරාණ සොහොන් හා ස්මාරක ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අපට තිබෙන්නේ ගෞරවනීය ඉතිහාසයක් නොවේ. කාලයාගේ ඇවෑමෙන් සිදුවන ස්වාභාවික විනාශයන්ගෙනුත්, කාලීන ලාභ ප්‍රයෝජන ගැන පමණක් සලකා කරන මානව ක්‍රියාකාරකම්වලිනුත්, පුරාවස්තූන් හා වැදගත් ඓතිහාසික ස්ථාන වනසන කුරිරු මිනිසුන්ගෙනුත්, දිවයිනේ ඇති ඓතිහාසික හා පොදු පිළිගැනීමට ලක්වූ ස්මාරක විනාශ වී ඇති බව පිළිගත යුතුය.

ලංකාවේ පුරාණ සොහොන් හා ස්මාරක පිළිබඳව, ඉතා අගනා ග්‍රන්ථයක් මෙරට සිවිල් සේවාවේ නියුක්තව සිටි J. Penri Lewis, c m g විසින් පළ කර තිබේ. (හද්‍රා ඉන්ද්‍රනි අමරකෝන් විසින් පරිවර්තනය කරන ලද) එම ග්‍රන්ථයට අනුව ක්‍රි. ව. 1501 සිට 1910 දක්වා කාලය තුළ මෙරටදී මරණයට පත්වූ යුරෝපීය ජාතීන්ගේ සොහොන් ස්මාරක විශාල ප්‍රමාණයක් පිළිබඳව කරුණු හෙළිකර තිබේ.

ලෙවිස් මහතා විසින් ඉතාමත් වැදගත් සමීක්ෂණයක් සිදු කර ඇති අතර අතීතය සටහන් කර ඇති වැදගත් ග්‍රන්ථ වැනි ස්මාරක ගැන දක්වා ඇති අඩු සැලකිල්ල ගැන කතුවරයා බොහෝ සේ කනගාටුව පළ කර තිබේ. ඔහු සඳහන් කරන්නේ ලන්දේසීන් යාපනයේ දේවස්ථානවල හා යාපනය කොටුව අසල සුසාන භූමිවල පෘතුගීසීන්ගේ සොහොන්කොත් කඩා දමන ලද බවය.

සොහොන් කැබලි ඔවුන්ගේ කාලතුවක්කුවලට පිරවූ බවත්, ඔවුන් විසින් තබන ලද කාලතුවක්කු වෙඩි දිනපතාම සොහොන් කැබලි සමඟ යාපනය නගරයට ඇද වැටුණු බවත්ය. අවාසනාවන්ත පෘතුගීසීහු ඔවුන්ගේ ආදිතමයන්ගේ හා නෑදෑයන්ගේ සොහොන් කොත් කැබලිත් සමඟම වැනසුන බවත් ලන්දේසි හමුදාවේ සේවය කළ ජර්මානු සෙබළකු ලෙවිස් මහතා සමඟ පවසා තිබේ.

එයින් පැහැදිලි වන එක කරුණක් වන්නේ යටත් විජිත පාලන සමයේ වුවද පෘතුගීසීන්ගේ සොහොන් කොත් ලන්දේසීන් අතින්ද, ලන්දේසීන්ගේ සොහොන් කොත් ඉංග්‍රීසීන් අතින්ද, ඉංග්‍රීසීන්ගේ සොහොන් කොත් පසුකාලීනව සිංහලයන් අතින්ද ඇතැම් විට වැනසී තිබෙන බවය.

එවැනි තත්ත්වයක් යටතේ වුවද කතෝලික හා ක්‍රිස්තියානි පල්ලිවල ඇති සුසාන භූමිවල තිබූ බොහෝ සොහොන් ගැබ් තවදුරටත් ආරක්ෂා වී තිබීම පුරාවිද්‍යාත්මක වශයෙන් මිල කළ නොහැකි කෞතුක වටිනාකමක් සහිත වැදගත් අවස්ථාවකි. ශතවර්ෂ කිහිපයක් තිස්සේ බෝල්වත්ත කතෝලික පල්ලියේ සුසාන භූමියෙහි පුරාණ සොහොන් තවදුරටත් ආරක්ෂාව පැවැතීම ආශ්චර්යයකි. එම සොහොන් ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගේ හෝ ජුසේවාස් පියතුමාගේ හෝ විය හැකි නම් එහි කෞතුක අගය තවදුරටත් බොහෝ සෙයින් ඉහළ යන්නේය.

> සෑම සුසානයක් තුළම නමක් හිමි ගෞරවනීය මිනිසකු නිදයි. ඒ නන්නාඳුනන මිනිසා කවරකු වුවද ඔහුට මනුෂ්‍යත්වයේ නාමයෙන් අපගේද මතු උපදින පරම්පරාවන්ගේද ගෞරවය හා ආරක්ෂාව හිමිවිය යුතුය.



ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ශ්‍රී ලංකාවේ කතෝලික ආගම ප්‍රතිෂ්ඨාපනය කිරීම පිණිස විශිෂ්ටතම මෙහෙයක් සිදුකළ ජුසේවාස් මුනිතුමාගේ සමකාලීනයෙකි. ලංකාවේ වසර ගණනාවක් සිට පූජකයන් නොමැති බව වාර්තා වූ වකවානුවක ශාන්ත ජුසේවාස් පියතුමා ලංකාවේ කතෝලිකයන්ගේ දුක්ඛිත තත්ත්වය ගැන අසා ඔවුන් බේරා ගැනීමට ස්වකැමැත්තෙන් ඉදිරිපත් වී ඇත. 1687 වසරේ ශාන්ත ජුසේ වාස් පියතුමා ඉන්දියාවේ සිට තූත්තුකුඩිය හරහා ලංකාවට පැමිණියේය.

ජුසේවාස් පියතුමා ශ්‍රී ලංකාව පුරා ඉතා දුකසේ ගමන් කරමින් කටුක උපද්‍රවයන්ට මුහුණ දෙමින් වරෙක කන්ද උඩ රාජධානියේ රජුගේ උදහසටද ලක්වෙමින් සිය ධර්ම දූත කාර්යය මැනැවින් ඉටු කළ උත්තමයෙකි. උන්වහන්සේ ශ්‍රී ලංකාවේ සෑම නගරයකම දෙපයින් ඇවිද ධර්මදූත සේවාවේ යෙදී තිබේ.

ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ජුසේවාස් පියතුමා හා සම්බන්ධ වීමට ශ්‍රී ලංකාවට පැමිණ තිබෙනුයේ 1705 මැයි 9 වැනි දිනය.

ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා වසර 36ක් පුරා සිය දුෂ්කර ධර්මදූත සේවය ඉටු කොට 1742 ජූලි 17 වන දින අභාවප්‍රාප්ත වූ අතර මෙරට කතෝලික ඉතිහාසයේ සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ බෝල්වත්ත දේවස්ථානයට අයත් සුසාන භූමියෙහි උන්වහන්සේගේ සිරුර තැන්පත් කරන ලද බවය.

ශාන්ත ජුසේවාස් පියතුමන්ගේ සමීපතම සහෘදයා ලෙස ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා ශ්‍රී ලාංකික කතෝලික බැතිමතුන් විසින් සලකනු ලැබේ.

මෙහිලා සැලකිය යුතු තවත් විශේෂ සිදුවීමක් තිබේ. 2015 ජනවාරි මාසෙදි අතිඋතුම් ෆ්‍රැන්සිස් පාප් වහන්සේ විසින් ශ්‍රී ලංකාවේදී ශාන්ත ජෝශප් වාස් මුනීන්ද්‍රයාණන් ශාන්තුවරයට පත් කරනු ලැබීය. ඉන් අනතුරුව දිවාර් ප්‍රදේශයේ ජනතාව ඉතා උනන්දුවෙන් හා උද්යෝගයෙන් මූලිකත්වය ගෙන ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාණන් ශාන්තුවරයට පත්කිරීම පිණිස වැඩපිළිවෙළක් සම්පාදනය කර ඇත.

ඒ අනුව දිවාර්හි අප ස්වාමිදූගේ දේවස්ථානයේ පූජක ජෝස් ඩයස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාණන් සාන්තුවරයට පත් කෙරිණි.

ජුසේවාස් පියතුමන්ගේ අභාවය සිදුවී තිබෙන්නේ 1711 ජනවාරි 16 මහනුවරදීය. අභාවයට පත්වන විට උන්වහන්සේ 59 හැවිරිදි වියේ පසුවිය. ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා මිෂනාරිවරයකු ලෙස 1705 දී ලංකාවට පැමිණි අතර ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා අභාවයට පත්වන විට ඔවුන් දෙදෙනා එක්ව ධර්මදූත කාර්යයෙහි නිරතව තිබුණේ වසර 6කි පමණි. ජුසේවාස් පියතුමන්ගේ කාර්යය ඉදිරියට ගෙන යන ලද්දේ ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා විසිනි. පියතුමන්ලා දෙදෙනාම ශ්‍රී ලාංකේය කතෝලික ප්‍රජාවගේ ඉමහත් ගෞරවාදරයට පත්වූ උත්තමයන් වෙති.

බෝල්වත්ත පල්ලියේ සුසාන භූමියේ තිබී හමුවූ විශේෂ සොහොන් ගැබ සති අන්තයේදී පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් අනුර මනතුංගගේ අධීක්ෂණයට ලක්ව තිබිණි.

මහාචාර්ය අනුර මනතුංග මව්බිමට පැවසුවේ නව ඉදිකිරීමක් සඳහා බිම සැකසීමේදී තරමක යට තිබී හමුවී ඇති මෙම සොහොන් ගැබ තමා නිරීක්ෂණය කළ බවත් එය අවම වශයෙන් වසර 100 කට වැඩි නොවන බව තමාට නිරීක්ෂණය වූ බවය. පසුකාලීනව නැවත තහවුරු කරන ලද්දක්ද යන්න තවදුරටත් පරීක්ෂණය කළ යුතුව ඇතැයිද හෙතෙම පැවැසීය.

ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගේ සොහොන් ගැබ බෝල්වත්ත පල්ලියේ සුසාන භූමියේ වෙනත් ස්ථානයක පවතින බැවින් මෙම සොහොන ගොන්සාල්වේස් පියතුමාගේ විය නොහැකි බව පැහැදිලි බවද අධ්‍යක්ෂ ජනරාල්වරයා පැවැසීය. ජුසේවාස් පියතුමා ගොන්සාල්වේස් පියතුමා හා සමඟ සමකාලීනව හලාවත මීසමේ ධර්මදූත කාර්යයෙහි නිරතව ඇති බැවින් ප්‍රාදේශීය කතෝලික බැතිමතුන්ගේ මහත් ගෞරවාදරයට ලක්ව ඇති බැවිනුත් පසුකාලීනව මහනුවර සිට ජුසේවාස් මුනීන්ද්‍රයාණන්ගේ අවශේෂවලින් කොටසක් හෝ බෝල්වත්තට ගෙනැවිත් මිහිදන් කරාද යන්න පිළිබඳව වෙනම විමර්ශනය කළ යුතුව ඇතැයිද පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩිදුරටත් පැවැසීය.

■ **උදේනි සමන් කුමාර**

**හලාවත - ප්‍රසාද් පූර්ණිමාල්**



# ළමා නිරුවත විකුණන ෆේස්බුක් පිස්සෙක්ට උඩ ගෙඩි දුන්න ළමාරක්ෂකයේ හැටි..!

**බොහෝ අම්මාවරුන් කිරි සිහින දකිනුයේ ලේ කැටියක් තම කුස දරන්නටත් පෙරය. ඔවුන් නොදුටු ලොව තම දරුවන්ට තනා දෙන්නට දෙන්නා දෙමහල්ලෝ රැය දහවල නොතකා වෙහෙසෙති. දරුවකු කුස දැරූ පළියට හෝ උස් මහත් කොට පෝෂණය කළ පළියට තම සිහින උන් ලවා සාක්ෂාත් කර ගැන්මට වෙර දැරීම කෙතරම් මානුෂීය දැයි යළි යළිත් සිතා බැලිය යුතුය.**

ලෙය කිරට හැරවූ අම්මාගේත්, ගත රුහිරු හෙළා පෝෂණය කළ තාත්තාගේත් සිහින හැබෑ කරන්නට ගොස් ජීවිතය මංමුළා වූවෝ සිටිති. තම සිහින පසෙකලා ඒ සිහින හඹා යන්නට නොහැකිව රහසේ හඬා වැටෙන දරුවෝ අනන්තය. සමහරෙක් තම ජීවිතයෙන් පවා වන්දි ගෙවති.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ දැක්වෙනුයේ අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයකුම 'ළමයෙක්' යන්නය. ඔවුන් ජීවත් වනුයේ වැඩිහිටි රැකවරණය තුළය. ඔවුන් පෝෂණය කරනුයේ වැඩිහිටියන්ය. දරුවන් ලෙස ඔවුන්ව නිර්වචනය කරනුයේද එහෙයිනි.

අද වනවිට ලෝකය අමුතු සෙල්ලම් පිරි සෙල්ලම් යායක් බවට පරිවර්තනය වෙමින් පවතී. නිම්වළලු පුළුල් වූ තාක්ෂණය එහි නිදහසේ රඟන්නට තටු දී ඇත්තා සේය. පසුගිය දිනෙක මුහුණු පොතේ පිටුවක් පිළිබඳ කතාබහ කරළියට පැමිණියේ එය මල්කැකුළු තළා දමන්නට මාන බැලූ අයකුගේ අඳබාල වැඩක් තරම් පෙනුණු නිසාය. එහි සැබෑ අරමුණ දන්නේ එම ෆේස්බුක් පිටුවේ අයිතිකාරයාම මිස වෙන කිසිවෙක් නම් නොවේ. එහෙත් පුහුදුන් සමාජය එහි යටි අරුත වටහා ගන්නට නොහැකි තරම් මෝඩයෝ යැයි කිසිසේත්ම උපකල්පනය කළ නොහැකිය.

ෆේස්බුක් පිටුව පවත්වාගෙන ගොස් තිබුණේ බාල වයස්කාර දැරියන්ගේ ඡායාරූප වාණිජ අරමුණු වෙනුවෙන් භාවිත කිරීමට බව නොරහසකි. එහෙත් ඒ සම්බන්ධව ජාතික ළමාරක්ෂක අධිකාරියට පැමිණිලි කළ විට ඔවුන්ගේ හැසිරීම සමාජ ක්‍රියාකාරීන් කිසිසේත්ම අනුමත කළේ නැත. පැමිණිල්ල කර තිබුණේ ළමාරක්ෂක අධිකාරියේ සයිබර් විමර්ශන අංශයටය. එහි විමර්ශන ක්‍රමවේදයට ගල් මුල් විසි කරන්නට මිස මල් පුදන්නට නම් කිසිවෙක් ඉදිරියට ආවේ නම් නැත.

කුඩා දැරියන් විලාසිතා නිරූපණ කටයුතුවලට යොදා ගන්නා මුවාවෙන් ෆේස්බුක් පිටුව පවත්වාගෙන ගොස් තිබිණි. ඒ ගැන ළමාරක්ෂක අධිකාරියට පැමිණිල්ලක් ගොනු කෙරිණි. එයට ප්‍රතිචාර ලෙස එම අධිකාරියේ නීතිය බලාත්මක කිරීමේ සහකාර අධ්‍යක්ෂවරිය අදාළ ෆේස්බුක් පිටුවේ හිමිකරුට අවවාදාත්මක ලිපියක් යොමුකොට තිබුණේ ඔහුගේ වෘත්තියට සුබ පැතුම් පිරිනමමිනි.

**"කුඩා දරුවන් යොදාගෙන ඔබ විසින් උක්ත නම සඳහන් ගිණුම පිළිබඳව අප ආවේක්ෂණ කණ්ඩායම නිරන්තරයෙන් ආවේක්ෂණ කටයුතුවල නිරත වෙමින් සිටී. එකී ඡායාරූප පළ කිරීමේදී ළමයින්ගේ හා භාරකරුවන්ගේ අවසරයකින් තොරව පළකිරීම හෝ අශ්ශීල ඡායාරූප පළ කිරීමක් සිදුවුවහොත් ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවද දන්වා සිටිමි.**

**ඡායාරූප කලාව පිළිබඳව ඔබට සුබ පතන මුත් ළමයින් යොදා ගැනීම තුළ එකී ළමයින්ගේ ආරක්ෂාවට තර්ජනයක් සිදු නොවන ලෙස කටයුතු කරනා ලෙස කාරුණිකව දන්වා සිටිමි."**

ලිපිය යවා තිබුණේ 2020.01.13 දිනැතිවය. ඒ එහි නීතිය බලාත්මක කිරීමේ සහකාර අධ්‍යක්ෂ නීතිඥ චන්ද්‍රිමා දුනුවිලගේ අස්සනිනි.

වෘත්තියක ගෞරවනීයත්වය රැඳෙනුයේ එහි නියැළෙන උන්ගෙන් මිස වෘත්තියෙන් නොවේ. ගරුකටයුතු වෘත්තියකට මුවාවී තම පහත් ආශාවන් සපුරා ගන්නවුන් නැත්තේ නැත. විසිකරන්නට සල්ලි ඇත්නම් කැමරාවක් නොව ඕනෑම දෙයක් මිලට ගත හැකිය. ඉස්සර විකුණුයේ තරුණියන්ගේ නිරුවතය. දැන් එයට ඇති මිල පහළ බැස ඇතිවා විය හැකිය. එහෙයින් සල්ලි හොයන්නට කාමාතුරයෝ වෙන මඟක් සොයාගෙන ඇත්තා සේය.

උන්ගේ අලුත්ම ගොදුර පීදෙන්නට ළංවූ මල් කැකුළුය. සුදු හැඳගත් උපාසක වෙසින් පැමිණෙන්නේ කාමාතුරයෝ බව කඩතුරාවෙන් දෑස් වසා ගත් මවුපියන්ට නොතේරෙනුයේ දරුවන්ගේම අවාසනාවට වන්නට ඇත. තෝරා බේරා ගැන්මට තරම් මුහුකුරා ගිය බුද්ධියක් දරුවන්ට ඇත්තේ නැත. වර්තමානයේ ජීවත්විය හැකි නමුත් අනාගතයේ පෙරනිමිති ගැන උන්ට ඉවක් නැත. ජීවිතයේ දශක කිහිපයක් පසුකොට අනේකවිධ වේදනා බාධා මැද ලොව උතුම්ම පදවිය ලැබූ මවුපියවරුන්ට ඒ ඉව නැත්තේ යැයි කීම හාස්‍යජනකය. එක අතකින් එය සිනහ වීමට තරම් කරුණක්ද නොවේ. දෑස බැඳ කඩතුරාවක් ඇති කල්හි සිත්තටික් සිහිනවල ජීවත්වනවා මිසක යථාර්ථවාදී පොළොවක පය ගසන්නට උන්ට දැනුමක් නැත.

කුඩා දැරියන් නිරූපණ ශිල්පීන් ලෙස සමාජය ඉදිරියේ නිරාවරණය කරන්නට තරම් මවුපියන්ට අයිතියක් ඇත්තේ නැත. කෙදිනක හෝ වැඩිවියට පත්වන දියණියන් ඒ පිළිබඳව තම මවුපියන්ගෙන් ඒ තත්ත්වයට පත් කළේ ඇයිද යන්න පෙරළා ප්‍රශ්න කළ විට 'ආසාවට' යැයි පිළිතුරු දිය හැකිද? අයාලේ ගිය, මඟ වැරදුණු ජීවිතයකට එය එතරම් සරල පිළිතුරක් නොවේ.

නිරූපණ ශිල්පයේ මුවාවෙන් ඇඟ මසද විකුණන සෙල්ලම කරන්නට අරඅඳින උන් බහුල සමාජයේ, තම කුඩා දියණියන්, නිරූපණ ශිල්පිනියන්ගේ වෙස් ගැන්වීමට දත කන සලෙළුන්ට බිලි දීමට තරම් මවුපියන් අඥාන වූයේ කෙසේද යන්න ගැටලුවකි. දියණියන් කැමරාව ඉදිරියේ අඩ නිරුවත් කොට, ඔවුන් දෑසින් නිරුවත් කොට බලන උන්ට ඇඟිල්ල දිගු කිරීම සාධාරණ නැත. මල් කැකුළු දෑස් ඉදිරියේ නිරුවතින් දකින්නට තරම් අනුබල දුන්නේ කැමරාව ඉදිරියේ දියණියන්ගේ අඩ නිරුවත පෙන්වීමට ඇති පරිසරය සකසා දුන් මවුපියන්මය.

තම කුඩා දරුවන් මෙවැන්නකට පෙලඹවූයේ යම්කිසි අයුරකින් මානසිකව යම් බලපෑමකට ලක් වූ අය විය හැකිය. තමන්ට ළඟාකර ගත නොහැකි වූ දෑ තම දරුවන්ට හිමිකර දීම තුළ මානසික ආරෝපණය කොට ගත් සතුටක් විඳින මවුපියෝද වෙති. කොටට අඳින්නට, නිරූපණයේ යෙදෙන්නට, නටන්නට, ගයන්නට, රඟන්නට තමන්ට නොහැකි වී නම් තම දරුවන් ලවා හෝ එය ඉටු කරගන්නට මාන බලන්නෝ වෙති. එයින් සිදුවනුයේ කුඩා දරුවන් සතු අනන්‍යතාව අහිමිවීමය. සිතට ආරූඪ වනුයේ නව යොවුන් තරුණියකගේ සිතුවිලිය. ඉන් සිදුවනුයේ ළමයාට ළමාකම අහිමි වීමය.

> **බොරු ජනප්‍රිය සිල්ලර වැඩවලට මවුපියෝත් රැවටෙන්න එපා**

විකෘති කාමාශාව සමාජයේ බොහෝ පෞරුෂයන් තුළ සැඟවී ඇත. එය එළියට එනුයේ රහසින්මය. එළිපිට රඟන්නට නොහැකි වන්නම රඟනුයේ විකෘති කාමාශාව ද මුසුකොට ගෙනය. එයට බොහෝ විට ගොදුරු වනුයේ කුඩා වුන්ය. මේ අනුබල දෙනුයේ ඒවාටය.

කැමරාව ඉදිරියේ කුමක් සිදු වුවත් තිරය පිටුපස සිදුවන දේ ගැන දන්නේ සැඟවුණු න්‍යාය පත්‍ර ඇත්තවුන් පමණක්මය. කෙටි කලිසමකිනුත් හීන් පටි ඇති උඩුකය ඇඳුමකිනුත් සැරසුණු මල් කැකුළක් දෙස බලා හෝ රාගයේ සියුම් තත් පිරිමදින අයුරේ සරාගී ඉරියව්වලින් නිරූපණයේ යෙදෙන මල් කැකුළු දෙස බලා තම කාමාශාව රහසේම සංතෘප්ත කර ගන්නවුන්ට මෙවැනි ෆෙස්බුක් ගිණුම් හා පිටු තළු මරන්නට හැකි රජ බොජුනකි. වැඩුණු ගැහැනියක හා එක්වී ලබන සතුටටත් වඩා වැඩි සංතෘප්තියක් දෑස පිනවා ගැනීමෙන් පමණක් ඔවුහු ලබති.

මෙය උපක්‍රමිකව ලිංගික ගනුදෙනුවකට පොලඹවා ගැනීමකි. ගරුකටයුතු උපක්‍රම පාවිච්චි කිරීමකි. කැමරාවට මුවා වෙමින් ආශා සපුරා ගැනීමකි. එය මවුපියන්ට නොතේරීම ගැටලුවකි.

මෙවැනි දෑවලට කුඩා කල සිටම හුරුවන දරුවන් තුළ වර්ධනය වනුයේ ළමා මනසක ඇති සිතිවිලි නම් නොවේ. විකෘති සිතිවිලිය. ඒවා බොහෝ දුරට ළමා මනසට ඔරොත්තු නොදේ. ඒ හරහා ඇතිවන චර්යාමය වෙනස තුළ ඇතිවන බලපෑම සුළුපටු නම් නැත. මානසික වශයෙන් චරිතමය ලක්ෂණ වෙනස්ය. වයසට වඩා මුහුකුරා ගිය හැසිරීමක් පෙන්නුම් කරන්නේ අනාගතය පිළිබඳව සුබවාදී සලකුණු නොවේ.

පිළිගත් නීතිය තුළ අවුරුදු 16ට අඩු දරුවන්ගේ කැමැත්ත කැමැත්තක් ලෙස කිසිසේත්ම පිළිගනුයේ නැත. එම දරුවාගේ කැමැත්තෙන් හෝ ලිංගික ක්‍රියාකාරකමක යෙදෙන්නේ නම් එය වරදකි. එවන් පසුබිමක ජාතික ළමාරක්ෂක අධිකාරියේ සහකාර අධ්‍යක්ෂවරියක් යැවූ ලිපිය ප්‍රශ්නකාරී වනුයේ එබැවිනි. එහි කියැවෙනුයේ භාරකරුවන්ගේ අවසරයකින් තොරව අශ්ශීල ඡායාරූප පළ කිරීමක් සිදු වූ බව සනාථ වුවහොත් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවය.

ඉන් හැඟවෙනුයේ භාරකරුවන්ගේ කැමැත්තෙන් දරුවන්ගේ අශ්ශීල ඡායාරූප පළ කළ හැකි බවද යන්න කුකුසක් මතු වේ. ඒ කෙසේ වෙතත් සමාජය පිළිබඳව පූර්වාපර සන්ධි ගළපා තේරුම් ගත හැකි වයසක නොවන දරුවන්ගේ අඩ නිරුවත හෝ අශ්ශීල ඡායාරූප පළ කිරීමට මවුපියන්ට හෝ භාරකරුවන්ට අයිතියක් ඇත්තේ නැත. උන් ජීවිත කාලයේම දරුවන් සේ එකම වයසක සිටිනුයේ නැත. දිනෙන් දින වැඩෙමින් වැඩිහිටියන් බවට පත් වේ. ඔවුන්ද දිනෙක මවුපිය පදවි ලබනු ඇත. මවුපියන්ගේ අදූරදර්ශී නොමනා තීරණ නිසා අඳුරු ළමා කාලයක වගකීම මවුපියන්ගේ කර මත පටවා සුසුම් හෙළනු මිස අනාගතය වෙනස් කිරීමට ඔවුන්ට ශක්තියක් ඉතිරි නොවනු ඇත.

> තම කුඩා දියණියන්, නිරූපණ ශිල්පිනියන්ගේ වෙස් ගැන්වීමට දත කන සලෙළුන්ට බිලි දීමට තරම් මවුපියන් අඥාන වූයේ කෙසේද යන්න ගැටලුවකි. දියණියන් කැමරාව ඉදිරියේ අඩ නිරුවත් කොට, ඔවුන් දෑසින් නිරුවත් කොට බලන උන්ට ඇඟිල්ල දිගු කිරීම සාධාරණ නැත. මල් කැකුළු දෑස් ඉදිරියේ නිරුවතින් දකින්නට තරම් අනුබල දුන්නේ කැමරාව ඉදිරියේ දියණියන්ගේ අඩ නිරුවත පෙන්වීමට ඇති පරිසරය සකසා දුන් මවුපියන්මය.

දරුවන් සම්බන්ධයෙන් වගකිවයුතු ආයතනයක් හැසිරෙන්නේ මෙලෙස නම් නීතිය ක්‍රියාත්මක වීම ගැන කවර කතාදැයි විමසිය යුතුය. ළමාරක්ෂක අධිකාරියෙන් මෙහි පරීක්ෂණ පොලිසියට පවරාය. යෂ්ටිය අතකින් අතකට මාරු වූ පමණින් වගකීම ගිලිහෙනුයේ නැත. දරුවන් වෙනුවෙන් නැඟෙන හඬ දියට කැපූ ඉනි මෙන් නොවිය යුතුය. ඒ හඬ නිම් රාව දී නැඟෙනුයේ නීතියේ ශක්තිමත් දෑතින් එය සුරක්ෂිත වූ විටය.

දරුවන්ගේ ළමාකම වනසන දෙයට එරෙහිවන්න. කට වචන වඩාත් මුවහත් විය යුත්තේ ළමා හිංසනයක් දුටු විට දීය. ඊයේටත් වඩා එය අදට ඔබිනු ඇත. හෙට ලොව වඩාත් සුරක්ෂිතවනු නිසැකය.

**විශේෂ ස්තුතිය:**
**ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශක (ආයුර්වේද විශේෂ) මනෝ වෛද්‍ය කමල් එස්.ජයසේකර මහතාට**

■ **සචනි ශේෂාධි**

ළමා අපයෝජනයක් සම්බන්ධයෙන් ඔබට යම් සාධාරණ සැකයක් හෝ තොරතුරක් වේ නම් වහාම 1929 අංකයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට දැනුම්දී වගකිව යුතු පුරවැසියකුගේ යුතුකම ඉටු කරන්න.

රෝහණ විජේවීර ලියූ ලිපි... 04

## විධායක ජනාධිපති ක්‍රමයේ අනිටු ඵල විපාක අනාගත පරම්පරාවන්ට විඳීමට සිදුවනු ඒකාන්තය



# අසීමිත බලය අසීමිත දූෂණයට පාර කපනු ඇත

"ඇමෙරිකන් හමුදාවේ ඒකාබද්ධ අණදෙන නිලධාරි මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද "යුනයිටඩ් ස්ටේට් මිලිටරි ඕවර් රිව්‍යු" යුද්ධ සඟරාව සිය 1982 කලාපයේ 49 පිටුවේ අංක 1107 දරන සිතියම මඟින් ලංකාවේ ත්‍රිකුණාමලය වරාය ඇමෙරිකන් සන්නද්ධ හමුදාවන්ට පහසුකම් සපයන වරායක් ලෙස සලකුණු කර තිබේ. මෙය ඉතාමත් භයානක තත්ත්වයකි. එමඟින් යුද්ධයකදී මෙරට ඇමෙරිකන් විරෝධී ප්‍රහාරකයන්ගේ ඉලක්කය බවට පත් වනු ඇත.

ජේ.ආර්.ගේ යූ.එන්.පීය මේ වනවිට පස් අවුරුද්දක් රට පාලනය කර තිබේ. බලයට ඒම සඳහා ඔහු දුන් මැතිවරණ පොරොන්දු සියල්ල ඔහු විසින් කඩ කර ඇත. ඔහු සේවය කිරීමට බැඳී සිටින්නේ යැංකි අධිරාජ්‍යවාදය ප්‍රමුඛ විදේශීය අධිරාජ්‍යවාදයට සහ දේශීය ජාවාරම්කාරයන්ටය.

විදේශීය හා දේශීය ජාවාරම්කාරයන්ගේ අවශ්‍යතාවන් ඉටු කරමින් යූ.එන්.පීය ගෙනයන පොදුජන විරෝධී ක්‍රියාමාර්ග හේතුවෙන් ජනතාවට මහත් අසීරුකම්වලට මුහුණදීමට සිදුව ඇත. ජනතාව මෙතෙක් භුක්තිවිඳි අයිතිවාසිකම් එකින් එක ගෙවුණු වසර පහ තුළ උදුරා ගන්නා ලදී. රාජ්‍ය බලයත් මැර බලයත් යොදා ගෙන ජනතාවගේ සාධාරණ අරගලයන් මැඬ පවත්වනු ලැබීය. මෙතෙක් ශේෂ වී තිබූ සුබසාධක සහන සේවා එකින් එක කපා හරිනු ලැබිණි.

ලංකාව යැංකි අධිරාජ්‍යවාදයේ ආර්ථික, දේශපාලන, යුදමය වහල් කඳවුරක් බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු එකිනෙක සම්පාදනය කරමින් සිටී. යූ.එන්.පී.ය 1946 පිහිටුවනු ලැබුවේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ සහ විදේශීය

ජාවාරම්කාරී පෙළැන්තියේ අවශ්‍යතා ඉටු කිරීමට බව අපි නොයෙක් විට පැහැදිලි කර ඇත්තෙමු.

යූ.එන්.පී.ය පිහිටු වූ වකවානුව වනවිට ලෝකයේ බලගතුම අධිරාජ්‍යය වශයෙන් ඉංග්‍රීසි අධිරාජ්‍යයට හිමි වූ තැන මේ වනවිට අහෝසි වී ගොසිනි. දෙවැනි ලෝක මහා යුද්ධයෙන් පසු ඇමෙරිකානු අධිරාජ්‍යවාදය කරළියට පිවිස ඇත. අධිරාජ්‍යවාදයේ නායකයා බවට අලුතෙන් පත්වී සිටින ඇමෙරිකන් අධිරාජ්‍යවාදය මුලින්ම කළේ තමන්ට කලින් බලසම්පන්නව සිට දැන් දුර්වලව සිටින සෙසු අධිරාජ්‍යවාදීන් සතු සම්පත් එකිනෙක අත්පත් කර ගැනීමය.

ආසියාකරයේ අනෙකුත් අධිරාජ්‍යවාදීන්ට යටතේ වූ සම්පත් ළඟාකර ගැනීමේදී මුලින්ම ජපානය ඉත්තකු ලෙස යොදාගත්තේය. එසේ කළ නොහැකි තැන ඔවුන් විසින් කරන ලද්දේ වෙනත් උපාය මාර්ගයක් අනුගමනය කිරීමය. ඒ සඳහා ඇමෙරිකන් මධ්‍යම ඔත්තු සේවයේ සහාය ඇතිව එක් එක් රටවල පාලක පක්ෂ සහ කණ්ඩායම් තුළින් තමන්ට පක්ෂපාතී තමන්ට අවනත කණ්ඩායම් හා පුද්ගලයන් තෝරා සිය අවශ්‍යතාවන් සඳහා යොදා ගන්නා ලදී.

ලංකාවේ දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ ඒජන්තයන් බවට පත් කරගෙන සිටි සේනානායක පවුල අතහැර පළමුවැනි මුදල් ඇමැති ජේ.ආර්. ලංකාවේ තම ප්‍රධාන ගෝලයා බවට පත්කර ගැනීමට ඇමෙරිකාව සමත්විය. ජේ.ආර් බලයට පත් වූ මුල් දිනවලම කැලිෆෝනියාවට ගොස් ප්‍රසිද්ධියේම ඇමෙරිකන් අධිරාජ්‍යවාදය වැලඳගත්තේය. එවක් පටන් ලංකාව තුළ ඇමෙරිකන් අධිරාජ්‍යවාදී අවශ්‍යතාවන් නියෝජනය කරන්නා වූයේ ජේ.ආර්. ජයවර්ධනය.

ජේ.ආර් මුදල් අමාත්‍යාංශය යටතේ ප්‍රථමයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ගොඩනඟන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව ගොඩනැඟීමට උපදේශකයකු ගෙන්වීමේදී ඔහු කළේ ඇමෙරිකන් අධිරාජ්‍යවාදී නියෝජිතයකු වන ජෝන් ඇක්ස්ටර් ගෙන්වා ගැනීමය. ඇක්ස්ටර් - ජයවර්ධන හවුල විසින් මේ රටේ ඇමෙරිකන් අධිරාජ්‍යවාදී සැලසුම්වලට මුල් පදනම දමනු ලැබීය. එකල ජේ.ආර්. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී සමාගම් දෙකක් සමඟ තරග වැදීමට ඇමෙරිකානු තෙල් සමාගම් තුනක්ම ලංකාවට ගෙන්වීය.

ලංකාවේ පළමු පෙළේ ඇමෙරිකානු අධිරාජ්‍යවාදී හිතවතා වීමේ හේතුවෙන් පොදු ජනතාව විසින් ජේ.ආර්. හඳුන්වන ලද්දේ යැංකි ඩිකී නමිනි.

ඩඩ්ලි සේනානායකගේ ඇවෑමෙන් යැංකි ඩිකී බලයට පත්වීම දේශපාලනික වශයෙන් අධිරාජ්‍යවාදය ලද මහත් ජයග්‍රහණයකි. බලයට ඒමත් සමඟ ඔහු සිය හාම්පුතා වූ යැංකි අධිරාජ්‍යවාදයේ ආර්ථික, දේශපාලන හා යුදමය සියලු අවශ්‍යතා නොපිරිහෙළා ඉටු කිරීමේ කටයුත්තට අත ගැසීය.

පැරණි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කර ඇමෙරිකන් මාදිලියේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඔහු සම්මත කරගත්තේය. තමාත් ඇමෙරිකන් ජනපති මෙන් ජනාධිපති කෙනෙක් බවට පත්වීම ඔහුගේ අභිලාෂය විය. 1977දී තමා ලත් 5/6ක අසීමිත බලය යොදාගනිමින් සම්මත කරගත් විධායක ජනාධිපති ක්‍රමය විසින් ශ්‍රී ලංකාවේ එතෙක් පැවැති ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායයන් පුපුරවා හරින ලදී. විධායක ජනාධිපති ක්‍රමය විසින් අනාගතයේ රටට කරනු ලබන හානිය අපි දිගින් දිගට ජනතාවට පෙන්වා දුන්නෙමු.

අනෙකුත් දේශපාලන පක්ෂ සහ සාම්ප්‍රදායික වමේ පක්ෂ මේ අන්තරාය තේරුම් ගත්තේ පෙරහර ගියාට පසුවය. අනාගත පරම්පරාවන්ට විධායක ජනාධිපති ක්‍රමයේ අනිටු ඵල විපාක විඳීමට සිදුවනු ඒකාන්තය. අසීමිත බලය විසින් අසීමිත දූෂණයට පාර කැපෙන අතර යථාර්ථය තේරුම් ගන්නා, කරුණු වටහා ගන්නා, ජනතාව ඉදිරියට පැමිණීමෙන් තොරව ජේ.ආර්.ගේ ඒකාධිපති ව්‍යවස්ථාව පරාජය කළ නොහැකි වනු ඇත. ජේ.ආර්. ජයවර්ධන ලද ඊනියා ජනවරමින් මස්තකප්‍රාප්ත කරන ලද්දේ සකලවිධ ධනපති පන්තීන්ගේ අවශ්‍යතාව බව අමතක නොකළ යුතුය.

විධායක ජනාධිපති ජේ.ආර්. විසින් ප්‍රථමයෙන් කළේ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය අධිරාජ්‍යවාදීන්ගේ අවශ්‍යතාව අනුව අටවන්නට පටන් ගැනීමයි. ඇමෙරිකන් අධිරාජ්‍යවාදයේ පෙරදිග අග්‍රගණ්‍ය ගෝලයකු වූ සිංගප්පූරු අගමැති ලී ක්වාන් යූ අනුගමනය කරමින් මේ රටේ පොදු ජනතාවට පහර පිට පහර දෙමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය බිඳ දමනු ලැබීය. එතෙක් භුක්ති විඳි සහන සේවා හා සුබසාධක කපා දැමීය. ජනතා විරෝධතා, ව්‍යාපාර කුරිරු ලෙස ප්‍රචණ්ඩ ක්‍රියා මඟින් මැඬලනලදී. ඒ සඳහා රාජ්‍ය බලයත්, මැරවර බලයත් යොදා ගත්තේය.

විදේශීය ජාවාරම්කාරයන්ට හා ආයතනවලට රට උකස් කරමින් නව යටත් විජිතයක් බවට ලංකාව පෙරළීමට අත්‍යවශ්‍ය සියලු තත්ත්වයන් සම්පාදනය කළේය. අද ඇමෙරිකාවේ ප්‍රචාරක හොරණෑවක් වන "ඇමෙරිකන් හඬ" ගුවන් විදුලි සේවයට පුත්තලම දිස්ත්‍රික්කයේ ඉරණවිල

කිලෝවොට් 1,200ක බල ධාරිතාවක් සහිත බලසම්පන්න කෙටි තරංග සම්ප්‍රේෂණාගාර 6ක් ඉදිකිරීමට ජේ.ආර්. අවසර දී ඇත. එමඟින් ලොව පුරා ඇමෙරිකානු ප්‍රචාරක ජාලය ශක්තිමත් කර තිබේ.

යුදමය අතින් ඉතා වැදගත්කමකින් යුත් ත්‍රිකුණාමලය වරායේ අක්කර 2,500ක් ඇමෙරිකන් බහුජාතික සමාගමක් වූ සීමාසහිත කෝස්ටල් බර්මියුඩා කෝපරේෂන් සමාගමට පැවරීමට කුමන්ත්‍රණ දියත්කර ඇත. එහි ඇති අති විශාල තෙල් ගබඩා සංකීර්ණය දීර්ඝකාලීන බදු දීම සඳහා ද මේ වනවිට පිඹුරුපත් සකසමින් සිටී. ඒ පිළිබඳ සියලු සත්‍ය තොරතුරු ජනතාවගෙන් වසාගෙන සිටින අතර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවටද දැනුම් දී නැත.

ඇමෙරිකන් හමුදාවේ ඒකාබද්ධ අණදෙන නිලධාරි මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද "යුනයිටඩ් ස්ටේට් මිලිටරි ඕවර් රිව්‍යු" යුද්ධ සඟරාව සිය 1982 කලාපයේ 49 පිටුවේ අංක 1107 දරන සිතියම මඟින් ලංකාවේ ත්‍රිකුණාමලය වරාය ඇමෙරිකන් සන්නද්ධ හමුදාවන්ට පහසුකම් සපයන වරායක් ලෙස සලකුණු කර තිබේ. මෙය ඉතාමත් භයානක තත්ත්වයකි. එමඟින් යුද්ධයකදී මෙරට ඇමෙරිකන් විරෝධී ප්‍රහාරකයන්ට (න්‍යෂ්ටික ප්‍රහාරක ඇතුළුව) ඉලක්කය බවට පත්වීම අනාගතයේදී සිදු වනු ඇත. කෙසේ වුවද කලින් විදේශීය යුද නැව්වලට වසා තිබූ ත්‍රිකුණාමල වරාය මේ වනවිට විදේශීය යුද නැව් සඳහා විවෘත කර ඇත.

ලංකාව ඇමෙරිකන් මධ්‍යම චරපුරුෂ සේවයේ වැඩ කටයුතුවලට හොඳ තිප්පොළක් බවට පත්කර තිබෙන අතර ලංකාවේ අභ්‍යන්තර දේශපාලන කටයුතු පිළිබඳව විශේෂයෙන්ම වාම ව්‍යාපාර පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවා මඟින් එකතු කරන ලද තොරතුරු ඔවුන්ට ලබාදීමටද ඉඩ සලසා දී ඇත. ඇමෙරිකන් අධිරාජ්‍යවාදී හමුදාව පසුගිය වසර පහ තුළ කීප වරක්ම ලංකාවට ගොඩ බැස තිබෙන අතර විවේක ගැනීමට ලංකාව හොඳ තිප්පොළක් බවද ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇත. මේ සෑම කරුණකින්ම පෙනී යන්නේ අපේ රට ජේ.ආර්. විසින් ඇමෙරිකාවේ තිප්පොළක් බවට පත්කරමින් ඇති සැටිය.

■ උදේනි සමන් කුමාර





පටන් ගන්න සෞඛ්‍ය රක්ෂණය

ශ්‍රී ලංකාවේ හැටෙන් ඉහළ වැඩිහිටියන් සඳහාම සැලසුම් කළ සෞඛ්‍ය රක්ෂණය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙඩි සික්ස්ටි

මෙරට රක්ෂණ ඉතිහාසයේ අද්විතීය හඳුන්වාදීම

- වෛද්‍ය පරීක්ෂණ අවශ්‍ය නැත
- වාර්ෂිකව අලුත් කළ හැකිය
- රෝග රැසකට ආවරණය ලබා දෙයි

60 වසරක අභිමානය සමරන දේශාරක්ෂකයා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙතින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහාමයි

කොන්දේසි සහිතයි

Sri Lanka Insurance

www.srilankainsurance.com

ඔබත් අදම අපගේ මූල්‍ය උපදේශකවරයකු හෝ 0112 357 357 අමතන්න

SLIC ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පියෙකු මෙන් මවක මෙන්


C M Y K



# නොකා නොබී බිලුත් ගෙවනවා නම් දීපල්ලා අපට විදුලිය

විදුලිය සැපයීම තවදුරටත් අර්බුදයකට යමින් තිබීම නිසා රට තොටේ සෑම දෙනාගෙම කතාබහ පවතින්නේ "තියෙන ප්‍රශ්න මදිවට කළුවරෙත් ඉන්න වේවිද?" යන්නය. ඒ නිසාම ජනතාවගේ පැත්තෙන් ඔවුන් පෙළන විසඳුමක් තවමත් ඇතැයි නොසිතන තිත්ත කතාව හෙළිදරව් කිරීම අපගේ යුතුකමය.

මේ සටහන තබන මොහොත වන විට එනම් ජනවාරි 18දා වන විට තෙල් නොලැබුණහොත් 19දා සිට කළුවරේ සිටින්නට වන බව විදුලි ඉන්ජිනේරු සංගමය අනතුරු ඇඟවීම මෙම අර්බුදයේ බරපතළ බව දැනවීමේ සිදුවීමක් විය. ඒ අනුව අර්බුදය දිග් ගැහෙන බවක් පෙන්වයි. ජල විදුලියෙන් තවත් වැඩකරන්නට හැකි වන්නේ තවත් මාස 2ක් පමණක් බවත් අඹතලේ ජල පොම්පාගාරයට විදුලිය සැපයීම ඇනහිටියහොත් ජලය සැපයීමත් සිදුකළ නොහැකි වනු ඇති බව එම සංගමය අවධාරණය කළේය. ඒ අනුව 'අඳුරෙත් ඉඳගෙන වතුර ටිකක්වත් නැතිව ජනතාවට මැරෙන්නයි වෙන්නේ' යන කතා දසතින් ඇසෙයි.

විදුලිය උත්පාදනයේදී මේ තරම් කඩා වැටීමක්, මේ තරම් අපරික්ෂාකාරී පරිපාලනයක් ඇති වූයේ කෙසේ දැයි සොයා බලා කඩිනම් විසඳුම් සොයා බලනවා වෙනුවට දැනට පෙනෙන්නට තිබෙන සත්‍ය නම් "ඔක්කෝම කතා කර කර ඉන්නවා. අරහෙම වෙනවා මෙහෙමත් වෙන්න පුළුවන්, මෙච්චර කාලයක් යාවි"ය යන කතා මිස කිසිදු බලධාරියකුගේ නිශ්චිත වැඩපිළිවෙළක් නැති බැව් පෙනෙයි.

තෙල් ටික නැතිව රටක් දුවන්නට බැරි බව බොහෝ අයට මතක් වී තිබෙන්නේ අර්බුදය ගෙදර එළිපත්තටම පැමිණි පසු බැව්ද පෙනෙයි. දුගී පැල්පතේ අසරණ මිනිසුන්ගේ සිට මහ මැඳුරේ මැති ඇමැතිවරුන්ගේ සුපිරි මාලිගා තෙක් අර්බුදය පැමිණ තිබියදීත් තවමත් ඇසෙන්නේ ඒ ඒ පාර්ශ්වයන් ප්‍රශ්නය මුල් කරගෙන එල්ල කර ගන්නා වාග් ප්‍රහාර පමණක්දෝයි ජනතාවට සිතෙන තරමේය.

තෙල් භාර ඇමැති කියන්නේ "තෙල් නැව් දෙකක් මුහුදේ. අපටත් දැන් තෙල් නෑ. විදුලිබල මණ්ඩලේට මේ මොහොතේ තෙල් දුන්නොත් වාහනවලට දෙන්න තෙල් නැති වේවි. ඩොලර් දුන්නොත් තෙල් දෙනවා" කියලාය. එය බරපතළ ප්‍රකාශයකි.

තත්ත්වය එසේ නම් හෙට අනිද්දා විදුලිබල මණ්ඩලයට තියෙන තෙල් ටික දුන්නොත් පාරට බැහැලා ගමන් බිමන් යන්නට ත්‍රීවීලරයට, ස්කූටියට, සෙසු වාහනවලට තෙල් නැති වන්නේය. මහජනතාවගේ බොහෝ කටයුතු අක්‍රිය වන්නේය. රැකීරක්ෂා සඳහා යෑමට වන්නේ පයින්ය. එසේ නැතිනම් පාපැදියෙන්ය. ඒකවත් නැති එකාට මේ කරුමය කවදා හෝ විසඳෙන තෙක් දහදුක් විඳින්නට සිදුවන්නේය. එසේ නම් මේ ගතවන්නේ 'තෙල් නැතිව රට දුවවන්න බෑ"ය කියන අවස්ථාව නේදැයි ජනතාවට හොඳටෝම තේරුම් ගොස් අවසන්ය. ඩොලර් නැති නිසා ගෙන්වා ගත් තෙල් නැව් දෙකක් මුදාගන්නට බැරිය. "ඩොලර් දුන්නොත් එක තෙල් නැවක් හරි මුදා ගන්නවා" යැයි තෙල් ඇමැතිට කියන්නට සිදුවී ඇත. විදුලි ඇමැති බොහෝ කරුණු කාරණාවලදී නිහඬය.

ආණ්ඩුවක් ඇතුළේ ඉඳගෙනම තෙල් භාර ඇමැතිටත් විදුලිය භාර ඇමැතිටත් ඩොලර් ඉල්ලා කෑ මොර දෙන්නට සිදු වී ඇත. එළැඹෙමින් තිබෙන තත්ත්වය අනුව දවසකට පැය එකහමාරක් හෝ ඊට වැඩි වේලාවක් දිවයිනේ තැනින් තැන විදුලිය කප්පාදු කෙරෙන ඉඩකඩ තවදුරටත් වැඩිය. දැනටත් නොනිල වශයෙන් තැන තැන කපන වේලාවල් අනුව ඒ හැම "වැඩ කෙරෙන වෙලාවල්" වීම බරපතළය.

කර්මාන්තශාලා, කාර්යාල ඇතුළු එදිනෙදා රටේ පණ ගැහෙන්නට අත්‍යවශ්‍ය තැන් මේ අනුව අකර්මණ්‍ය වන්නේය. ඉතා පහත් අඩියකට වැටී තිබෙන රටේ නිෂ්පාදන ක්‍රියාවලිය මේ අනුව බරපතළ කඩා වැටීමකට ලක්විය හැකිය.

රටේ සැබෑම තත්ත්වයට අනුව විදුලිය උත්පාදනය කරන ගල්අඟුරු බලාගාරද හෙට අනිද්දා වන විට අක්‍රිය තත්ත්වයට පත්වන තැනකය. ගල්අඟුරු බලාගාර සඳහා වාර්ෂිකව ගල්අඟුරු නැව් 38ක් අවශ්‍ය වන නමුත් මේ වන විට මෙරටට ආනයනය කර තිබෙන්නේ නැව් 22ක් පමණය. එම ගල්අඟුරු තොගද ප්‍රමාණවත් වන්නේ සැප්තැම්බර් මාසය දක්වා පමණය. රට පුරා නිරීක්ෂණය කර බලද්දී පවතින කාලගුණ තත්ත්වය අනුව ජල විදුලිය නිෂ්පාදනයද ක්‍රමානුකූලව පහත වැටෙනු ඇතැයිද රන්ටැඹේ හා රන්දෙණිගල ජලාශවලින් ජල විදුලියට ලැබෙන ජලය 18දා සිට අඩුවෙමින් පැවැතීමද සැලකිය යුතුය. අප්‍රේල් සහ මැයි මාසය තෙක් වර්ෂාව නොලැබෙනු ඇති බවට විද්‍යාඥයන් පුරෝකථනය කර ඇත. ඒ අනුව ඉදිරියේදී 22%ක් නිපදවන ජල විදුලිය 5% දක්වා අඩු විය හැකිය.

**තත්ත්වය එසේ නම් හෙට අනිද්දා විදුලිබල මණ්ඩලයට තියෙන තෙල් ටිකත් දුන්නොත් පාරට බැහැලා ගමන් බිමන් යන්නටද ත්‍රීවීලරයට, ස්කූටියට, සෙසු වාහනවලට තෙල් නැති වන්නේය. මහජනතාවගේ බොහෝ කටයුතු අක්‍රිය වන්නේය. රැකීරක්ෂා සඳහා යෑමටද වන්නේ පයින්ය.**

විදුලිය නිපදවීමේ ගැටලුවට බරපතළ ලෙස මුහුණදී තිබියදී විදුලිබල මණ්ඩලය පරිපාලන වශයෙන්ද කඩා වට්ටගන්නා අර්බුදයක් නිර්මාණය කර ගනිමින් පැවැතීමද බරපතළ ප්‍රශ්නයකි. විදුලිබල මණ්ඩලයේ සම්ප්‍රදායට අනුව එහි සාමාන්‍යාධිකාරීවරයා පත් වන්නේ ජ්‍යෙෂ්ඨත්වය අනුවය. එහෙත් එහි සාමාන්‍යාධිකාරීවරයා ලෙස සම්පූර්ණයෙන්ම පිටස්තර අයකු පත් කිරීමත් සමඟ අර්බුදය හට ගෙන තිබේ. සභාපතිවරයායි, මණ්ඩලයයි, විදුලිබල ඇමැතිවරයයි මීට වගකිව යුතු බව රජයේ ප්‍රබල ඇමැතිවරුම චෝදනා කරන අතර එය තියෙන ප්‍රශ්නවලට අමතරව ආණ්ඩුව තුළ පරිපාලනය දුර්වල වීමෙන් හදාගත් ගැටලුවකි. මෙයාකාර අර්බුද මැදින් විදුලිබල මණ්ඩලයට තවත් කොතෙක් දුර යා හැකිදැයි විමසිය යුතුය.

තත්ත්වය මෙලෙස අර්බුදකාරී ඉසව් වෙත වේගයෙන් ගමන් කරද්දී රටට අත්‍යවශ්‍ය මොහොතක් ගෙන්වා තිබෙන දැනට මෙරට සමුද්‍ර තීරයේ නැංගුරම්ලා තිබෙන ඩීසල් නැව් දෙක මුදා ගන්නට ඩොලර් නැතිකම නිසා සිදුවන්නේ නම් තත්ත්වය බරපතළය. ඉන් එකක් හෝ මුදාගන්නට වෙර දැරිය යුතු තරමට තත්ත්වය ඉතා උණුසුම්ය.

තෙල් නැව් දෙක මුදා ගැනීම පමාවන දිනක් පාසා ඩොලර් නැති රටට දිනකට ඩොලර් 18,000ක් බැගින් ප්‍රමාද ගාස්තු ගෙවන්නටද සිදුවීම කනගාටුදායක තත්ත්වයකි.

අර්බුදය මෙසේ පෙළගැහෙද්දී වෘත්තීය සංගම්ද ජනතාවට සිදුවිය හැකි අපහසුතාව සලකා බලා ජනතාව වෘත්තීය සටන්වලට පෙළ ගස්වන තැනකය. ඒ අනුව එළැඹෙන 22දායින් පසු රට පුරා විදුලිය කප්පාදු කෙරෙන්නේ නම් ජනතාව තමන්ගේ වගකීම අතට ගෙන නීතිමය ක්‍රියාමාර්ගවලට එළැඹිය යුතු බවට වූ ප්‍රකාශයක් ලංකා විදුලි පොදු සේවක සංගමය පසුගියදා ප්‍රකාශ කර තිබුණේය. ඒ අනුව විදුලි බිල නියමිත දිනට පාරිභෝගිකයා විසින් ගෙවනු ලබන්නේ නම් මෙවන් අවස්ථාවකදී ජනතාවට නීතිමය පියවර ගත හැකි බවත් එම සංගමය පෙන්වා දී ඇත.

අර්බුදය හරි හැටි හඳුනාගන්නවා වෙනුවට විදුලිබල ඇමැති කියන්නේ අමුතු කතාවකි. ඔහුගේ කියමනට අනුව 22දා තෙක් ඉන්ධන ඇති බවත් ඉන් පසු ඉන්ධන නොලැබුණහොත් විදුලිය කප්පාදු කිරීමට සිදුවනු ඇති බවත් එසේ වුවහොත් කොරෝනාවලින් පසු රට වසන්නට සිදු වූ ලෙසින්ම අනිවාර්යයෙන් විදුලිය කප්පාදුවකට යෑමට සිදු වුවහොත් දෙවැනි වතාවටත් රට වසා දැමීමට සිදුවන බවත් කියැවේ.

බොහෝ අයට අමතක වූ කරුණු කාරණා කිහිපයක් ගැන රටට හිතැති විදුලි ඉන්ජිනේරුවන් පිරිසක් හඬ නඟමින් සිටීමද වැදගත්ය. එනම් සාම්පූර් බලාගාරය ඉදිනොවීමේ කතාවය. අද අප මුහුණ දෙමින් සිටින විදුලි අර්බුදයට එම බලාගාරයේ මේ වන විට ඉදිවී සක්‍රියව තිබුණේ නම් මුහුණදෙන්නට සිදු නොවන්නට තිබුණු බව කියැවේ. 2010 ඉන්දියාවෙන් ලැබුණු යෝජනාවකට අනුව ත්‍රිකුණාමලය සාම්පූර් ප්‍රදේශයේ බලාගාරයක් ඉදිකිරීමට යෝජනා විය. එක් පසෙකින් චීනයේ ක්‍රියාන්විතයක් ලෙස නොරොච්චෝලේ බලාගාරය ඉදිවෙමින් තිබුණු අතර ඉන්දියාව මුල්වී සාම්පූර් බලාගාරය ඉදිවූයේ නම් අපට මේ තරම් ගැටලු ඇති වන්නේ නැත. 2015 දී ඊට අදාළ ටෙන්ඩර් කැඳවීමට නියමිතව තිබුණු අතර ඊට පෙර දිනයේ එවක ජනාධිපති සිරිසේන හිතුමතේ ව්‍යාපෘතිය අවලංගු කළේය. එය ඉදිකිරීමට අවසර දුන්නේ නම් 2020 වෙද්දී එය අවසන් වීමටද තිබුණේය.

අපට ප්‍රමාණවත් තරම් මුදල් තිබේ නම් කෙටි කාලීන විසඳුමක් ලෙස ඩීසල් බලාගාර ගෙනැවිත් ඉන් විදුලිය නිපදවිය යුතුය. ඊට දිගුකාලීන හා ස්ථිර විසඳුමක්ද ඇත. අඩු වියදම් සහිත ප්‍රධාන ප්‍රවාහයේ බලාගාරද අවශ්‍යය. එහෙත් රට මේ මොහොත තෙක් එනතුරු බලා සිටි නිසාම කාට කාටත් අර්බුදයේ තරම දැන් වැටහී අවසන්ය. එහෙත් ඩොලර් ප්‍රශ්නයට හරි හැටි විසඳුමක් නැතිව සිඟමනේ යන තත්ත්වයක් තුළ සෙසු ප්‍රශ්නවලට කුමණ විසඳුම් දැයි කෙනකු විමසන්නට පුළුවන. බලාගාර ඉදිකිරීම හෝ වෙනත් විකල්ප වෙත යෑමට පෙර තියෙන බක්කක් රැක ගත යුතුය. එසේ නම් ජනතාවට කරුණු කියමින් කාලය අපතේ යවනවා වෙනුවට මැති ඇමැතිවරුන් හා සියලු නායක කාරකාදීන්ට තිබෙන්නේ අර්බුදයට සැබෑ විසඳුම් හෙවීමය.

නොවරදවාම, ටක්කෙටම හරි ගස්වා, වෙලාවට විදුලි බිල්පත සකසන්නත්, එය ගෙදරට එවන්නත් පොඩ්ඩ වැරදුණාම විදුලිය විසන්ධි කරන්නත් ශූර විදුලිබල මණ්ඩලයට මේ මොහොතේ රට කරවන්නන් අබිමුවට ගොස් ඇත්ත ඇති සැටියෙන් පවසා මීට කඩිනම් විසඳුම් සොයාගත යුතුය. බඩගින්නේ ඉඳ හෝ විදුලි බිල්පත ගෙවන ජනතාවට සාධාරණයක් කළ යුතුය. නැති නම් ඔවුන් පාරට බසිනු ඇත. ඒ කවුරුත් අඳුරේ ඉන්නට අකැමැති නිසාය. බැරි නිසාය.

■ **විජිත කේ. පතිරණ**

# ඩොලර් අහේනියෙන් ගිනි ගන්න රට හූරගෙන කන ගජ මිතුරෝ කවුද?

### ආනයනකරුවන්ට එල්සී අරින්න ඩොලර් නෑ

### ඩොලර් ධනපතියො කොටසක් රටේ ඉන්නවා

### වුවමනා බඩු ඒ ගොල්ල ගෙන්නනවා

### ආනයනකරුවන්ට වැඩි මිලට විකුණනවා

ශ්‍රී ලංකාව මුහුණ දී සිටින ඩොලර් අර්බුදය හමුවේ මෙතෙක් දකින්නට නොලැබුණු කළු ව්‍යාපාර රාශියක් මතු වී තිබේ. මේ දිනවල ව්‍යාපාරික ප්‍රජාව මුහුණදෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ ආනයනකරුවන්ට ණයවර ලිපි විවෘත කර ගැනීම සඳහා අවශ්‍ය ඩොලර් නැති වීමය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනෙකුත් බැංකු සඳහා ඩොලර් මුදාහරින්නේ ණයවර ලිපි පිළිබඳව පූර්ව පරීක්ෂාවකින් පසුය.

ණයවර ලිපියක් යනු ජාත්‍යන්තර වෙළෙඳාම මූල්‍යකරණයේදී භාවිත වන විශ්වාසදායි පිළිවෙතයි. භාණ්ඩ අපනයනය සඳහා කොන්ත්‍රාත් පාර්ශ්වවල විශ්වසනීයත්වය පහසුවෙන් තීරණය කළ නොහැකි විට බැංකුව මැදිහත් වීමෙන් ණයවර ලිපිය විශ්වාසවන්තභාවය තහවුරු කරයි. ඊට දිගු ඉතිහාසයක් තිබේ. වර්තමානයේ ලෝකය පුරා ආනයන අපනයන වෙළෙඳාම සිදුවන්නේ එල්. සී. හෙවත් ණයවර ලිපි මඟිනි.

වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණදී සිටින ඩොලර් අර්බුදය හමුවේ ශ්‍රී ලංකා මහ බැංකුව ඩොලර් නිදහස් කරන්නේ ආනයනය කරනු ලබන භාණ්ඩවල අත්‍යවශ්‍යතාව පිළිබඳව තීරණය කිරීමෙනි. එනිසාම ඩොලර් අර්බුදය නිසා වූ බරපතළ ගැටලු රාශියක් පැනනැඟී තිබේ.

ප්‍රශ්නයට විසඳුම හැටියට ඉදිරිපත් වූ අලුත්ම තත්ත්වය පළමු පෙළේ ව්‍යාපාරිකයන් භාණ්ඩ ආනයනය කරන්නන් වෙනුවෙන් ඉදිරිපත්ව තමන් විසින් අදාළ භාණ්ඩ සඳහා ණයවර ලිපි විවෘත කිරීමයි. එහිදී භාණ්ඩ ඇණවුම් කරන්නේ භාණ්ඩ ගෙන්වන ව්‍යාපාරිකයා නොව, ණයවර ලිපි නිකුත් කිරීම සඳහා ඩොලර් ස්වකීය සන්තකයේ ඇති ව්‍යාපාරිකයාය.

භාණ්ඩ ආනයනයේදී මෙම ඩොලර් යෙදවීම සිදු කෙරෙන්නේ විශේෂයෙන්ම අපනයනකරුවන්ගේ නිෂ්පාදන සඳහා ද්‍රව්‍ය ආනයනය කිරීමේදීය. අදාළ ද්‍රව්‍ය ආනයනය සිදු නොකරන්නේ නම් භාණ්ඩ නිෂ්පාදනය හා අපනයනය අඩාල වේ. ඒ නිසා අපනයනකරුවන් සඳහා විශේෂයෙන් එල්. සී. නිකුත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. ඒ සඳහා ඩොලර් අවශ්‍යය.

ඊනියා black market කාරයන්ට අවස්ථාව පෑදෙන්නේ එහිදීය. නිෂ්පාදකයන් අත ඩොලර් නැති විට ඔහු කළු ව්‍යාපාරිකයාගේ පිහිට පතති. ණයවර ලිපි විවෘත කිරීම, භාණ්ඩ සඳහා වන රේගු බදු ගෙවීම, ප්‍රවාහන ගාස්තු ආදී සියලු අමතර ගෙවීම් කරන්නේ ද ඔවුන් විසිනි. නියමිත භාණ්ඩ ආනයනය කෙරුණු පසු අපනයනකරු විසින් ඩොලර් ව්‍යාපාරිකයාට රුපියල්වලින් මුදල් ගෙවිය යුතු අතර දළ වශයෙන් මෙය ඔවුන් යෙදවූ ඩොලරයකට රුපියල් 280ක් පමණ වේ.

මෙම ගනුදෙනු සිදු කෙරෙන්නේ ව්‍යාපාරිකයන් විසින් ඒ සඳහා පිහිටුවාගත් අතිරේක සමාගම මඟිනි. එම ඉපැයීම් ආදායම් බදු සීමාවන්ට ඇතුළත් නොවන සේ පවත්වා ගැනීමටද එම සමාගම් වගබලා ගනියි. මෙම ව්‍යාපාරයේ සාමාන්‍ය දළ ලාභය සියයට 60ක් පමණ වනු ඇත.



මෙම කළු ව්‍යාපාරයන්හි පැහැදිලිව නොපෙනෙන අඳුරු පැති රාශියක් තිබේ. අපනයනකරුවන් උපයා ගන්නා මුදල් ප්‍රමාණයන්ගෙන් සියයට 6 හෝ 7ක් විදේශ බැංකුවල තැන්පත් කිරීමට පුරුදුව සිටියි. අපනයන ආදායම නිසියාකාරව වාර්තා නොවීම නිසා ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට එම 6% හා හෝ 7 අඩංගු නොවේ.

මේ වන විට කුප්‍රකට ව්‍යාපාරිකයන් කිහිපදෙනෙක් ඒ සඳහා ආධිපත්‍ය පතුරුවාගෙන සිටිති. ඔවුහු තමන් විසින් ණයවර ලිපි ඇණවුම් කර භාණ්ඩ ගෙන්වා ඩොලර් එකක් සඳහා රුපියල් 240 - 250 ආදී වශයෙන් අධික පොලියක් අයකර ගනිති. පවතින මූල්‍ය අර්බුදය දඩමීමා කරගනිමින් මෙම පිරිස බිලියන ගණන් ආදායම උපයන බව වාර්තා වේ. දේශපාලනික වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගජ මිතුරන් වන මෙම ව්‍යාපාරිකයන් සම්බන්ධයෙන් මහ බැංකුව අනුගමනය කරන්නේ දෑස් අන්ධ වූ පිළිවෙතකි.

එක පැත්තකින් කළු සල්ලි හිමි කූට ව්‍යාපාරිකයන්ට ආනයනකරුවන් සූරා කෑමට ඉඩ ලැබී තිබෙන අතර අනෙක් පැත්තෙන් භාණ්ඩාගාරයට අයත් විශාල ඩොලර් ප්‍රමාණයක් ඊට අහිමි වෙයි. පෞද්ගලික අංශයට අත දෙනවා නම් රජය කළ යුත්තේ ගෙන්වනු ලබන භාණ්ඩවල අවශ්‍යතාව පිළිබඳව නිසි ඇගැයීමක් කිරීමෙන් පසු ආනයනය සඳහා ණයවර ලිපි නිකුත් කිරීමට අවශ්‍ය ඩොලර් ප්‍රමාණය නිදහස් කිරීමය. ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත්ව එය අතපසු කරමින් සිටින අතර අතරමැද කළු සල්ලි හිමියන්ට ආනයනකරුවන් සූරා කෑමට ඉඩදී බලා සිටී.

කල් පිරුණු ස්වෛරී බැඳුම්කර සඳහා වසරේ මුල් කාර්තුව වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ ඇමෙරිකන් ඩොලර් මිලියන 500 ගෙවා දැමූ බව ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් උජාරුවෙන් පැවැසීය. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඖෂධ ඇතුළු භාණ්ඩ සහිත කන්ටේනර් 1600ක් පමණ මුදා ගත නොහැකිව කොළඹ වරායේ සිරවී තිබේ. ඊට හේතුව ණයවර ලිපි සඳහා අවශ්‍ය ඩොලර් මහා භාණ්ඩාගාරයෙන් නිකුත් නොවීමය.

ගෙවුණු වසර අවසාන වන විට ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පැවැති විනිමය සංචිත ඇ. ඩො. බිලියන 1.6 කි. ඇමෙරිකාවෙන් සහ චීනයෙන් අතමාරු ලැබුණද මූල්‍ය අර්බුදය සමහන් වී නැත. ආර්ථික විශේෂඥයන්ගේ පුරෝකථන නොතකා හරිමින් මේ අවස්ථාවේ ස්වෛරී බැඳුම්කර ගෙවා දැමීමට මහ බැංකුව තීරණය කළේ මන්ද යන්නද ප්‍රශ්නයකි.

එය ප්‍රශ්නයක් වන්නේ ස්වෛරී බැඳුම්කර සඳහා ගෙවීම් කළේ කාටද යන්න රටට හෙළිදරව් නොවීමය. ගෙවනු ලැබූ ඇමෙරිකන් ඩොලර් මිලියන 500න් ඩොලර් මිලියන 117ක්ම දේශීය බැංකු සහ දේශීය ව්‍යාපාරිකයන්ට ගෙවා ඇති බව මාධ්‍ය වාර්තා කළේය. ආණ්ඩුව එවැනි තදියමකින් මුදල් ගෙවීම් කළේ කාටද යන්න මේ දක්වා හෙළි කර නැත.

කෘත්‍රිමව ස්ථාවර අනුපාතයක් පවත්වාගෙන යෑමට රටේ මහ බැංකුවෙන් ලැබෙන උපදෙස් විසින් සමාන්තර කළු වෙළෙඳපොළක් මතුවී ඇති අතර ව්‍යාපාරික ප්‍රජාව මුදල් සොයා ගැනීම සඳහා දැඩි අරගලයක නිරත වී සිටී. ඊට අමතරව විදේශ මුදල් ඉපැයීම් ශ්‍රී ලංකා රුපියල් බවට අනිවාර්යෙන් පරිවර්තනය කිරීම රට මුදල් හා ආර්ථික අර්බුදයක් කරා වේගයෙන් ගමන් කිරීමටද හේතු වී තිබේ.

ආණ්ඩුව සිටින්නේ වසරකට සාමාන්‍යයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 4.5ක විදේශ ණය පියවීම අනිවාර්ය වූ පදනමකය. සියල්ල තීරණය වන්නේ එම කටුක යථාර්ථය මතය. ආර්ථික අර්බුදය සමහන් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව විදේශ හා ආර්ථික ආධාර ප්‍රාර්ථනය කරන්නේ කේවල් කිරීමේ ශක්‍යතාවක් නැති දුර්වල තත්ත්වයක සිටය.

මෙහි පවතින භයානක අඳුරු පැත්ත නම් ඩොලර් හිඟය දඩමීමා කරගනිමින් රජයට සම්බන්ධ ඇතැම් ව්‍යාපාරිකයන් භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය ඩොලර් වැඩි මිලට රහසින් සැපයීමයි. එමඟින් බිලියන ගණන් විනිමය උපයා ගන්නේ සැඟවුණු රාජ්‍ය අනුග්‍රහය ඇතිව ද යන සැකය මතුවේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් පවසන්නේ වසරකට ඩොලර් කෝටි 100 - 200 අතර මුදලක් උණ්ඩියල් හා හවාලා ක්‍රමවේද යටතේ නීති විරෝධී අන්දමින් හුවමාරු වන බවය. විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සහ සෙසු පිරිස් මෙරටට විදේශ මුදල් එවීමේදී මෙවැනි හුවමාරු ක්‍රම භාවිතයට ගන්නා බවට තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව සතු බව ඔහු පවසා තිබේ.

වසරකට ශ්‍රී ලංකාවේ විදෙස් මුදල් හුවමාරුව ඇමෙරිකන් ඩොලර් කෝටි 6000 කි. (ඩොලර් බිලියන 60කි.) නීත්‍යනුකූල නොවන මාර්ග ඔස්සේ සිදු කෙරෙන මුදල් ඊට අයත් නොවේ. එවැනි තත්ත්වයක් යටතේ මහ බැංකු අපේක්ෂා කරන අන්දමට විදේශීය ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවට ඩොලර් පොම්ප කරතැයි මහ බැංකුව සිතන්නේ නම් එය මුළාවකි.

වලංගු නොවන ක්‍රමවේද අනුව ඩොලර් එකක් සඳහා රුපියල් 240 සිට 250 අතර මුදලක් ගෙවන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය අනුපාත පවත්වා ගනුයේ ඩොලරයකට රුපියල් 200 මට්ටමටය. ඊට අමතරව රුපියල් 10ක අතිරේක මුදලක් ගෙවීමට මහ බැංකුව සියලුම බැංකුවලට උපදෙස් දී ඇත. විවෘත මූල්‍ය වෙළෙඳපොළේ ඇමෙරිකන් ඩොලර් 1ක් රුපියල් 240 - 250ට අලෙවි වෙද්දී ආණ්ඩුව 210ක් දික් කළාට ඩොලර් ගලා එන්නේ නැත.



**ඩොලර් කළු කඩෙන් ගරන ලාබෙත් දේශපාලකයන්ගේ සාක්කුවට**

■ **උදේනි සමන් කුමාර**

# පරිසර දූෂණයට තිත තබන සේදුම්කාරක දියර නැවත පුරවන ස්වයංක්‍රිය යන්ත්‍රයක්





නිර්මාණ කණ්ඩායමේ සාමාජිකයන් එල්. ශාන් මාෂ්, බුද්ධික ද සිල්වා, මෙරිල් ද සිල්වා, මල්ක මධුෂාන්

එදිනෙදා ජන ජීවිතයේදී මිනිසා අවශ්‍යතා සඳහා විවිධ සේදුම්කාරක දියර භාවිත කරනු ලබයි. ඒ අතරින් බඳුන් සේදුම් සේදුම්කාරක, රෙදි සේදුම්කාරක, අත් සේදුම්කාරක දියර ආදිය අප නිතර භාවිතයට ගනු ලබයි. මෙසේ භාවිත කරන සේදුම්කාරක භාවිත කර අවසන් වූ පසු අප නැවත බෝතලයක් මිලදී ගනු ලබයි. එවිට භාවිත කර අවසන් වූ බෝතලය සාමාන්‍යයෙන් අප ඉවතලීම සිදුකරයි.

මෙසේ නැවත සේදුම්කාරක බෝතලයක් මිලදී ගැනීමේදී පාරිභෝගිකයාට නැවත ප්ලාස්ටික් බෝතලයකට මුදල් ගෙවීමට ද සිදුවේ.

සාමාන්‍යයෙන් ප්ලාස්ටික් බෝතලයක් කිහිපවතාවක්ම භාවිතයට ගත හැකි වුවද වරක් භාවිත කර හිස් වූ ප්ලාස්ටික් බෝතලය ඉවතලීම මඟින් ප්ලාස්ටික් පරිභෝජනය වැඩි වීමද සිදුවේ.

අප වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල ප්ලාස්ටික් බැහැරලීම විධිමත් මට්ටමකින් සිදු නොවීම නිසා අද වන විට ප්ලාස්ටික් බෝතල් මඟින් දැඩි පරිසර හානියක් සිදුවී ඇත.

අප කණ්ඩායම ඒ සඳහා කළ නිර්මාණය වනුයේ ස්වයං සේවා සේදුම්කාරක දියර නැවත පිරවීම යන්ත්‍රයයි. (self-service washing liquid refilling machine)

මෙම නිර්මාණය මඟින් පාරිභෝගිකයාට තනිවම ඔහුට අවශ්‍ය සේදුම්කාරක ද්‍රව්‍ය තෝරා, අවශ්‍ය ප්‍රමාණය තෝරා ගෙන hela pay ඩිජිටල් ක්‍රමය මඟින් මුදල් ගෙවා, සේදුම්කාරක ද්‍රව්‍යය විනාඩියකටත් අඩු කාලයකින් නැවත පිරවීම සිදුකරගත හැකිය. එමෙන්ම පාරිභෝගිකයාට අවශ්‍ය නම් ඒ සඳහා රිසිට් පතක් ද ලබාගත හැකිය.

දැනට අප කණ්ඩායම මඟින් මෙය සංකල්පමය ආකෘති නිර්මාණයක් (concept model design) ලෙස නිර්මාණය කර ඇති අතර මෙම නිර්මාණය සඳහා පේටන් බලපත්‍ර ඉල්ලුම් කර ඇත.

ඇත්තෙන්ම, අප මෙම නිර්මාණ සිදු කිරීමට මූලික හේතුව වූයේ, අප කණ්ඩායම මුලදී සිදු කරනු ලැබුවේ සේදුම්කාරක දියර අලෙවි කිරීමයි.

එම වෙළෙඳාම පුළුල් කිරීමත් සමඟ පාරිභෝගිකයන් අපගේ නිෂ්පාදන මිලදී ගෙන එම දියර අවසන් වූ පසු හිස් ප්ලාස්ටික් බෝතල් අවිධිමත් ආකාරයෙන් පරිසරයට බැහැර කිරීමය. දිගින් දිගටම මෙම දර්ශනය දුටු අප හට එය සිතෙහි දැඩි කනස්සල්ලක් ඇති වූ අතර ඒ සඳහා තාක්ෂණික නිර්මාණයක් කිරීමේ අවශ්‍යතාව දුටුවා.

ඒ අනුව වසරකට වැඩි කාලයක අත්හදා බැලීම්වල ප්‍රතිඵලයක් ලෙස අප හට මෙම නිර්මාණය සාර්ථකව සිදු කිරීමට හැකි වූවා.

අපගේ මෙම නිර්මාණය තවදුරටත් වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වන අතර ශ්‍රී ලාංකික ජනතාවට ඉතා ඉක්මනින් ගෙන ඒමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා එකතු වීමට කැමැති සියලු දෙනාට ආරාධනා කරන අතර ප්ලාස්ටික් බෝතල් නැවත පරිභෝජනයට ගෙන ප්ලාස්ටික් බෝතල් පරිභෝජනය අවම කර සුන්දර ශ්‍රී ලංකාවක් ගොඩනැඟීමට ඔබත් අප සමඟ එකතුවන්න.

■ පාලිත සේනාරත්න

## 07 >> අඩුපාඩු ඇති අය...

මෙසේ රියැදුරු බලපත්‍රය ලබන සියලුදෙනා අනුගමනය කළයුතු තවත් රීතියක් සම්බන්ධවද ජාතික ප්‍රවාහන වෛද්‍ය අධිකාරියේ සභාපතිවරයා මතක් කළේය.

"අපි ඔවුන්ට සුවිශේෂී ලාංඡනයක් ලබාදෙනවා. මේ ලාංඡනය ඔවුන් තමන් පදින වාහනයේ ඉදිරිපස හා පසුපස ප්‍රදර්ශනය කළ යුතුයි. එහෙම වුණාම අනිත් රියැදුරු මහත්තුරු දන්නවා ඒ වාහනය පදවන්නේ ආබාධිත කෙනෙක් කියලා."

මීට පෙර අවස්ථාවලදී රියැදුරු බලපත්‍ර ලබාගැනීමේදී තිබූ තවත් බාධකයක් වූයේ වයස්ගත තත්ත්වය. බොහෝදෙනා විශ්‍රාම ගැනීමෙන් පසුව තමන්ට රියැදුරු බලපත්‍රයක් ලබාගැනීම අපහසු විය හැකි යැයි සිතා සිටි අවස්ථාද එමටය. එහෙත් දැන් ඒ සඳහාත් සහනදායි වාතාවරණයක් සකස් වී ඇත.

"වයස අවුරුදු 75 පැන්නුවත් අපිට ගැටලුවක් නැහැ. අයැදුම් කළ අයට රියැදුරු බලපත්‍රය ලබාදෙන්න අපි ක්‍රියා කරනවා. අවුරුදු 75 පැනපු අයට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න හොඳ නම් සාමාන්‍ය පුද්ගලයකුට රියැදුරු බලපත්‍රය ගන්න ඇති බාධාව මොකක්ද?" සභාපතිවරයා සිනාසෙමින් කීවේය.

"මම කියන්නේ මෙච්චරයි. අපි අද ආබාධිත අයටත් රියැදුරු බලපත්‍රය ලබාදෙන්න කටයුතු කරනවා නම් ඒ අයට සුදුසු වාහන ලෝකයේ නිෂ්පාදනය වෙනවා නම් මොකක්ද තිබෙන ප්‍රශ්නය.

මහ පාරට වාහනයක් දමන නිරෝගිම පුද්ගලයන් කියන අයගෙනුත් අද මහා දරුණු රිය අනතුරු වෙනවා.

අද වෙද්දි දවසකට 8 දෙනෙක් වාහන අනතුරුවලින් මහ මඟ මිය යනවා. 80 දෙනෙක් පමණ තුවාල වෙනවා. ඒ ප්‍රමාණය පොඩි ප්‍රමාණයක් නෙවෙයි. තිස් අවුරුදු යුද්ධයෙන් මියගිය සේරම ගණන විසි නවදහස් ගණනක්. මේ විදිහට මහ මඟ අනතුරුවලින් මැරෙන විදිහට බැලුවොත් 30 අවුරුද්දකදී තිස්දාහක් මිය යනවා.

ඉතින් එහෙම බලද්දී යුද්දෙදි මැරුණු පිරිසට වඩා මහ මඟදී මිනිස්සු මැරෙනවා. ඒ නිසා මේ තත්ත්වයට හැම තරාතිරමකම රියයැදුරු මහත්තුරු වගකිව යුතුයි. මහ මාර්ගයේදී වාහනය පදවන විට සැලකිලිමත් විය යුතුයි. ඒක මොන තරාතිරමේ කෙනකුට වුණත් වලංගුයි."


# උකසට තබා බේරා ගැනීමට නොහැකිවූ

# ඔබේ රන් භාණ්ඩ නැවතත් ඔබේ අතටම

ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න

## වැඩි විස්තර සඳහා අමතන්න

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | වැල්ලවත්ත | 0710 870 686 |
| මොරටුව | 0766 227 059 | කළුතර | 0776 167 149 |
| මීගමුව | 0766 227 056 | ගම්පහ | 0779 230 549 |
| වෙන්නප්පුව | 0710 869 378 | හලාවත | 0779 256 191 |
| ගාල්ල | 0705 979 274 | මාතර | 0705 979 237 |
| කුරුණෑගල | 0766 227 061 | ගම්පොල | 0710 870 735 |
| දිගන | 0778 156 738 | නාවලපිටිය | 0710 870 706 |
| තලවකැලේ | 0710 871 009 | හැටන් | 0778 790 372 |
| මාතලේ | 0702 539 389 | කෑගල්ල | 0703 583 363 |
| බේරුවල | 0772 999 934 | පූඬළුඔය | 0777 683 889 |
| මතුගම | 0772 206 413 | රාගල | 0710 870 703 |
| වව්නියාව | 0740 920 313 | උඩප්පුව | 0771 201 851 |
| මොණරාගල | 0771 201 852 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| බදුල්ල | 0771 201 863 | පුත්තලම | 0771 201 861 |
| කොටහේන | 0702 539 382 | මහියංගනය | 0771 201 862 |
| කල්පිටිය | 0761 605 803 | මස්කෙලිය | 0760 909 822 |
| කටුගස්තොට | 0779 476 206 | පානදුර | 0776 157 119 |
| නාඋල | 0763 226 230 | | |

F.A.Ads


# නිරෝගී සිරුරක්, සුවපත් මනසක් කැන්ගන් ජලය පානය මගින් ලබාගන්න

**විශ්මිත වතුරක් 8වන කොටස**

නිරෝගීව සිටීමට අවශ්‍ය නම් සැමදාම පානය කළයුතු හොඳම වතුර කැන්ගන් වතුරයි.

**කැන්ගන් වතුර සුවිශේෂී වන්නේ ඇයි ?**

1. ප්‍රතිඔක්සිකාරක ඉතා බහුල වීම - (ORP අගය - 300mV සහ - 850mV අතර වේ.) Kangen Water හි Green tea මෙන් 6 ගුණයක් හෝ 8 ගුණයක් පමණ ප්‍රති ඔක්සිකාරක (Anti-Oxidants) අඩංගු වේ. එමගින් අප වයස් ගත වීමේ හා දිරාපත් වීමේ ක්‍රියාවලියේ වේගය අඩු කරන අතර පිළිකාව, හෘද රෝග, පාර්කින්සන් රෝගය, ඇල්සයිමර් රෝගය, හන්දි රෝග යනාදිය සෑදීමට මුල්වන මුක්ත ඛණ්ඩක(Free Radicals) උදාසීන කරයි.
2. ඉතා ක්ෂුද්‍ර අංශුමය ස්වභාවය - (Micro Clustered - ශරීරයට ඉතා ඉක්මනින් උරා ගනී) Kangen Water හි ඉතා ක්ෂුද්‍ර ජල අංශු අඩංගු වන අතර එමගින් ශරීරයේ විජලනය හොඳින් වළක්වයි. එය අනෙක් පානීය වතුර වලටත් වඩා හොඳින් විජලනය වළක්වයි.
3. තරමක් භාෂ්මික වීම - (ආම්ලික තත්වයේ පවතින රුධිරය නැවතත් නිරෝගී වීම සඳහා අවශ්‍ය වන තරමක් භාෂ්මික තත්වයට හෙවත් pH 7.3 - 7.4 අතරට ගෙන ඒම) Kangen Water පානය කළ විට ආම්ලිකව ඇති ඔබගේ ශරීරය තරමක් භාෂ්මික තත්වයට පත් කරයි. එවිට රුධිර සෛල හොඳින් ක්‍රියාකාරිත්වය ඇති කරන අතර පිළිකාව වැනි පිරිහෙනසුළු රෝග (බෝ නොවන රෝග) සෑදීම වළක්වයි.

www.kangencarepoint.lk

'කැන්ගන් ජලය' නිශ්පාදනය කරනු ලබන්නේ මෙම ' ලෙවලුක් ' වර්ගයේ යන්ත්‍ර මගින්ම පමණයි. (වෙනත් අනුකරණ වලට රැවටෙන්න එපා)




වරකාපොළ ප්‍රදේශයේ ආර්. ජයසේකර මහතා සහ කුසුමා හේරත් යුවළ රාජ්‍ය සේවයේ නියුතුව සිට විශ්‍රාමිකව කල්ගෙවන දෙදෙනෙකි.

මේ දෙදෙනාම විවිධ වු රෝගවලින් පෙලුනෝ වෙති. ජයසේකර මහතා දියවැඩියාව, කොලෙස්ටරෝල්, අධිරුධිර පීඩනය වැළඳීම නිසා ඉතා අපහසුවෙන් කල්ගෙවන අතර කුසුමා මහත්මිය ද දියවැඩියාව, ආතරයිටිස් හා නිතර ඇඟපත රිදීම, නින්ද නොයාම වැනි රෝග ාබාධ වලින් පෙළෙන්නියක්ව සිටියේය. දසවසරකට අධික කාලයක සිට නොකඩවා මේ දෙදෙනාම බටහිර වෙදකම සහ වෙනත් අය හොඳ යයි ප්‍රකාශ කරන සිංහල වෙදැදුරන්ගෙන් බෙහෙත් ලබාගනිමින් සිටි අතර පැහැදිලි සුවයක් නොලැබූ බවයි උපාධිධාරී ගුරු මහත්මියකු වන ඔවුන්ගේ දියණිය අපට පැවසුවේ.

පුවත්පත් මගින් කැන්ගන් පානීය ජල ප්‍රතිකාර ක්‍රමවේදය සහ ඩී.එන්.ඒ. ස්කෑන් කර රෝග හඳුනාගැනීමත් එමඟින් සුව කිරීමේ ක්‍රමවේදයත් පිළිබඳ දැනගත්ත ද 'පුවත්පතක පළවන සියල්ල සත්‍ය නොවේ' යන සිතුවිල්ල ඇති වීම නිසා ඒ පිළිබඳ එතරම් උනන්දුවක් දක්වා නොමැත.

ඔවුන්ගේ දියණිය අපට පැවසුවේ... ''මගේ අම්මායි, තාත්තායි ගැන මට ගෙඩාක් දුකයි. එයාලට එක අසනීපයක් අඩු වෙනකොට තව එකක් මතු වෙනවා. වෛද්‍යවරු පවසන්නේ මෙයලාගේ වයස වැඩි නිසා මේ රෝග නිට්ටාවට සුවකරන්න අමාරුය කියල මේ බෙහෙත් දිගටම බොන්න දෙන්න කියලයි. මට ඕනි මේ දෙන්නා ඉක්මණින් සනීප කරගන්න. කැන්ගන් පානීය ජල ප්‍රතිකාරයත් ඩී.එන්.ඒ. ස්කෑන් ප්‍රතිකාර ක්‍රමයත් වෙනස්ම ප්‍රතිකාර ක්‍රමයන් නිසා මට හිතුණා එක සැරයක් උත්සාහ කරලා බලන්න. මම අම්මා, තාත්තා එක්කත් කථා කළා. ඇත්තටම වැඩි විශ්වාසයක් ඇති වුණේ නැ. එහෙත් අප තීරණය කළා එක සැරයක් ප්‍රතිකාර කරලා බලමු කියලා.

දෙතුන් පාරක් උත්සාහ කරලා වෛද්‍ය ගුණරත්න මහතා සම්බන්ධ කරගත්තා. එතුමා කිව්වා කැන්ගන් ජලය සති දෙකක් විතර පාවිච්චි කරලා ඉන්පසු දිනයක් වේලාවක් ඉල්ලාගන්න කියලා. අපි එසේ වෙලාවක් වෙන් කරගෙන එදිනට මාතර රාහුල හරස් පාරේ වෛද්‍ය ගුණරත්න මහතාගේ නිවසට යන විටත් තව කණ්ඩායමක් ජලය සහ ප්‍රතිකාර ලබාගෙන පිටවෙමිනුයි සිටියේ.

වෛද්‍ය ගුණරත්න මහතා සමග අපි කථා බහ කළා. එතුමා බොහෝම කරුණික අයෙක් බව අපට වැටහුණා. අපි මුලින්ම අම්මායි, තාත්තායි දෙන්නාම ඩී.එන්.ඒ. පරීක්ෂණයට යොමු කළා. අපිට හිතාගන්නත් බැරි විදිහට මේ දෙන්නාගේ අසනීප තත්වයන් ඩී.එන්.ඒ. ස්කෑන් කිරීමෙන් හඳුනාගන්නට හැකි වුණා. අම්මාගේ ඇසක සුද මතුවෙමින් පවතින බවත් ග්ලූකොමා තත්වයකුත් හටගෙන තිබෙන බවත් අප එතෙක් දැනසිටියේ නෑ. ඒ වගේම තාත්තාගේ හෘදයේ නාලිකා දෙකක් අවහිර වෙමින් පවතින බවත් ඒවෙලේ දැනගන්නට ලැබුණා. වෛද්‍ය ගුණරත්න මහතා පැවසුවේ බියවන්න එපා මේ දෙන්නාව දැන් මම සුවපත් කරනවා, ඊට පස්සේ දිගටම මම කියලා දෙන පිළිවෙලට මේ දෙන්නාටම කැන්ගන් ජලය පමණක් බීමට ලබා දෙන්න කියලයි.

එවලේම ඩී.එන්.ඒ. ස්කෑන් යන්ත්‍රය මගින් සුවකිරීමේ ක්‍රමවේදයක් කළා. ඇත්තටම අපිට පුදුමයි. ඒවගේම ගොඩාක් සතුටුයි. පැහැදිලි සුවයක් මේ දෙන්නාටම ඒවෙලේම ලැබුණා. අම්මාගේ ඇසේ ග්ලූකොමා ගතියයි ඇසේ සුද තත්වයයි ඉවත් කළා. තාත්තාගේ හෘද නාලිකා අවහිර වීමත් හැදුවා. ඊටපස්සේ කැන්ගන් ජලය ප්‍රමාණයක් එදින රැගෙන ආවා. කුලියාපිටියේ සහ නුවර ප්‍රදේශයෙත් කැන්ගන් යන්ත්‍ර ඇති අයගේ දුරකථන අංක අපට ලබා දුන්නේ කොහොමහරි සති 3-4 ක් එකදිගට කැන්ගන් ජලය බීමට ලබා දී නැවතත් ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණයක් කර සුවපත් වීම පිළිබඳ නැවත දැනගන්නා ලෙසයි. ඒ දිනවල සංචරණ සීමා නිසා ජලය ලබාගැනීම දුෂ්කර වුණා. එහෙත් මම කොහොමහරි දිගටම කැන්ගන් ජලය වෛද්‍යතුමා කියාදුන් පිළිවෙළට අම්මාටයි, තාත්තාටයි ලබා දුන්නා.

දිනෙන් දින මේ දෙදෙනා සුවපත් වෙනවා. මට හරි සතුටුයි. අපි කැන්ගන් ජල ප්‍රතිකාරය පිළිබඳව මුලින්ම දැනගත්ත අවධියේ ගියානම් තවත් හොඳයි කියලා දැන් අපිට හිතෙනවා. දැන් මගේ හිතත් නිදහස්. රටේ පැවතුන තත්ත්වය නිසා අපට තවමත් ඩී.එන්.ඒ. ස්කෑන් දෙවන පරීක්ෂණයට යාමට සහ කැන්ගන් යන්ත්‍රයක් ලබාගැනීමට බැරි වුණා. එහෙත් ඉදිරි දින කිහිපයෙදී කැන්ගන් ජලය යන්ත්‍රයක් අපේ නිවසට ලබා ගැනීමට සියළු කටයුතු සුදානම් කරලයි තියෙන්නේ. වෛද්‍ය ගුණරත්න මහතාට ගොඩාක් පිං ලැබෙනවා මේ ප්‍රතිකාර ක්‍රමය අපේ රටට හඳුන්වා දී මනුෂ්‍යයින් සුවපත් කිරීම නිසා...'' ඇයගේ ප්‍රකාශ එලෙසයි.

කැන්ගන් ජලය යනු නිකන්ම නිකන් ජලයක් නොවේ. එහි ඇති සංඝටක සහ ශක්තීන් මිනිස් සිරුරට ඉතාමත් හිතකර, ප්‍රතිශක්තිකරණ ක්‍රියාවලියට සෘජුවම ශක්තියක් ලබාදෙන, මිනිස් සිරුරේ අක්‍රමවත් අකර්මණ්‍ය සියළු පද්ධති නැවත ප්‍රතිසංස්කරණය කරන, ලෙඩ රෝග සෝදා හැරීමට මුල්වන, බලවත් විශ්මිත ජල ප්‍රභේදයකි. එමෙන්ම ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණ ප්‍රතිකාරය කිරීම තුළින් ලෙඩ රෝග හඳුනාගනිමින් සහ ක්ෂණිකව සුවකිරීම් කරගනිමින්, රෝගයට අදාළ කැන්ගන් ජල ප්‍රභේදය හඳුනා ගනිමින් පානය කරන සියළු දෙනාටම නිරෝගී දිවියක්, සුවපත් මනසක් ලබාගත හැකි බව ශ්‍රී ලංකාවට කැන්ගන් ජලය සහ ඩී.එන්.ඒ. ස්කෑන් පරීක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දුන් මාතර රාහුල හරස් පාරේ වෛද්‍ය එල්. ගුණරත්න මහතා පවසනවා.

**0777 362 860 යන දුරකථන අංකය ඇමතීමෙන් වෛද්‍ය එල්.ගුණරත්න මහතා සම්බන්ධ කරගත හැක. (සවස 7.00 ත් 9.00 ත් අතර ඇමතීම වඩාත් පහසු වේ.)**

**සැකසුම - අමරසිංහ මාලගේ**

## Kangen Water ™

**කැන්ගන් වතුර,** 1974 දී (අවුරුදු 24 ක් තිස්සේ, එනම් 1950 සිට කරනු ලැබූ පර්යේෂණ වල සාර්ථක ප්‍රතිඵලයක් ලෙස) ජපානයේදී, ප්‍රථමයෙන්ම නිශ්පාදනය කරන ලද, ජල පවිත්‍ර ප්‍රතිකාරක යන්ත්‍රයකින් සෑදෙන වතුර වර්ගයකි.

සාමාන්‍ය වතුර වෙනුවට මෙම කැන්ගන් වතුර දිනපතා පානය කිරීමෙන් සිරුරේ අනවශ්‍ය ආම්ලික අපද්‍රව්‍ය ඉතා ඉක්මනින් ඉවත්ව යාමත් අප සිරුරේ **ප්‍රතිශක්තිකරණ පද්ධතිය ඉතා ඉක්මනින් නිවැරදි වීමත්** නිසා අපගේ ලෙඩ රෝග සියල්ල අප ශරීරය විසින්ම සුවකර ගැනීමට හේතු වේ.






C M Y K



## පල්ලියේ බෝම්බෙට සේවකයෙක් ඇල්ලුවා

## දැන් කියනවා තිබ්බෙ ඇඹිලිපිටියේ කෙනෙක්ලු

## නාරාහේන්පිට බෝම්බෙට 04 දෙනෙක් ඇල්ලුවා

## දැන් කියනවා ඒකත් පිළියන්දල දොස්තරගෙලු

# සැකකාරයෝ අල්ල අල්ල රට වටේ යන බොරැල්ල බෝම්බයේ හතර බීර කතාව

බොරැල්ල සියලු සාන්තුවරයන්ගේ දෙව් මැඳුරේ සුරුවමක් මත තිබී හමුවූ ජීව අත්බෝම්බය සම්බන්ධයෙන් කරන ලද පොලිස් විමර්ශන මේ වනවිට දැඩි මතභේද රැසකට තුඩුදී තිබේ. ඒ පොලිසිය විසින් මෙතෙක් සිදු කර ඇති විමර්ශන ඇතැම් පාර්ශ්වයන්ගේ දෝෂාරෝපණයට ලක්වී තිබීමයි. එම පාර්ශ්වයන් පවසන්නේ පොලිසිය කරන ලද විමර්ශන ගොතන ලද කතා බවය.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් පොලිසිය කරන ලද මූලික විමර්ශනවලදී සියලු සාන්තුවරයන්ගේ දෙව් මැඳුර සමඟ වසර 16ක් සම්බන්ධකම් පැවැත්වූ පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමත් සමඟ එම විමර්ශන කෙරෙහි දැඩි දෝෂාරෝපණ එල්ල කරමින් කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් පැවැත්වූ ප්‍රවෘත්ති සාකච්ඡාව රට තුළ මහත් ආන්දෝලනයක් ඇති කරවන්නට සමත් වූ අතර ඒ නිසා බොහෝ පිරිස් අතර පොලිස් විමර්ශන කෙරෙහි ඇති වූයේ සැකයකි. කුතුහලයකි.

ජනවාරි මස 14 වැනිදාට පාස්කු ඉරිදා ප්‍රහාරයට හරියටම දින 1000ක් ගතවී තිබිණි. ඒ නිමිත්තෙන් වින්දිතයන්ට යුක්තිය ඉටු නොවීමට විරෝධය පා කොළඹ අගරදගුරු පදවිය මඟින් රාගම ජාතික බැසිලිකා දෙව් මැඳුරේදී දේව මෙහෙයක් සංවිධානය කර තිබිණි. මෙවන් දේව මෙහෙයක් පැවැත්වීමට නියමිතව තිබියදී බොරැල්ල සියලු සාන්තුවරයන්ගේ දෙව් මැඳුරේ තිබී ඊට දින තුනකට පෙර (11දා) මෙම ජීව අත්බෝම්බය හමුවීමත් සමඟ අගරදගුරු හිමිපාණන් පැවැසුවේ එය කතෝලික ජනතාව තුළ බියක් ඇති කිරීමට සිදු කළ කුමන්ත්‍රණයක් බවය. එමෙන්ම මෙම අත්බෝම්බ සම්බන්ධයෙන් කරන ලද පොලිස් විමර්ශන ප්‍රතික්ෂේප කරන බවය. එමෙන්ම මේ සිද්ධියේ ඇත්ත හොයනවාට වඩා පොලිසිය කතාන්දරයක් ගොතන්නට හදන වැඩක් බවත්ය. එහෙත් පොලිසිය විමර්ශන නතර කළේ නැත. ඔවුන් දිගටම පරීක්ෂණ සිදුකරගෙන ගියේය.

බොරැල්ල ආනන්ද රාජකරුණා මාවතේ පිහිටි සියලු සාන්තුවරයන්ගේ දෙව් මැඳුරේ ජීව අත්බෝම්බයක් ඇති බවට බොරැල්ල පොලිස් ස්ථානාධිපතිවරයාට තොරතුරක් ලැබුණේ ඉකුත් 11 වනදා හවසය. ඒ සම්බන්ධයෙන් විමර්ශන ඇරැඹි අතර බොරැල්ල පොලිසියට අමතරව කොළඹ අපරාධ කොට්ඨාසයට (CCD) ද කැඳවා තිබිණි.

කෙසේ වෙතත් සොයා ගැනුණු ජීව අත්බෝම්බය පොලිස් විශේෂ කාර්ය බළකා බෝම්බ නිෂ්ක්‍රිය අංශය මඟින් නිෂ්ක්‍රිය කරන ලදී. ඒ සමඟම විමර්ශන ඇරැඹි පොලිසිය දෙව්මැඳුරේ රැඳී සිටි පුද්ගලයන් 4 දෙනෙක් ඒ මොහොතේම අත්අඩංගුවට ගෙන කොළඹ අපරාධ කොට්ඨාසයට භාර කෙරිණි.

අත්අඩංගුවට ගත් පුද්ගලයන් අතර සාන්තුවරයන්ගේ දෙව් මැඳුරේ වසර 9ක් සේවය කරමින් පල්ලිය සමඟ වසර 16ක් සම්බන්ධකම් පැවැත්වූ පුද්ගලයකු දෙව්මැඳුරට බෝම්බය තැබූ අය බවට හඳුනාගත් බව පොලිසිය පැවැසීය. එමෙන්ම තවත් පුද්ගලයකු අධිකරණයට ඉදිරිපත් කරමින් පොලිසිය පැවැසුවේ, ඔහු එම බෝම්බය දැක විනාඩි 45කට වැඩි වේලාවක් කිසිදු දැනුම් දීමක් කර නැති බවය.

මෙහිදී එම පුද්ගලයා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා පවසා සිටියේ, තම සේවාදායකයා දේවස්ථානයේ සැරසිලි කරන අයකු බවත් ඔහු එදින හවස 3ට මෙම බෝම්බය ගැන දැනුවත් වී එය පියතුමාට දැනුම් දුන් බවත්ය. එමෙන්ම ඔහු බෝම්බය තැබීමට සම්බන්ධ නොවූ බවද නීතිඥවරයා සඳහන් කර තිබිණි.

එහිදී කොළඹ අපරාධ කොට්ඨාසය වැඩි දුරටත් පැවැසුවේ සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රධාන සැකකරු ඇතුළු තවත් තිදෙනකු දින තුනක කාලයක් රඳවාගෙන ප්‍රශ්න කරන බවත් සී.සී.ටී.වී. කැමරා දත්ත පරීක්ෂාවෙන් පසු ඔවුන් අත්අඩංගුවට ගත් බවත්ය.

එමෙන්ම පිපිරීමට සකස් කරන ලද අත්බෝම්බය සම්බන්ධයෙන් සාක්කියක් ලෙස දහතුන් හැවිරිදි පාසල් සිසුවකුද කොළඹ අපරාධ කොට්ඨාසය විසින් කොළඹ අතිරේක මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කෙරිණි. එම සිසුවා අත්බෝම්බය සම්බන්ධයෙන් වැදගත් කරුණු කිහිපයක් අනාවරණය කළ බව පැවැසූ අපරාධ කොට්ඨාසය ඔහු මහෙස්ත්‍රාත්වරිය ඉදිරියේ රහස් ප්‍රකාශයක් ලබාදීමට කැමැත්ත පළ කළ බවද සඳහන් කළේය. ඒ අනුව ඉකුත් 12 වැනිදා එම දහතුන් හැවිරිදි පාසල් සිසුවා මහෙස්ත්‍රාත්වරිය හමුවේ රහස් ප්‍රකාශයක්ද ලබාදී තිබිණි. සියල්ල සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව අධිකරණය විසින් දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචි සැකකරු රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

මේ සම්බන්ධයෙන් පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිහාල් තල්දූව මහතාද 12 වැනිදා හවස ප්‍රකාශයක් කරමින් සඳහන් කළේ, බෝම්බ සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් වයස අවුරුදු 56ක මරදාන ප්‍රදේශයේ පදිංචි පුද්ගලයා එම දේවස්ථානය සමඟ වසර 16ක පමණ සම්බන්ධයක් පැවැත්වූ අයකු බවත් ඔහු දේවස්ථානයේ බෝම්බය තැබූ පුද්ගලයා බවට හඳුනාගෙන ඇති බවය.

මෙම 56 හැවිරිදි පුද්ගලයා විසින් බෝම්බය සැකසීමට යොදාගත් ගිනිකූරු, රබර් පටි හා සෙලෝටේප්වල කොටස් ඔහුගේ කාමරයේ තිබී සොයා ගැනීමටද පොලිසියට හැකිවූ බවත් පැවැසූ මාධ්‍ය ප්‍රකාශකවරයා සැකකරුට බෝම්බය ලැබුණේ කෙසේද, ඊට උදවු කළ තවත් අය සිටිත්ද ඇතුළු කරුණු රාශියක් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කර ඇති බවත්ය.

මෙම අත්අඩංගුවට ගැනීමත් සමඟ සියලු සාන්තුවරයන්ගේ දෙව්මැඳුරේ පියතුමන්ලා දැඩි අපහසුතාවට පත්වූ අතර මේ සම්බන්ධයෙන් අගරදගුරු හිමිපාණන්ද දැනුවත් කෙරිණි. ඒ අනුව දෙව්මැඳුරේ පියතුමන්ලාද එහි තිබූ සී.සී.ටී.වී. කැමරා සෝදිසියට ලක් කළ අතර ඉන් අනතුරුව අගරදගුරු හිමිපාණන් මූලිකත්වයෙන් ප්‍රවෘත්ති සාකච්ඡාවක්ද පැවැත්විණි.

අගරදගුරු හිමිපාණන් එහිදී වැඩිදුරටත් පැවැසුවේ පොලිසිය පල්ලියේ සී.සී.ටී.වී. කැමරා පරීක්ෂා කර ඇත්තේ හවස තුනෙන් පසුව බවය. එහෙත් එදින උදෑසන 9.52ට පුද්ගලයකු සිලිසිලි බෑග් එකක් රැගෙන පල්ලියට ඇතුළු වී කෙළවරේ ඇති ප්‍රතිමාවක් අසලට ගොස් කලිසම ඇතුළෙන් හෝ සාක්කුවෙන් ඇද කුමක් හෝ පිටතට ඇද කිසියම් ක්‍රියාවක් සිදුකරන බවත් පැවැසූ කාදිනල් හිමිපාණන් ඉන් අනතුරුව ඔහු කඩිමුඩියෙන් පල්ලියෙන් පිටව යන අයුරු සී.සී.ටී.වී. කැමරාවල රූගත වී ඇති බවය. පොලිසිය එම දර්ශන නිරීක්ෂණය කර නැති බවත් හවස තුනෙන් පසුව ඇති සී.සී.ටී.වී. දර්ශන පමණක් නරඹා පල්ලිය සුද්ද පවිත්‍ර කරන පුද්ගලයා හා සෙසු තිදෙනා අත්අඩංගුවට ගෙන ඇති බවත් කාදිනල් හිමිපාණන් පොලිස් විමර්ශනවලට දොස් නඟමින් පවසා සිටියහ. එමෙන්ම බෝම්බය තියපු පුද්ගලයා නොසොයා කොස්සෙන් අතුගාන පුද්ගලයා අල්ලා ඇතුළට දැමීම පොලිසිය සිදුකර ඇතැයි කී උන්වහන්සේ ඉතිහාසය පුරාවටම පොලිසිය කර ඇති ක්‍රියා දෙස බලද්දී මේ පිළිබඳවද ප්‍රශ්නයක් ඇතිවන බවත් ඒ නිසා බොරු නොකොට නිල ඇඳුම ගලවා ගෙදර යන ලෙසත් අවධාරණය කළහ.

මෙම ප්‍රකාශය රට පුරා පැතිරගියේ රජයද පොලිසියද දැඩි අපහසුතාවට පත්කරමිනි. කාදිනල් හිමිපාණන් එම ප්‍රකාශය ඉදිරිපත් කර පැය කිහිපයක් යන්නටද මත්තෙන් මහජන ආරක්ෂක අමාත්‍ය රියර් අද්මිරාල් සරත් වීරසේකර මහතා ප්‍රකාශ කළේ අත්අඩංගුවට ගත් පුද්ගලයා රැඳී සිටි පල්ලියේ කාමරය පරීක්ෂා කළ පොලිසියට එහි තිබී ගිනිකූරු අඩු ගිනිපෙට්ටියක්, හඳුන්කූරු, ටේප් ආදිය සොයා ගැනීමට හැකිවූ බවය. එමෙන්ම ඔහු අත්අඩංගුවට ගැනීම වැරදියි කියන ප්‍රකාශ ඉතාම වැරදි ප්‍රකාශයක් බව කී ඇමැතිවරයා සිද්ධියට අදාළ තොරතුරු ඇත්නම් ඒවා පොලිසියට ලබාදීම මිස මාධ්‍යයට ලබාදීම පරීක්ෂණවලට බාධාවක් බවද සඳහන් කළේය. එමෙන්ම වයස අවුරුදු 13ක සිසුවා මේ සම්බන්ධයෙන් අධිකරණයට ප්‍රකාශයක් සිදුකළ බවත් අත්අඩංගුවට ගත් පල්ලියේ සේවකයා එම සිසුවාට බෝම්බය අඩංගු මල්ල දුන්න බවත් අත්අඩංගුවට ගත් පුද්ගලයාද එම බෝම්බ මල්ල දුන්න බවට පිළිගන්නා බවත් අමාත්‍යවරයා වැඩිදුරටත් අවධාරණය කළේය.

ඇමැතිවරයා මාධ්‍යයට එසේ පවසා පැය කිහිපයක් යන්නටත් පෙර පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතා විසින්ද මාධ්‍යයට ප්‍රකාශයක් ලබාදී තිබිණි. ඔහු එහි සඳහන් කර තිබුණේ විමර්ශනවල ප්‍රගතියයි. සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රකාශ 14ක් සටහන් කරගෙන ඇති බවත් මෙම විමර්ශන තවමත් පවතින්නේ මූලක අදියරේ බවත් සඳහන් කළ පොලිස්පතිවරයා අදාළ විමර්ශන මෙතෙක් අවසන් කර නැති බවද සී.සී.ටී.වී දත්ත සහ පරිවේෂණීය සාක්කි හා පුද්ගල සාක්ෂි මඟින් විමර්ශන කරන බවත් අවධාරණය කළේය.

ඉන් අනතුරුව ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතාද මේ සම්බන්ධයෙන් මාධ්‍යයට ප්‍රකාශයක් කර තිබිණි.

කෙසේ වෙතත් අගරදගුරු හිමිපාණන් විසින් ඉදිරිපත් කරන ලද සී.සී.ටී.වී. දර්ශන ඔස්සේද විමර්ශන පැවැත්වීම ඉන් පසුව සිදුවූ අතර එම විමර්ශන සඳහා බොරැල්ල පොලිසිය කොළඹ අපරාධ කොට්ඨාසයට අමතරව කොළඹ දකුණ අපරාධ විමර්ශන කොට්ඨාසයද එක්කරගෙන තිබිණි. එහි ස්ථානාධිපති පොලිස් පරීක්ෂක අජිත් කුමාර ඇතුළු කණ්ඩායමක් මේ සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කළ අතර ඔවුන් පල්ලියේ සී.සී.ටී.වී. දර්ශන නිරීක්ෂණය කරමින් කාදිනල් හිමිපාණන් පෙන්වා දුන් උදෑසන 9.25ට පල්ලියට ඇතුළු වූ පුද්ගලයා හඳුනා ගැනීමටත් ඔහු සොයා ගැනීමටත් පුළුල් විමර්ශනයක් ආරම්භ කළහ. අගරදගුරු හිමිපාණන් මාධ්‍ය හරහා මෙම පුද්ගලයා ගැන තොරතුරු හෙළි කරනතුරු පොලිසිය ඒ සඳහා උත්සුක නොවුයේ මන්දැයි බොහෝ පිරිසකට ඒ වන විටත් ගැටලුවක් මතු වී තිබිණි.

ඒ අනුව කොළඹ දකුණ අපරාධ විමර්ශන කොට්ඨාස රහසිගත විමර්ශනයක යෙදිණි. එම විමර්ශනයේ ප්‍රතිඵලයක් ලෙස ඉකුත් 15 වැනිදා පල්ලියට ඇතුළු වූ පුද්ගලයා ඇඹිලිපිටිය, පනාමුරේදී කොටුකර ගැනීමට නිලධාරීන්ට හැකිවිණි. එය ඇතැම් සමාජ මාධ්‍ය ප්‍රචාරය කළේ බොරැල්ල පල්ලියේ අනාවරණයෙන් බෝම්බ තැබූ සැබෑ පුද්ගලයා අත්අඩංගුවට ගෙන ඇති බවය. ඔහු දයාසේන නමැත්තෙකි. කඩවත, මංකඩ පාරේ පදිංචිකරුවකු වන දයාරත්න වයස අවුරුදු 67ක අයකු වන අතර මීට පෙරද විවිධ චෝදනා මත බන්ධනාගාරගත වූ පුද්ගලයෙකි.

කොළඹ දකුණ අපරාධ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන්ගේ ප්‍රශ්න කිරීම් හමුවේ සැකකරු පවසා සිටියේ, එක්තරා පුද්ගලයකු රුපියල් 50,000 ක් තමාට ලබාදී එම බෝම්බය පල්ලියේ තබන ලෙස පැවසූ බවකි. ඒ අනුව තමා එම බෝම්බය රැගෙන කඩවත සිට බසයකින් පැමිණ එය පල්ලියේ දමා ගිය බවට පොලිසිය පැවසූ බවද මාධ්‍ය හෙළිකර තිබිණි.

ඒ අනුව මීට පෙර පොලිසිය මඟින් අත්අඩංගුවට ගත් පුද්ගලයන් නිකරුණේ අත්අඩංගුවට ගත් අය බව කියමින් බොහෝ පාර්ශ්ව ගණනාවක් පොලිසියට දෝෂාරෝපණය එල්ල කරන්නට වූහ. මේ සම්බන්ධයෙන් පොලිස් මූලස්ථානය හෝ පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා නිහඬ පිළිවෙත් රකිමින් කිසිදු ප්‍රකාශයක් සිදුනොකිරීම නිසා රටපුරා පොලිස් පරීක්ෂණ කෙරෙහිද ඇති වූයේ සැකයකි.

කෙසේ වෙතත් කොළඹ දකුණ අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් අත්අඩංගුවට ගත් දයාසේන වරාය පොලිසිය තුළ රඳවාගෙන ප්‍රශ්න කිරීම සිදුකළ අතර බස්නාහිර පළාතේ උසස් පොලිස් නිලධාරීන්ද විමර්ශනයට එක්වෙමින් ඔහු පවසන පරිදි එම බෝම්බය ඔහුට දුන් පුද්ගලයා හඳුනා ගැනීමට උත්සුක වූහ. එම ප්‍රශ්න කිරීමේදී ඔහු මුලින් ප්‍රකාශ කර තිබුණේ රත්මලාන පදිංචි මුස්ලිම් ජාතිකයකු එම බෝම්බය පල්ලියේ තැබීමට තමාට දුන් බවය.

කෙසේ වෙතත් ඊට දින තුනකට පසු ඉකුත් 18 වැනිදා කොළඹ දකුණ අපරාධ විමර්ශන කොට්ඨාසය කීවේ සිද්ධිය සම්බන්ධයෙන් විශ්‍රාමික වෛද්‍යවරයකු අත්අඩංගුවට ගත් බවය.

ඒ අනුව හෙළි වූයේ දේවස්ථානයේ සී.සී.ටී.වී. කැමරා පද්ධතිය නිරීක්ෂණය කිරීමෙන් කතෝලික පල්ලිය විසින් හඳුනාගත් බෝම්බය රැගෙන එන බවට හඳුනාගෙන ඇඹිලිපිටිය පනාමුරේ ප්‍රදේශයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයා යළි හෙළි කළ තොරතුරු මත මෙම විශ්‍රාමික වෛද්‍යවරයා අත්අඩංගුවට ගත් බවය. එමෙන්ම සැකකරු පල්ලියේ බෝම්බයට අමතරව නාරාහේන්පිට පෞද්ගලික රෝහලේ බෝම්බය ගැනද තොරතුරු හෙළි කර තිබිණි.

විශ්‍රාමික වෛද්‍යවරයා පිළියන්දල වට මාවතේ තෙමහල් නිවෙසක පදිංචිකරුවෙකි. ඔහු නිවෙසට ආසන්නයේ පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන ගොස් ඇති අතර දයාසේන නමැත්තා එම මධ්‍යස්ථානයේ ආරක්ෂකයකු ලෙස වසර 8ක කාලයක් සේවා කර ඇතැයි කියති. දෙදෙනා අතර සබඳකමක් ඇති වී ඇත්තේ ඉන් අනතුරුවය.

ප්‍රශ්න කිරීමේදී පනාමුරේදී අත්අඩංගුවට ගත් දයාසේන පවසා ඇත්තේ අදාළ විශ්‍රාමික වෛද්‍යවරයා ලබාදුන් කොන්ත්‍රාත්තුවකට අනුව පල්ලියේ බෝම්බයක් තැබූ බවය. එමෙන්ම වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී නාරහේන්පිට පෞද්ගලික රෝහල් වැසිකිළියේ අත්බෝම්බයක් තැබුවේද තමා බව ඔහු පොලිසියට පැවැසූ බව මාධ්‍ය වාර්තා කර තිබිණි. එහෙත් වෛද්‍යවරයාගෙන් පොලිසිය මුලින් කළ විමසීමේදී තමා දයාසේන දන්නා හඳුනන වුවද බෝම්බයක් තැබීමට ඔහුට කිසිවිටෙකත් නොපැවසූ බව පවසා තිබිණි. එහෙත් වෛද්‍යවරයා ගැන සැක සිතූ පොලිසිය ඔහුගෙන් දීර්ඝ ලෙස ප්‍රශ්න කෙරිණි. අවසානයේ ඔහු හෙළි කළ තොරතුරු මත පොලිසිය පොලිස් විශේෂ කාර්ය බළකායද එක්ව 17 වැනිදා රාත්‍රියේම ඔහු පදිංචිව සිටි පිළියන්දල වට මාවතේ නිවෙස පරීක්ෂා කිරීමේදී අවි ආයුධ කිහිපයක්ද සොයාගෙන තිබේ. පිස්තෝල පහක් කඩු දෙකක්, රැම්බෝ පිහියක් හා වර්ගය හඳුනාගත නොහැකි ගිනි අවියක්ද ඒ අතර තිබිණි. කෙසේ වෙතත් වෛද්‍යවරයාගේ නිවෙසේ තිබී ආයුධ රැසක් සොයා ගැනීමත් සමඟ වෛද්‍යවරයාගේ පුතකු වන ඖෂධ හේරත් මහතා මාධ්‍ය හමුවක් තබමින් පවසා සිටියේ පොලිසිය මාධ්‍ය යොදාගෙන ගිනි අවි ලෙසින් හුවා දක්වන්නේ තම නිවෙසේ තිබූ වායු පිස්තෝල හා සිහිවටන ලෙස එකතු කළ කිරිච්චි බවකි. එම වායු රයිෆල හා පිස්තෝල නුගේගොඩ ප්‍රදේශයේ වෙළෙඳසලකින් මිලදී ගත හැකි බවද ඔහු පවසා සිටියේය. එමෙන්ම නොකළ වරදකට තම පියා මෙසේ පටලවා ඇති බවද ඔහු අවධාරණය කළේය.

එතැන තිබුණු ඒ.කේ. 47 එකක් වගේ ලොකු මැෂින්ගන් එක මිරිහානේ කඩයකින් ගන්න පුළුවන් ඒකට දාන්නේ වෝටර් පෙලට්. ඒක සෙල්ලම් තුවක්කුවක්. අනෙක් පිස්තෝල තුනයි රිවෝල්වරයත් වායු තුවක්කු එයාර්ගන් කියලයි ඒවාට කියන්නේ."

කිසිම පිස්තෝලයක් අපේ ගෙදර තිබිලා හම්බවුණේ නැහැ. ඔය මාධ්‍යයේ යන පින්තූරවල තියෙන්නේ එයාර් පිස්ටල්. කිරිගරුඬ කොපුවක් අස්සේ දාලා තිබුණේ චීනවට්ටිවලින් හදපුවා.

මේවා පොලිසිය ගොතන කතාවක්. අත්අඩංගුවට ගත් වෛද්‍යවරයාගේ පුතු මාධ්‍ය හමුවේ එලෙස පැවැසීමත් සමඟ පොලිස් විමර්ශන නොයෙකුත් පාර්ශ්වයන් තුළ තිබූ සැකය වඩාත් තීව්‍ර විණි. කෙසේ වෙතත් වෛද්‍යවරයාගේ පුතු නිවෙසේ තිබී සොයාගත් පිස්තෝල හා තුවක්කුව වායු තුවක්කු බව මාධ්‍ය හමුවේ ප්‍රකාශ කළද පොලිසිය පවසන්නේ අත්අඩංගුවට ගත් එම අවි රජයේ රස පරීක්ෂකවරයා වෙත යොමු කර ඇති බවය. කෙසේ වෙතත් පොලිසිය සැකකාර වෛද්‍යවරයාගෙන් දිගින් දිගටම ප්‍රශ්න කරමින් තවත් තොරතුරු ලබා ගැනුණු අතර ඔහු හෙළි කළ තොරතුරු මත වෛද්‍යවරයාට බෝම්බ සැපයූ බව කියන පුද්ගලයා හම්බන්තොට රන්න ප්‍රදේශයේදී අත්අඩංගුවට ගැනීමට කොළඹ අපරාධ කොට්ඨාසයට ඉකුත් 20 වැනිදා හැකිවිණි. මෙහිදී අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් වෛද්‍යවරයාගෙන් කළ ප්‍රශ්න කිරීමේදී බෝම්බය තැබීමට උපදෙස් දුන්නේ ඔහු බව පිළිගැනීමත් සමඟ ඔහුගේ ප්‍රකාශ මත රන්න පදිංචි 'රුවන්' නමැත්තකු කොටු කරගෙන තිබේ. මේ සඳහා වෛද්‍යවරයා විසින් රුවන් නමැත්තාට වරින් වර මුදල්ද ලබාදී තිබිණි. රුවන් වරාය අධිකාරියේ සේවකයකු බවත් ඔහුද අපරාධ කිහිපයකට සම්බන්ධ වූ අයකු බවත් පොලිසිය කියයි.

එමෙන්ම බොරැල්ල පල්ලියට අමතරව නාරාහේන්පිට පෞද්ගලික රෝහලේ බෝම්බය තැබීමට උපදෙස් දුන්නේද සැකකාර වෛද්‍යවරයා බව මෙහිදී පොලිසිය අනාවරණය කරගෙන තිබිණි.

සැකකාර වෛද්‍යවරයා බොරැල්ල දෙව් මැඳුර සමඟ කිසියම් ද්වේෂයකින් පසු වී ඇති බවද විමර්ශනවලදී හෙළි වී තිබේ.

1974 වසරේදී බෞද්ධ කාන්තාවක් සමඟ ඔහු විවාහ වී ඇත්තේ බොරැල්ල සියලු සාන්තුවරයන්ගේ දෙව් මැඳුරේය. ඔහුගේ බිරිය බෞද්ධ වීම හේතුවෙන් එවකට දේවස්ථානයේ සිටි පූජකවරයා ඔහුට උදෑසන කාලයේදී විවාහ මංගල උත්සවයට අදාළ පූජාව ලබා නොදීම ගැන සැකකාර වෛද්‍යවරයා පල්ලිය සමඟ තරහින් සිට ඇතැයිද කියති. මෙයද මහත් ගැටලුවකි. ඒ වසර 48කට කලින් සිදුවූ සිදුවීමකට මෑතකදී මෙවන් විනාශයක් කිරීමට සැකකරු උත්සාහ දැරීමය.

එමෙන්ම බිරිය දැඩි ලෙස රෝගීව සිටියදී කොම්පඤ්ඤවීදියේ පිහිටි පෞද්ගලික රෝහලකට ප්‍රතිකාර සඳහා ඇය ඇතුළත් කිරීමට වෛද්‍යවරයා දැඩි උත්සාහයක් ගෙන ඇතත් එම රෝහල ඔහුගේ බිරියට ප්‍රතිකාර දීම ප්‍රතික්ෂේප කර ඇති බවද සැකකරු පවසා ඇතැයි මාධ්‍ය වාර්තා කර තිබිණි.

පසුව ඔහු බිරිය ඇතුළත් කර ඇත්තේ නාරාහේන්පිට පිහිටි පෞද්ගලික රෝහලකට බවත් බිරියට එම රෝහල හොඳින් ප්‍රතිකාර කළ බවත් ඇය එම රෝහලේදීම මියගියත් ඔහු පවසා ඇත.

අදාළ රෝහල ඔහුගේ බිරියට හොඳින් සැලකූ නිසා රෝහලට ප්‍රචාරයක් ලබා දීමට සිය මිතුරා ලවා නාරාහේන්පිට පෞද්ගලික රෝහල් වැසිකිළියේත් බොරැල්ල දේවස්ථානයටත් බෝම්බ තැබූ බව හෙළි වී ඇතැයි පොලිසිය පවසා තිබිණි. එමෙන්ම පොලිසිය වැඩිදුරටත් පවසන්නේ, ඔහු බිරිය මියයෑමෙන් පසු ඇගේ සිරුර ආදාහනය කර ඇති බවත් එහිදී ලබාගත් බිරියගේ 'මිනී අළු' දමා මුද්දක් සකස් කොට එය ඔහුගේ ඇඟිල්ලක දමාගෙන සිටි බවත්ය. ඒ ඔහු බිරිය කෙරෙහි තිබූ අසීමිත ආදරය නිසා බවද පොලිසිය කියයි.

75 හැවිරිදි විශ්‍රාමික වෛද්‍යවරයා මීට වසර 48කට පෙර බොරැල්ල දේවස්ථානයේදී විවාහ වුවද පූජකවරයා උදෑසන පූජාව ලබා නොදීම හේතුවෙන් ඇති වූ සිත්තැවුල මත ඉන් පසු කිසි දිනෙක මොහු දෙව්මැඳුරට ගොස් නැති බවත් දෙව්මැඳුරට හානියක් කිරීමේ අදහසින් සිට ඇති බවත් පොලිසියේ මතයයි.

සැකකාර වෛද්‍යවරයා පවසන මෙවන් තොරතුරුවල සත්‍යතාවක් ඇත්දැයි සෙවීමටද විමර්ශන ආරම්භ කර ඇති අතර ඔහු මානසික පීඩාවකට ලක්ව ඇති බව පෙනී ගොස් ඇති නිසා සැකකරු මානසික වෛද්‍යවරයකු වෙත යොමු කර වාර්තාවක් ලබාගැනීමටද නියමිතය.

මේ අතර මෙම ප්‍රකාශවල සත්‍යතාව දැනගැනීම සඳහා වරාය පොලිසියේ රඳවා සිටින පනාමුරේදී අත්අඩංගුවට ගත් දයාසේන නමැත්තාද කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් දීර්ඝ ලෙස ප්‍රශ්න කිරීමට භාජන කර තිබේ.

තත්ත්වය මෙසේ වුවත් මේ වන විට නාරාහේන්පිට රෝහලේ බෝම්බය තැබූ පුද්ගලයා හා බෝම්බය සැපයූ පුද්ගලයා බව කියමින් පොලිසිය පුද්ගලයන් කිහිපදෙනකුම මීට මාස කිහිපයකට පෙර අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කොට රිමාන්ඩ් බන්ධනාගාරද ගත කර තිබිණි. එහෙත් ඔවුන්ගෙන් කළ ප්‍රශ්න කිරීම්වලදී මෙම සැකකරුවන් ගැන කිසිදු තොරතුරක් හෙළි වී නොතිබීමද සැකයට තුඩු දී ඇත. මෙම විමර්ශන සියල්ලම කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් සිදුකිරීමද විශේෂත්වයකි.

මේ අනුව පොලිසිය කරන ලද විමර්ශන තව තවත් පැටලැලි සහගත තත්ත්වය මතුව තිබේ. නාරාහේන්පිට පෞද්ගලික රෝහලේ බෝම්බය තැබීමත් බොරැල්ල දෙව්මැඳුරේ බෝම්බය තිබීම ඊයේ පෙරේදා අත්අඩංගුවට ගත් සැකකරුවන්ගේ වැඩක් නම් එම සිද්ධීන් සම්බන්ධයෙන් පොලිසිය හා කොළඹ අපරාධ කොට්ඨාසය විසින් කලින් අත්අඩංගුවට ගත් සැකකරුවන් නිර්දෝෂී පුද්ගලයන්ද යන්න සැකයක් කා තුළත් ඇති වී තිබේ. එහෙත් එම පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබුණේද ඔවුන්ගෙන් හෙළි වූ තොරතුරු හා ප්‍රකාශ මත බව පොලිසිය එදා පැවැසුවද අද එම සිද්ධීන් සිදුකළේ වෙනත් පාර්ශ්වයක් බව සඳහන් කරමින් පොලිසිය ඔවුන් අත්අඩංගුවට ගැනීම නිසා නාරාහේන්පිට පෞද්ගලික රෝහල් බෝම්බය හා බොරැල්ල සියලු සාන්තුවරයන්ගේ දෙව් මැඳුරේ තැබූ බෝම්බය සම්බන්ධයෙන් මහජනයා තුළ ඇති වී ඇත්තේ නොවිසඳුණු ප්‍රශ්න රාශියකි. එසේ නම් පොලිසිය මීට කලින් අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් බන්ධනාගාරගත කර ඇත්තේ නිර්දෝෂී පුද්ගලයන් යන්නද මෙහි ප්‍රධානම සැකයයි.

එමෙන්ම විමර්ශනවල ප්‍රගතිය සම්බන්ධයෙන් පොලිස් මූලස්ථානය හෝ පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා මෑතකදී කිසිදු ප්‍රකාශයක් හෝ නිවේදනයක් නිකුත් නොකිරීමද මෙම ගැටලු සහගත තත්ත්වය තවත් වර්ධනය වීමට හේතුවක් වී තිබේ.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ අධීක්ෂණය මත බොරැල්ල පොලිසිය, කොළඹ අපරාධ කොට්ඨාසය හා කොළඹ දකුණ කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය සිද්ධීන් සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

■ කීර්ති මෙන්ඩිස්

**ඉස්කෝලෙ යන දරුවන්ට කන්න දෙන්න දෙයක් නෑ**

**ලිප පත්තු කර ගන්න භූමිතෙල් ටිකක්වත් නෑ**

**බඩු ලොරි එන්නේ නැතුව නාට්ටාමිලාත් කම්මුතුයි**

**හයර් නෑ: ත්‍රීවීල්වල යන්න මිනිස්සුන්ට සල්ලි නෑ**

**බඳින්න හිටියා: දෙන්නටම රස්සා නැති වුණා**

# දිවි ගැට ගහ ගන්න මඟක් නැතුව ජනතාව තැන තැන නඟන අඳෝනා



**කඳුළු පිස දමමින් සිටි දෙදරූ මව මොහොතකින් සිය කටහඬ අවදි කළාය. ඒ අවට සිටි අනෙක් අයට නොඇසෙන විදිහට.**

"ළමයින්ගේ තාත්තා ත්‍රීවීලර් එකක් හයර් එකට අරන් දිව්වා. දැන් ඒක නැහැ. අයිතිකාර මහත්තයා කිව්වා ලීසිං ගෙවා ගන්න බැරිව ඒක අරන් ගියා කියලා. ඊට පස්සේ එයා බාසුන්නැහේ කෙනකුට අත් උදවු දෙන්න ගියා. දැන් සිමෙන්ති නැහැ කියලා ඒ රස්සාවත් නැවතිලා.

අපි ඉතින් කොහොමද මේ දරුවන්ට උගන්වන්නේ? ගෙදර හාල් ඇටයක් ගන්නවත් සල්ලි නැහැ. අහල පහළ හොයලා මඤ්ඤොක්කා ටිකක් තම්බලා දීලා තමයි දරුවන්ව ඉස්කෝලේ යවන්නේ. මෙසේ කීවේ ඔක්කම්පිටිය ප්‍රදේශයේ ජීවත් වන තරුණ මවකි.

ඇගේ මේ දුක්බර කතාව එදින අප ඇසූ එකම සහ අවසන් කතාව නොවේ. එවැනි තවත් කතා බොහොමයක් අපට අසන්නට ලැබිණි. ඒ හැම කතාවකම ඇත්තේ රැකියා අහිමි වීම හේතුවෙන් මෙරට දරු පවුල් මුහුණ දී තිබෙන ඛේදයයි.

රටක සේවා නියුක්තිය ඒ රටේ ආර්ථික හයියට බෙහෙවින් බලපායි. සේවා නියුක්තිය අඩු වී සේවා වියුක්තිය ඉහළ යන සෑම අවස්ථාවකදීම මතු වී පෙනෙන්නේ ඒ රටේ දුප්පත්කම දැන් ඒ දුප්පත්කම පෙනෙන ලෝක දර්ශකය පවා අපට ඔච්චම් කරමින් ඉන්නා අන්දම මැනවින් පෙනෙන්නට ඇත. අපේ රටේ බොහෝ ඇත්තන් මේ වෙනුවෙන් පෙන්වා දෙන එකම කාරණය ලෙස පෙනෙන්නට තිබෙන්නේ 2019 වසරේදී ලෝකයම ගිලගත් කොවිඩ් වසංගතයය.

එහෙත් ලෝකයේ රටවල් ඒ වසංගතයට මුහුණදී සිය රටේ ආර්ථිකය ආරක්ෂා කර ගනිද්දී අපේ රට පමණක් එයින් ඇද වැටුණේ කෙසේද යන්න දැන් රහසක්ව තබා ගැනීමට අසීරුය. ඒ තරමටම ඒ ප්‍රශ්නයට බලපෑ ඩොලර් ප්‍රශ්නය ගැන දැන් කුඩා දරුවෝ පවා දැනුම් තේරුම් ගෙන සිටිති. අපේ රටේ ඩොලර් හිඟය ඇති වූ මුල්ම අවස්ථාවේදී එය ඇඟට පතට දැනෙනා ගැටලුවක් බවට පත්වූයේ රසායනික පොහොර ගෙන්වීම අත්හිටුවූ තීරණයත් සමඟය. එයින් මෙරට ගොවි ජනතාවට සිදුවූයේ බරපතළ වැරැද්දකි.

"අද මේ ප්‍රශ්නය නිසා කොයි තරම් පිරිසක් රැකියා නැතිව ඉන්නවාද? කෘෂිකර්මාන්තයෙන් පමණක් නොවෙයි ඒකෙන් වක්‍රව යැපෙන විශාල පිරිසකුත් ඉන්නවා. ඒ අතර කැත්ත, උදැල්ල ගත්ත ගොවි මහත්තුරුන්ට අමතරව බඩු ප්‍රවාහනය කරන අයට එළවළු, පලතුරු විකුණන අය ඒ වගේම පොහොර හා කෘෂි ද්‍රව්‍ය අලෙවි කරන අය ඉන්නවා. මීට අමතරව ගොවින්ගේ අස්වැන්න මිලදී ගන්න අයත් ඉන්නවා. අතරමැදි කණ්ඩායම් වගේම නාට්ටාමි රස්සාව කරන උදවියත් ඉන්නවා. මේ හැමෝගේම රස්සාවලට අද ගැටලුවක් මතු වී තිබෙනවා. ඒ විතරක් නොවෙයි මේ අයට බත් පැකට් එකක් විකුණන අය. තේ කෝප්පයක්, බුලත් විටක් විකුණන අය. මේ හැමෝම අද අසරණයි. මේ පද්ධතියම අද කඩා වැටිලා.

මෙසේ කියන්නේ ගොවි මහත්තුරුන් වෙනුවෙන් හඬ නඟන සමස්ත ලංකා ගොවි ජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න මහතාය. ඔහු පවසන ආකාරයට අද කුඩා වී මෝල් හිමියන් හා ඔවුන් යටතේ සේවය කරන සියලුම දෙනා සිටින්නේ රැකියා විරහිතවය.

මේ අනුව බැලූ විට ලක්ෂ සංඛ්‍යාත පිරිසකගේ රැකියාවලට අත්වී ඇත්තේ මහා විනාශයකි. ඒ විනාශය බලපා ඇත්තේ ඔවුන්ගේ දරු පවුල්වලටය.

වත්ත පිටියේ අලයක් කොළ යක් වවාගෙනවත් කන්න දැන් අපට බැහැ.පොහොර නැහැ. කෘමියෝ ඒ හැමදේම විනාශ කරනවා. ඉතින් කොහොමද රටට කන්න දෙන්නේ? "අපි කන හැටි ළිපා දනී " කියනවා.

දැන් ළිප පත්තු කරන්න ලාම්පු තෙල් ටික නැති නිසා ළිපවත් ඒක දන්නේ නැහැ මහත්තයා. මෙසේ කීවේ කොළඹ මැනිං මාර්කට් එකේදී හමු වූ දුප්පත් ගොවි මහත්තයෙකි.

"කරන්නට දෙයක් නැති නිසා අද වට්ටක්කා කොළඹට අරන් ආපු ලොරියක අත් උදව්වට ආවා. මම අක්කර තුනක් වවපු ගොවියෙක්. පොහොර නැති නිසා ඔක්කොම විනාශ වුණා මහත්තයෝ. ඔහු එසේ කීවේ දෑසට කඳුළු පුරවාගෙනය.

අපේ රටේ ලක්ෂ සංඛ්‍යාත ගොවි මහත්වරුන් හා ඊට වගා කටයුතුවලට වක්‍රව සබඳතා දක්වන සියලු දෙනා දැන් සිටින්නේ අත මිට හිඟ දුගී දුප්පතුන් ලෙසයි. " වවන්නෝ දිනන්නෝ" කීවත් දැන් ඔවුන්ගේම අදහසට අනුව " වවන්නෝ හිඟන්නෝ" වී සිටිති. රජකමට සුදුසු ගොවියා හිඟමනට වැටී ඇත.

"දරුවෝ ඉස්කෝලේ යවා ගන්න තරම්වත් ආදායමක් දැන් අපට නැහැ. අපි ප්‍රශ්න ගොඩක හිරවෙලා"

අපේ රටේ මේ ආකාරයට හිඟමනට වැටී සිටින්නේ ගොවි මහත්තුරු පමණක්ම නොවේ. නගරයේ වෙසෙන ත්‍රීවීලර් රියැදුරුගේ සිට මාර්කට් එකේ ඉන්නා නට්ටාම්වරයා දක්වා කවුරුත් කියන්නේ එකම කතාවකි.

"මාර්කට් එකට බඩු එන්නේ නැතිව අපිට රස්සාව නැහැනේ මහත්තයා. දවසට සත පහක් හෙව්වේ නැහැ. දැන් වෙලාව හවස තුනයි. අපි උදේ ඉඳලා බලාගෙන ඉන්නවා. මොනවද අද අපි අපේ දරුවන්ට කන්න අරන් යන්නේ. "ඉස්සර මේ මාර්කට් එකට ලොරි එන්නේ එක දිගට. අද එහෙම එන්නේ නැහැ. ලොරිවල වැඩ කරන කම්කරුවොත් අනාතයි. ඒ අයටත් රස්සා නැහැ."

නාටාම්වරුන් පිටකොටුවට අද සිදුවී තිබෙන දුක්බර තත්ත්වය ගැන කියා සිටියේ කේන්තියෙනි. නටාම්වරුන්ගෙන් පසු අපට හමුවූයේ ත්‍රීවීලර් රථ රියැදුරන් කීප පොළකි. ඔවුන් කියන්නේත් වෙනස්ම කතාවකි.

"තෙල් මිල ඉහළ ගිය ගමන් මිනිස්සු ත්‍රීවීලරයේ යන ගමන් සීමා කළා. ඇයි මිල ගණන් දරා ගන්න බැරිව. ඉතින් අපි මේ ත්‍රීවීලර් පාක්වල නවත්වගෙන ඉඳලා සොච්චමක් සොයාගෙන ගෙදර යනවා. ඒ මුදලින් කොටසක් ත්‍රීවීලරය අයිතිකාරයට දෙනවා.

තවත් අය ස්ටෑන්ඩ්වල අසල නෙමෙයි හයර් හොයා ගන්නේ. ත්‍රීවීලරය එළවන ගමන්. දැන් ඒ අයටත් හයර් නැහැ. ඒ අයගේ තෙල් පිච්චෙනවා විතරයි. හැම බඩු මුට්ටුවක්ම ගණන් ගිය කාලේ කෝ මහත්තයෝ මිනිස්සුන්ට ත්‍රීවීලර් එකේ යන්න සල්ලි?"

අපි නගරයේ ජීවත්වන මිනිස්සු හැටියට වතුර ටිකත් බොන්නේ සල්ලි දීලා. අද ගෑස් නැහැ. ලාම්පුතෙල් නැහැ. දර ළිප පත්තු කරගන්න අපි ඉන්න වතු ගෙවල්වල ඉඩ නැහැ. හිතු හිතු මිල ගණන්වලට විකුණන හාල්, සිල්ලර බඩු ටික ගන්න සල්ලි නැහැ.

කොහොමද අපි ජීවත් වෙන්නේ? අපිට සමෘද්ධිවත් නැහැනේ. අපේ දරුවන්ට අපි කොහොමද කන්න දෙන්නේ? මෙසේ කීවේ කොළඹ නගරයේ ත්‍රීවීලර් රථ රියැදුරකු වූ සමන්තය. ඔහු ටවුන්හෝල්, මරදාන, පිටකොටුව ආශ්‍රිතව ත්‍රීවීලරය පදවන රියැදුරෙකි.

අද වනවිට අපේ රටේ බොහෝ ගම්මානවල ජීවත්වන අතිබහුතරයක් දෙනා නගරයට පැමිණ විවිධ රැකියාවල නිරත වෙති. ඒ අතර සිටින සැලකිය යුතුම පිරිසක් වන්නේ ඇඟලුම් කර්මාන්ත ශාලාවල සේවය කරන සේවක සේවිකාවන්ය.

බඩු ගෙන්වන්න ඩොලර් නැහැ කියලා අපිටත් ටික දවසකට නිවාඩු දුන්නා. තව ටික දවසක් බලලා ගමට යනවා. වෙන මොනවා කරන්නද?

කැලණිය එකම නිවෙසක් කුලියට ගෙන ජීවත්වන ඇඟලුම් කර්මාන්ත සේවයේ නිරතව සිටින කාන්තාවන් කිහිපදෙනා එසේ කීවේ දුක්මුසුවය.

අපේ රටේ මහා පරිමාණයෙන් ඇඟලුම් කර්මාන්ත කටයුතු කරන බොහෝ අයගේ රැකියා තවමත් සුරක්ෂිතය. එහෙත් කුඩා පරිමාණයෙන් මේ කර්මාන්තය කරන අය මුහුණපා සිටින්නේ විසඳාගත නොහැකි ගැටලු රැසකටය. අපේ මහත්තුරු කියනවා හැමදේම ගණන්ලු. ඒ මිලට අරගෙන ඇඳුම් මහන එක පාඩුයිලු. මගේ ස්වාමිපුරුෂයා වැඩ කරන්නේ පංචිකාවත්තේ මෝටර් රථ අමතර කොටස් ගෙන්වන තැනක. දැන් එයාටත් රැකියාව නැති වෙන්න වගේ යන්නේ. වාහන අමතර කොටස් ගෙන්වන්න විදිහක් නැහැලු, මිල ගණන් වැඩියිලු. ඊළඟට ඩොලර් නැති නිසා ගෙන්වන එකත් ගැටලුවක් වෙලාලු.

මෝටර් රථ අමතර කොටස් පමණක් නොව, දැන් අපේ රටට ඖෂධ ගෙන්වන ඇත්තෝ පවා මුහුණදී සිටින්නේ ගැටලුසහගත තත්ත්වයකටය. ඇතැම් ෆාමසිවල සේවක සේවිකාවන් අඩුකොට ඇත්තේ ඒවා පවත්වාගෙන යෑමට තරම් ආදායමක් නැති නිසාය.

අපේ රටේ ඩොලර් ආදායම පහළ බහින වටපිටාවක අදාළ ගැටලුව වැඩිපුරම දැනෙන ඊළඟ වැඩබිම වන්නේ හෝටල් කර්මාන්තයයි. අද ගම්බිම්වලින් සේවයට ආ බොහෝ සේවක පිරිසක් එම වැඩබිම හැරදා ගොස් ඇත්තේ ඉහළ පාලන අධිකාරිය කළ දැනුම් දීමකට අනුවය. අපිට කිව්වා උපරිම ගෙවන්න පුළුවන් රුපියල් 12,000ක වැටුපක් විතරයි කියලා. එහෙම කියන ගමන් සේවක පිරිසත් අඩු කළා. වැඩ වැඩි වුණා. කොහොමද මහත්තයා රුපියල් 12,000කින් ජීවත් වෙන්නේ? ඉතින් අපි ගමට ආවා. කසාද බැඳපු නැති කොල්ලෝ ටිකක් ඒ වැටුපට වැඩ කරනවා, කරන්නට දෙයක් නැති නිසා, ගමට ගිහින් ගෙදරින් කන්න පවා බැරි නිසා. අද වෙද්දි හෝටල් කර්මාන්තයත් ඉවරයි.!

මේ අපි ඇසූ තවත් පැත්තක ශෝචනීය කතන්දරයකි.

අද මහා පරිමාණයෙන් කෙරෙන හෝටල්වල තත්ත්වය ඛේදනීයයි. වසා දමා නිකම් පැත්තකට වී සිටින්නට ඇති නොහැකියාව නිසාම ඔවුහු තම හෝටල් සේවාව පවත්වාගෙන යති. නමුත් පසුගිය දිනක සිට සිදුවූ ගෑස් හිඟයත් සමඟ ඇතැම් හෝටල්වල සේවා කටයුතු සම්පූර්ණයෙන්ම අත්හිටුවා තිබේ.

"නැවැත දැනුම් දෙනතුරු ගෙදරට වෙලා ඉන්න කිව්වා. ගෑස් නැතිව උයන්න විධියක් නැහැ කිව්වා. අනේ ඇයි අපිට මෙහෙම වුණේ? අපේ විතරක් නෙවෙයි අපේ දරුවන්ගේ අනාගතයත් ඉවරයි."

මීගමුවේ සුප්‍රසිද්ධ හෝටලයක සේවය කරන තරුණයකු අපිට කීවේ දුක හිතෙන කතාවකි. රැකියාව අහිමි වීම නිසාම ඔහු මුහුණදී සිටින මේ අර්බුදකාරී තත්ත්වය ඔහුටම පමණක් උරුම වූ තත්ත්වයක් යැයි කිව නොහැකිය. ඒ අපේ රටේ බොහෝ තරුණ තරුණියන් මුහුණදී සිටින ගැටලුවක් වී අවසන්ය. "මම විවාහ වෙන්න හිටියේ මැයි මාසේ මුල. දැන් රැකියාව නැහැ. බඳින්න හිටපු ගෑනු ළමයා වැඩ කළෙත් මගේ ආයතනයේමයි. දැන් අපි දෙන්නටම රස්සාව නැහැ. ඉතින් කොහොමද දැන් අපි විවාහ වෙන්නේ? කෝ සල්ලි? අපිට රස්සාවත් නැහැ. ජීවත්වෙන්න සල්ලිත් නැහැ. මෙහෙම දෙයක් කාටවත් වෙන්න එපා!"

මේ වෙද්දී අපේ රටේ කුඩා පරිමාණයෙන් කළ සේවා ආයතන රැසක් තාවකාලිකව හෝ සදාකාලිකව වසා අවසන්ය. ඒවායින් සිදුවූ සේවා වියුක්තිය කොපමණ දැයි කිව නොහැකිය. පෙරකී පරිදි නාටාමි රැකියාව කරන පුද්ගලයාගේ සිට පෙදරේරු රැකියාවට අත්වැල සපයන පුද්ගලයා දක්වා සිටින්නේ පොකැට්ටුව හිස්වය. ඊට අමතරව ඇතැම් සමාගම්වල සේවක සේවිකාවන් පිරිස අඩුකොට ඇත. ඉදින් මෙසේ රැකියා අහිමි වූ පිරිස කුසගින්න නිවාගන්නේ කෙසේද? මිනිසකුගේ මූලික අවශ්‍යතා වන්නේ කෑම බීම ඉඳුම් ඉටුම් සහ ඉගෙනීමය. අද ඇත්තේ ඒ අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි ශෝචනීය වටපිටාවකි.

"අපි ගම්වලට ගිහින් ජනතාව සමඟ කතා කරනකොට අද විවිධ ක්ෂේත්‍රවල ඇතිවී තිබෙන රැකියා පිළිබඳ ප්‍රශ්නය මතුවී පෙනෙවා. එදා සේවක සේවිකාවෝ තියාගෙන කොනරි එකක් කළ තැන ඉන්නේ අයිතිකාරයයි. ඔහුගේ බිරියයි දරුවයි විතරයි. මොකද සේවක සේවිකාවන්ට පඩි ගෙවන්න සල්ලි නැහැ."

"පාරිභෝගික ජනතාව අතේ සල්ලි නැත්නම් බඩු විකිණෙන්නේ නැහැ. එහෙම විකිණෙන්නේ නැත්නම් බඩු නිෂ්පාදනය වෙන්නෙත් නැහැ. දැන් එතකොට ඒ හැම තැනකම පාඩුව දරාගන්න නම් රැකියා අඩු කරන්න සිද්ධ වෙනවා."

"දැන් මේ තෙල් මිල ඉහළ යෑමත් එක්ක හැමදේම ආපසු සැරයක් මිල ඉහළ ගියානේ. ඉතින් එතකොටත් රැකියා අඩු වෙනවා." මෙසේ කියන්නේ ජවිපෙ හිටපු මන්ත්‍රීවරයකු වූ සුනිල් හඳුන්නෙත්තිය.

"අපිට රටේ ඇති වෙමින් පවතින තත්ත්වය ගැන තොරතුරු ලැබෙනවා. නිෂ්පාදකයා දිරි ගන්වන්න, එහෙමත් නැතිනම් නිෂ්පාදනය වැඩි කරන්න ඊට අවශ්‍ය අමුද්‍රව්‍ය අපි ගෙන්වන්න ඕනෑ. ඒකට ඩොලර් අවශ්‍යයි. එහෙම නැති වුණොත් සමාගම් බිඳ වැටීම නවත්වන්න බැහැ. රැකියා විශාල සංඛ්‍යාවක් එයින් අහිමි වෙනවා. ඒක පාලනය කරන්න ආණ්ඩුවට වැඩපිළිවෙළක් නැහැ. ඉදිරියේ අපේ රට ඩොලර් සංචිත අඩුවීම නිසාම විසඳාගත නොහැකි ගැටලු රැසකට මුහුණ දෙන බව ඇත්තකි. මේ යථාර්ථයෙහි ඇති නීරස අසුබ ආරංචිය වන්නේ තවත් සැලකිය යුතු ප්‍රමාණයකින් රැකියා වියුක්තිය ඇති වීමය. ඒ ව්‍යසනය නිසා අපේ රටේ මිනිසුන්ගේ කුස ගින්න වැඩි වෙනවා මිස අඩුවන්නේ නම් නැත."

■ **සමන් ප්‍රියංකර නම්මුනිගේ**

## සබරගමුව පළාත තුළ එයාර්ටෙල් 4G ජාල ආවරණය පුළුල් කිරීමේ කටයුතු අවසන්

එයාර්ටෙල් ලංකා දිවයින පුරා සිය 4G ජාලය ව්‍යාප්ත කිරීමේ සැලසුමේ තවත් අදියරක් සාර්ථකව නිම කරමින් සබරගමුව පළාත තුළ සිය 4G ජාලය පුළුල් කිරීමේ කටයුතු සාර්ථකව අවසන් කළ බව නිවේදනය කර සිටී. රත්නපුර සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මෙම ව්‍යාප්තිය සිදු කොට තිබේ. මෙම අමතර 4G සන්නිවේදන කුළුණු මගින් 50%ක වඩාත් හොඳ ගෘහස්ථ ආවරණයක් සහිත හතරගුණයක් දක්වා වේගවත් අන්තර්ජාල අත්දැකීමක් සමඟින් ඉහළ පරිශීලක අත්දැකීමක් ලබා දෙනු ඇත. එයාර්ටෙල් හි 4G යටිතල පහසුකම් 5G තාක්ෂණය සඳහා ද සූදානමින් යුතුව එන නිසා පහසුවෙන් නව ජාලයට මාරුවීමේ හැකියාව ඇත. දැනට දීප ව්‍යාප්තව ක්‍රියාත්මක 4G ආවරණ ජාලය ව්‍යාප්ත කිරීම යටතේ සියලුම ශ්‍රී ලාංකිකයින්ට හදිසි වෙනසක් සහිත එයාර්ටෙල් හි සුපිරි ජාල අත්දැකීමක් ලබා දෙනු ඇති සුපිරි ස්මාර්ට් ජංගම දුරකතන අත්දැකීමක් පාරිභෝගිකයා වෙත ලබා දීමට එයාර්ටෙල්හි වැඩිදියුණු කළ 4G ජාලය පුළුල් ආවරණයක් සහ ධාරිතාවකින් යුතුව කදිම සුසංයෝජනයක් ලබා දෙයි. මේ යටතේ දරුවන්ගේ සිට වැඩිහිටියන් දක්වා වූ සෑම පරිශීලකයෙකුටම online අධ්‍යාපන කටයුතු, නිවසේ සිට වැඩ කිරීම සහ අන්තර්ජාලය හරහා එකිනෙකා සමඟ සම්බන්ධ වීම ආදී කටයුතු ඇමතුම් බිඳවැටීම්, බාධා ඇතිවීම් හා ආවරණ දෝෂවලින් තොරව භුක්ති විඳිය හැකිය.

මීට අමතරව පරිශීලකයින්ට එයාර්ටෙල් හි සුපිරි 4G ජාලයට වැඩි ප්‍රවේශයක් ලබා දෙමින් සහ ඔවුන්ට අන්තර්ජාලය පුරා සැරිසැරීමේදී වැය කරන මුදල්වලින් 80%ක් දක්වා ඉතිරි කර ගත හැකි එයාර්ටෙල් හි නවතම Freedom Packs අත්විඳීමට ද මෙමගින් අවස්ථාව ලැබේ.




## 05 >> කොවිඩ් අස්සේ විස්කි පාටි දැමූ.....

එක් මන්ත්‍රීවරයකු පවසා තිබුණේ 1922 කමිටුවට අවශ්‍ය ලිපි 54 ළඟදීම සම්පූර්ණ කර ගැනීමට හැකි වනු ඇති බවයි.

මේ අතර අගමැතිවරයාට එරෙහිව ක්‍රියාකිරීමට සැරසෙන මන්ත්‍රීවරුන්ට යම් යම් තර්ජන එල්ල වෙමින් ඇති බවටද චෝදනා නැගෙමින් තිබේ. මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කර තිබුණේ විලියම් විරැග් නමැති කොන්සර්වේටිව් පක්ෂ මන්ත්‍රීවරයෙකි. සිය ඡන්ද කොට්ඨාසවල කටයුතු සඳහා මෙම මන්ත්‍රීවරුන්ට ලබාදෙන ප්‍රතිපාදන කපා හරින බවට තර්ජන එල්ල වෙමින් ඇතැයි ඔහු චෝදනා කර තිබිණි. මෙවැනි තර්ජන සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කරන මෙන්ද ඔහු තර්ජනයට ලක්වන මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා ඇත. මේ ගැන අදහස් දක්වමින් පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයක් වන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායක ශ්‍රීමත් එඩ් ඩේවි පවසා තිබුණේ ජොන්සන් අගමැතිවරයකුට වඩා මාෆියා නායකයකු මෙන් කටයුතු කරමින් සිටින බවයි.

නමුත් ඉහත කී ආකාරයෙන් මන්ත්‍රීවරුන්ට තර්ජනය කිරීමක් ගැන කිසිදු සාක්ෂියක් තමා නොදුටු බව අගමැති ජොන්සන් පවසා තිබිණි. කෙසේ වෙතත්, ඇති වී තිබෙන මෙම තත්ත්වය හමුවේ ඉදිරි කාලය බොරිස් ජොන්සන්ට ඉතා දුෂ්කර කාලයක් වනු ඇති බව අමුතුවෙන් කිව යුතු නැත.


දිනුම් ඇදින ලද දිනය 2022.01.20 බ්‍රහස්පතින්දා www.nlb.lk නිල ප්‍රතිඵල NLB

**මහජන සම්පත** දිනුම් වාරය : 4653 දිනා ඇති මුළු මුදල රු.10,754,670.00

ජයග්‍රාහී අක්ෂරය J ජයග්‍රාහී අංක 9 5 2 3 2 9

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 29,936,979.00

**ගොවි සෙත** දිනුම් වාරය 2948 දිනා ඇති මුළු මුදල රු. 6,254,840.00

ඉංග්‍රීසි අක්ෂරය E ජයග්‍රාහී අංක 17 28 66 69

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 60,601,156.40

**Mega POWER මෙගා පවර් කෝටි 10** දිනුම් වාරය 1001 දිනා ඇති මුළු මුදල රු.4,961,520.00

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු 173,062,382.00

රු 10,000,000.00

රු 10,000,000.00

මෙගා වාසනා අංකය 03054

ඉංග්‍රීසි අකුර U සුපිරි අංකය 02 ජයග්‍රාහී අංක 05 09 42 55

**ධන නිධානය** දිනුම් වාරය 683 දිනා ඇති මුළු මුදල රු. 3,742,980.00

ඉංග්‍රීසි අක්ෂරය R ජයග්‍රාහී අංක 06 45 78 79

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 93,316,102.80

**සුපිරි වාසනා** දිනුම් වාරය 1673 දිනා ඇති මුළු මුදල රු.2,638,140.00

සුපිරි අංකය 13 ජයග්‍රාහී අංක 01 13 21 48

**සෙවණ** දිනුම් වාරය 345 දිනා ඇති මුළු මුදල රු.2,182,700.00

ඉංග්‍රීසි අක්ෂරය G ජයග්‍රාහී අංක 31 32 70 89

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.14,200,340.00

ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01. දු.ක.: 011-4607000, 011-4607001-2 ෆැක්ස්: 011-4669475


## සයවස් පූර්ණ සිහිකිරීම



කුලියාපිටිය කාර්මික විද්‍යාලයේ සේවය කළ ආචාර්ය

**ජේ. ඇම්. ජගත් කුමාර ජයසිංහ මහතා**

ඔබ වෙනුවෙන් 2022.01.22 දින දහවල් සංඝගත දක්ෂිණාවක් පිරිනමා පින් පැමිණවීම.

අව්‍යාජ මිනිස්කම
අමිල ගුණ සුවඳ
මුව පිරූ සිනහපොද
නිරතුරුව සිහිකරමි
දුක හිතේ තදකරන්
පතමි ඔබට අජරාමර නිවන්

ආදරණීය බිරිඳ චිත්‍රා චන්ද්‍රසේකර





භාවිතය අවම කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය

මධ්‍යම පරිසර අධිකාරිය
පරිසර අමාත්‍යාංශය

# සාලියවැව කැලෑබූ තිදරු මවගේ අබිරහස් ඝාතනයේ ඇඟ හිරිවැටෙන කතාව

## එක දිගට වතුර බොමින් සිටි සැකකරුගේ අසාමාන්‍ය හැසිරීම

## තියුණු අවධානයත් නිරීක්ෂණයත් නිසා එළියට ආ අබිරහස

අපරාධයක් සිදුකළ පුද්ගලයකු එම අපරාධය වසන් කිරීම සඳහා නොයෙකුත් උපක්‍රම යොදයි. කිසිවක් සිදු නොවුණු ලෙස හැසිරෙයි. අපරාධය සොයන්නට පොලිසියටද සහය දෙයි. එහෙත් දක්ෂ පොලිස් නිලධාරියාට අපරාධකරුගේ හැසිරීමෙන් ඉරියව් තුළින් ඔහු ගැන කිසියම් සැකයක් ඇති කර ගැනීමට හැකිවේ. අවසානයේ උපක්‍රමශීලී ප්‍රශ්න කිරීම් තුළින් එම අපරාධ සිදුකර ඇත්තේ ඔහු බව ඔහුගේ පෙර හා පසු හැසිරීමෙන් අනාවරණය කර ගත හැකිවේ.

මෙවන් අපරාධකරුවකු සම්බන්ධයෙන් පුවතක් පසුගියදා පුත්තලම පොලිස් කොට්ඨාසයේ සාලියවැව පොලිසියෙන්ද වාර්තා විණි.

සාලියවැව ප්‍රදේශයේ බොහෝමයක් පිරිස් ජීවත්වන්නේ කෘෂිකර්මාන්තයෙනි. තවත් සමහරු එදිනෙදා කුලී වැඩවල යෙදෙමින් දවසේ කුලිය සොයා ගනිති. නගරයෙන් ඇතුළට ඇති ගම්මානවල ජීවත්වන බොහෝමයක් දෙනා තවමත් ගෙවන්නේ කටුක ජීවිතයකි. බොහෝ අඹු සැමියන් අතර ඇතිවන ආරවුල් නිසා පොලිස් පොතද පිරී පවතී. ඉන් අඩක්ම අසාර්ථක පවුල් ජීවිත ගත කරන්නෝ වෙති. සැමියා අතහැර ගිය ගැහැනුන් මෙන්ම බිරියගෙන් වෙන්වී වෙනත් කාන්තාවන් සමඟ පවුල් කන පිරිස් වසමේ දකින්නට හැකිවේ.

ඉන්ද්‍රාණීද එවන් කාන්තාවකි. ඇය පනස් හය හැවිරිදිය. පිරිමි දරුවන් තිදෙනකුගේ මවක් වන ඇගේ සැමියා මීට වසර කිහිපයකට පෙර මියගොසිනි. මේ වනවිට දරුවන්ද කරදඬු උස් මහත් වූවෝ වුවද ඇය එදිනෙදා ජීවිතය ගැට ගසාගන්නේ කුලී වැඩක යෙදෙමිනි. ලොකු කොලුවා දීගෙක ගොස් සිටී. ඇය ජීවත් වන්නේ බාල පුතු සමඟිනි. නැති බැරිකම ඉහවහා ගියද කාලයක් තිස්සේ ඇය මත්පැනට පුරුදුව සිටියාය. හොර රහසේ කෙරෙන නීති විරෝධී මත්පැන්වලට ඇය ඇබ්බැහි වී ඇති සැටියකි.

ඉහළ පුලියන්කුලම ප්‍රදේශයේ පදිංචි ඉන්ද්‍රාණී අතමිට මුදල් අහිමි වූ විට නිවෙසට මීටර දෙසීයක් තුන්සියයක් ඈතින් පිහිටි ගඩොල් සෝමෙගේ තිප්පොළේ ගඩොල් කැපීමට යෑම පුරුද්දක් කරගෙන සිටියාය. ඇය සමඟ තව දෙතුන් දෙනකුම ගඩොල් කැපීම සිදුකළහ.

කපන ලද ගඩොල් ගණනට පමණක් මුදලක් ලබාදීම එහි හිමිකරු ගඩොල් සෝමේගේ ක්‍රියාකලාපය විය.

දින ගණනාවක් ගඩොල් පෝරනුව පැත්තේ නොපැමිණි ඉන්ද්‍රාණී ඉකුත් 15 වැනිදා ගඩොල් කැපීම සඳහා පැමිණෙද්දී බණ්ඩාරද ගඩොල් කැපීමට පැමිණ සිටි අයුරු ඉන්ද්‍රාණී දකින්නට ඇත. බණ්ඩාරද එතරම් හොඳ චරිතයක් ඇත්තකු නොවේ. ඔහුටද දරුවන් දෙදෙනකු සිටී. කෙල්ලන්ම දෙන්නෙක් සිටියද බණ්ඩාරගේ ක්‍රියාකලාපය නොරිස්සූ ඔහුගේ බිරිය ඔහු දමා ගොස් දැනට වසර කිහිපයකි. ඒ නිසා ගඩොල් වැඩපළට යාබදව පැලක් තනාගෙන එහි ජීවත් වන බණ්ඩාර අතමිටට කීයක් හෝ සොයා ගන්නේ ගඩොල් සෝමේ ළඟ ගඩොල් කැපීමෙනි. එලෙස උපයා ගන්නා මුදලද ඔහු වියදම් කරන්නේ මත්පැනට බව ගඩොල් සෝමේ පමණක් නොව ඒ අවට බොහෝ දෙනා දනිති. ඒ නිසා බණ්ඩාර නිතරම සිටින්නේ බීමතිනි. සමහරදාට බණ්ඩාරට දිවා ආහාරය සප්පායම සෝමේ විසිනි. නැතහොත් කුමක් හෝ ව්‍යංජනයක් සමඟ බත් ටිකක් පැලේම සාදා ගැනීමටද බණ්ඩාර පුරුදුව සිටී ඉකුත් පහළොස්වැනිදා උදෑසන බණ්ඩාර හා ඉන්ද්‍රාණී හැරෙන්නට වෙනස් පිටස්තරයකු ගඩොල් කැපීම සඳහා පැමිණ සිටියේ නැත. ගඩොල් පෝරනුවේ හිමිකරුද උදෑසනම වැඩපළ වෙත පැමිණ දෙදෙනාට ගඩොල් කැපීම සඳහා අවශ්‍ය උපදෙස් දී එතැනින් පිටව ගියේ සාලියවැව නගරයට යෑමට තිබූ අවශ්‍යතාව නිසාය. ඒ නිසා එදා ගඩොල් කැපීම සිදුකළේ බණ්ඩාරත් ඉන්ද්‍රාණීත් බව හිමිකරු හොඳින් දැන සිටියේය.

මෙලෙස නගරයට පිටව ගිය පෝරනුවේ හිමිකරු නැවත ගඩොල් වැඩපළට පැමිණියේ දිවා කාලයේය. බණ්ඩාර සුපුරුදු පරිදි ගඩොල් කැපීමේ නිරතව සිටියද ඉන්ද්‍රාණී පෙනෙන තෙක් මානයක නොවීය.

"කෝ බං ඉන්ද්‍රාණී අක්කා" පෝරනුවේ හිමිකරුට බණ්ඩාර පිළිතුරු දුන්නේ වැනි වැනිය.

"උඹ අද උදෙන්ම ගහලා නේද? කෝ බං මේකි කොහෙ ගියාද? ඉතුරු ගඩොල් ටික කපන්නෙ නැද්ද?"

බණ්ඩාර මත්පැනින් සප්පායම් වී ඇති බව දත් හිමිකරු ගඩොල් කැපීම බාගෙට සිදුකළ ඉන්ද්‍රාණී ගැන විමසුවේ ඒ මේ අතද විපරම් කරමිනි.

"අනේ මන්දා මේකි කොහේ ගියාද කියලා. මටත් ඕවට වගකියන්න වෙයිද දන්නෙ නැහැ."

බණ්ඩාර ගඩොල් පෝරනු හිමිකරු ඉදිරියේ මුමුනන්නට වූයේ වෙරි මතිනි.

"මොකටද උඹ වගකියන්නේ. උඹට වගකියන්න හේතුවක් නැහැනේ."

"නැහැ. ඒ වුණාට එකි මගෙත් එක්කනේ ගඩොල් කැපුවේ. ඒකයි මම එහෙම කිව්වේ"

"අනේමන්දා මේකි කොහේ ගියාද මේ වැඩේ බාගෙට කරලා. ගඩොල් 38යි කපලා තියෙන්නෙත්."

"ඔය කොහේ හරි අරක්කු බොනවා ඇති."

බණ්ඩාර එසේ කියමින් සුපුරුදු රාජකාරියේ යෙදෙන්නට වූයේ වෙරිමත ඔහුට එතරම් අපහසුතාවක් ගෙන නොදුන් නිසාය.

කෙසේ වෙතත් 15 වැනිදා රාත්‍රිය නික්මී ගියද ඉන්ද්‍රාණී ගඩොල් වැඩපළට නොපැමිණි අතර ගඩොල් හිමිකරු අනුමාන කළේ ඇය සිය ගෙදරට යන්නට ඇති බවය. එතැනින් එහාට බණ්ඩාරත් ගඩොල් සෝමේත් අතර ඉන්ද්‍රාණී ගැන කිසිදු කතා බහක් ඇති නොවුවද පසුදින ඇය යළි වැඩට එනු ඇතැයි සෝමෙගේ සිතේ විශ්වාසයක් තිබිණි.

16 වැනිදාද ඉන්ද්‍රාණී ගැන තොරතුරක් දැන ගැනීටම ගඩොල් වැඩපළේ හිමිකරුට හැකියාවක් නොලැබුණද සුපුරුදු පරිදි බණ්ඩාර ගඩොල් කැපීමේ නිරතව සිටියේ ඉන්ද්‍රාණී ගැන හාන්කවිසියක්වත් නොදත්තකු ලෙසය.

"අදත් අරකි වැඩට එන්නේ නැහැ වගේ" සෝමේ එසේ කීවද බණ්ඩාරගෙන් ඊට කිසිදු ප්‍රතිචාරයක් නොවීය. ඔහු වෙනදා මෙන් කසිප්පු වඩියකින් සප්පායම් වී සුපුරුදු පරිදි ගඩොල් වැඩපළ ආසන්නයේ ඇති පැල තුළ නිදාගෙන සිටියේය.

16 වැනිදා ගෙවී ගොස් 17 වැනිදාට උදාවුවද ඉන්ද්‍රාණී ගඩොල් කැපීම සඳහා පැමිණ නොසිටියද වෙනදා මෙන් ගඩොල් වැඩපළේ හිමිකරුගෙත් බණ්ඩාරගෙත් අවධානය ඇය වෙත යොමු නොවිණි. සුපුරුදු පරිදි බණ්ඩාරද ගඩොල් කැපීමේ නිරතව සිටි අතර වැඩපළේ හිමිකරු වෙනත් වැඩකටයුතුවල යෙදී සිටියේ එදිනත් ගඩොල් කැපීමට ඉන්ද්‍රාණී අක්කා නොඑන බවට ඇතිවූ සැකයෙනි.

"අයියේ අපේ අම්මා වැඩට ආවේ නැද්ද?"

මේ අතර ඉන්ද්‍රාණීගේ බාල පුතු කලබලයෙන් එතැනට පැමිණ ගඩොල් සෝමෙගෙන් ඒ ගැන විමසුවේ ඒ දින දිකේම තම මව නිවෙසට නොපැමිණි බව සඳහන් කරමිනි.

"ඇයි බං අම්මා ගෙදර ආවෙ නැද්ද? මේ දවස් දෙකේම අම්මා මෙහේ ආවේ නැහැ. පහළොස් වැනිදා දවල් වෙනකම් වැඩකරලා මෙහෙන් ගියා. අඩුම ගානේ මටවත් කිව්වේ නැහැ. ගඩොල් 38ක් විතර කපලා තිබුණා. ඒකේ සල්ලි ගන්නවත් ආවේ නැහැ."

"ඇත්තද අයියේ. මාර වැඩේනේ. අම්මා ගෙදර ආවේ නැහැනේ"

"පුතේ ඉන්ද්‍රාණී අක්කා එදයින් පස්සේ ඇහැටවත් දැක්කේ නැහැනේ."

හිමිකරු බණ්ඩාර දෙසට හැරී එසේ පැවැසුවත් බණ්ඩාරද ඊට හූම්ටි දුන්නේ ඉන්ද්‍රාණී අක්කා දින දෙකක් තිස්සේ ඔහුටද දකින්නට නොලැබූ බව කියමිනි. ඉන්ද්‍රාණී සමහරදාට මෙලෙස දින දෙක තුන වෙනත් ගෙවල්වල නතර වන බව ඇගේ බාල පුතා දැන සිටියද ඒ කිසිදු තැනක මව නොසිටීම ඔහුටද මහත් ප්‍රශ්නයක් ගෙන දුනි. ගඩොල් හිමිකරුත් බණ්ඩාරත් සමඟ එකතුව ඒ අවට විපරම් කළද ඔවුන් කිසිවකුටත් ඉන්ද්‍රාණී සොයාගත නොහැකි විණි.

"කෝකටත් පොලිසියට ගිහින් පැමිණිල්ලක් දාපන්.." ගඩොල් පෝරනුවේ හිමිකරු කියන අයුරු බණ්ඩාරටද ඇසිණි. ඒත් ඔහු තම රාජකාරියේ නිරතව සිටියේ ඉන්ද්‍රාණී ගැන සොයන්නට ඔහුට අවශ්‍යතාවක් නොතිබූ හෙයිනි.

17 වැනිදා දහවල් ඉන්ද්‍රාණීගේ බාල පුතු නිරෝෂන් සාලියවැව පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රියදර්ශන හමුවී තම මවගේ අතුරුදන් වීම සම්බන්ධයෙන් තොරතුරු පවසන්නේ දින දෙකක්ම ඇය ගෙදර නොපැමිණි බවටද පැමිණිල්ලක් පොලිස් පොතේ සටහන් කරමිනි.

"පැමිණිල්ල දැම්මට පස්සේ මමත් ක්‍රයිම් ඕ.අයි.සීත් ටීම් එකකුත් ඔය ගඩොල් පෝරනුව තිබුණු තැනට ගියා. පොලිසියේ ඉඳන් හරියටම තියෙන්නේ කිලෝමීටර් 9 මීටර් 300යි. අපි යනකොට ඔය බණ්ඩාර කියන පුද්ගලයා පෝරනුව ළඟම තියෙන පැලේ හිටියා. අපිව දැක්ක ගමන් මිනිහා මේසය උඩ තිබුණු වතුර බෝතලේ බීගෙන බීගෙන ගියා. අපි බණ්ඩාරගෙන් ඇහැව්වා ඉන්ද්‍රාණී කෝ කියලා. අනේ මම දන්නේ නැහැ සර්.. ඔය කොහේ හරි යන්න ඇති. එදා දවල් ඉඳන් මමත් දැක්කේ නැහැ. ගඩොල් ටිකත් බාගෙට කපලා ගිහින් තියෙන්නේ කියලා මිනිහා අපිට කිව්වා. ඒත් අපේ සැරයන් චරිත්ට මේ පුද්ගලයා ගැන ඒ වෙනකොටත් තොරතුරු ඇවිත් තිබුණේ. අපිට මිනිහගේ කතාවෙනුත් ඉරියව්වලිනුත් පොඩි සැකයක් ඇතිවුණා. අනික මේ ගෑනු කෙනා අන්තිමට ගඩොල් කපලා තියෙන්නේ මෙයත් එක්කනේ. ඒ සැකයත් නිසා මම නිලධාරියෙක් බණ්ඩාර ගාව තියලා අපි ටිකක් කැලේ ඇතුළට ගියා.

අපි ගඩොල් පෝරනුවේ අයිතිකාරයාගෙනුත් ප්‍රශ්න කළා. එයා කිව්වේ උදේ වැඩ පවරලා ගියා. දවල් එයා කෑමත් අරන් එනකොට බණ්ඩාර හිටියා ඉන්ද්‍රාණී හිටියෙ නැහැ කියලයි.

පස්සේ අපි කැලේ ඇතුළට යනකොට අපිට පෙනුණා එක තැනක ගස් කොළන් තණකොළ එහෙම පොඩිවෙලා තියෙනවා. කවුරු හරි එතන වාඩිවෙලා ඉඳලා තියෙනවා වගේ සලකුණු. ඒ නිසා මට සැකයක් ඇතිවුණා මෙතැන කවුරුහරි ඉඳල තියෙනවා කියලා. ඒ සැකය නිසාම තව ටිකක් ඉස්සරහට යනකොට අපිට පෙනුනා ඒ හරියෙත් ගස් කොළන් තැළිලා තියෙන ආකාරය. ඒ කියන්නේ කවුරුහරි බිම දිගේ ඇදගෙන ගිය සලකුණු තිබුණා. දිගටම තණකොළ තැළිලා තිබුණා. එතැනදී අපිට සැකයක් ආවා ඒ වෙනකොට අතුරුදන් වෙලා හිටිය ඉන්ද්‍රාණීට මොනවාහරි කරදරයක් වෙලා තියෙන බවට. අපි තව ටිකක් ඒ අවට සෝදිසි කළා. අපි සැක කළා වගේම ඊට මීටර් සීයක් විතර ඈතින් ඉන්ද්‍රාණීගේ මිනිය තිබිලා අපිට හම්බවුණා. ඒත් යට ඇඳුම් තිබුණේ නැහැ. උඩට ඇඳගෙන හිටියේ අත්දිග ෂර්ට් එකක්. ඒක ඇඹිරිලා කර ගාවට වගේ ඇවිත් තිබුණා. ඒ නිසා අපි විශ්වාස කළා කවුරු හරි ඉන්ද්‍රාණීව කැලේ දිගේ ඇදගෙන ඇවිත් එතැනට දාන්න ඇති කියලා. ප්‍රශ්නයකට තිබුණේ ඉන්ද්‍රාණීගේ මළසිරුර නරක්වෙලා තිබුණු එක විතරයි. ඒ දවස් දෙකේම එතැන තිබුණු නිසා. එහෙත් අපි මේ කිසිවක් නොදැක්ක විධියට නැවතත් ගඩොල් පෝරනුව ළඟට ආවා. බණ්ඩාර කියන පුද්ගලයා එතකොටත් එතැනම හිටියා. අපිට මිනිහා ගැන සැකයක් තිබුණට ඒක තහවුරු කරගන්න විධියක් තිබුණේ නැහැ. අනික අපරාධකාරයෙක් අපරාධයක් කළාම එතැනින් පැනලා යනවනේ. ඒත් මෙයා එහෙම දෙයක් කළා නම් පොලිසියට අහු නොවෙන්න පැනලා යනවා වුණාට මෙයා එතැනම හිටියා. මිනිහා හිටියෙ පැලේ නිසා අපිට මිනිහා මේක කළා කියලා කියන්නත් බෑනේ. මම මුකුත් නොදන්න විධියට බණ්ඩාරට එන්න කියලා ආයෙත් මිනිහගෙන් ඇහැව්වා "කෝ බං මේ ඉන්ද්‍රාණීට මොකද වුණේ" කියලා..."

ස්ථානාධිපතිවරයා එසේ විමසද්දී බණ්ඩාරගේ තොල කට වියැළිනි. ඔහු එතැනම තිබූ වතුර බෝතලයක් ගෙන මුවගට හලාගත්තේ. "අනේ සර්... මම මේ මුකුත් දන්නේ නැහැ. එයා මගේ අක්කා වගේ" යැයි කියමිනි.

"සර් මූ දවල්ට ගෙනාපු බත් එකවත් තවම කාලා නැහැ. මම දිගටම බලාගෙන හිටියේ. මේකා මේ ටිකට වතුර බෝතල් දෙක තුනක්ම එක දිගටම බිව්වා. මූ කතා කරන්නෙත් අමුතු විධියට.."

බණ්ඩාර අසල නතර කළ පොලිස් කොස්තාපල්වරයා ස්ථානාධිපතිවරයා හමුවේ එසේ පවසද්දී බණ්ඩාරගේ පසු හැසිරීම් පිළිබඳ හොඳින් නිරීක්ෂණය කළ පොලිස් ස්ථානාධිපතිවරයා දුටුවේ බණ්ඩාර කිසියම් තැති ගැනීමකින් සිටින බවත් ඔහුගේ ඇඟිලිවල වෙව්ලන ස්වභාවයක් ඇති බවත්ය.

අපරාධකරුවන් සම්බන්ධයෙන් හොඳ හැටි පළපුරුද්දක් ඇති ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රියදර්ශනට බණ්ඩාරගේ පසු හැසිරීම තුළින් ඉන්ද්‍රාණීගේ මරණයට බණ්ඩාරගේ කිසියම් සම්බන්ධයක් ඇති බවට නිගමනය කිරීමට හැකිවිය. වහා මේ සම්බන්ධයෙන් ඔහු සහකාර පොලිස් අධිකාරි සංජීව මහානාම මහතා දැනුවත් කළේය. අනුරාධපුර මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා ලෙස වසර ගණනාවක් සේවය කොට මෑතකදී එම තනතුරට උසස් වීම් ලැබූ ඔහුද අපරාධ විමර්ශනයෙහිලා දක්ෂකම් දැක්වූ නිලධාරියෙක් විය. ඔහුගේ උපදෙස් මත ඉදිරි විමර්ශන ආරම්භ කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රියදර්ශන ඉන්ද්‍රාණීගේ මරණය සම්බන්ධයෙන් වැඩිදුර ප්‍රශ්න කිරීම සඳහා සැකකාර බණ්ඩාරව සාලියවැව පොලිසියට රැගෙන ආවේය.

බණ්ඩාර ඒ වනවිටත් ඉන්ද්‍රාණීගේ මළසිරුර පොලිසියට හමුව ඇති බව දැන සිටියේ නැත. පසුව ඔහුව සිය කාර්යාලයට කැඳවූ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා ඔහුට සිය අසුන ඉදිරිපිට අසුනේ වාඩි ගන්නට ඉඩ සැලැස්විය.

"මාර වැඩේනේ කොල්ලෝ. එතකොට මොකද ඉන්ද්‍රාණීට වුණේ!.."

"අනේ මම දන්නෙ නැහැ සර්... අක්කා කොහේ හරි ගියාද කියලා"

"ඇත්තටම උඹ දන්නෙම නැද්ද"

"නැහැ මහත්තයෝ ඒකිට පිස්සු.. ඒකි එදා වැඩ කළෙත් නැහැ. උදේ ආව වෙලාවේ ඉඳන්ම බොන්න තමයි ඉල්ලුවේ. මම අරක්කු ටිකක් ගෙනාවා. අපි දෙන්නම බිව්වා. ඊට පස්සේ අක්කා කොහේ හරි යන්න ඇති. උන්දෑ කොහේ හරි ඇති මහත්තයෝ... කොහේ හරි බීලා වැටිලා ඇති."

බණ්ඩාර හතර අතේ දිවුරමින් පොලිස් ස්ථානාධිපතිවරයාට කීවේය. රාත්‍රියේ පොලිසියට ගෙනැවිත් දීර්ඝ ලෙස ප්‍රශ්න කළද බණ්ඩාරගෙන් ඉන්ද්‍රාණීගේ මරණය සම්බන්ධයෙන් කිසිදු හෝඩුවාවක් දැනගත නොහැකිවිය. එහෙත් ඉන්ද්‍රාණීගේ මළසිරුර හමුවූ බවක් ස්ථානාධිපතිවරයා බණ්ඩාරට ඒ මොහොතෙත් පැවැසුවේ නැත. ඒ නිසා බණ්ඩාර සිතුවේ පොලිසියට තවමත් ඇය සොයාගත නොහැකි වී ඒ බව තමාගෙන් දැන ගැනීමට උත්සාහ ගන්නා බවය.

කෙසේ වෙතත් ඒ අතරතුරත් බණ්ඩාර පොලිස් නිලධාරීන්ගෙන් වතුර ඉල්ලමින් වතුර වීදුරු කිහිපයක්ම හිස් කළේය. දිගින් දිගටම වතුර බීම ගැන තවදුරටත් සැක පහළ කළ නිලධාරීන් අවසානයේ ඔහුව උපක්‍රමශීලීව කොටුකර ගත්තේය.

"අපි උඹට මෙච්චර වෙලා චාන්ස් දුන්නා. දැන් ඉතින් ඇත්ත කියපන්. උඹ නේද අර ගෑනිව මැරුවේ. අපි ඔක්කොම හොයාගෙන ඉවරයි."

නිලධාරීන් බණ්ඩාර ඉදිරියේ කීවේය. ඒ සමඟම ඔහුගේ මුව ගොළුවිය. ඔහුගේ උගුර කට වියළී ගියේය.

"සර්.. මට වතුර ටිකක්.."

බණ්ඩාර මිමිණුවේය.

ඒ වනවිට වේලාව අලුයම තුනට විතර තිබිණි.

"වතුර දෙන්නම්. ඇත්ත කියපන්කො ඉස්සෙල්ලා"

"සර් මම ඇත්තම කියන්නම් සර්.. අපි දෙන්නා කැලේ ඇතුළට ගිහින් අරක්කු බිව්වා. මමයි අරක්කු ගෙනාවේ. ඒ වෙලාවේ අක්කා මාව බදාගන්න හැදුවා. මම ඒකට කැමැති වුණේ නැහැ. මට කේන්ති ගියා. මම පයින් එයාගේ බෙල්ලට ගැහැව්වා. ඒ පාරට අක්කා වැටුණා. විනාඩි පහක් යනකොට නහයෙන් කටෙන් ලේ ආවා. අක්කාගේ සාය ගලවලා ලේ පිහිදුවා. අක්කා මැරුණු බව මට තේරුණා. පස්සෙ මම අක්කව කකුල් දෙකෙන් ඇදගෙන ගිහින් කැලේ ඇතුළට දාලා පැලට වෙලා හිටියා. මම පැනලා ගියේ නැහැ. එහෙම ගියා නම් පොලිසිය මාව සැකකරන නිසා මම අරක්කු බිබී පැලට වෙලා හිටියා සර්. අනේ සර් මට වතුර.."

ඔහුගේ ඉල්ලීමට කන්දුන් නිලධාරීන් ඔහුට නැවතත් බීමට වතුර වීදුරුවක් දුන්නේය. ඔහු එක හුස්මට එය බීගෙන බීගෙන ගියේය. අවසානයේ දිග සුසුමක් පිටකළ බණ්ඩාර පොලිස් නිලධාරීන් දෙස බයාදු බැල්මක් හෙළීය. නිලධාරියකු ඔහුගේ දෑතට මාංචු යොදවා ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා ඔහු අපරාධ විමර්ශන අංශයට රැගෙන ගියේය.

බණ්ඩාර පවසන පරිදි ඉන්ද්‍රාණී මියගියේ ඔහුගේ පා පහර නිසාද යන්න නිශ්චිත වශයෙන් දැන ගැනීම සඳහා ඉන්ද්‍රාණීගේ සිරුර පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදුකිරීමට පොලිසිය පියවර ගෙන තිබිණි. එහිදී හෙළිවූයේ ඇය පහරදී ඝාතනය කර ඇති බවය.

සැකකාර බණ්ඩාර පුත්තලම මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

වයඹ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සංජීව ධර්මරත්න, පුත්තලම දිසා භාර නියෝජ්‍ය පොලිස්පති ආර්.එම්. නිමල් පෙරේරා, පුත්තලම කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජේ.පී. එස්. ජයමග යන මහත්වරුන්ගේ අධීක්ෂණය මත පුත්තලම සහකාර පොලිස් අධිකාරි III සංජීව මහානාම මහතාගේ උපදෙසින් සාලියවැව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කේ.ජී.පී. ප්‍රියදර්ශන මහතාගේ මෙහෙයවීමෙන් අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක තෙන්නකෝන්, සැරයන්වරුන් වූ පතිරාජ (7014), ගුණවර්ධන (59340), චරිත් (66112) හා කොස්තාපල්වරුන් වූ සෙනෙවිරත්න (74988) ලියනාරච්චි (87169) යන නිලධාරීහු මෙම විමර්ශනවලට එක්ව සිටියහ.

(පොලිස් පරීක්ෂණ ඇසුරෙන් ලිපිය සකස් කෙරිණි.)

■ කීර්ති මෙන්ඩිස්






සංජීව මහානාම සහකාර පොලිස් අධිකාරී පුත්තලම කොට්ඨාශය III




කේ. ජී. පී. ප්‍රියදර්ශන ප්‍රධාන පොලිස් පරීක්ෂක ස්ථානාධිපති සාලියවැව




කොළඹ 07, රොස්මීඩ් පෙදෙසේ, අංක 101 හි පිහිටි සීමාසහිත සිලෝන් නිව්ස්පේපර්ස් පෞද්ගලික සමාගම විසින් ජා ඇල, මිනුවන්ගොඩ පාරේ, 302/1/A හි පිහිටි සිය මුද්‍රණාලයේදී මුද්‍රණය කරනු ලැබ ප්‍රසිද්ධ කරන ලදී.

# වල්සපුගල මහ වන මැද අතීත-අනාගත උරුමයන් වෙනුවෙන් පාරමිතා පුරන බුද්ධ පුත්‍රයෙක්





## වැනසෙන ගල්පාය-මාගම්පුර රාජධානියේ පුරාවස්තු

## ඊනියා අලි කළමනාකරණ කෙරුවාවෙදි සිදු කරන වංචා

■ කතාව - ප්‍රභාත් අත්තනායක
පින්තූර - රුක්ගහවිල ඒ. දේවේන්ද්‍ර

**ඊ.එච්.කා. යනු නූතන ඉතිහාසඥයන් අතර අතිශයින් සම්භාවනාවට පත්වූ විද්වතෙකි. ඔහු එක්සත් රාජධානියෙහි කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයෙහි උපාධි අපේක්ෂකයන්ට පවත්වා ඇති දේශනයන්ගේ එකතුවක් ඉතිහාසය යනු කුමක්ද? යනුවෙන් සිංහලෙන් පළව තිබේ. ඔහුට අනුව අනාගතයේ පහන අතීතයයි. අතීතයේ පහන අනාගතයයි.**

මෙම ආස්ථානය වල්සපුගලට පමණක් අදාළ නොවන්නේ මන්ද? වල්සපුගලටද ප්‍රශංසා කටයුතු ඉතිහාසයක් හිමි බව එහි සැඟව ඇති සාධක කියාපායි. එකී අතීත ආලෝකයෙන් දිස්න දී වර්තමානයෙහිද වල්සපුගල බැබළෙනයුරු වටහා ගැනීමට නම් අප විසින් එම ඉපැරැණි ඉතිහාසයට අදාළ සාක්ෂි සොයා යා යුතුමය. අප්‍රබුද්ධ බවේ අඩයාලමෙන් වල්සපුගල වැසියන්ට සමච්චල් කිරීම සැබැවින්ම යහපත් බවේ සාපයකි.

සද්භාවයකින් යුතුව ආරම්භ කළ අපගේ මෙම කාර්ය මුදුන් පමුණුවා ගැනීම සඳහා සහාය වන්නේ මේ වනවිටත් වල්සපුගල මහ වනයේ පුරාවිද්‍යාත්මක සාක්ෂි අනාගත පරපුරට දායාද කර දීම සඳහා කර්කශ දිවියක් ගෙවනා වල්සපුගල ඉන්ද්‍රසාර හිමියන්ය. උන්වහන්සේ ගිහි කල වල්සපුගල වැසියෙකි. බාල වියේ සිට මෙම මහ වනයේ සැඟව ඇති පුරාවිද්‍යාත්මක වටිනාකම් හඳුනාගන්නා උන්වහන්සේ මහණදම් පිරීම ආරම්භ කළ මොහොතේදී තමා විසින් ඉටු කළ යුතු පළ මු කරුණ ලෙස හඟන්නේ මෙම මහ වනය තුළ සැඟව ඇති අතීත උරුමයන් නූතන පරම්පරාව වෙත රැගෙන ඒමය.

උන්වහන්සේගෙන් දිස්වන්නේ යෞවනය එක රැයකින් ආශයකි. උන්වහන්සේගේ ගාම්භීර මහේශාක්‍ය පැවැත්ම සහ විටකදී මුවින් පිටවන වැකිවල යටිපෙළ කියාපාන්නේ තම ශ්‍රද්ධානයන් ආරක්ෂා කර ගැනීම අරමුණු කරගෙන ජීවිතය ගෙවා දමන්නකු ලෙසිනි. මා අසා ඇති ආකාරයට උන්වහන්සේ වල්සපුගල වැසියන්ට ගෑවිලාවත් නැති සෞම්‍ය මිහිරද ලබාගෙන ඇත්තේ මවු පාර්ශ්වයෙනි. හුදෙකලා වින්දනයක ලැබූ ලෙස එය නිවුණු ආත්මය මේ ගන වනය තුළ ගෙවා දැමීම සඳහා උන්වහන්සේ කෙරේ ඇති ආත්ම ශක්තියට අප ගරු කළ යුතුමය. එය සමබරතාවයේ සහ ශාන්තභාවයේ අපූරු හාස්කමකි.

"මම වල්සපුගල මේ මහ වනයට ඇවිදින් දැනට වසර 06කේ. අපි කුඩා ළමයින් කාලයේ සිට මෙම කැලයේ තිබෙන නොයෙකුත් පුරාවිද්‍යාත්මක සාක්ෂි බලන්න එනවා. අවුරුදු කිහිපයක් ඇතුළත එම පුරාවිද්‍යාත්මක සාක්ෂි නිදන් හොරුන් විසින් විනාශ කළ ආකාරය මම දැක්කා. ගිහි ජීවිතයෙන් මිදිලා මහණදම් පුරන්න ගත්තට පස්සේ මට ඕන වුණේ මෙම පුරාවිද්‍යාත්මක සාක්ෂි අනාගත පරපුරට දැකගත බලාගත හැකි ආකාරයට අවම මට්ටමකින්වත් පවත්වාගෙන යන්න. මගේ ගවේෂණයට අනුව මෙම වල්සපුගල මහ කැලයේ වෙහෙර විහාර යැයි උපකල්පනය කළ හැකි පුරාවිද්‍යාත්මක ස්ථාන පහකට වඩා වනය විසින් ගිල ගනිමින් පවතිනවා.

21>>



---

# ජෙරාඩ් මෙන්ඩිස් සහ කොකා-කෝලා සමඟින් මෙනුපතට එක් වන සැබෑම මායාව




චොක්ලට් නිෂ්පාදකයෙකු මෙන්ම ප්‍රවීණ සූපවේදියෙකු ලෙසින් නම් දරා සිටින ජෙරාඩ් මෙන්ඩිස්, ප්‍රබෝධමත් කෝක් පානයක් සමගින් රස විදිය හැකි ආහාර වර්ග සොයා යාම සදහා කොකා-කෝලා සමගින් අත්වැල් බැඳගෙන සිටියි. කොළඹ නරගයේ ඉහළ පෙළේ අවන්හල් වෙත ගොස් ඒහි සූපවේදීන් සමග කරන කතබවට ජෙරාඩ් සමඟින් ඔබත් එක්වන්න. මේ සතියේ ජෙරාඩ් 'පිස්සු හැදෙන ඉස්සො' සොයා ගියේ කොහේදැයි බලමු..

අපි හැම දෙනා සතුවම අපටම ආවේණික වූ රුචි අරුචිකම් සහ තේරීම් තිබෙනවා. ඒ වගේම සමහර කෑම වර්ගවල සුසංයෝගය මොනයම් හෝ හේතුවක් මත වෙනස් කිරීමට සිත් දෙන්නේ නැහැ. කොකා-කෝලා සහ සීෆුඩ් කියන්නේත් ඒ විදිහට නිර්මාණය වූ දිව පිනවන, අසමසම රසයක් ගෙන එන කදිම සුසංයෝගයක්. ඉස්සන් මූලිකව යොදා ගනිමින් මුහුදු ආහාර (සීෆුඩ්) පිරිනමන ඉස්සෝ නම් භෝජනාගාරය ගැන බොහෝ දෙනකුගෙන් ආකර්ෂණීය දේ දැනගැනීමෙන් පසු ඉස්සෝ සහ එහි ප්‍රධාන සූපවේදී නිශාන්ත ඉන්ද්‍රජිත් හමු වී ඉස්සෝ සහ කොකා-කෝලා එක්ව නිර්මාණය වන ගැලෙපීම අත්දකින්න මම එහි ගියා.

කවදත් 'ඉස්සෝ පිස්සෙක්' වන මා, ඔවුන්ගේ ජනප්‍රියතම ආහාර වේල් අතරට මා රැගෙන යමින් ඉස්සෝ 'පිස්සු හැදෙන' කෑම වර්ග පෙළක් මා වෙත ඉදිරිපත් කළා.

තෝරාගැනීමට රසයෙන් අනූන ආහාර වර්ග රැසක් තිබුණත් බේක් කළ කකුළුවන්, ඉස්සෝ බිරියානි සහ Northern Twist මාගේ ප්‍රියතම තේරීමයි. Northern Twist කියන්නේ ඉස්සෝහි ආහාර ලැයිස්තුවේ ජනප්‍රියතම අංගයක්, ඊට හේතුව මට ඉතා හොදින් පැහැදිලියි. ඉතා සියුම් ලෙස සුපරීක්ෂාකාරීව පවුලේ ක්‍රමයට සකස් කළ රසයෙන් අනූන ආහාර වට්ටෝරුවක් සූපවේදී ඉන්ද්‍රජිත් සහ කණ්ඩායම ඉතා දක්ෂ ලෙස මේ සදහා යොදාගෙන තිබෙන අතර සුවිශේෂී යාපන තුනපහ මිශ්‍රණයක් යොදාගනිමින් සකස් කරන ව්‍යංජනය කවදාවත් මට අමතක වන්නේ නම් නැහැ.

මාගේ රාත්‍රී ආහාර වේලෙහි කැපී පෙනෙන අංගය වූයේ බේක් කරන ලද කකුළුවන්. මේ ව්‍යංජනය මෙතරම් රසවත් වීමට හේතුව වූයේ සියලු රසයන්හි සාරය කැටි වූ නිමාවක් ලබාදීමට සූපවේදී ඉන්ද්‍රජිත් යොදාගත් හතු තෙල් (truffle oil) වර්ගයයි. ඒ වගේම සම්පූර්ණ ඉස්සන් භාවිත කර පාන් කුඩු දවටාගනිමින් සකස් කළ සුවිශේෂී පිරවුමක් සමගින් එන ඉස්සෝ බර්ගර් එකත් මාගේ ප්‍රියතම ලැයිස්තුවට ඇතුළත් වෙනවා. රසයෙන් පිරි ක්‍රිස්පි එම පිරවුම සහිත බර්ගර් එකත් අනිවාර්යයෙන්ම රස බැලිය යුතුයි.

මම පරණ තාලේ කියලා කිව්වත් කමක් නෑ... ඒත් කෝක් එක්ක හොදින්ම ගැලපෙන්නේ බිරියානි කියන එකයි මගේ අදහස. ඉස්සෝ සකසක සියලුම ආහාර වර්ග සමග කෝකා හොඳින් ගැලපුනත් සීතල කොකා-කෝලා බෝතලයක් සමඟ වඩා හොදින් ගැලපෙන්නේ ඉස්සෝ බිරියානි එකයි. මේ බිරියානි පිසීමේදී රෝස වතුර ස්වල්පයක් එක් කිරීමෙන් ලබාදෙන අවසන් ප්‍රතිඵලය ඔබට උතුරු ඉන්දියාව සහ මැද පෙරදිග මතක් කරන බවට සැකයක් නැහැ.

'ඉසි - විශිෂ්ටයි'...

ඕනෑම ආහාර ලෝලියකුට රස විඳිය හැකි අපූර්ව රසයන්ගෙන් යුත් මුහුදු ආහාර ඇති ඉස්සෝ වෙත පළමුවරට ගිය අමුත්තකු ලෙසින් මට පැවසිය හැක්කේ ඉස්සෝ යනු මාගේ දවසේ හොඳම සිදුවීම බවයි. සීතල කෝක් රස විදිමින් ඉතාලියේ රසවත් ආහාර සොයා යන මාගේ ඊළඟ සවාරියට ඔබත් එක්වන්න.













# හැමෝම එකතුවෙලා ආණ්ඩුව හදලා දැන් උඹලා පලයල්ලා කියන්න බෑ



කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී

## අනුර ප්‍රියදර්ශන යාපා

**මේක ආණ්ඩු හදන වෙලාවක්වත් පෙරළන වෙලාවක්වත් නෙවෙයි**

**පුද්ගලබද්ධ දේශපාලනයක් තවදුරටත් අවශ්‍ය නෑ**

**මහින්ද අගමැතිතුමා තමයි සන්ධානයේ ලයිව් වයර් එක**

**ඇමැතිලා තමන්ගේ විෂය හරියට කරනවද කියන එකත් ප්‍රශ්නයක්**

**ඉදිරිගාමී අදහස් ඉදිරිපත් කරන අලුත් බලවේගයක් රටට අවශ්‍යයි**

**වැරැදි කළමනාකරණය නිසා රටේ ආර්ථිකය අවපාතයකට ගියා**

**රට බංකොලොත් වෙලා, මිනිස්සු ජීවත් වෙන්නෙ අසීරුවෙන්. නමුත් ආණ්ඩුව කිසි දෙයක් කරන්නෙ නෑ කියලා මිනිස්සු චෝදනා කරනවා?**

පසුගිය වසර දෙක තුළ අපි කොවිඩ් වසංගතයට මුහුණ දුන්නා. ඒ නිසා රටට එන ආදායම් අඩු වුණා. එයින් ප්‍රධානම දෙකක් තමයි සංචාරක කර්මාන්තය සහ විදේශ ප්‍රේෂණ. මේ දෙකම කොවිඩ් නිසාම අඩු වුණා කියලා මම කියන්නෙ නෑ. මොකද ගෙවුම් ශේෂය ගැන අපිට දීර්ඝ කාලීන ප්‍රශ්න තිබුණා. ආනයන වැඩි වෙලා අපනයනය අඩු වීමත් එයට බලපෑවා. රුපියලක දෙයක් අපනයනය කළොත් රුපියල් තුනක දෙයක් ආනයනය කරන්න සිදුවුණා. ඒවාට අතිරේකව මේ ප්‍රධාන ආදායම් මාර්ග දෙක අඩුවීම නිසා ගෙවුම් ශේෂයට බරපතළ ප්‍රශ්න ඇති වුණා. රටට ගෙවන්න තියෙන ණය වැඩිවෙලා ආහාර, ඉන්ධන, ඖෂධ ලබාගැනීමේ ගැටලු නිර්මාණය වීමත් සමඟ රටේ ආදායම් අඩු වීමත් වේගයෙන් සිදුවුණා. බදු සහන ලබාදීම සහ රාජ්‍ය සේවය පුළුල් වීම සහ ඒ සඳහා ගෙවීමට තිබෙන වැටුප් සහ විශ්‍රාම වැටුප් නිසා ඒ තත්ත්වය තීව්‍ර වුණා. මම මේ ප්‍රශ්නවලට මේ රජයට දොස් කියන්නෙ නෑ. ඒ වැඩේට මම එච්චර කැමැතිත් නෑ. මේ ප්‍රශ්නවලට මෙතෙක් සිටි ප්‍රතිපත්ති සම්පාදකයෝ සහ මෙතෙක් සිටි මහ බැංකු අධිපතිවරු සහ මෙතෙක් සිටි සියලු මුදල් අමාත්‍යාංශ ලේකම්වරු වගකිව යුතුයි. ඔවුන් අතින් එදත් මේ වැඩේ හරියට වුණේ නෑ. අදත් වෙන්නෙ නෑ.

**ජනාධිපතිවරයාගේ රාජාසන කතාව තුළ මේ ප්‍රශ්නවලට විසඳුම් තිබුණේ නැද්ද?**

ඕනෑම ජනාධිපතිවරයෙක්ට කෙටිකාලීන සහ දිගුකාලීන වශයෙන් සැලසුම් තිබෙනවා. ආර්ථික උපදේශකයන්ගෙ උපදෙස් මත ඒවා ක්‍රියාවට නැඟෙනවා. එතුමා යම් යම් විසඳුම් කිව්වා. ඒ අතර දිගුකාලීන විසඳුම් රැසක් කිව්වා. ඒක රටකට අවශ්‍යයි. නමුත් මේ මොහොතේ ක්‍රියාත්මක කළ යුතු කෙටිකාලීන විසඳුම් සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කිරීමක් කළා නම් හොඳයි කියලා මට සිතෙනවා.

මෙතැනදි ප්‍රතිපත්ති සම්පාදකයන්ට විශාල වගකීමක් තිබෙනවා රජයට නිවැරදි උපදෙස් දීම සම්බන්ධයෙන්. නිවැරදිව ආර්ථිකය මෙහෙයවීමට උපදෙස් ලබාදීම වෙනුවට ඔවුන් කරන්නෙ ඔවුන් කැමැති දේශපාලන උපදෙස් ලබාදීම. ඒකෙන් වෙන්නෙ ප්‍රශ්න තව තවත් උග්‍ර වෙන එක.

**ඔබ කියන්නෙ මේ මොහොතේ තිබෙන ප්‍රශ්නවලට රාජාසන කතාව තුළ විසඳුම් තිබුණේ නෑ කියලද?**

මේ මොහොතේ අපිට ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් තිබෙනවානෙ. ඉන්ධන ගෙන්වා ගන්න, රටට විදුලිය සැපයීමට සහ රටේ අනෙකුත් කටයුතු කරගෙන යෑමට ගැටලුවක් තිබෙනවා. මේ දේවල් කරන්න ජාත්‍යන්තර වශයෙන් මුදල් එකතු කරගන්නෙ කොහොමද කියලා ගැටලුවක් අපිට තිබෙනවා. ඉතින් ඒ සම්බන්ධයෙන් අපි අවධානය යොමු කළ යුතු වෙනවා.

**විපක්ෂය සහ දේශපාලන විචාරකයන් කියන්නෙ ජනාධිපතිවරයාගෙ විසඳුම් ප්‍රායෝගික නැහැ කියලා?**

එතුමාටත් ප්‍රශ්න තිබුණා. එතුමාගෙ පැත්තෙනුත් සාධාරණව බලන්න ඕනෑ. එතුමා රට භාරගන්න විට මේ රටේ විදේශ විනිමය සංචිත බිලියන 7.9ක් තිබුණා. නමුත් ඒක දිගටම පවත්වගෙන එන්න හිටපු මහ බැංකු අධිපතිවරයා සමත් වුණේ නෑ. ඔහු ඔහුගේ කාර්ය හරියට කළේ නෑ. රටක මහ බැංකුවට ලොකු වගකීමක් තිබෙනවා අපේ තිබෙන සංචිත ප්‍රමාණය පවත්වාගෙන යෑමට. නමුත් ඒක කළේ නෑ. ඔහේ පාවෙන්න ඇරියා. මේවා ගැන යළි සමාලෝචනයක් කළ යුතුයි කියලා මම හිතන්නෙ.

**සන්ධාන දේශපාලනය කියන්නේ පහසු දෙයක් නෙවෙයි**

**විපක්ෂය වී පාටිය මඟහැරියෙත් මේකට විරෝධය පෑමක් විධියට නේද?**

ආණ්ඩුවක හෝ විපක්ෂයක සිටින විට අපි පවතින තත්ත්වයන් අවබෝධ කරගන්න ඕනෑ. දුෂ්කර අවස්ථාවලින් ගොඩඑන්න හැමෝගෙම සහාය අවශ්‍ය වෙනවා. රජයත් ඒක පැහැදිලිව ඒ අයට කිව යුතුයි. ඒ අයත් නම්‍යශීලී විය යුතුයි සාකච්ඡාවකට අවතීර්ණ වීමට. මොකද එහෙම නැතිව අපිට ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරගන්න බෑ. මේ වෙලාව ආණ්ඩු හදන වෙලාවක්වත් ආණ්ඩු පෙරළන වෙලාවක්වත් නෙවෙයි.

**තෙල් සම්බන්ධව ඔබත් ඇමැතිකම් කරලා තිබෙනවා. අපි දැන් මුහුණ දෙමින් සිටින තෙල් අර්බුදය ඔබ දකින්නෙ කොහොමද?**

මේක විශාල අර්බුදයක්. නමුත් අද ඊයෙ ඇති වුණු එකක් නෙවෙයි. තෙල් සංස්ථාව දීර්ඝ කාලයක සිට ජනතාවට සහන දුන්නා. ගෙන්වන මිලට නෙවෙයි විකුණන්නෙ. අඩු මිලට. රජයේ ආයතනවලට නොමිලේ දෙනවා. ජනතාවට සහනාධාර විදියට දෙනවා. මේ නිසා සපයන ප්‍රමාණයන්ට අදාළව මුදල් ගන්න හැකියාවක් ඇත්තෙත් නෑ. ඒ නිසා නියමිත මුදල් ලැබෙන්නෙ නෑ. ඒ නිසා බැංකු දෙකටම තෙල් සංස්ථාව ඩොලර් බිලියන 3.5ක් වගේ ප්‍රමාණයක් ණයයි. ඒ නිසා තෙල් ගේන්න සල්ලි නැහැ. අනෙක් පැත්තෙන් විදුලිබල මණ්ඩලයටත් ප්‍රශ්නයක් තිබෙනවා. ඔවුන් පළමුවැනි ඒකක 90ම දෙන්නෙ අඩු මුදලට. මේ දෙකම නිසියාකාරව කළමනාකරණයක් වෙන්නෙ නෑ. ඒක ලොකු අඩුවක්. දැන් ඒක රටට බරක්. මේකෙ අවසාන අදියරේ තමයි දැන් අපි ඉන්නෙ.

**නමුත් මේ ප්‍රශ්න අද ඊයෙ ඇතිවුණු ඒවා නෙවෙයි නේද. ඔබ ඇමැතිකම් කරපු කාලෙත් යම් යම් ගැටලු තිබුණා?**

ඔව්. මම කියන්නෙ නෑ මේවා මේ අද ඊයේ ඇතිවුණු ප්‍රශ්න කියලා. දීර්ඝ කාලයක් තිස්සෙ තමයි මේ ගැටලු තිබෙන්නෙ. නමුත් 2013 මම තෙල් සංස්ථාව භාර ගන්න විට අලාභය තිබුණේ රුපියල් මිලියන 85,000යි. නමුත් මම ණය අය කළා. කාටවත් ණය වෙන්න දුන්නෙ නෑ. ඉන්ධනහල්වලට තෙල් දුන්නම වහාම මුදල් ගෙවන ක්‍රමයක් හැදුවා. මම ගිණුම් දෙකක් හැදුවා. ඒවට මුදල් බැර කළොත් පමණයි අපි තෙල් දුන්නෙ. 2014දී මම රුපියල් මිලියන 7,900කින් පාඩු අඩු කළා. රුපියල් බිලියන 1.4ක මෙහෙයුම් ලාභයක් පෙන්වුවා. නමුත් ආණ්ඩුව වෙනස් වුණු නිසා දිගටම ඒ කටයුතු කරන්න බැරි වුණා. දීර්ඝ කාලයක් තිස්සේ අපේ රටේ තිබෙන වැරදි කළමනාකරණය නිසා අද විශාල ආර්ථික අවපාතයකට අප ගොස් තිබෙනවා. රජය සහනාධාරයක් දෙනවා නම් ඒක භාණ්ඩාගාරයෙන් දෙන්න ඕනා. රජයේ ආයතනවලින් ඒක කරලා හරියන්නෙ නෑ.

**ඇමැති විදුලිය කප්පාදු කරන්නෙ නෑ කියලා කිව්වට විදුලිබල මණ්ඩලය එකපාරටම විදුලිය කැපුවා. ඇයි ඇමැතිවරු මේ විදිහට මිනිසුන්ට බොරු කියන්නෙ?**

විදුලිබලය තිබෙන්නේ ජනනය මත. පසුගිය කාලයේ අලුත් ජනන මධ්‍යස්ථාන ඇති වුණේ නෑ. ඉන්දියාව සමඟ සාම්පූර් බලාගාරය හදන්න එකඟවෙලා සිටියත් ඒක වුණේ නෑ. ඉන්පසුව අපිට එන්න තිබුණේ එල්.එන්.ජී. නමුත් ඒකට ආපු ඉල්ලීම් සම්බන්ධව ගිවිසුම තවමත් ඒ ඉන්ජිනේරු මහත්වරු හදනවා. මොකද ජනන සැලැස්ම සම්බන්ධයෙන් රජය සහ ඉන්ජිනේරුවන් අතර ගැටලුවක් තිබුණා. ඒක තවම විසඳිලා නෑ. මේවා විසඳන්න වෙන්නෙ ආර්ථික කළමනාකරණයකින් විතරයි. ආණ්ඩුව මර්මස්ථාන කියලා වතුර, ගෑස්, තෙල්, ලංගම, විදුලිය, ශ්‍රීලන්කන් එයාර් සමාගම ආදිය තියාගන්නවා. නමුත් මේවා කළමනාකරණය කරගන්න රජය අපොහොසත්. ඒ නිසා මේවා රාජ්‍ය - පෞද්ගලික රාජ්‍ය ආයෝජනයන් යටතට පත් කරන්න ඕනෑ. එහෙම කරලා ආණ්ඩුව මේ මහා බරෙන් ගැලවෙන්න ඕනෑ. එහෙම නැතිව මේ ගැටලු විසඳන්න බෑ.

**ත්‍රිකුණාමලේ තෙල් ටැංකි ගිවිසුම නිසා ආර්ථිකයට ලොකු ප්‍රතිලාභ ටිකක් ලැබෙනවා කියලා තමයි විෂය භාර ඇමැතිවරයා කියන්නෙ. මේ තියෙන ගැටලුවලට මේකෙන් සහනයක් ලැබෙයිද?**

මේ තෙල් ටැංකි හැදුවේ දෙවැනි ලෝක යුද්ධ කාලේ. වසර 70ක් අපි මේවාගෙන් ප්‍රයෝජන ගත්තෙ නෑ. ඉන්දු - ලංකා ගිවිසුමේදී ලංකා ආණ්ඩුවයි ඉන්දියානු ආණ්ඩුවයි හවුල් ව්‍යාපාරයකට තමයි අස්සන් තැබුවේ. හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරනවාට මගෙ කිසි ආරවුලක් නෑ. මම කැමැතියි ඒකට. නමුත් ආරක්ෂාව ගැන ප්‍රශ්නයක් තිබෙන බවත් ඇතැම් පාර්ශ්ව කියනවා. එහෙම වෙන්නත් පුළුවන්. මොකද ලංකාව තිබෙන මර්මස්ථානය අනුව යම් වැරදි අතකට මේක ගියොත් ඒක ඉන්දියාවේ ආරක්ෂාවට ප්‍රශ්නයක් වෙනවා කියලා ඔවුන් ගොඩනඟන මතයේ වරදක් කියන්නත් බෑ. මට මේ හවුල්කාරීත්වය සම්බන්ධයෙන් ගැටලුවක් නෑ. නමුත් මට මේ සම්බන්ධයෙන් තිබෙන්නෙ එකම එක ගැටලුවයි. ඉන්දියාව කොපමණ ප්‍රමාණයක් මේ සඳහා ආයෝජනය කරනවද කියන එක තමයි තවම මට අපැහැදිලි. ඒ ගැන තවම පැහැදිලිව කියලත් නෑ. අස්සන් කළා විතරක් නෙවෙයි, කොපමණ තාක්ෂණික හැකියාවන් ඉන්දියාව අපේ පැත්තට ගේනවද? තෙල් පිරවීම රජයට දෙනවද? පිටරටට විකුණනවද? කියන කාරණා ගැනත් තව පැහැදිලිව කියන්න ඕනා.

**ත්‍රිකුණාමලේ තෙල් ටැංකි ගිවිසුමේදී ඉන්දියාව කොපමණ ප්‍රමාණයක් ආයෝජනය කරනවාද කියලා හරියට කියන්න ඕනෑ**

**ජනාධිපතිවරයා මේ වෙද්දි ගැසට් 22ක් ගහලා අමාත්‍යාංශ විෂය පථ වෙනස් කොට තිබෙනවා. මේකෙනුත් පේන්නෙ ඔහුගේ නිවැරදි තීන්දු තීරණ ගැනීමේ නොහැකියාව නේද?**

අමාත්‍යවරයෙක්ට පුළුවන් වෙන්න ඕනෑ තමන්ට ලැබුණු අමාත්‍යාංශය දිගු කාලීන සහ කෙටි කාලීන සැලසුම් අනුව ගෙනියන්න. ඒ වගේම රජයකට පුළුවන් වෙන්න ඕනෑ ඒ රාජ්‍ය ආයතනවල අනාගතය තීන්දු වෙන ආකාරය ගැන සිතලා ප්‍රතිපත්තිමය තීන්දු ගන්න. නමුත් මේ දෙකම අද හරියට වෙන්නෙ නෑ. ඇමැතිවරු තමන්ගේ විෂය පථයන් හරියට කරනවද කියන එකත් ප්‍රශ්නයක්. අනෙක් කාරණය තමයි සේවකයො බලන්නෙ ආයතන එයාලට අවශ්‍ය විදියට මෙහෙයවන්න. හැමදාම රජයයි වෘත්තීය සමිතියි ගැටුම්. කෙළින් කතා කරලා මේවා විසඳගන්න ඕනා. විනිවිදභාවයකින් යුතුව සෑම ගනුදෙනුවක්ම වෙන්න ඕනෑ. විනිවිදභාවයකින් වැඩ කළාම සේවකයන්ට ප්‍රශ්න අහන්නත් විසඳගන්නත් අයිතියක් ලැබෙනවා. රජයටත් පුළුවන් අපි මෙන්න මේකයි කරන්නෙ කියලා ඔවුන්ට කියන්න. දැන් මේ දෙකම වෙන්නෙ නෑනෙ. සෘජුව සාකච්ඡාවක් නොමැති වීම, පවතින පරිමාව ගැන අවබෝධයක් නැතිකම, කළ යුතු දේ නියමිත වෙලාවට නොකිරීම ආදිය නිසයි මේ සෑම ප්‍රශ්නයක්ම ඇති වී තිබෙන්නෙ.

**ප්‍රතිපත්තියක් නැතිව ආවම අඟ-මුල දන්නේ නැහැ**

**ඔබ ඔය අවසානයට කියපු දේවල් ටික ආණ්ඩුව ඇතුළෙත් වෙන්නෙ නැති නිසා නෙවෙයිද ආණ්ඩු අභ්‍යන්තරයෙත් ගැටලු ඇති වෙලා තිබෙන්නෙ?**

අපි ඉන්නෙ 21 වන ශත වර්ෂයේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ. සෑම දෙයක් ගැනම මිනිස්සුන්ට කුහුලක් තිබෙනවා, විවේචනයක්, මතයක් තිබෙනවා. මම සිතන්නෙ ආණ්ඩුව කරන කියන දේවල් ගැන හරි දෙයක් ඇමැතිවරු ලවා ජනතාවට කියවන්න පුළුවන් වෙන්න ඕනා. ඒ පැහැදිලි කිරීම් ජනතාවට විතරක් නෙවෙයි පාර්ලිමේන්තුවටත් කරන්න ඕනා. ඒක කරනවා නම්, නිවැරදි තීන්දු ගන්නවා නම් මම සිතන්නෙ නෑ ප්‍රශ්න ඇතිවෙයි කියලා. ඔබ කිව්වා හරි, මටත් සිතෙනවා ඒක ආණ්ඩුව ඇතුළේ වෙන්නෙ නෑ කියලා. පැහැදිලි කිරීම්, සාකච්ඡා සහ තීන්දු ගැනීම් ප්‍රමාදයි. ඒවා තමයි අවසානයේ විවේචන සහ ප්‍රශ්නවලට බඳුන් වෙන්නෙ.

**ආණ්ඩුව ඇතුළේ කතා කරන්න ඉඩක් නැති නිසා එළියේ කතා කරනවා කියලා කට්ටිය කියන්නෙ ඒ නිසාද?**

මගේ තර්කය මේවා ඇතුළෙයි එළියෙයි දෙකේම කතා කරන්න ඕනා කියන එකයි. ඒක වරදක් නෙවෙයි. ලෝකයේ දියුණු රටවල්වලත් බොහෝ කරුණු ආණ්ඩුවලින් පිටත කතා කරනවා. ඒවා නවත්වන්න බෑ. තමන් කරන දේ ගැන හරියට පැහැදිලි කරන්න රජයකට හෝ අමාත්‍යවරයෙක්ට පුළුවන් නම් දේවල් හංගන්න අවශ්‍යතාවක් ඇති වෙන්නෙ නෑ. අපි අසවල් ආයෝජනය ගේනවා, මේ වගේ දෙයක් අපි මේ කාරණය නිසා කරනවා, ඒක කළාම අපිට මේ වගේ ප්‍රතිලාභ ලැබෙනවා කියලා කෙළින් කියන්න දිව නැමෙන්නෙ නැත්තෙ ඇයි කියන එක තමා ප්‍රශ්නය. ආණ්ඩුවට මාධ්‍ය ප්‍රකාශකයෝ ඉන්නවා, අමාත්‍යාංශ තිබෙනවා, ලේකම්වරු ඉන්නවා, ඇමැතිලා ඉන්නවා. ඇයි දෙයක් හරියට පැහැදිලිව කියන්න බැරි.

**මම ඇමැතිකම් කරපු සමහර අවස්ථාවලත් හිතේ තිබෙන දේ කියාගන්න බැරිවුණා**

**යථාර්ථය කතා කිරීම සහ පැහැදිලිව නිරවුල්ව දේවල් ජනතාවට කියන එකේ ප්‍රධාන වගකීමක් ජනාධිපතිවරයාටත් තිබෙනවා නේද?**

මට මේකට උත්තරයක් දෙන්න අමාරුයි. මොකද රජය අභ්‍යන්තර සාකච්ඡා ගැන මට වැඩිය වැටහීමක් නෑ. මම මන්ත්‍රීවරයෙක් විතරක් නිසා. නමුත් මමත් සිතනවා එතුමා ඉදිරියේදීවත් මේ දේවල් ගැන සාකච්ඡාවක් කළ යුතුයි කියලා.

**ඔබටත් ඇමැතිකමක් තිබුණා නම් ඇතැම්විට ඔබත් මෙහෙම ආණ්ඩුව විවේචනය කරන එකක් නෑ නේද?**

ඇමැතිකමක් නැති වීම මට ප්‍රශ්නයක් නෙවෙයි. ඇමැතිකම්වල ඉද්දි ඇතැම් අවස්ථාවල අපිට අපේ ඇතුළෙ තිබෙන දෑ කියන්න බැරි වෙනවා. ඇමැතිකම් එක්ක අපි සාමූහික වගකීමෙන් බැඳෙනවා. මම ඇමැතිකම් කරපු ඇතැම් අවස්ථාවල මගේ අදහස් මේ විධියට මට කියාගන්න බැරිවුණා. ආණ්ඩුවක ප්‍රතිපත්තියක් උඩ ඉද්දි ඒක සාධාරණයි. ඒ වගකීම් සහ බැඳීම්වලින් නිදහස් වුණාම මට පුළුවන් මම අදහන සහ විශ්වාස කරන කාරණා ගැන කතා කරන්න. මම ඒකට කැමැතියි. දීර්ඝ කාලයක් ඇමැතිකම් කරපු කෙනෙක් විධියට දන්නවා කොහොමද රජයන් ක්‍රියාත්මක වෙන්නෙ කියලා. ඔවුන් ඇතැම් වෙලාවට බලය රඳවාගන්න කරන උපාය උපක්‍රම ගැනත් මම දන්නවා. නමුත් දැන් මම ඒකෙන් ඈත් වෙලයි ඉන්නෙ.

**මැතිනි, චන්ද්‍රිකා, මහින්ද රාජපක්ෂ වගේ නායකයෝ සන්ධාන ආණ්ඩුවල සාරය රැක්කා**

ඒ නිසා මට වඩාත් හොඳින් තේරෙනවා අපේ රටේ යම් ඉදිරිගාමී අදහසක් ඉදිරිපත් කරන්න අලුත් බලවේගයක් අවශ්‍ය බව. මම කියන්නෙ දේශපාලන බලවේගයක් ගැන නෙවෙයි අලුත් අදහසක් ගැන. නවීන අදහස්වලින් පරිපූර්ණ අය මේ ප්‍රවාහය තුළට එන්න ඕනා. තරුණ කාන්තාවක් විධියට ඔබට වුණත් පාර්ලිමේන්තුවට එන්න හැකියාවක් තිබෙන්න ඕනා. කාන්තා නියෝජනයත් අඩුයිනේ. මම කියන්නෙ අන්න ඒ වගේ ඉදිරිගාමී නවීන අදහස්වලින් සමන්විත බලවේගයක් මේ දේශපාලන ක්‍රමය තුළම ඇති වෙන්න ඕනා කියලයි.

**ආණ්ඩුවට මාධ්‍ය ප්‍රකාශකයෝ ඉන්නවා, ඇමැතිලා ඉන්නවා, ලේකම්වරු ඉන්නවා. ඒත් දෙයක් හරියට පැහැදිලි කරගන්න බෑ**

**කාන්තාවන්ට ආරාධනා කළාට ඒ අයව පාර්ලිමේන්තුව තුළ අපහාසයට උපහාසයට ලක්කරන එකනෙ වෙන්නෙ මන්ත්‍රීතුමා?**

ඔව්. ඒක ලොකු ප්‍රශ්නයක් සහ ලොකු වරදක්. මම එය අනුමත කරන්නෙ නෑ. ඒක තමයි මම කිව්වෙ ඉදිරිගාමී නව අදහස් ඇති අය පාර්ලිමේන්තුවට එන්න ඕනා කියලා. අපි නව සංස්කෘතිකයක් ඇති කරන්න අවශ්‍යයි.

**කොහොමින් කොහොම හරි ආණ්ඩුව පළාත් පාලන ඡන්දයත් කල් දැම්මා නේද?**

නීතියට අනුව පළාත් පාලන ඡන්දය වසරකින් කල් දාන්න පුළුවන්. ඒ නීතියට අනුව තමයි රජය මේක කල් දැම්මේ. මේ ගැන මත දෙකක් තිබෙනවා'. සමහරුන්ට කල් දැම්ම එක හොඳයි. සමහරුන්ට නරකයි. නමුත් මේ ගැන ලොකු මතයක් දේශපාලන ලෝකයේ ඇතිවුණු බවක් නම් පේන්න නෑ.

**ඇයි ආණ්ඩුව ඡන්දය කල් දැම්මේ?**

ඒක අදාළ අමාත්‍යවරයා ජනතාවට කියන්න ඕනා. නමුත් මම නම් සිතන්නෙ මේ තිබෙන කොවිඩ් අර්බුදයත් එක්ක වෙන්න ඇති කල්දාන්න ඇත්තෙ.

**මේ ආණ්ඩුව කොවිඩ් තිබියදී ඡන්දය කරලා පෙන්නුවනෙ?**

ඒක තමයි ඒ පැහැදිලි කිරීම අදාළ ඇමැතිවරයා කරන්න ඕනා. ඡන්දය කල්දැමීම නම් මම හොඳ දෙයක් විධියට දකින්නෙ නෑ. ඒකටත් හරි හේතුවක් විෂය භාර ඇමැති කිව්වා නම් වෙන වෙන කතා එළියට එන්නෙ නැහැනෙ.

**නායකයෝ සන්ධාන දේශපාලනයේදී පරිණත විය යුතුයි**

**එළියේ කතා කරන්නත් බැහැනෙ ඇමැතිකම් ගලවනවානෙ?**

එළියෙ කතා කරන එක විවේචන කරන එක වරදක් නෙවෙයි. අපි කරන්නෙ අලුත් අදහස් ඉදිරිපත් කරන එක. ජනතාව පත් කරපු මහජන නියෝජිතයෝ විධියට නව අදහසක් ඉදිරිපත් කරන්න අපිට අයිතියක් තිබෙනවා. මොකද අපි ජනතාවට වගකියන්න ඕනා. අපි කතා නොකරනවිට මිනිස්සු අපිට බනිනවා අපේ ප්‍රශ්න ගැන කතා කරන්නෙ නෑ කියලා. සුසිල් ප්‍රේමජයන්ත රාජ්‍ය අමාත්‍යවරයා කියපු කාරණාවක් නිසා හෝ වෙනත් කාරණාවක් නිසා හෝ තනතුරෙන් ඉවත් කළා. පාර්ලිමේන්තුව තුළ දැන් ඔහු වාඩිවෙන්නෙ මගෙ ළඟ හතරවැනි පේළියේ. මගේ අදහස ජනාධිපතිතුමා ඔහුට කතා කරලා ඔහුගෙන් ඉල්ලා අස්වීමේ ලිපිය ලබාගත්තා නම් හොඳයි කියන එකයි. වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වෙන්නෙ එහෙම කළා නම් තමයි. අනෙක් කාරණය එතුමා වගේම ඇතැම් අවස්ථාවල එතුමටත් වඩා තදින් ආණ්ඩුව විවේචනය කරපු අය ආණ්ඩුව ඇතුළෙ ඉන්නවා. ඒත් මේ විධියට කරන්නෙ එතුමාට විතරද අනෙක් අයට නැද්ද කියලා ගැටලුවක් ඇතිවෙනවා. නමුත් ඇමැතිකම් නැති වුණත් ජනතාවගෙ පැත්තට කතා කරන්න මන්ත්‍රීකම තිබෙනවානෙ. ඒ ඇති.

**ජනාධිපතිතුමා කියන ආකාරයට වාසු - විමල් - ගම්මන්පිල කියන්නෙත් සාමූහික වගකීම් කඩකළ තිදෙනෙක්?**

මේක අධිකරණය යටතේ තිබෙන කාරණාවක් නිසා මම වැඩිය කතා කරන්න කැමැති නෑ. නමුත් කැබිනට් පත්‍රිකාවක් පළමුවැනි වතාවෙන්ම සම්මත වෙන්නේ නෑ. දෙවැනි වතාවටත් එතකොට ඒක කැබිනට් මණ්ඩලයට ගේනවා. එවිට අපි ඒක ගැන කතා කරනවා. මේ යුගදනව් ගිවිසුම සම්බන්ධයෙන් එහෙම කළාද කියන්න මම දන්නෙ නෑ මම කැබිනට් මණ්ඩලයේ නැති නිසා. මේ ගැන තිබෙන නඩුව අවසන් වුණාම ඒ ගැන සාකච්ඡාවක් ඇතිවෙයිනෙ. එතකොට අපි ඒ ගැන බලමු.

**පොහොට්ටු පාර්ශ්වයෙන් ශ්‍රීලනිපයට සහ හවුල්කාර පක්ෂවලට එල්ල කරන පීඩනය කොහෙන් අවසන් වෙයි කියලද ඔබට සිතෙන්නෙ?**

සන්ධාන දේශපාලනය කියන්නෙ පහසු දෙයක් නෙවෙයි. මෙතෙක් අපි සිටි සෑම ආණ්ඩුවක්ම සන්ධාන. ශ්‍රීලනිපයෙන් බිඳී ගිය කොටස තමයි පොජපෙ කියන්නෙ. අපි හැමෝගෙම මව් පක්ෂය තමයි ශ්‍රීලනිප කියන්නෙ. මේ ආණ්ඩුව හැදෙන්නෙත් පක්ෂ ගණනාවක් එකතුවෙලා. ඒ නිසා කාටවත් කියන්න බෑ අපි තමයි මේක තනිවම කළේ කියලා. මොකද හැමෝම එකතුවෙලානෙ මේ ආණ්ඩුව හැදුවෙ. ඒ නිසා කාටවත් කියන්න අයිතියකුත් නෑ උඹලා පලයල්ලා කියලා. ගැටුමක් තිබෙනවා නම් ගැටුම ගැන සාකච්ඡා කරන්න පුළුවන්. පක්ෂ අතර ගැටුමක් තිබෙනවා නම් ශිෂ්ට විධියට ප්‍රශ්න විසඳගන්න පුළුවන් වෙන්න ඕනා. නමුත් සිදුවෙන දේවල් දිහා බැලුවම නම් පේන්නේ සාකච්ඡා කරලා විසඳගන්න බෑ කියලයි. ඒ නිසා මම කියන්නෙ නායකයෝ සන්ධාන දේශපාලනයේදී බොහෝ පරිණත විය යුතුයි. ඒ ගැන ශ්‍රීලනිපය විටින් විට විවේචනය කරනවා මම අහලා තිබෙනවා. ඉතාම සාර්ථක විධියට සන්ධාන ආණ්ඩු කරපු නායකයෝ ඉන්නවා. මහින්ද රාජපක්ෂ අගමැතිතුමා, චන්ද්‍රිකා මැතිනිය, සිරිමාවෝ මැතිනිය වගේ අය සන්ධාන ආණ්ඩුවල සාරය ආරක්ෂා කරගෙන කටයුතු කළා.

**ඔබ නොකියා කියන්නෙ ගෝඨාභය ජනාධිපතිවරයා අපරිණත සහ සන්ධාන දේශපාලනය ගැන නොදන්න කෙනෙක් කියන එකද?**

ඔහු දේශපාලන පක්ෂයක නායකයෙක් නෙවෙයිනෙ. ඉස්සර නම් පක්ෂ නායකයා තමයි රටේ නායකයා වුණේ. රටේ නායකයා තමයි පක්ෂ නායකයා වුණේ. එහෙම වුණාම ඒ අයට මෙවැනි ප්‍රශ්න විසඳන්න පුළුවන්කමකුත් තිබුණා. දැන් ඒ තත්ත්වය වෙනස් වෙලානෙ. මම කිව්වෙ මම දැකපු සහ මම දන්න දෙය. නමුත් පක්ෂ නායකයන්ට පුළුවන් වුණා එකට වාඩිවෙලා තමන්ගෙ සන්ධානයේ තිබෙන ගැටලු විසඳගන්න.

**තවමත් සන්ධානයේ එකමුතුව රැඳිලා තිබෙන්නෙ අගමැතිවරයා නිසා නේද. ඔහු නැත්නම් මේ සේරම විසිරිලා නේද?**

**එළියේ කතා කරන එක විවේචනය කරන එක වරදක් නෙවෙයි**

මහින්ද රාජපක්ෂ අගමැතිතුමා තමයි මේ සන්ධනයේත් දේශපාලනයේත් ලයිව් වයර් එක. එතුමා තමයි මේ හැමෝම ඇද බැඳ තබාගන්න කෙනා. එතුමාට ඒකට අතිවිශාල අත්දැකීම් සම්භාරයක් තිබෙනවා.

**මේ යන විධියට නම් පේන්නේ ශ්‍රීලනිපයයි හවුල්කාර පක්ෂ ටිකයි කඩාගෙන ගිහින් අලුත් බලකඳවුරක් නිර්මාණය කරයි වගේ?**

මම කියන්නෙ තවදුරටත් පුද්ගල බද්ධ දේශපාලනයක් අවශ්‍ය නෑ කියලයි. ප්‍රතිපත්ති මත පදනම් වුණු සාමූහික ක්‍රියාවලියකට සම්බන්ධ වුණු දේශපාලන ව්‍යාපාරයක් සඳහා අපි අනාගතයේදී යොමු විය යුතුයි. ප්‍රතිපත්තියක් නැතිව පුද්ගලයෙක් ආවට මේක කරන්න බෑ. ප්‍රතිපත්තියයි පුද්ගලයයි දෙකම එකක් වෙන්න ඕනා. ප්‍රතිපත්තියක් නැතිව ආවන අගක් මුලක් දන්නෙ නෑ, විනාශයක් තමයි වෙන්නෙ. ජනාධිපතිතුමාට තව කල් තිබෙනවා. අපි බලමු එතුමා මේක කරන විධිය ගැන.

**ඔබ නියෝජනය කරන වයඹ පළාතේ රාජ්‍ය අමාත්‍යවරයෙක් සහ කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් එතනෝල් ජාවාරම්කාරයෙක්ව ඉතා සූක්ෂ්ම ආකාරයට රට තුළට ගෙනාවා. මෙවැනි මැති ඇමැතිවරු සිටින රජයකට තව කොතෙක් කල් ආයුෂ තිබෙයිද?**

දේශපාලකයන්ට අයිතියක් නෑ නීතිමය කාර්යකට අතගසන්න. වරෙන්තුකාරයෙක් වුණු කෙනෙක් නම් අපිට තියාගන්නවත් බෑ. මොකද එසේ රඳවා තබා ගැනීමත් නීතිමය වරදක්. දේශපාලකයන්ට පුළුවන් වෙන්න ඕනා නීතිගරුක වෙන්න. ඒකනෙ ඔය ප්‍රශ්නෙ ආවේ. මමත් දැක්කා එවැනි වරෙන්තුකරුවෙක්ව වී.අයි.පී. පර්යන්තයෙන් අරන් ආවා කියන කතාව. දේශපාලනය සහ මත්පැන් අතර තිබෙන සබඳතාව හොඳ දෙයක් නෙවෙයි. මහජන නියෝජිතයෝ විධියට පත්වෙලා එන අපි මෙවැනි කටයුතුවලට සම්බන්ධ නොවී සිටීමට වගබලා ගත යුතුයි.


■ අරුණි මල්ලවආරච්චි

● ඡායාරූපය - සරත් සුභසිංහ

පළමු කොටස



## ලිච්ඡවි රජ දරුවෝ බුදුන්ගේ චිතකය ළඟට ආවා
## ශෝකය පළ කරන්නට රන් අබරණ ගලවා දැම්මා
## කාශ්‍යප මහරහතුන් ඒ රන්වලින් පිළිම හතරක් මැව්වා
## මලියදේව මහරහතුන් ඒ පිළිමයක් පුසුල්පිටියට ගෙනාවා



නාරංපනාවේ සුදන්ත හිමි

# බුදුන්ගේ චිතකය ළඟ මැවූ රන් පිළිමය තවමත් සුරැකිව තිබෙන පුසුල්පිටිය මහ වෙහෙර

**භෞතිකත්වය ලාභ කොට සලකන්නකු ලෙස මම උන්වහන්සේ පසුපස වැටුණු බව සැබැවි. පය රැඳුණු අඩිය දෙදරුම්කන තරම් වූ කතා ගොන්නක් උන්වහන්සේගේ මුවින් වෑහෙන විට මම නිසොල්මනේ ගලා බසින්නට නොහැකිව සිටින කොත්මලේ ඔය දෙස බලා සිටියෙමි.**

“ප්‍රිය මිත්‍රවරුනි” ඔය සේම මාද එක් තැනකය. උන්වහන්සේගේ මුවින් පිටවන වචන අකුරු කිරීමට නම් සිත් එකලසක් තිබීම අනිවාර්යය. සිත් එකලස්ව තබාගැනීම සඳහා මෙවන් වැඩබිමක් තවත් කොයින්ද? උන්වහන්සේගේ සඟ නාමය නාරම්පනාව සුදන්තය. පුසුල්පිටිය රජමහ විහාරස්ථානයේ වැඩසිටින මෙම හීන්දෑරි හිමිනම සැබැවින්ම සියවස් ගණනාවක් පිළිබඳව දැනුම ඇත්තෙකි. ඉතිහාසකරුගේ උරුව උන්වහන්සේ හිමිකරගන්නේ යම්කිසි උජාරුවක් සමඟිනි. එම උජාරුව පෝෂණය වන්නේ උන්වහන්සේ සතු ලිඛිත ඉතිහාස දැනුමෙනි. ඉතිහාස ආලවට්ටම් කපා කොටා ඔප දමා සුදන්ත හිමියන් පුසුල්පිටිය රජමහ විහාරස්ථානය පිළිබඳව මෙලෙස බිනීය.

පෙරාතුව අප පුසුල්පිටිය රජමහ විහාරස්ථානය මෙලෙස හඳුනාගත යුතුය. නුවරඑළි දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නවම්ගම ග්‍රාමසේවා වසම තුළ පිහිටි පුසුල්පිටිය රජමහ විහාරස්ථානය ඉතිහාසයේ එක් පදාසයක් නියෝජනය කරනු ලබන්නේ බුද්ධ වර්ෂයට පෙර යුගය සහ බුද්ධ වර්ෂයද ඉනික්බිති සියවස් ගණනාවක ඉතිහාසයට එක් මිටකට ගන්නා නිසාය. එක් හුයකින් බැඳුණු එම ඉතිහාසය සංවර්ණය සහ තුලනය මඟින් තුලිත වේ. පුසුල්පිටිය රජමහා විහාරස්ථානය වැදගත් වන්නේ ඒ නිසාවෙනි.

අවසරයි සුදන්ත හිමියනි.

මලය රටේ සිළුමිණ, එසේ නොමැති නම් කොත්මලේ මුදුන්මල්කඩ ලෙසයි මෙම විහාරස්ථානය හඳුන්වනු ලබන්නේ. බුද්ධ වර්ෂ 236දී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩමවූවාට පසු බෝධීන් වහන්සේගෙන් හටගත් අෂ්ටඵල බෝධීන් වහන්සේලා 08 දෙනා සහ දෙතිස්ඵල බෝධීන් වහන්සේ 32 දෙනා අතරින් දෙතිස්ඵල බෝධීන් වහන්සේලාගේ 19 වැනි ශාඛාව මිහිඳු හිමියන් විසින් එවකට රාජ්‍යත්වය ඉසිලූ දේවානම්පියතිස්ස රජු භාරකරනු ලබනවා. රජු විසින් පුසුල්පිටිය රජමහ විහාරයේ එම 19 වැනි දෙතිස්ඵල බෝධීන් වහන්සේ එම වසරදීම රෝපණය කරනු ලබනවා. ඒ අනුව මෙම විහාරස්ථානයත් පූජනීය බෞද්ධ විහාරස්ථානයක් බවට පත්වෙනවා. විහාරස්ථානය බෞද්ධ විහාරස්ථානයක් බවට පත්වීමට පෙර ඉතිහාසය පිළිබඳ අවබෝධයක් අප ලබාගත යුතුයි.

එම ඉපැරැණි ඉතිහාස කතාව මෙලෙස පෙළ ගැස්ගස්වා ගත හැකියි. ප්‍රථමව තේරුම් ගත යුතුයි එම ඉතිහාසයේ ගොඩනැගිල්ලේ හුදෙකලාව සමඟ බව. කඳු පන්තියකින් වට වූ වෙනම රටක් ලෙසයි එම ඉතිහාසය කොත්මලේ මුල්කර ගනිමින් මලය රට හඳුන්වා දෙන්නේ. ලේඛනගත ඉතිහාසය ප්‍රථමව ඇරැඹෙන්නෙත් මෙම විහාරස්ථානය මුල්කරගෙනයි. විහාරස්ථානය තදාසන්නව පිහිටි නයින් කෙළිනා තොටුපොළ ප්‍රයෝජනයට ගනිමින් ඉන්දියාවේ සිට නාඩි ගෝත්‍රයට අයත් නක්ෂත්‍රකරුවන් පැමිණ සිටිනවා. නාඩි ගෝත්‍රය තුළ එම නක්ශාස්ත්‍රකරුවා හඳුන්වන්නේ අංගශාස්ත්‍රගුරු ලෙසයි. එහි සරල අදහස කේන්ද්‍රාන්තයේ සිට පාදන්තය දක්වා විමසුම් බැල්මක් හෙළලා පුද්ගලයකුගේ අතීතය සහ අනාගතය පිළිබඳ නිශ්චිත කාරණා පැවැසීමට ඇති හැකියාව. ඒ අංගශාස්ත්‍ර ගුරු නයින් කෙළිනා තොටුපළ හරහා මලය රටට පැමිණ තුන් කුලුදුල් දරුවකු බිහිකරගත හැකි මට්ටමේ කාන්තාවක් විවාහ කරගෙන, දරුවා බිහිවුණාට පසු පෙර සඳහන් කළ තොටුපොළේදී දරුවාට ජල ක්‍රීඩා සියල්ලක්ම පාහේ පුරුදු පුහුණු කර තිබෙනවා. දරුවාට අවුරුදු හතක් එම ක්‍රීඩා පුහුණු කළත් ඔහුගේ යටි අදහස වී තිබෙන්නේ රන් පුහුල්වැලක ඇති පුහුල් හතක නිධානය ලබා ගැනීමට දරුවාව බිලි දීම. නියමිත නැකැත උදාවුණාට පසු පුහුල්වැලේ තුන්වැනි රන් පුහුල දරුවා ලවා කඩාගෙන පුහුල දරුවා තමන්ගේ හිස මතට ගනිද්දී දරුවාගේ හිස ගසා දමා අදාළ බිල්ල නැකැතට අනුව ලබාදී තිබෙනවා. රන්පුහුල් නිධානය ලබාගෙන එම අංගශාස්ත්‍රගුරු මෙම විහාරස්ථානයට පැමිණ තිබෙනවා. එලෙස පැමිණ තිබෙන්නේ වත්මන් චෛත්‍ය රාජයා ඉදිකර තිබෙන ගල් තලාවට. රන් පුහුල ගල් තලාව මත තැන්පත් කරලා ගල් තලාවට, ආසන්නව ඇති දිය කඩිත්තකින් දිය බී නැවත පැමිණෙන විට රන් පුහුල ගල්තලාව මත කිඳා බැස තිබෙනවා. ඉතිහාස කතාකරුට අනුව මෙම දිය කඩිත්තත් සුවිශේෂීයි. එම සුවිශේෂී බව තමයි ගැහැනු උදවිය එම දිය කඩිත්ත යම් අවශ්‍යතාවක් සඳහා භාවිත කළහොත් දිය සිඳී යනවා යැයි විශ්වාස කිරීම. මම විහාරස්ථානයට වැඩම කොට වර්ෂ හතරකට ආසන්නයි. මෑත භාගයේදී, නිශ්චිතව පැවැසුවහොත් මීට මාස 9කට පමණ පෙර විහාරස්ථානය නැරඹීමට පැමිණි කාන්තාවන් පිරිසක් නා කියා ගත්තා. පුදුමයකට මෙන් එදිනම දිය කඩිත්ත සිඳී ගියා. ඉන් පසුව තුන් මුරයට තේවාව සිදුකර පිරිත් කිව්වාට පසුවයි නැවතත් දිය කඩිත්ත සක්‍රිය වුණේ.

අංගශාස්ත්‍රගුරුට රන් පුහුලත්, තමන් විසින් වසර හතක් තිස්සේ උස් මහත් කරගත් දරුවාත් අහිමි වීම දරාගත නොහැකිව ඔහු මෙම ස්ථානයේදී මියගියා යැයි ඉතිහාස කතාකරු පවසා සිටිනවා. එම ඉතිහාස කතාවෙන් වඩා වැදගත් වන්නේ මෙම ප්‍රදේශය පුහුල්පිටිය ලෙස හැඳින්වෙන නිසා. පුහුල කිඳා බැස්ස පිටිය පුහුල්පිටිය ලෙස ව්‍යවහාර වෙන්නැති. ඉන්පසුව එය පුසුල්පිටිය ලෙස ව්‍යවහාරයට එක්වුණා. පැරැන්නන් අදටත් මෙම ප්‍රදේශය හඳුන්වන්නේ පුහුල්පිටිය ලෙසයි. අපි තේරුම් ගත යුතුයි බුද්ධ වර්ෂයට ප්‍රථම යුගයේදී මිනිසුන් වන්දනාමාන කර තිබෙන්නේ ගස් ගල්වලට බව. එවැනි යුගයකදී මෙවැනි හාස්කමක් සිදුවූ ස්ථානයක් මිනිසුන්ගේ නොමඳ ගෞරවයට පාත්‍ර වෙනවා. ඒ නිසා ඔවුන් එතැන් සිට මෙම ස්ථානය වන්දනාමාන කර තිබෙනවා. ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට රැගෙන ආවාට පසු පෙර සඳහන් කළ පරිදි දෙතිස්ඵල බෝධීන් වහන්සේලා අතරින් 19 වැනි බෝධීන් වහන්සේ මෙම ස්ථානයේ රෝපණය කිරීමට එක් හේතුවක් ලෙස දිගු කාලයක සිට මෙම ස්ථානය වන්දනාමාන කිරීමත් සැලකිය හැකියි. ඒ අනුව අවුරුදු 2300ක ඉතිහාසයට මෙම රජමහ විහාරය වගකියනවා. අදටත් දෙතිස්ඵල බෝධීන් වහන්සේලා අතරින් 19 වැනි බෝධීන් වහන්සේ විහාරස්ථානය තුළ ජීවමානව වැඩ සිටිනවා. වර්ෂ 1905දී එම බෝධීන් වහන්සේගේ අතු ඉති කප්පාදුවකට ලක්කර බෙහෙත් ගල්වනු ලැබුවා.

බුද්ධාගම රජයේ ආගම බවට පත්වුණාට පසු මෙම ස්ථානය බෞද්ධ පන්සලක් බවට පත්වූවා යැයි කීම නිවැරැදියි. ඉන්පසු එළැඹෙන යුගයේ වැදගත්ම කරුණ වන්නේ මලියදේව නමින් හඳුන්වන මහරහතන් වහන්සේලා දෙනමක් මෙම විහාරස්ථානයේ වැඩ සිටීම. බුදු සිරිතේ පැවසෙන පරිදි අවසන් මලියදේව මහරහතන් වහන්සේ මෙම විහාරස්ථානයේ වැඩ සිට තිබෙනවා. උන්වහන්සේ වැඩ සිටි තිබෙන්නේ උඩපාය ගල්ලෙනේ. අද වෙද්දී පරිසරයේ සිදුවූ වෙනස්කම් මුල්කරගෙන එම ගල්ලෙන කරා යෑමට නොහැකියි.

බුදුන් වහන්සේ පිරිනිවන් පෑවාට පසු රන් දෙණක උන්වහන්සේ තැන්පත් කොට ආදාහන උත්සවය සිදුකළ බවයි ඉතිහාසය කියා තිබෙන්නේ. එම අවස්ථාවේදී උපවත්තන සල් උයනට පැමිණ සිටි ලිච්ඡවී රජදරුවන් සහ තවත් අවශේෂ රජවරු තම තමන්ගේ රන් ආභරණ බුදුන් වහන්සේගේ චිතකයට දමා සිය ශෝකය ප්‍රකාශ කර තිබෙනවා. මෙම ආභරණ මුල්කරගෙන රජ දරුවන් භවයකට යාවි යන විශ්වාසය මත එම අවස්ථාවේ එහි සිටි මහ කාශ්‍යප මහ රහතන් වහන්සේ ප්‍රමුඛ රහතන් වහන්සේලා අධිෂ්ඨාන කර තිබෙනවා එම දඹ රත්රන්වලින් චිතකය හතරකොන බුදු රුවවල් මැව්වා කියා. ඉන් පසුව එම පිළිම වහන්සේලා සතරනම ඉන්දියාවේ එක් සංඝ පරම්පරාවක් විසින් දිගින් දිගටම ආරක්ෂා කරනු ලැබුවා. එක් යුගයකදී එම පිළිම වහන්සේලාගේ ආරක්ෂාව භාර වුණේ නායක හිමි නමකට හා වයස අවුරුදු හතේදී රහතන් වහන්සේ නමක් බවට පත්වූ හිමිනමකට. කුඩා මහ රහතන් වහන්සේ හඳුන්වන්නේ ගුප්ත මලියදේව මහරහතන් වහන්සේ නමින්. නායක ස්වාමීන් වහන්සේ අපවත් වන විට ගුප්ත මලියදේව මහ රහතන් වහන්සේට එම පිළිම වහන්සේලා භාරකරනු ලබනවා. වගකීම භාරගත් ගුප්ත මලියදේව මහ රහතන් වහන්සේ සෘද්ධි බලයෙන් සම්බුද්ධ ශාසනය පවතින තුරු මෙම පිළිම වහන්සේලා හතරනම සුරක්ෂිත වන්නේ කෙහෙද කියා සොයා බලනවා. උන්වහන්සේ දකින්නේ මෙම පුසුල්පිටිය රජමහ විහාරස්ථානය.

ඉන්පසුව විහාරස්ථානය ආසන්නයේ ඇති මලියමහ පාය කියන ගල් ලෙනට පිළිම වහන්සේලා වඩමවනු ලබනවා. වට්ටාරම, මොරපාය, මාදන්වෙල කියන රජමහ විහාරස්ථානවලට පිළිම වහන්සේලා තුන්නමක් වඩම්මවලා ඉතිරි පිළිම වහන්සේ මෙම විහාරස්ථානයේ තැන්පත් කරනු ලබනවා. පිළිම වහන්සේ දහවල් කාලයේ මෙම විහාරස්ථානයේත් ආරක්ෂාව මුල්කරගෙන රාත්‍රි කාලයේදී තැන්පත් කරන්නේ පෙර සඳහන් කළ ගල්ලෙන තුළයි. රාත්‍රි කාලයේදී දේවතාවන් හා දේවතාවියන් පිළිම වහන්සේව වන්දනාමාන කරනු ලබනවා. ඉන් ප්‍රමුඛ වන්නේ මලය රටේ කඳු පන්තිය භාර මේඝවර්ණ දෙවියන්. මේඝවර්ණ දෙවියන් අධිපතිත්වය දරනු ලබන්නේ වර්ෂාවට එම නිසා මේඝවර්ණ දෙවියන් වැස්ස වලාහක දෙවියන් ලෙසත් හඳුන්වනු ලබනවා. මලියදේව මහ රහතන් වහන්සේ දෙතිස්ඵල බෝධීන් වහන්සේ අසලින් අහසට පලක් බැඳගෙන මේඝවර්ණ දෙවියන්ට ධර්මය දේශනා කොට පිළිම වහන්සේගේ ආරක්ෂාව මේඝවර්ණ දෙවියන්ට භාර කරනවා. ඉන් පසුව තමයි ලංකාව තුළ වැස්ස වලාහක දෙවියන්ට කැපවුණු එකම දේවාලය එම විහාරස්ථානය තුළ ඉදිවන්නේ. වැසි නොමැති කාලයක දේවාලයට මල් පෙරහරක් වඩම්මන විටදී පෙරහර ගෙවදින්නටත් කලියෙන් වැස්ස ලැබෙනවා. ඒ පිළිබඳ අත්දැකීමක් මා සතුයි. දන්ත ධාතුන් වහන්සේ සඟවා තැබූ සකු බෝධීන් වහන්සේ යුද හමුදාවේ සහාය ලබාගෙන අප පිළිසකර කරන්නට අප ගත් අවස්ථාවේදී එක දිගටම වැස්ස වැටෙන්න පටන් ගත්තා. මම සුවඳ ධූපය රැගෙන දේවාලයට ගොස් ඉල්ලා සිටියා අපගේ රාජකාරි අහවර වෙනතුරු වැස්ස නවතා දෙන්න කියා.

එය එලෙස සිදුවුණා. සහායට පැමිණි හමුදා සෙබළුන් විහාරස්ථානයෙන් පිටත්ව යන්න ගත්ත මොහොතේ සිට නැවතත් වැස්ස ඇද වැටුණා.

ඉංග්‍රීසීන් රට යටත් කරගෙන වෙහෙර විහාර කොල්ලකාගෙන එම වස්තුව එංගලන්තයට රැගෙන යෑමට උත්සුක වූ මුල් අවස්ථාවේදී මෙම ප්‍රදේශයේ ප්‍රාදේශීය පාලකයන් දඹ රත්රන් පිළිම වහන්සේ මෙම භූමියේම යම් තැනක තැන්පත් කර වන්දනාමාන කටයුතුවලට පස්ලෝහ පිළිම වහන්සේනමක් නිර්මාණය කර විහාරස්ථානයේ තැන්පත් කරනු ලබනවා. එයට අදාළ සෙල්ලිපියක් මඟින් ප්‍රාදේශීය පාලකයන් එසේත් නොමැති නම් රදලයන් පවසා සිටින්නේ විහාර භූමිය අවට පස් විහාරස්ථානයේ වැඩකට ගැනීමත්, එම පස් පිට වැඩකට රැගෙන යෑමත් තහනම් බව. තවදුරටත් එම සෙල්ලිපිය මඟින් නියෝග කරනවා ගම්මානයේ කිරි ගොවියකුට තමන් සතු කිරි ගවයෙක් පවා විහාර වත්තට ඇතුළු කිරීම තහනම් බව. ගණිනින් වහන්සේලා මෙම විහාරස්ථානයේ වැඩ සිටි යුගයේදී ඉන් පසු උපසම්පදාව රැගෙන නැවත වරක් භික්ෂූන් වහන්සේලා වැඩසිටි යුගයේදී එම නියෝග ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වී තිබෙනවා. අදටත් එම නියෝග සියල්ල වලංගුයි.

පුසුල්පිටිය රජමහ විහාරය සහ දුටුගැමුණු රජ සබැඳි කතා ගොන්න ලබන සතියේදී කියවමු.

■ **කතාව : ප්‍රභාත් අත්තනායක**
**පින්තූර: රුක්ගහවිල ඒ. දේවේන්ද්‍ර**



### ශනිදා (සනිදා - Shanida) — පායන හිරු මෙන් විශ්වාසයි

දිනය: 2022.01.20
දිනුම් වාරය: 3791
රතු
බ්‍රහස්පතින්දා

ජයග්‍රාහී අංක: 23 44 47 56 — ඉංග්‍රීසි අක්ෂරය: N

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| ජය අංක 04 සමග ඉංග්‍රීසි අක්ෂරයට | - | 48,568,773.60 | - |
| ජය අංක 04ට | 1 | 1,000,000/- | 1,000,000/- |
| ජය අංක 03ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 1 | 100,000/- | 100,000/- |
| ජය අංක 03කට | 133 | 2,000/- | 266,000/- |
| ජය අංක 02ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 240 | 1,000/- | 240,000/- |
| ජය අංක 02කට | 5,824 | 100/- | 582,400/- |
| ජය අංක 01ක් සමග ඉංග්‍රීසි අක්ෂරයට | 3,607 | 100/- | 360,700/- |
| ජය අංක 01කට | 90,227 | 20/- | 1,804,540/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 15,406 | 20/- | 308,120/- |

**දිනා ඇති මුළු මුදල රු. 4,661,760/-**

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
ප්‍රතිඵල සඳහා වෙබ්අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02. දුරකථන: 0112 333 546-47
ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>SF යොදා 1919 ට යොමු කරන්න
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න

### ලග්න වාසනාව

දිනය : 2022-01-20
දිනුම් වාරය : 3342 | වර්ණය : දුඹුරු
සුපිරි ජයමල්ල දිනා ඇත. රු. 2,719,907.60

දිනුම් අංක: 12 23 42 52 — වෘශ්චික

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 ක් සහ ලග්නය | 1 | 2,719,907/- | 2,719,907/- |
| අංක 4 ක් | 1 | 500,000/- | 500,000/- |
| අංක 3 ක් සහ ලග්නය | 38 | 10,000/- | 380,000/- |
| අංක 3 ක් | 392 | 1,000/- | 392,000/- |
| අංක 2 ක් සහ ලග්නය | 1,575 | 200/- | 315,000/- |
| අංක 2 ක් | 17,058 | 100/- | 1,705,800/- |
| අංක 1 ක් සහ ලග්නය | 19,295 | 60/- | 1,157,700/- |
| එක් අංකයට | 212,865 | 20/- | 4,257,300/- |
| ලග්නයට | 66,522 | 20/- | 1,330,440/- |
| මුළු එකතුව | 317,747 | | 12,758,147/- |

**දිනා ඇති මුළු මුදල රු. 12,758,147/-**

ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් වලංගුවේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත. යූනියන් පෙදෙස, කොළඹ 2,
ක්ෂණික ඇමතුම් : 011 4 824 824
ප්‍රතිඵල ක්ෂණික ඇමතුම : 011 2 333 778
ස්වයංක්‍රීය තොරතුරු අංකය : 011 4 825 825

### අද කෝටිපති (ADA KOTIPATHI) — කෝටි 5 ඇරඹෙන සුපිරි ජයමල්ල

බ්‍රහස්පතින්දා
දිනුම් වාරය: 1456
වර්ණය: තද නිල්
දිනය: 2022.01.20

ජයග්‍රාහී අංක: 05 20 25 48 — ඉංග්‍රීසි අක්ෂරය: A

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 සහ ඉංග්‍රීසි අක්ෂරය | - | 52,512,734/- | - |
| ඕනෑම අංක 4කට | - | 1,000,000/- | - |
| අංක 3ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 5 | 100,000/- | 500,000/- |
| ඕනෑම අංක 3කට | 105 | 2,000/- | 210,000/- |
| අංක 2ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 258 | 1,000/- | 258,000/- |
| ඕනෑම අංක 2කට | 6,340 | 100/- | 634,000/- |
| අංක 1ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 4,017 | 100/- | 401,700/- |
| ඕනෑම අංක 1කට | 100,008 | 20/- | 2,000,160/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 17,525 | 20/- | 350,500/- |

**දිනා ඇති මුළු මුදල රු. 4,354,360/-**

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
ප්‍රතිඵල සඳහා වෙබ්අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919 ට යොමු කරන්න
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න

### කෝටි 12 කප්රුක

දිනුම් වාරය: 806 | වර්ණය: තැඹිලි
දිනය: 2022.01.20 | බ්‍රහස්පතින්දා

ඉංග්‍රීසි අක්ෂරය, සුපිරි අංකය සහ ජයග්‍රාහී අංක: H 30 (සුපිරි අංකය) 41 45 51 52

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| අංක 4 සමඟ ඉංග්‍රීසි අක්ෂරය සහ සුපිරි අංකය | - | 205,386,721/- | - |
| අංක 4 සහ ඉංග්‍රීසි අක්ෂරය | - | 10,000,000/- | - |
| අංක 4 සහ සුපිරි අංකය | - | 5,000,000/- | - |
| ඕනෑම අංක 4 කට | 01 | 1,000,000/- | 1,000,000/- |
| අංක 3 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 02 | 100,000/- | 200,000/- |
| ඕනෑම අංක 3 කට | 100 | 2,000/- | 200,000/- |
| අංක 2 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 235 | 1,000/- | 235,000/- |
| ඕනෑම අංක 2 කට | 5,652 | 100/- | 565,200/- |
| අංක 1 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය | 3,633 | 100/- | 363,300/- |
| ඕනෑම අංක 1 කට | 90,047 | 20/- | 1,800,940/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 15,731 | 20/- | 314,620/- |

**දිනා ඇති මුළු මුදල රු. 4,679,060/-**

**මීළඟ සුපිරි ජයමල්ල රු. 205,692,529/-**

ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් පමණක් වලංගු වේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
ප්‍රතිඵල සඳහා වෙබ් අඩවිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන: 0112 333 546-47
දුක: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>KK යොදා 1919 ට යොමු කරන්න.
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න.

### සුපර් බෝල් (SUPER BALL)

දිනුම් වාරය: 1630
දිනය: 2022.01.20
වර්ණය: කොළ
දවස: බ්‍රහස්පතින්දා

ජයග්‍රාහී අක්ෂරය සහ අංක: C 23 41 44 66

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් ගණන | ත්‍යාග මුදල (රු.) | මුළු ත්‍යාග මුදල (රු.) |
|---|---|---|---|
| අංක 4 සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | - | 55,242,724/- | - |
| අංක 4 කට | - | 1,000,000/- | - |
| ඕනෑම අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 3 | 100,000/- | 300,000/- |
| ඕනෑම අංක 3 කට | 89 | 2,000/- | 178,000/- |
| ඕනෑම අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 191 | 1,000/- | 191,000/- |
| ඕනෑම අංක 2 කට | 4,611 | 100/- | 461,100/- |
| ඕනෑම අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 2,928 | 40/- | 117,120/- |
| ඕනෑම අංක 1 කට | 73,390 | 20/- | 1,467,800/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 12,843 | 20/- | 256,860/- |
| මුළු ගණන | 94,055 | | 2,971,880/- |

**දිනා ඇති මුළු මුදල රු. 2,971,880/-**

ජයග්‍රාහී ටිකට්පත් මාස 6කේ වලංගු වේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02.
ප්‍රතිඵල සඳහා වෙබ් අඩවිය: www.dlb.lk
දුරකථන: 0112 333 546-47 ක්ෂණික: 0114 824 824, 0112 333 778 හෝ 1919
SMS: DLB<space>LOT<space>SB යොදා 1919 ට යොමු කරන්න.
ස්වයංක්‍රීය හඬ සම්බන්ධතා සඳහා 0114 825 825 අමතන්න.

### සංවර්ධන වාසනාව

දිනුම් වාරය : 478
පාට : නිල්
දිනය : 2022-01-20

ඉංග්‍රීසි අක්ෂරය: J — ජයග්‍රාහී අංක: 32 26 61 — දෛව අංකය: 8

| ත්‍යාග රටාව | ජයග්‍රාහකයින් සංඛ්‍යාව | ත්‍යාග මුදල රු. | මුළු ත්‍යාග මුදල රු. |
|---|---|---|---|
| ජය අංක 3 සමඟ දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | - | 11,438,924/- | - |
| ජය අංක 3 සමඟ දෛව අංකයට | - | 500,000/- | - |
| ජය අංක 3 සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | - | 100,000/- | - |
| ජය අංක 3ට | 5 | 50,000/- | 250,000/- |
| ජය අංක 2ක් සමඟ දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | 5 | 10,000/- | 50,000/- |
| ජය අංක 2ක් සමඟ දෛව අංකයට | 114 | 500/- | 57,000/- |
| ජය අංක 2ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 35 | 500/- | 17,500/- |
| ජය අංක 1ක් සමඟ දෛව අංකය සහ ඉංග්‍රීසි අක්ෂරයට | 148 | 200/- | 29,600/- |
| ජය අංක 1ක් සමඟ දෛව අංකයට | 3,629 | 100/- | 362,900/- |
| ජය අංක 2කට | 870 | 100/- | 87,000/- |
| ජය අංක 1ක් සමඟ ඉංග්‍රීසි අක්ෂරයට | 1,202 | 100/- | 120,200/- |
| දෛව අංකයට | 25,922 | 20/- | 518,440/- |
| ජය අංක 1කට | 28,731 | 20/- | 574,620/- |
| ඉංග්‍රීසි අක්ෂරයට | 9,297 | 20/- | 185,940/- |
| එකතුව | 69,958 | | 2,253,200/- |

**මීළඟ සුපිරි ජයමල්ල රු. 12,853,604/-**

2022 ජනවාරි මස 22 වෙනි සෙනසුරාදා මීළඟ දිනුම් ඇදීමට වලංගු වන්නේ රතු පැහැති ටිකට් පත්‍රය.
ජයග්‍රාහී ටිකට් පත් මාස 6 ක් වලංගුවේ.

ජීවිතයම එළිය කරන සංවර්ධන ලොතරැයිය www.dlb.lk
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත. යූනියන් පෙදෙස, කොළඹ 2,
දුරකථන: 011 2 333 546-47 ක්ෂණික ඇමතුම්: 0114 824 824
ප්‍රතිඵල ක්ෂණික ඇමතුම: 011 2 333 778
ස්වයංක්‍රීය තොරතුරු අංකය: 011 4 825 825

C M Y K

# පොහොර නැවට ගෙව්වේ අන්තිම රත්රන් ටිකත් විකුණලා



# ජනාධිපති මුළා වෙලා ඉන්නේ

## සමගි ජන බලවේගය කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා

**ජනාධිපතිවරයා පසුගිය 18 වැනිදා ප්‍රතිපත්ති ප්‍රකාශය නව පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළා. මේ ගැන ඔබේ අදහස මොකක්ද?**

ඇත්ත වශයෙන්ම මට කතාව අහන්න බැරි වුණා. මොකද මම පාර්ලිමේන්තු ආවේ නෑ අපේ පවුලෙ පොඩි කරදරයක් සිද්ධ වුණ නිසා. මම පත්තරේ කියෙව්වා. මම නම් බලාපොරොත්තු වුණේ අපි මුහුණ දීලා තිබෙන ගැටලු සම්බන්ධයෙන් උත්තර දෙයි කියලා. මොකද පාර්ලිමේන්තුව කල් දැම්මේ වැදගත් හේතුවක් නිසා වෙන්න ඇති. නැතිව ඕනෑ ඕනෑ වෙලාවට පාර්ලිමේන්තුව කල් දාන්නෙ නැහැ. ආර්ථික ප්‍රශ්න ගැන කතා කරලා තියෙන්නෙ අවසානෙ. ඒ ප්‍රශ්න ගැනත් මට ප්‍රශ්න තියෙනවා.

### කෘෂිකර්මේ දියුණු කරන්න ආපු මිනිස්සු චීනෙන් හාල් හිඟා කනවා

**ආර්ථික අර්බුදයට හේතුව කොවිඩ් කියලා ජනාධිපතිවරයා අවධාරණය කළා?**

නෑනෙ. ආර්ථිකය කඩා වැටුණේ වැරදි ආර්ථික කළමනාකරණය නිසා. හැම රටකටම කොවිඩ් ආවනෙ. නමුත් අපේ වගේ හිඟාකන රටක් වෙන කොහෙවත් නෑනෙ. කතාවේ මැද හරියෙ එතුමා කියනවා අපි මුහුණ දෙන විශාලම අර්බුදය විදේශ විනිමය ගැටලුව කියලා. උදාහරණයක් විදිහට පටන් ගන්නෙම වැරදි තැනකින්. එතුමා කියනවා රට බාරගන්නකොට විදේශ විනිමය සංචිත තිබුණා ඇමරිකානු ඩොලර් බිලියන 7.2ක් කියලා. ඒක බොරු. ආණ්ඩුව පටන් ගද්දිම තිබුණා ඩොලර් බිලියන 7.8ක්. අනිත් කතාව තමයි ඒකෙන් කොටසක්ම කෙටිකාලීන ණයලු. ඒකත් බොරු. මේවා මිනිස්සු කතා කරන්නෙ නෑ. උදාහරණයක් විදිහට ඒගොල්ලො 2014 දෙසෙ යනකොට ඩොලර් බිලියන 8.2ක්

### අපි වගේ හිඟාකන රටක් වෙන කොහේවත් නෑ

තිබුණා. ඉන් 5.7ක් තිබුණෙ soft හා කෙටිකාලීන ණය. soft තිබුණා ඩොලර් බිලියන 2.2ක්. Hot money කියලා කුමයක් තියෙනවා. Hot money කියන්නේ විදේශිකයො ඉහළ පොලියක් දෙනකොට භාණ්ඩාගාර බිල්පත්වලට ඒවා ඩොලර්වලින් ගෙනල්ලා රුපියල්වලට හරවලා ආයෝජනය කරනවා. හැබැයි ඕනෑ වෙලාවක ඒ මුදල් අනිත් පැත්තට යන්න පුළුවන්. එතැන තිබුණා ඩොලර් බිලියන 3.5ක්. අර මං කිව්ව ඩොලර් බිලියන 8.2න්, ඩොලර් බිලියන 5.7ක්ම තිබ්බෙ කෙටිකාලීන ණය. හැබැයි අපි ආණ්ඩුව බාර දෙනකොට 7.8ක් තිබුණා. ඒ 7.8 කෙටිකාලීන ණය තිබුණෙ. Soft තිබුණෙ ඩොලර් මිලියන 360යි. මං කියපු විදේශිකයෝ භාණ්ඩාගාර බිල්පත්වලට ආයෝජනය කරලා තිබුණෙත් ඩොලර් මිලියන 600යි. ඩොලර් මිලියන 960යි එතන. ඩොලර් බිලියනයටත් අඩුයි. ජනාධිපතිට මේවා ලියලා දෙන්නේ කවුද දන්නේ නෑ.

**මේ අවුරුදු දෙකක් ඩොලර් බිලියන 6ක විදේශ ණය වාරික ගෙවන්න තිබූ බවත් ජනාධිපතිවරයා කිව්වා?**

ඒක කාටත් තියෙන දෙයක්. මේ පාර විතරක් තිබූ දෙයක් නෙවෙයි, 2019ත් ඩොලර් බිලියන 6කට වඩා ගෙවන්න තිබුණා. ඇත්තටම මහා විශාල ස්වෛරීත්ව බැඳුම්කර ගන්න පටන් ගත්තේ නිවාඩ් කබ්රාල්, 2008. එතැන ඉඳලා පටන්ගත් දේ මේ හැමෝම ගෙවන්නේ. මේක හෝඩාභය රාජපක්ෂට විතරක් වුණු දෙයක් නෙවේ. ණය ගෙවන්න තිබ්බා කියලත් කිව්වනේ.අර වෙරිටේ ආර්ථික පර්යේෂණ ආයතනයෙන් කරලා තියෙනවා දැන් මාස දෙකකට පමණ පෙර ප්‍රසිද්ධ කළා. 2015 සිට 2019 දක්වා ණය ගෙවීම සම්බන්ධයෙන් සම්පූර්ණ විශ්ලේෂණ වාර්තාවක්. ඒක මහ බැංකුවට, මහා භාණ්ඩාගාරට යවලා තිබුණා. ඒ වාර්තාව වැරදියි

### ජනාධිපති කියනවා ජාත්‍යන්තරයෙන් ණය ගන්නේ නෑ කියලා. ගන්නේ නෑ නෙවෙයි දුන්නේ නෑ

කියලා රජයේ කිසි කෙනෙක් කියලා නෑ. ඒකෙ තියෙනවා 2015-2019 දක්වා ගත් ණයවලින් 89.8%ක් ගිහිල්ලා තියෙන්නෙ යහපාලන ආණ්ඩුවට කලින් ගත් ණයවල පොලී ගෙවන්න. කියන්න ලේසියි ණයවලින් මොනවද කළේ කියලා. 90%කට ආසන්න ප්‍රමාණයක් ගෙවලා තියෙන්නේ පොලිය. ඒකයි කියන්නෙ අපි විශාල ඩොලර් ණය කන්දක හිරවෙලා කියලා. දන්නෙ නැති මිනිසුන්ට මේවා කිව්වම මිනිස්සු මුළා වෙනවා. ජනාධිපතිතුමත් මුළා වෙලා තියෙන්නෙ. ජනාධිපතිතුමාවත් දන්නේ නැතිව ඇති 89.8%ක් ගිහින් තියෙන්නෙ පොලී ගෙවන්න කියලා.

**පසුගිය 18 වෙද්දී රටේ ඩොලර් මිලියන 500ක ණය වාරික ගෙවාගන්න බැරි බව ඔබලා කිව්වා. නමුත් ආණ්ඩුව එය ගෙවා දැම්මා?**

මං කැට තියලා කිව්වා මේක ගෙවනවා කියලා. හේතු දෙකක් තියෙනවා. අපි ණය කවදාවත් පැහැර හරලා නෑ. අපේ credibility එකට හේතුවක්. නොගෙවෙන තව හේතුවක් තියෙනවා.

### මේ රට ස්විට්සර්ලන්තයක් වගෙයි කතා කරන්නේ. හැබැයි කන්න හාල් කිලෝවක් ගන්න බෑ

මේ ණය අරන් තිබුණේ ගොඩක් ආයතනික ආයෝජකයො. මේ ශ්‍රේණිගත කිරීමෙන් යම්කිසි තැනකට වඩා පහළට රටක් වැටුණොත් ඒගොල්ලන්ගෙ රීතිවලට අනුව ඒවා තවදුරටත් ඒ අයට රඳවාගෙන ඉන්න බෑ. අවදානම වැඩියි. රීතිවලට අනුව ඒගොල්ලො ඒවා විකුණන්න ඕනෑ. ඩොලරයක වටිනාකම තියෙන ස්වෛරීත්ව බැඳුම් නම් ද්විතීයික වෙළෙඳපොළේ අද වෙද්දී ශත 47ට බැහැලා තියෙනවා. 2030 කල් පිරෙන ඒවා පවා ඩොලරය යම්කිසි ශ්‍රේණිගත කිරීමකින් පහළට වැටුණු නිසා ලොකු වට්ටමකට මේ අය විකිණා. සමහරු මේවා ගත්තා. එතකොට කවුද මේවා ගත්තෙ.

**ඔබ ප්‍රකාශ කළා මෙම ණය වාරික නොගෙවා සිටිය හැකි බවත්?**

මම කිව්වේ නෑ නොගෙවා ඉන්න කියලා. මම 2020 ඉඳලා මං කිව්වා මේවා ප්‍රතිව්‍යුහගත කරන්න කියලා. ඒ කියන්නෙ නොගෙවා ඉන්න කියලා නෙමෙයි. කල් දාගන්න එක. මම තමයි මේ ගැන මුලින්ම කිව්වෙ IMF එකත් එක්ක කතා කරලා ප්‍රතිව්‍යුහගත කරන්න කියලා. මං ඔයාගෙ කලින් ඉන්ටර්විව් එකේදීත් මේ ගැන කිව්වා. ණය ගෙවා ගන්න බැරි වුණාම ප්‍රතිව්‍යුහගත කරන එක ඕනෑම රටක් කරන දෙයක්.

**අපි මේ බැඳුම්කර නිකුත් කරන්නේ අපේ ස්වෛරීත්වය උකසට තබා. මේවා නොගෙවා සිටියොත් ජාත්‍යන්තර වශයෙන් අපිට කළු පැල්ලමක් නේද?**

කළු පැල්ලමක් කියලා මිනිස්සු ආවට ගියාට කියනවා. කළු පැල්ලම කියන්නෙ අපිට ජාත්‍යන්තර වෙළෙඳපොළ දොරටුව වැහෙනවා කියන එක. අපිට ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ දොර වැහුණා 2020 මැ. ඒකට හේතුව 2019 දෙසැම්බර් මාසෙ අත්තනෝමතිකව 25%කට වඩා වැඩි බදු ආදායමක් එපා කියලා කපා හරපු නිසා. ජනාධිපති කියනවා මම ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් ණය ගත්තෙ නෑ කියලා. ණය නොගත්තා නෙවෙයි. ණය දෙන්නේ නෑ අපිට. කළු පැල්ලම අපිට වැදිලා ගොඩක් කල්. අපිට දැන් ණයවර ලිපි විවෘත කරගන්නත් බෑ. දැන් අපිට කළු පැල්ලම් ගොඩක් වැදිලා තියෙන්නේ.

**සරලම කාරණය ගත්තොත් අපේ වරායේ සිරවී තිබෙන ගෑස්, කිරිපිටි ඇතුළු අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ සහිත නැව් ටික නිදහස් කරගන්න කුමක්ද කළ යුත්තෙ?**

කයිවාරු ගැහුවත් නෑ. කතාව දෝලාවෙන් ගමන පයින් වගේ ආණ්ඩුව මහා ලොකු ටෝක් දෙන්නේ. මගේ අම්මේ නිකම් මේ රට ස්විට්සර්ලන්තයක් වගේ කතා කරන්නේ. හැබැයි කන්න හාල් කිලෝව ගන්න බෑ. චීනෙන් හාල් මෙට්‍රික් ටොන් ගණන් හිඟා කනවා. මේ කෘෂිකර්මය දියුණු කරන්න ආපු මිනිස්සු. ඉන්දියාවට තෙල් ටැංකි ටික දීලා අඩිලා හොඳු පෙරලා තෙල් ටික ඉල්ලාගන්න වෙලා. මොකක්ද මේ මිනිස්සු අපිට කරලා තියෙන්නේ. මේවා ගන්ද කළු පැල්ලම්. මහලොකුවට කිව්වේ ඩොලර් අච්චර ආවා, මෙච්චර ආවා කියලා. තියෙනවා නම් ඔය ඩොලර් දෙන්න එපැයි. බොරුනෙ කියන්නේ.

**නමුත් චීන පොහොර නැව වෙනුවෙන් මහජන බැංකුව ඩොලර් මිලියන 6.7ක් ගෙව්වා. ඒවට ඩොලර් තියෙනවා නම් ඉන්ධන ටිකවත් නිදහස් කර ගන්න ඩොලර් නැ කියන්නේ කොහොමද?**

ඒක තමයි කියන්නේ අන්තිම රත්රන් ටිකත් විකුණලා ගෙව්වේ. ඇත්ත වශයෙන්ම මේවා දණ්ඩ නීති සංග්‍රහයේ අපරාධ. මේවා කරපු මිනිසුන්ට දඬුවම් දෙන්න ඕනෑ. රජයේ මිනිසුන්ට කන්න නැති වෙලාවක කවුද මේවා කෙළේ. මේ වෙලාවේ කරන්න තියෙන්නෙ කොහොමහරි ඩොලර් ටික එක පැත්තකින් එළියට යන එක නවත්තන එක. අපිට කන්න

### අපි කට කැඩෙනකම් ජනාධිපතිට කිව්වා ඔය විධියට සල්ලි අච්චු ගහන්න එපා කියලා

### IMF කියන්නේ රකුසෙක් නෙවෙයි

බොන්න ඩොලර් අවශ්‍යයි. වාරික පොලිය ගෙවන්න නම් ප්‍රතිව්‍යුහගත කරලා හරි කල් දාගන්න පුළුවන්.

**ආණ්ඩුව ඇයි ඒ වගේ දේකට නොයන්නෙ?**

නොයන්න හේතුව එක පැත්තකින් උද්දච්චකම. අනෙක් පැත්තෙන් ඒගොල්ලො හිතනවා අපි තමයි හොඳටම කළේ කියලා. අවවාදයක් උපදෙසක් ගන්න ආණ්ඩුව සූදානම් නෑ. උපදෙස්

දුන්නු අය එළවලා දැම්මා. කෘෂිකර්ම විශේෂඥයෝ එළ වලා දැම්මා. නමුත් මේවා කියන ආර්ථික විශේෂඥයන් එළවලා දාන්න බෑ. අන්තිමට මේ වැඩේ සම්පූර්ණයෙන්ම අනාගෙන ඉන්දැද්දිත් මේ ස්වාධීන කට්ටිය කියන දෙයක් අහන්න සූදානම් නෑ. ඒගොල්ලො තමයි හොඳටම දන්නේ ඒගොල්ලො තමයි හොඳටම කළේ කියලා හිතලා කවදාවත් නැති තරම් මේ රට පහළට දාලා තියෙනවා.

**ඔබලා විපක්ෂය ලෙස යෝජනා කරනවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යා යුතු බව. නමුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට දෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යෑමෙන් ජනතාව පීඩාවට පත්වන බව?**

එතකොට ජනතාව දැන් පීඩාවට පත්වෙලා නැද්ද? මීට වඩා මොකක්ද ජනතාවට තියෙන පීඩාව, මිනිසුන්ට කන්න නැත්නම්, විදුලිය නැත්නම්, බෙහෙත් නැත්නම් මොනද්ද වෙන පීඩාවක්. මේගොල්ලො පාරවල් කාපට් කරන්න ඩොලර් රුපියල් මිලියන 330ක් මේ අවුරුද්දට වෙන් කරනවා. එතකොට ඒවට සල්ලි තියෙනවා. අපිට අමතා වෙලා තියෙන්නේ ඒක නෙවෙයිනේ. ප්‍රමුඛතාව තියෙන්නේ මිනිසුන්ට ජීවත් වෙන ප්‍රශ්නය. මිනිසුන්ට බෙහෙත් ටිකක් දෙන්න බැරි රටකින් ඇති තේරුම මොකක්ද? පිළිකා රෝහලේ බෙහෙත් නෑ. රියේ පෙරේදා කියලා තිබ්බා බෙහෙත් ගේන්නත් ඩොලර් නෑ කියලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන නොයන එක ආණ්ඩුවේ තීරණයක්. නමුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන්නේ රකුසෙක් නෙමෙයි. ඒගොල්ලෝ දිගටම දුවසක කොන්දේසි දාන්නෙ නෑ. ඒගොල්ලො කරන්නේ රටක් විසින් ඉදිරිපත් කරන වැඩපිළිවෙළ කට එකඟ වීම පමණයි. අපි බැංකුවකින් ණය ගන්න යනකොට ව්‍යාපාරික යෝජනාව හදන්නෙ අපි මිස ඒ බැංකුවේ කළමනාකාරවරයා

නෙවේනෙ. ඉතින් ඒ වගේ ව්‍යාපෘති යෝජනාවක් අපි ලියාගෙන යා යුතුයි. හැබැයි ඒගොල්ලො බලාපොරොත්තු වෙන එකම දේ තමයි රාජ්‍ය මූල්‍ය විනය.

ලෝක දළ දේශීය නිෂ්පාදනයෙන් අවම බදු එකතු කරන රට ලංකාව. මුළු ලෝකෙන්ම. අනෙක් කාරණය තමයි මුළු ලෝකෙන්ම ආදායමට සාපේක්ෂව වැඩිම පොලිය ගෙවන රටත් ලංකාව. සියයට 75ක් පමණ වෙනවා. එතකොට අපිට හිතාගන්න පුළුවන් කොච්චර අමාරු තැනකද මේ රට තියෙන්නෙ කියලා.

**ඔබ පාරවල් කාපට් කිරීමට යෙද වූ ඩොලර් බිලියන ගාණක් ගැන පැවසුවා. නමුත් මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ විසින් පසුගියදා ජනතාවට සහන පැකේජයක් සඳහා රුපියල් බිලියන 229ක් වෙන්කර තිබෙනවා. ඒක ඔබලා සාධනීයව දකින්නේ නැද්ද?**

අය-වැය ඉදිරිපත් කරලා මාසෙකින් මේ සහන ඉදිරිපත් කරනවා

කියන්නෙම කිසිම සැලැස්මක් නෑ කියන දෙයක්. ඕක අය-වැයේදී කියන්න තිබ්බනේ. අය-වැය දාපු දවසේ ඉඳලා අද වෙනකම් මහලොකු විප්ලවයක් ලෝකෙ වුණේ නෑනේ. වුණේ එකම දෙයයි. මේගොල්ලොන්ගේ කළ මනාකරණයේ තිබුණු අවුල් ටික විතරයි. පොහොර නැතුව කෘෂිකර්මය සම්පූර්ණයෙන් සමතලා කළා. මොකුත් කළේ නෑ. එදා හිතපු නැති තව ඩොලර් රුපියල් බිලියන 229ක් වියදම් කරනවා නම් ඒ ඩොලර් බිලියන 229 කොහෙන්ද කපන්නේ, ඒකට උත්තරයක් දෙන්නේ නෑ.

**ජනාධිපතිවරයා නිහතමානීව යම් ඉල්ලීමක් රජයේ ඉදිරි වැඩපිළිවෙළට විපක්ෂයේ සහාය ලබා දෙන්න කියලා. ඔබලා සහාය දෙනවාද?**

ඉතින් අපි කොච්චර නම් ඔය ජනාධිපතිතුමාට කිව්වද. ඔය ජනාධිපතිතුමාට ආපු දවසෙ ඉඳල අපි කිව්වා අපි සහාය දෙන්නම් කියලා. මේ රටේ මිනිසුන්ව මෙවැනි විනාශකාරී තැනකට ඇදලා දාන්න එපා කියලා. අපි කට කැඩෙනකම් කිව්වා ඔය විදිහට සල්ලි අච්චු ගහන්න එපා ඕක වැරදියි කියලා. අපි කියපු කිසි දෙයක් ඇහුවේ නෑ. අපි පොහොර ගැන ඇත්ත වශයෙන්ම සද්භාවයෙන් කතා කළේ. කිසි දෙයක් ඇහුවේ නෑ. ණය ප්‍රතිව්‍යුහගත කරන්න කියලා කිව්වා. අපි ඒකට සහාය දෙන්නම් කියලත් කිව්වා. විපක්ෂ නායකතුමාත් මමත් කිව්වා. සත පහකට ගනන් ගත්තේ නෑ.

### සහාය ඉල්ලුවාට අපේ උපදෙස් සත පහකට ගණන් ගත්තේ නෑ

### තව ටික දවසක් යනකොට මේ අර්බුදය පුපුරනවා

**මේ ආර්ථිකයේ දිග පළල, ගැඹුර ඔක්කොම බලලා පෙන්වා දෙනවා. භාණ්ඩ අපනයනය කරන්න බෑ කියනවා. තෙල් නෑ. විදුලිය කපනවා. ණය වාරික, පොලී ගෙවා ගන්න බෑ. මේ ඔක්කොම අවසානයේ අපේ රට කුමන තැනකට පත් වෙයිද?**

මෙහෙම කවදාවත් වෙලා නෑනෙ රටේ. ඔයාගෙ ජීවිතේ කවදාවත් මේ වගේ අර්බුදවලට මුහුණදී තිබෙනවාද. නෑනේ. මේක රටක්ද, මේක මහා අපායකට කොටුවෙලා. මේක තව ටික දවසක් යනකොට මේ අර්බුදය පුපුරනවා. මිනිසුන්ට ජීවත් වෙන්න බැරි වුණාම මිනිස්සු මොකද කරන්නේ. ඊට පස්සේ බඩු මිල අහස උසට යනවා. මිනිස්සු එක මාළු මිරිස් කරල ගන්න තත්ත්වෙට පත්වෙලා. හාල් කිලෝ එකක් රුපියල් එකසිය අසූවක් විතර වෙනවා. කොහොමද මිනිස්සු කන්නේ? මේ රටේ හැම මනුස්සයාටම ප්‍රශ්න තියෙනවා. රාජ්‍ය සේවකයා විතරක් නෙමෙයි ප්‍රශ්නවල ඉන්නෙ. පෞද්ගලික අංශයේ අය, ස්වයං රැකියා කරන අයට සහනයක්වත් ලැබුණේ නෑ. ලැබුණේ රාජ්‍ය සේවකයන්ට හා හමුදාවට විතරයි. හරිම අසාධාරණයි.

### මානව හිමිකම් ගැන කතා කළේ මොකක් හිතාගෙනද කියලා දන්නෑ

**ආර්ථික ප්‍රශ්න වගේම අපි මානව හිමිකම් ගැන කතා කළොත් ජනාධිපතිවරයා ප්‍රතිපත්ති ප්‍රකාශයේදී කිව්වා ඔහුගේ කාලයේ කිසිම ආකාරයකට මානව හිමිකම් උල්ලංඝනය නොවුණු බව?**

ජනාධිපති මානව හිමිකම් ගැන කතා කළේ මොකක් හිතාගෙනද කියලා මං දන්නෙ නෑ. මානව හිමිකම් උල්ලංඝනය ගැන කොච්චර නම් උදාහරණ තියෙනවද, අඩුගානෙ සමාජ මාධ්‍ය හරහා ජනාධිපති විවේචනය කරනකොට පොලිසියෙන්

### ආණ්ඩුවට තියෙන එකම තුරුම්පුව ජාතිවාදය ඇවිස්සීම පමණයි

අල්ලගෙන යනවා. සමාජ මාධ්‍යවල අදහස් දැක්වීම පුරවැසියෙක්ට වාචවස්ථාවෙන් දීලා තියෙන අයිතිවාසිකමක්. මං අහගෙන ජාතිවාදී වැඩ කරන්න එපා කියලා එතුමා කියනවා. කවුද ජාතිවාදය අවුස්සන්නෙ. විශේෂයෙන් ජාතිවාදය අවුස්සන්නේ? ජනාධිපති එහෙම ජාතිවාදී කතාවක් ගැන කියපු එක ගැන මට හරි පුදුමයි. එහෙනම් ජනාධිපති මීට පස්සෙ කතා කරද්දි ජාතිවාදය ඇවිස්සෙන ප්‍රකාශ නොකර සිටිය යුතුයි. ජනාධිපති ආදර්ශයක් දිය යුතුයි. අපි දකිනවා මේ රටේ ජාතිවාදය ගැන කොච්චර මේ ආණ්ඩුව විසින් අවුස්සනවද කියල. මේ ආණ්ඩුවට තියෙන එකම තුරුම්පුව ජාතිවාදය ඇවිස්සීම පමණයි. ජනාධිපති ප්‍රතිපත්ති ප්‍රකාශය කරන කොට පාර්ලිමේන්තුවට එක කතෝලික පූජකවරයෙක්වත් ඇවිත් නෑ කියලා ආරංචියි. පූජකතුමන්ලා එයිද. කාදිනල් උන්නාන්සේට කට්ටිය දම්මලා ගහනවා. මුස්ලිම් කට්ටියට ගහනවා. දෙමළ කට්ටියට ගහනවා. මේක ජාතිවාදය නෙමෙයිද.

### යුද්ධ කරනවා වගේ ආර්ථිකය ජය ගන්න බෑ

**ඔබට ආණ්ඩුවට දෙන්න තිබෙන පණිවුඩය කුමක්ද?**

ආර්ථික විද්‍යාව කියන්නෙ ශත වර්ෂ ගණනාවක් විද්‍යාත්මකව විශ්ලේෂණ කරලා, ලිපි ලියලා, ආර්ථික න්‍යාය සම්බන්ධයෙන් කතා කරලා, තර්ක විතර්ක කරලා යම්කිසි පිළිගත් තැනකට ගෙන ආ එකක්. ඒකත් ආණ්ඩුව තේරුම් ගත යුතුයි. යුද්ධ කරනවා වගේ ආර්ථිකය ජය ගන්න බෑ. දේශපාලනඥයන්ට ඕන විදිහට ආර්ථික හසුරුවන්නත් බෑ.

■ සංවාදය - අනුරාධා හේරත්

CMYK

## බල්ලොත් එපා කියන කුණු ගඳ පොහොර

# සාගතයට තල්ලුවෙන රට බේරගන්න වැඩපිළිවෙළක් නැති ආණ්ඩුවක කරුමය



මෙවර මාස් කන්නය ගොවි සිහින බොඳ කළ කන්නයක් යැයි රටට බත සපයන පොළොන්නරුවේ ගොවීහු කියා සිටිති. තමන් යල කන්නයට වඩා වැඩි සාර්ථක අස්වැන්නක් බලාපොරොත්තු වන්නේ මාස් කන්නයට වුවද මෙවර ඊට කණකොකා හඬා ඇති බව කීහ. එයට හේතුව තවමත් නොවිසඳුණු පොහොර අර්බුදය බවයි එම ගොවීන් පෙන්වා දෙන්නේ. එපමණක් නොව ඉදිරි යල කන්නයද රටට බත හිඟවන කන්නයක් වනු නොඅනුමාන යැයිද ඔවුහු පවසති. පොළොන්නරුවේ අත්දැකීම් බහුල ගොවීන් සහ ගොවි නායකයන් පෙන්වා දෙන්නේ මෙවර මාස් කන්නයේ අස්වැන්න වෙනදාට වඩා සියයට පනහකින් පමණ පහළ බසිනු අනිවාර්ය බවයි.

රාජ්‍ය ආයතන දිස්ත්‍රික්කයේ වී ගොවිතැනට අදාළව තම වගකීම් ඉටුකිරීමට යුහුසුලු වී ඇතත් ගොවීන්ගේ පැත්තෙන් තවමත් දක්නට ඇත්තේ වෙනදා මෙන් උනන්දුවක්, කඩිසර බවක් නොව ඉතාමත් ඇල්මැරුණු ස්වභාවයකි. ගොවීන්ගේ කතා බහෙන් මෙන්ම ගොවි බිම් දෙස බැලීමේදීද එය මනාව පැහැදිලි විය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිල ගණන් හිලව්වලට අනුව මෙවර මාස් කන්නයේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වගා කෙරෙන කුඹුරු බිම් ප්‍රමාණය අක්කර 1,50,000කට ආසන්නය. එම කුඹුරු ප්‍රමාණයෙන් අක්කර ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක වී වගාව පිහිටුවා අවසන් බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල යන මහා වාරිමාර්ග යටතේ සහ සුළු වාරිමාර්ග මෙන්ම වර්ෂා පෝෂක ජලයෙන් වගා කෙරෙන කුඹුරුද ඊට අමතරව මහවැලි බී කලාපය, සී කලාපය සහ ජී කලාපය යන මහවැලි කලාපවලට මෙම කුඹුරු අයත් වන බව දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ ආර්.පී. උපාලි මහතා පැවැසීය.

මාස් කන්නයේ වී වගාව සඳහා රජය මඟින් නොමිලයේ ලබාදෙන පොහොර වර්ග සියල්ලක්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන්ට නිකුත් කිරීම සඳහා ගොවි සංවිධාන වෙත ලබාදීම මේවනවිට අවසන් වෙමින් තිබෙන බව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව කියයි.


කාබනික දියර පොහොර ලීටර් ලක්ෂ 03ක් ගොවීන් වෙත නිකුත් කිරීම සඳහා මේවනවිට ලැබී ඇති බවත් ඒ ප්‍රමාණයෙන් සියයට 60ක් මේවනවිට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 13ක් මඟින් ගොවි සංවිධාන වෙත ලබාදී අවසන් බවත් පොළොන්නරුව ගොවිජන සේවා සහකාර කොමසාරිස් අසංග සෝමවංශ මහතා ප්‍රකාශ කළේය. ඉතිරි සියයට 40 ඉදිරි දෙසතිය තුළ බෙදා අවසන් කරන බවද ඒ මහතා කීය.

මේ අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයට ලැබුණු බණ්ඩි පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,866ක් බව කී ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරයා එම මුළු පොහොර ප්‍රමාණය මේ වනවිට ගොවීන් වෙත නිකුත්කර අවසන් බවද කීවේය. රජයේ නිලධාරීන් එසේ පැවැසුවද මෙවර මාස් කන්නයේ වී වගාවට යොමුවීම තුළ මේ දිස්ත්‍රික්කයේ ගොවීන් තුළ ඇත්තේ විශාල පසුබෑමක් බව දක්නට තිබිණි. ගොවීන්ගේ කතාබහ තුළින්ද ඒ බව මනාව පැහැදිලි විය. ඇළහැර මහ ගොවිජනපදයේ මාස් කන්නයේ වී වගාව සඳහා කුඹුරු අක්කර 16,000කට අධික ප්‍රමාණයකට ජලය නිකුත් කර මේ වනවිට මාසයක් ඉක්ම ගොසිනි. එහි ඇතැම් යායවල ගොවීන් තම කුඹුරුවල පළමු හීයවත් සීසා නොමැති බව අපට දැකගන්නට ලැබිණි.

**ඇළහැර මහ ගොවිජනපදයට අයත් 506, ඉකිරිවැව බෙදුම් ඇළ ගොවි සංවිධානයේ සභාපති ඩබ්ලිව්.එස්.එම්.ඒ. ලක්ෂ්මන් ප්‍රියදර්ශන මහතා පැවසුවේ**


රජය මඟින් ලබාදෙන පොහොර වර්ග කිසිවක් මේ වනතෙක් තම ගොවි සංවිධානයට ලැබී නොමැති බවයි. එම නිසා ඇතැම් ගොවීන් තම කුඹුරු වගා නොකර අත්හැරදමා ඇතැයිද ඒ මහතා කීය. "අපේ ගොවි සංවිධානයට අයත් සාමාජික ගොවීන් 268ක් ඉන්නවා. කුඹුරු අක්කර 750ක් විතර මේ ගොවි සංවිධාන බල ප්‍රදේශයේ තිබෙනවා. ඇළහැර අමුණ යටතේ මේ කුඹුරුවලට මාස් කන්නයේ වී වගාව සඳහා ජලය නිකුත් කරලා මාසයකට වැඩියි. සමහරු පළමුවැනි හීය විතරයි




ඒ.ඊ. ඉමාන්ඩීන්


ලක්ෂ්මන් ප්‍රියදර්ශන


පී.කේ.ඩී. විජේරත්න


ජගත් අරුණ කීර්ති


සරත් ජයසිංහ


ආර්. පී. උපාලි

හාලා තියෙන්නේ. රජය මඟින් ලබාදෙන පොහොර වර්ග කිසිම දෙයක් අපේ ගොවි සංවිධානයට මේ වනතෙක් ලැබිලා නෑ. ඒ නිසා ගොවීන් තමන්ගේ කුඹුරු වගා කරන්න එතරම් උනන්දුවක් නෑ. සමහර ගොවීන් වගාව අත්හැරලා. ඒ කුඹුරු දැනට පුරන් වෙමින් තිබෙනවා. පොහොර ප්‍රශ්නය තමයි මේ සියල්ලටම මුලවී තිබෙන්නේ."

මේ අතර රජය මඟින් ලබාදෙන කාබනික දියර පොහොර ගොවීන් විසින් කුඹුරුවලට යෙදීම ප්‍රතික්ෂේප කරන බව ගොවි බිම් වෙත ගිය ගමනේදී අපට අසන්නට ලැබුණු මූලික කාරණයකි.

රජය මඟින් නොමිලයේ ලබාදෙන කාබනික දියර පොහොර තම කුඹුරුවල වී වගාවට යෙදීමට ගොවීහු දැඩි මැළිකමක් දක්වන්නේ මන්දැයි අප විමසූවිට එයට හේතුව ලෙස ගොවීන් පෙන්වා දෙන්නේ එම දියර පොහොර මත්ස්‍ය කොටස් ආදිය යොදා නිපදවා ඇති හෙයින් අධික දුර්ගන්ධයකින් යුක්ත බවය. ඒ දියර පොහොර වී වගාවට යෙදූවිට අයාලේ යන බල්ලන් කුඹුරුවලට කඩාවැදී ගොයම කාදමන බව ගොවීහු කීහ. කබරගොයියන් ආදී මෙතෙක් කාලයකට ගොවිබිමට නොආ සතුන්ද මේ දියර පොහොර ඉසිනු ලැබූ කුඹුරුවලට එන බව ගොවි ජනතාව පැවසූහ. ඒ හේතුවෙන් ගොවීන් එම දියර පොහොර වගාවට නොයොදන බවද ඔවුහු කීහ. මේ අන්දමට බල්ලන්ගෙන් වී වගාවට හානි සිදුවනු තමන් ජීවිත කාලයේ කිසිම දිනෙක දැක නැති බව ඇතැම් ගොවීහු කියා සිටියහ.

**ගිරිතලේ ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් පුරාණ මුස්ලිම් ගොවි සංවිධානයේ**

> **අවිධිමත් කෘෂි සැලසුම් සහ කෘෂි විද්‍යාඥයන්ගේ මතය පරයා පෙරට පැමිණ තිබෙන අහිතකර දේශපාලන තීරණ, තීන්දු වී ගොවියාත් මෙරට වී ගොවිතැනත් වළ පල්ලට ඇද දමා තිබෙන බව අත්දැකීම් බහුල ගොවි ජනතාව පෙන්වා දෙන කාරණයකි**

**භාණ්ඩාගාරික ඒ.ඊ. ඉමාන්ඩීන් මහතා**

ඒ පිළිබඳව අප හමුවේ අදහස් දැක්වූයේ මෙසේයි. "අපේ ගොවි සංවිධානයට අයත් ගිරිතලේ වැව යටතේ වගා කරන කුඹුරු අක්කර 200ක් විතර තියෙනවා. මේ වතාවේ වතුර දීලා සෑහෙන දවසක් ගතවුණා කුඹුරු වගා කරන්න. ඒකට හේතුව මේ පොහොර ප්‍රශ්නය. පොහොර ලැබුණට පස්සේ තමයි කුඹුරු වගා කරන්න පටන් ගත්තේ. අඩු වයස් වී ඒ කියන්නේ මාස 03ක් වයස වී තමා මෙවර වගා කළේ. දැන් මේ රජයෙන් දීලා තියෙන කාබනික දියර පොහොර ගොඩ දෙනෙක් වගාවට යොදන්න කැමති නෑ. ඒවයේ තියෙන අමුතු ගඳක් නිසා ගොවි මහත්තුරු ඒවා ගෙනියන්නේ නෑ. අපේ ගොවි සංවිධානයේ ගබඩාවේ ගොඩ ගැහිලා තියෙනවා. කිහිපදෙනෙක් තමයි ඒ දියර පොහොර අරන් ගියේ. තව වැඩි ප්‍රමාණයක් ඉතිරිවෙලා තියෙනවා."

**පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රය ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති ජගත් අරුණ කීර්ති මහතා** ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින් කියා සිටියේද රසායනික දියර පොහොර යෙදීමට ගොවි ජනතාව විශාල මැළිකමක් දක්වන බවයි. ගොවීන් විසින් ඒ දියර පොහොර රැගෙන නොයෑම නිසා ගොවි සංවිධානවලට අයත් ගබඩාවල මේ වනවිට දියර පොහොර ගොඩ ගැසෙමින් තිබෙන බව කීය. වර්තමානයේ ඇතිවී තිබෙන පොහොර ප්‍රශ්නය නිසා ඉදිරි කාලයේදී මේ රටේ ගොවි ජනතාව වී වගාවෙන් ඉවත්වීම නොවැළැක්විය හැකි බවයි. ගොවීන් එසේ වී වගාවෙන් ඉවත්වුවහොත් මේ රට සාගතයකට ගොදුරුවනු අනිවාර්ය බවත් එහි වගකීම රජය භාරගත යුතු යැයිද ඒ මහතා කීවේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ජගත් අරුණ කීර්ති මහතා මෙසේද පැවැසීය.

"වී වගාවට අවශ්‍ය ප්‍රමිතියෙන් යුත් පොහොර නිසි කලට ලබාදීමට රජය කටයුතු නොකිරීම නිසා මේ වනවිට කෘෂිකර්මාන්තයේ අර්බුද රාශියක් ඇති වී තිබෙනවා. අද ඇති වී තිබෙන පොහොර ප්‍රශ්නය නිසා ගොවීන් ඉදිරි කාලයේදී වී වගාව අත්හැරීමට තීරණය කරනවා ඒකාන්තයි. රජයෙන් දැන් දෙන මේ පොහොර යොදලා අපිට රසායනික භාවිතයෙන් ගත්තු අස්වැන්න ගන්න බෑ කියන එක අපිට විශ්වාසයි. එම නිසා පාඩු ලබන ගොවිතැන් කරන්න ගොවීන් සූදානම් නෑ. මේ පොහොර ප්‍රශ්නය නිසා මේ වතාවේ සියයට පනහකින් අස්වැන්න පහළ බහිනවා. ඒ තත්ත්වය තුළ රටේ වී සහල් හිඟයක් ඇති වීම අනිවාර්යයි. පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රය ව්‍යාපාරයේ පමණක් ගොවීන් එක් කන්නයකට රුපියල් කෝටි 280ක් වටිනා වී නිෂ්පාදනය කරනවා. ඔවුන් එක් කන්නයක් වගාවෙන් ඉවත් වෙනවා කියන්නේ ඒ අස්වැන්න රටට නොලැබී යනවා. එමෙන්ම එසේ වී ගොවියා තම වගාව අත්හැරීම තුළ ඉදිරියේදී රට ඉබේම සාගතයකට තල්ලු වෙනවා. එහි වගකීම රජය භාර ගතයුතුයි. එම නිසා අපි රජයට කියනවා ඉදිරි යල කන්නයේ වී වගාවට අවශ්‍ය රසායනික පොහොර ලබාදෙන්න කියලා. මේ ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා වහාම ජනාධිපතිවරයා මැදිහත් විය යුතුයි. එහෙම නොවුණොත් මේ රටේ කෘෂිකර්මාන්තයේ දැනට ඇතිවෙලා තියෙන අර්බුදය ඔඩුදුවන තත්ත්වයට පත්වෙනවා. දේශීය සහල් කිලෝවක් රුපියල් හාරසීයට පන්සීයට මිල ඉහළ යාවි. එතකොට රටේ ජනතාව විශාල පීඩාවකට පත්වෙනවා."

**පොළොන්නරුව විජයබාහුපුර බෙදුම් ඇළ ගොවි සංවිධානයේ සභාපති සරත් ජයසිංහ මහතා** කියා සිටියේ මෙවර මාස් කන්නයේ වී වගාව වෙනත් කන්නවලට වඩා බොහෝ සෙයින් ප්‍රමාදවූ බවයි. කන්නය පමාවී වගා කටයුතු ආරම්භ කිරීමෙන් කෘමි හානි, වසංගත රෝග ආදියට ගොදුරුවීමට බොහෝදුරට ඉඩ තිබෙන බව ඒ මහතා කීය. එමෙන්ම මාස් කන්නයේ ඇතිවන මහ වැසි සහ ගංවතුර වැනි සොබාදහමේ අපල උපද්‍රවයන්ට වී වගාව ගොදුරුවීමට තිබෙන ඉඩකඩ ඉතා වැඩි බවද හෙතෙම කීවේය.

**පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රය ව්‍යාපාරයට අයත් අලුත්වැව නැඟෙනහිර බෙදුම් ඇළ ගොවි සංවිධානයේ සභාපති පී.කේ.ඩී. විජේරත්න මහතා**

"මේ වෙනකොට ගොවි ජනතාව බරපතළ අර්බුද රාශියක ඉන්නේ. සෑම අතින්ම ගොවියාට ප්‍රශ්න. ඒවාට විසඳුමක් පේනතෙක් මානයකවත් නෑ. වගාවට අවශ්‍ය පොහොර කියන්නේ ගොවිතැනේදී වැදගත්ම සාධකයක්. ඒ බව අමුතුවෙන් කියන්න වුවමනා නෑ. නමුත් අද වෙනකොට වී වගාවට අවශ්‍ය පොහොර නොවෙයි ලැබිලා තියෙන්නේ. වී වගාවේදී පසට යොදන මූලික පොහොර නෑ. මේ දීලා තියෙන්නේ එකක් බණ්ඩි පොහොර. අනෙක රසායනික දියර පොහොර වර්ගයක්. අනෙක් කාරණය කෘෂි රසායන, කෘමිනාශක වර්ග. මේවා තමයි අපිට තිබෙන ලොකුම ප්‍රශ්න. රසායනික පොහොර, කෘමිනාශක යොදන්නේ නැතිව මේ ගන්න අස්වැන්න ගන්න පුළුවන්ද කියන එක. ඒ වගේම කෘෂි රසායන යොදන්නේ නැතිව වී වගාවේ වල් මර්දනය කරන්නේ කොහොමද කියන කාරණය. මේ ප්‍රශ්න ඉදිරියේ ගොවි ජනතාව ඉන්නේ හරිම අසරණ තත්ත්වයකට



පත්වෙලා. ගොවීන් බොහෝ දෙනා මේ වනවිට ඉන්නේ වී ගොවිතැනේ හෙට දවස ගැන දැඩි අවිනිශ්චිතභාවයකින්. ගොවියාට කිසිම සහනයක් ලැබෙන බවක් පේන්න නෑ. මේ වෙනකොට අඳ ක්‍රමයට වී වගාකරන ඉදිරියට වී ගොවිතැන් කරලා වැඩක් නෑ. මේක දිගින් දිගටම පාඩු ලබන තත්ත්වයක්. ගොවීන් බොහොමයක් ගොවිතැනින් ඈත් වෙන්න තීන්දු කරලා. කාබනික වගාවෙන් අඳ කොටස දෙන්න තරම් සාර්ථක අස්වැන්නක් ලැබේවිද කියලා ඒ අයට ලොකු සැකයක් තිබෙනවා. කාබනික පොහොර සම්බන්ධයෙන් අපේ විරුද්ධත්වයක් නෑ. නමුත් මේ විදියට එක පාරටම එතැනට යන්න ගොවියාට අමාරුයි. මැති ඇමැතිවරුන්ට නිලධාරීන්ට හදිසි තීරණ තීන්දු ගන්න පුළුවන්. නමුත් ක්‍රියාත්මක කිරීමේදී තමයි එහි දුෂ්කරතාවලට මුහුණ දෙන්න ගොවියාට සිද්ධ වෙන්නේ. එම නිසා ඒ අය ඒක තේරුම් ගන්න ඕන." යැයිද ඒ මහතා කීය.

යම් හෙයකින් රටේ වී නිෂ්පාදනය අඩු වී සහල් හිඟයක් ඇති වුවහොත් එමඟින් ජාතික ආර්ථිකයට ඇති වන බලපෑම මෙන්ම ගොවි පවුල්වල ආර්ථිකය කඩා වැටීම සහ ඉන් ඇතිවන සමාජ අර්බුදයද බරපතළ කාරණයකි. දැන් පැන නැඟී ඇති රසායනික පොහොර සහ කෘෂි රසායන නොගෙන්වීමේ ප්‍රශ්නය හේතුවෙන් වී ගොවිතැනේ හෙට දවස කෙබඳුවේද යන්න ගොවි ජනතාව බොහෝ දෙනා තුළ ඇත්තේ බලවත් සැකයකි. මන්ද කාබනික පොහොර යෙදීමෙන්ම පමණක් දැනට ලබන අස්වැන්න ලැබිය හැකිද යන්න ගොවි ජනතාව තුළ ඇති වී තිබෙන ප්‍රධාන ප්‍රශ්නය බවයි පැවැසෙන්නේ.

මෙරට බහුතරයක් ජනතාවගේ මූලික ජීවනෝපායක් වන වී ගොවිතැන අඩාල වීම රටේ ආර්ථිකයට විශාල බලපෑමක් ඇතිකරවන බව අමුතුවෙන් කිවයුතු නොවේ. වී නිෂ්පාදනය පහළ වැටී එදිනෙදා පරිභෝජනය සඳහා අවශ්‍ය සහල් හිඟයක් ඇති වීම අනිවාර්ය ප්‍රතිඵලයකි. එම නිසා රටට අවශ්‍ය සහල් විදේශ රටවලින් මෙරටට ආනයනය කිරීමටත් ඒ සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවීමද නොවැළැක්විය හැකිවනු ඇත.

අවිධිමත් කෘෂි සැලසුම් සහ කෘෂි විද්‍යාඥයන්ගේ මතය පරයා පෙරට පැමිණ තිබෙන අහිතකර දේශපාලන තීරණ, තීන්දු වී ගොවියාත් මෙරට වී ගොවිතැනත් වළ පල්ලට ඇද දමා තිබෙන බව අත්දැකීම් බහුල ගොවි ජනතාව පෙන්වා දෙන කාරණයකි. රටට බත සපයන ගොවියා මීට පෙරද පොහොර සම්බන්ධ ප්‍රශ්න ඇතුළු විවිධ ගැටලුවලට මුහුණපා ඇතත් ඒවා නිරාකරණය කරගෙන සුපුරුදු ජීවනෝපායේ නිරතව තිබේ. එහෙත් මෙවර ඇති වී තිබෙන පොහොර පිළිබඳ ප්‍රශ්නය ඊට වඩා බරපතළ කාරණයක් වී තිබෙන බව පැහැදිලිය. එමෙන්ම දැන් එය රට පුරාම පාහේ ගොවිබිම් කරා විසිරී ඇති පොදු ප්‍රශ්නයක් බවටද පත් වී තිබෙන අතර ඉදිරි කාලයේදී වී වගාව අත්හැරෙන තත්ත්වයට පත්ව තිබීමෙන් එහි බැරෑම්කම තවදුරටත් තහවුර වේ. මෙරට ජනතාවගේ ප්‍රධාන ආහාරය වන බත සැපයෙන කාර්යට හරස් වී ඇති මේ ප්‍රශ්නයට නිසි විසඳුම් නොපමාව ලබා නොදුනහොත් එහි අවාසිය රටටත් ජනතාවටත් ඉතා තදින් දැනෙනු නොඅනුමානය.

■ **සටහන ඡායාරූප - අනුරාධ විශ්වනාත්**

## 17 >> වල්සපුගල මහ වනය...

මම දැන් මේ වාසය කරන ගල්පාය මාගම් රාජධානියේ එක් සමයකදී දියුණු බෞද්ධ විහාරස්ථානයක් යැයි උපකල්පනය කළ හැකියි. මෙම ස්ථානයෙහි සංඝාවාස, වෙහෙර විහාර ගොඩනැඟා තිබුණු බවට සාක්ෂි එමටයි. අප පෞද්ගලිකවම විශ්වාස කළා යෝජිත අලි කළමනාකරණ රක්ෂිතයට වල්සපුගල එකතු වෙද්දී මෙම පුරාවිද්‍යාත්මක සාක්ෂි යම් පමණකට හෝ සුරැකේවි කියා. නමුත් එය එලෙස සිදුවුණේ නැහැ. මේ කැලෑ භූමිය මුල්කරගෙන විශාල ප්‍රමාණයේ ගල්වළවල් කිහිපයක් ආරම්භ කිරීම පමණයි සැබැවින්ම සිදුවුණේ. මෙම භූමියේ තිබෙන පුරාවිද්‍යාත්මක සාක්ෂි මාගම් රාජධානිය කරා දිවයනවා යැයි උපකල්පනය කළ හැකියි. ඉන් පසුව දුටුගැමුණු රජු ලංකාව එක්සේසත් කළායින් පසු අනුරාධපුර යුගයේ ගෘහ නිර්මාණවල යම් ආභාසයක් දෙවැනුව හා තෙවැනුව මෙම පුරාවිද්‍යාත්මක සාක්ෂි මත පැමිණ තිබෙනවා. අප මෙම පුරාවිද්‍යාත්මක සාක්ෂි ඉතා සෙමෙන් මතුකරගත යුත්තේ ක්‍රි.පූ. යුගය සහ ඉන්පසු යුගය හා සබැඳි පුරාවිද්‍යාත්මක සාක්ෂි එම මහ වනය තුළ පවතින නිසා. පෙරාතුව සඳහන් කළ පරිදි අලි කළමනාකරණ රක්ෂිතය ගැසට්ටුවක් බවට පත්කරන විට අප බලාපොරොත්තු වුණේ අලි ඇතුන්ගේ වාසභූමි ආරක්ෂා කිරීම. යෝජිත රක්ෂිතයේ ඉඩම් සමාගම් සහ පුද්ගලයන්ට ආණ්ඩුව විසින් ලබාදී තිබෙන වටපිටාවකදී තමයි ගොවි අරගල දියත් වුණේ. අලි ඇතුන් හාරසීයකට වැඩි පිරිසකට අවශ්‍ය ඉඩකඩ සලසන යෝජිත අලි කළමනාකරණ රක්ෂිතයෙන් දැනටමත් නොයෙකුත් සංවර්ධන කටයුතුවලට යැයි කියමින් ගොන්නොරුව සිට බුරුතකන්ද දක්වා කුලු වැව් ගණනාවක් ඇති අක්කර දෙදහකට වැඩි ප්‍රමාණයක් නිදහස් කරගෙන තිබෙනවා. එම වැව්වලින් දීර්ඝ කාලයක් තිස්සේ සිදුවූවේ අලි ඇතුන්ගේ ජල අවශ්‍යතාව ඉටු වීම. ආරංචි මාර්ගවලට අනුව බුරුතකන්ද සූර්ය බලාගාරය සඳහා අක්කර 500ක් වෙන් කරගෙන තිබෙන අතර වල්සපුගල හා දිවුල්පැලැස්ස බලශක්ති ගම්මානයක් ඉදිකිරීම සඳහා තවත් අක්කර 300ක් වෙන්කරගෙන තිබෙනවා."

වලව වම් ඉවුර ඒකාබද්ධ ගොවි සමාගමේ සභාපති මහින්ද සමරවික්‍රම මහතාට අනුව රාජ්‍ය අමාත්‍ය විමලවීර දිසානායක මහතා විසින් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ සඳහන් වන්නේ රක්ෂිතය මුල් ප්‍රතිපාදනයෙන් ප්‍රකාශ කර තිබූ හෙක්ටයාර් 25,000කට වඩා හෙක්ටයාර 23,746ක් ආවරණ කර ඇති බවයි. යෝජිත අලි රක්ෂිතයේ සීමා නිර්ණය කළ ප්‍රදේශය දැක්වෙන යල්පැනගිය සිතියමක් ඇතුළත් ගැසට් පත්‍රය නිකුත් කර තිබීම සැක සහිත බව සමරවික්‍රම මහතා පවසා සිටී. අදාළ රක්ෂිතය තුළ මහා පරිමාණ සූර්ය බලශක්ති ගොවිපළ වල් දෙකක් සහ ගල් වළවල් දෙකක් නිරූපණය කර නොමැති බවද ඔහු පවසා සිටී. සූර්යවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමනිලධාරි වසම් 21න් 17ක් වන අලින්ගෙන් පීඩාවට පත්වන අතර අම්බලන්තොට, හම්බන්තොට, සෙවණගල සහ ලුණුගම්වෙහෙර, තණමල්විල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය හා හම්බන්තොට මහනගර සභා බල ප්‍රදේශය නිරන්තරයෙන් වන අලි ප්‍රහාරයට ලක්වේ.

"මෙම පුරාවිද්‍යාත්මක සාක්ෂි සැබැවින්ම ආරක්ෂා කර ගන්නට නම් වන අලි කළමනාකරණ සැලැස්මට මෙම මහ වනය අයිති විය යුතුයි. එවිට වන අලින් සහ පුරාවිද්‍යාත්මක සාක්ෂි සංවරණය සහ තුලනය මඟින් පාලනය වේවි. කුඩා වනාන්තරවලට කොටු වී සිටින අලිඇතුන් සඳහා තමයි අලි කළමනාකරණ කලාපයක අවශ්‍යතාව දැනුණේ. මෙම අලි කළමනාකරණ ප්‍රදේශය ලුණුගම්වෙහෙර, බුන්දල සහ උඩවලව අභයභූමිවලට අලි ඇතුන්ට යන්නට ප්‍රවේශ මාර්ගයක් සකසා දෙනවා. පසුගිය දශක දෙක තුළ හම්බන්තොට වරාය, මත්තල ගුවන්තොටුපොළ, දක්ෂිණ අධිවේගී මාර්ගය අනෙකුත් කාර්මික, කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා වනාන්තර අක්කර දහස් ගණනක් හෙළිපෙහෙළි කළා. අද ලෝකයේ අලි-මිනිස් ගැටුමෙන් වැඩිම අලි මරණ සංඛ්‍යාවක් සහ දෙවැනි වැඩිම මිනිස් මරණ සංඛ්‍යාවක් වාර්තා වන්නේ ශ්‍රී ලංකාවෙන්. 2019 අවුරුද්දේදී අලින් 405 දෙනකු ඝාතනය වී තිබෙනවා. 2019 වර්ෂයේදීම මිනිස් මරණ සංඛ්‍යාව 121ක්. අලි මිනිස් ගැටුම වර්ධනය වන්නේ සංවර්ධන ව්‍යාපෘති සඳහා අලි ඇතුන්ට ඔවුන්ගේ වාසස්ථාන අහිමි කිරීමෙන් බව අප දැන සිටිය යුතුයි. වල්සපුගල ප්‍රදේශයේ ජනතාව ඉල්ලා සිටින්නේ විදුලි වැටක් හෝ අලි ඇතුන් වෙනත් ප්‍රදේශයකට පලවා හරින්නට නොවේ. ඔවුන් කියන්නේ මිනිසුන්ට සහ අලින්ට නිදහසේ ජීවත් විය හැකි පරිසරයක් සකසා දෙන්න කියා."






# ගුවන අරා දෙරණ සිසාරා විස්කම් පානා යුද හමුදා පැරෂුට් භටයෝ



**ශ්‍රී ලංකා පැරෂුට් ඉතිහාසයේ නව පරිච්ඡේදයක් විවෘත කරමින් මේජර් එන්.ජී. චන්ද්‍රසේන ශ්‍රී ලංකාවේ ප්‍රථම නිදහස් ආර පැරෂුට් භටයා ලෙස පත් විය. ඔහු නිදහස් ආර පැරෂුට් පාඨමාලාව ඇමෙරිකාවේදී සාර්ථකව හදාරා ශ්‍රී ලංකාවට පැමිණි පසු කමාන්ඩෝ පැරෂුට් භටයන් නිදහස් ආර පැරෂුට් පැනීම් සඳහා අවශ්‍ය භූමි පුහුණුවීම් ආරම්භ කරන ලදී.**

පසුව කමාන්ඩෝ රෙජිමේන්තුවේ නිලධාරියකු සහ සෙසු නිලයන් 04කට ඉන්දියාවේදී ප්‍රථම නිදහස් ආර පැරෂුට් පාඨමාලාව හැදෑරීමට අවස්ථාවක් හිමි වූ අතර කමාන්ඩෝ රෙජිමේන්තුවේ නිලධාරියකු සහ තවත් සෙසු නිලයකට ඉන්දියාවේදී ප්‍රථම පාත්ෆයින්ඩර් පාඨමාලාවද හැදෑරීමට අවස්ථාවක් ලැබීමත් සමඟ කමාන්ඩෝ සෙබළුන්ගේ පැරෂුට් ක්‍රියාන්විත හැකියාවන් වර්ධනය විය.

ඒ අනුව කමාන්ඩෝ රෙජිමේන්තු පැරෂුට් පුහුණු අංශය ගනේමුල්ල කඳවුරේ ස්ථාපනය කළ අතර 1990 ජනවාරි 29 වැනි දින 01 වන පැරෂුට් පුහුණු පාඨමාලාව තෝරාගත් කමාන්ඩෝ භට කණ්ඩායමක් සඳහා කමාන්ඩෝ රෙජිමේන්තුවට පැරෂුට් පුහුණු අංශය වෙතින් පුහුණුවීම් පවත්වන ලදී.

පැරෂුට් පුහුණු අංශයේ පුහුණුවීම් සඳහා අත්‍යවශ්‍ය පහසුකම් තවදුරටත් පුළුල් කරමින් ගනේමුල්ල පැරෂුට් පුහුණු අංශය තුළ පැරෂුට් එතීම හා නඩත්තු කිරීමේ ගොඩනැගිල්ලක් ඉදිකළ අතර එම ගොඩනැගිල්ල 1991 මාර්තු 15 වැනි දින එවකට යුද්ධ හමුදාපති ලුතිතන් ජෙනරාල් හැමිල්ටන් වනසිංහ විසින් විවෘත කරන ලදී. මෙම වසරේදීම ශ්‍රී ලංකාවේදී ප්‍රථමවරට නිදහස් ආර පුනරීක්ෂණ පැරෂුට් පැනීම් පාකිස්තාන උපදේශකයන්ගේ සහාය ඇතිව රත්මලාන ගුවන් පථයේදී සාර්ථකව සිදුකරන ලදී.

පැරෂුට් ආශ්‍රිත පුහුණුවීම් තවදුරටත් පුළුල් කරමින් කමාන්ඩෝ රෙජිමේන්තු පැරෂුට් පුහුණු අංශය විශේෂ බළකායේ නිලධාරීන්ට හා සෙසු නිලයන්ට මූලික පැරෂුට් පාඨමාලා අංක 02 හැදෑරීමට අවස්ථාව ලබාදෙන ලදී. එමෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙතද එම පාඨමාලාව හැදෑරීම සඳහා එක් ඇබෑර්තුවක් වෙන් කරදුන් අතර එම පාඨමාලාව සාර්ථකව හදාරන ලද බළගණ නායක බී.එන්. රත්නකුමාර ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රථම පැරෂුට් භටයා ලෙස ඉතිහාසයට එක් විය.

ලංකා යුද හමුදා නිදහස් ආර පැරෂුට් භටයන් විසින් 44 වන නිදහස් උත්සවය වර්ණවත් කරමින් නිදහස් ආර පැරෂුට් සන්දර්ශනයක් පැවැත්වූ අතර මෙය ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම පැරෂුට් සන්දර්ශනය ලෙස ඉතිහාසයට එක්විය. කමාන්ඩෝ රෙජිමේන්තුවේ මේජර් එස්. සූරියබණ්ඩාරගේ





මූලිකත්වයෙන් කමාන්ඩෝ සහ විශේෂ බළකා සෙබළුන්ගෙන් සමන්විත නිදහස් ආර පැරෂුට් භට කණ්ඩායමක් ඒ සඳහා සහභාගි වූහ. මෙම පැරෂුට් සන්දර්ශනයේදී ශ්‍රී ලංකා පැරෂුට් ඉතිහාසයේ ප්‍රථමවරට ගුවනේ පැරෂුට් කැනපි සන්දර්ශනයක් ඉදිරිපත් කිරීමටද ඔවුන්ට හැකිවිය.

ශ්‍රී ලංකා පැරෂුට් ඉතිහාසයේ තවත් සුවිශේෂ අවස්ථාවක් සනිටුහන් කරමින් කමාන්ඩෝ රෙජිමේන්තු පැරෂුට් අංශය වෙතින් පවත්වනු ලැබූ මූලික පැරෂුට් පාඨමාලා අංක 04 සඳහා නාවික හමුදා සාමාජිකයකුට 1992 සැප්තැම්බර් 14 වැනි දින අවස්ථාව හිමිවූ අතර මෙහිදී ලුතිතන් යූ.අයි. සේරසිංහ ප්‍රථම නාවික හමුදා පැරෂුට් භටයා ලෙස ඉතිහාසයට එක්විය.

නිදහස් ආර පැරෂුට් පුහුණුවීම් ශ්‍රී ලංකාවේම අරඹමින් ප්‍රථම නිදහස් ආර පැරෂුට් පාඨමාලාව 1997 වර්ෂයේදී පවත්වනු ලැබූ අතර කපිතාන් එන්.එල්. සිරිමාන්න ප්‍රථම ශ්‍රී ලාංකික නිදහස් ආර පැරෂුට් පාඨමාලාව හැදෑරූ හමුදා සමාජිකයා ලෙස ඉතිහාසයට එක්විය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් භටයන්ගේ පැරෂුට් ආශ්‍රිත පුහුණුවීම් සහ පැරෂුට් ආශ්‍රිත ක්‍රියාන්විත හැකියාවන් ක්‍රමානුකූලව වර්ධනය වූ අතර ඔවුන්ට 2000 වර්ෂයේ අගෝස්තු මස ස්ලෝවැකියාවේ පැවැති අන්තර්ජාතික ආරක්ෂක සේවා පැරෂුට් තරගාවලිය නියෝජනය කිරීමට ප්‍රථමවරට අවස්ථාව හිමි විය. ඉන් අනතුරුව ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පැරෂුට් කණ්ඩායමක් සෑම වසරක් පාසා මෙම තරගාවලියට සහභාගි වීමට අවස්ථාව හිමිවී ඇති අතර එහිදී ඔවුන් කැපීපෙනෙන දක්ෂතා දක්වා ඇත.

ශ්‍රී ලංකා පැරෂුට් ආශ්‍රිත පුහුණුවීම් නව පිටුවක් පෙරළමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් පුහුණු අංශය විදේශීය හමුදා සමාජිකයන් සඳහාද පැරෂුට් පාඨමාලාවන් හැදෑරීමට අවස්ථාව ලබාදෙන ලදී. එහිදී මාලදිවයින් විශේෂ බළකායේ හමුදා සමාජිකයන් දෙදෙනකු 2005 වර්ෂයේදී මෙම පුහුණුව සාර්ථකව නිම කරන ලදී.

ශ්‍රී ලංකා යුද හමුදා පැරෂුට් ඉතිහාසය තවත් පරිච්ඡේදයක් විවර කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායට අයත් නිලධාරිනියක සහ සෙසු නිලයන් 03 දෙනකු මූලික පැරෂුට් පාඨමාලාව සාර්ථකව හැදෑරූ අතර එහිදී කපිතාන් වී.එම්.එස්. විදානගමගේ, කෝප්‍රල් ආර්.ඒ.එන්. හේමන්ති, කෝප්‍රල් ජේ.එම්. කහවල ශ්‍රී ලංකාවේ ප්‍රථම කාන්තා පැරෂුට් භටයන් ලෙස ඉතිහාසයට එක්විය.

කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල් පරිශ්‍රය තුළ පැරෂුට් පතිත කලාපයක් ඉදිකරමින් පැරෂුට් ආශ්‍රිත පුහුණුවීම් සඳහා වන පහසුකම් තවදුරටත් වර්ධනය කළ අතර එම පැරෂුට් පතිත කලාපය එවකට කමාන්ඩෝ රෙජිමේන්තු අධිපති ලෙස රාජකාරි ඉටුකළ වර්තමාන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ජෙනරාලේ ශවේන්ද්‍ර සිල්වා විසින් 2010 පෙබරවාරි 08 වැනි දින විවෘත කරන ලදී.

කමාන්ඩෝ රෙජිමේන්තු පැරෂුට් පුහුණු අංශය වෙතින් මූලික පැරෂුට් පාඨමාලාව, ජම්ප් මාස්ටර් පාඨමාලාව, පැරෂුට් එතීම හා නඩත්තු කිරීමේ පාඨමාලාව, නිදහස් ආර පැරෂුට් පාඨමාලාව, පාත්ෆයින්ඩර් පාඨමාලාව සහ පැරෂුට් ආශ්‍රිත අනෙකුත් වැඩමුළු ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ (විශේෂ කාර්ය බළකා) සමාජිකයන් සඳහා පවත්වනු ලබයි. ඒ අනුව මේ වනවිට කමාන්ඩෝ පැරෂුට් පුහුණු අංශය වෙතින් ත්‍රිවිධ හමුදා නිලධාරීන් 769ක් සහ සෙසු නිලයන් 3,437 දෙනකු සඳහා (පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරියකු හා සෙසු නිලයකු ඇතුළුව) පුහුණු කරවා ඇති අතර විදේශීය හමුදා නියෝජනය කරමින් නිලධාරීන් 04ක් සහ සෙසු නිලයන් 65 දෙනකු පුහුණු කර ඇත.

එමෙන්ම කමාන්ඩෝ රෙජිමේන්තු සහ විශේෂ බළකා සමාජිකයන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිදහස් ආර පැරෂුට් භට කණ්ඩායම් විදේශීය හමුදා පැරෂුට් තරගාවලි සඳහා සහභාගිවී ඒවායින් ජයග්‍රණ ලබා ශ්‍රී ලංකාවට ගෞරවයක් අත්කරදී ඇත. එහිදී 2017 වර්ෂයේදී වින්ෂුට් ඉසව්ව සහ නිවැරදි ඉලක්කයට පතිත වීමේ (Accuracy Landinng) ඉසව්වලින් රන් පදක්කම්, 2018 එංගලන්තයේ පැවැති පැරෂුට් තරගාවලියේදී නිවැරදි ඉලක්කයට පතිත වීමේ ඉසව්වෙන් රන් පදක්කම, 2019 වර්ෂයේ පැවැති අන්තර්ජාතික ආරක්ෂක සේවා පැරෂුට් තරගාවලියේදී නිවැරදි ඉලක්කයට පතිත වීමේ ඉසව්වෙන් ලෝකඩ පදක්කම දිනා ගැනීමට හැකිවිය.

තවද ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් කණ්ඩායම පැරෂුට් භටයන් 09 දෙනකු ගුවනේ පැරෂුට් සම්බන්ධ කරමින් ශ්‍රී ලංකාවේ වැඩිම පැරෂුට් ප්‍රමාණය එකිනෙකට සම්බන්ධ කිරීමේ වාර්තාවටද හිමිකම් කියයි.



දැනට සේවයේ යෙදී සිටින ජ්‍යෙෂ්ඨතම පැරෂුට් භටයා වන වර්තමාන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි හා යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාගේ මඟපෙන්වීම හා අධීක්ෂණය යටතේ සංග්‍රාමික පැරෂුට් ක්‍රියාන්විත හැකියා වර්ධනය කිරීම සඳහා පුහුණුවීම් ඉහළ තලයකට ගෙන ඒමට පැරෂුට් පුහුණු අංශයට හැකියාව ලැබී ඇත.

එම මඟපෙන්වීම යටතේ පැරෂුට් පුහුණු අංශය විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංග්‍රාමික බලය වර්ධනය කිරීමට අඩිතාලමක් යොදා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථමවතාවට ගුවන් හමුදාවේ හා නාවික හමුදාවේ සහාය ඇතිව ජලය මතට උපක්‍රමික පැරෂුට් පැනීමක් සිදුකිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හැකිවිය.

තවද ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉදිරි දැක්මේ (2020-2025) සංකල්පය යටතේ ක්‍රියාන්විත හැකියාවන් තවදුරටක් වර්ධනය කර ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථමවරට රාත්‍රී නිදහස් ආර පැරෂුට් පැනීම් සහ රාත්‍රී උපකරණ පැරෂුට් පැනීම් සිදුකිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හැකිවිය.

ශ්‍රී ලංකා විශේෂ ක්‍රියාන්විත හමුදාවන්හි සංග්‍රාමික පැරෂුට් හැකියාවන් වර්ධනය කිරීම සඳහා සංග්‍රාමික පැරෂුට් හා පාත්ෆයින්ඩර් පාඨමාලාව නිර්මාණය කළ අතර මෙම පාඨමාලාව සඳහා නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ විශේෂ ක්‍රියාන්විත හමුදා සමාජිකයන්ටත් අවස්ථාව ලබා දුන් අතර තවද මෙම පාඨමාලාව වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ සිදුකරනු ලබන උසස් තත්ත්වයේ සංග්‍රාමික පැරෂුට් පුහුණුම්වලින් සමන්විත පාඨමාලාවක් වන අතර 2022 වර්ෂයේ සිට මෙම පාඨමාලාව හැදෑරීමට විදේශීය හමුදා සමාජිකයන්ටද අවස්ථාව ලබාදී ඇත.

වෘත්තීයමය හමුදාවක යුද ශක්තිය ඉහළ නංවමින් මෙරට සහ විදේශයන්හිදී ශ්‍රී ලාංකික නාමය සෑම විටම ඔසවා තබන්නට කටයුතු කරන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංග්‍රාමික පැරෂුට් කණ්ඩායම ශ්‍රී ලංකාව සතු සුවිශේෂී වත්කමකි. ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට මෙන්ම රටට අත්කර දෙන්නේ ඉමහත් කීර්තියකි.

■ **දිලංක ගුණතිලක**



## සිහින තුළ නොසිටින්න ඔබ

හිමවතේ සැරි සරමින්
අනවතත්ත විලේ පියුම් හෙළමින්
තාවතිංසයේ සෙමෙර සලමින්
සිටියි ඔබ
රාත්‍රියේදී පෙනෙන සිහින තුළ

රාත්‍රිය ගන අඳුරය
වරදිති'යි මහ බියෙන්
හෙළමින් සුසුම්
නොසෙල් වී සිටිමි මම
නොහැකිව ඔබ සොයා ඒමට
සයනය මතම ගුළි වී
තද කර දෑස පියාගෙන

පෙනී සිටින්න හැබැහින්
සැඳෑ කල එළිමහනේ
ගිය හැකිය අවන්හලකට
රළ බිඳෙන මුහුදු වෙරළට
අසල ඇති උයනකට
අතරමං නොවී

■ සිඩ්නි ජයවීර

## පහන් වැට සටහන

**මෙහි එන කවි පද බැඳුම් එකිනෙකට වෙනස් ප්‍රස්තුතයන් හරහා ලියැවී ඇත. එහි සුවිශේෂ සටහනක් තැබිය හැකි නිර්මාණයකි "පිටස්තරයෙක්" යන්න 'බිරිය' ද අරුත්බරය. 'තහනම් ගස' වජිර කුමාරසිංහගේ සුපුරුදු ඉදිරිපත් කිරීමෙන් යුක්තය. "සෙනෙහස අයදිමි" තුළද ව්‍යංගාර්ථවත් බවක් තිබේ. කවිකම දන්නා, කවිකමට හිතැති නිර්මාණ තව තවත් ලියන්නට ඔබට සිත් පහළ වේවායි පතමි.**

සංස්කාරක
සජිත් රෝහිත ලියනගේ
101. රොස්මිඩ් පෙදෙස,
කොළඹ 07

# පහන් වැට



## ආදරය

එපා වෙන්නේ නැති හැටි
ආදරේ මල් සුවඳක්ම වෙන්නැති
ජීවිතේ හරි පාරකට ගෙන අකුරු
කියවූ
ආදරේ ගුරුවරයෙක්ම වෙන්නැති

මතක නැති වෙන්නැති හැටි
මතක පන්හිඳ රනින් සැරසූ
රුවන් වැකියක් වෙන්නැති

අතැර යන්නේ නැති හැටි
ජීවිතේ මහ ගිරිශිඛරයේ
පහන් තරුවම වෙන්නැති
ආදරේ හුස්ම පොද වෙන්නැති

■ ඉෂාරා කාවින්දි - මොනරාගල

## ජලය මිස

සිඳී ගිය පොකුණකට
යුතුද පිරවිය පැණිබීම
එලක් වේවිද හැමදාම
බොරතෙල් කෑන් පිරවීම

වැහි බිඳක්වත් නොහෙළාම
වලා පාවේ නම් නොබලාම

■ අ. නිපුනි චන්ද්‍රසෝම
ර/සුමන බා.වි.
රත්නපුර

## පිටස්තරයෙක්

දිග් ගැහුණ කෙස් ඉරටු රැලී ඇත නළල මත
දූවිලි මල් රටා කමිසය තැනින් තැන
අත් දෙකට මැදි වෙලා කොපි පොතක් ඉරී ගිය
නා රජිඳු මිණි කැටය රකිනා විලාසෙට....
පැන්සලක් ඇතද - අත ලියන්නේ නැත එයින්
සතුරෙක්ව ජය ගන්නට - අවියක්ය එය ඔහුට
සිනහවක් නැත මුහුණේ - බැල්මෙ ඇත හිස් බවක්
එන්නේ ඉඳහිටය ඔහු - ආ දිනට නඩු වැලක්
රිදෙව්වොත් ඔහුගේ හිත වැරදිලාවත් අයෙක්
රළු පරළු බස් කියයි හෙළා බැල්මක් රකුසු
සිදු වුණොත් පන්තියේ කුමක් හෝ දබරයක්
ගන්නේ මුල් තැනය, ඔහුය නැත කිසිම එහි සැකක්

මව ගොස් බොහෝ කල් හැර දමා කුල ගෙය
පියාණන් අසරණය - නැගණියද ඔහු සමඟ
ඉර එළිය ලද සඳ සිනාසෙහි ලොව සමඟ
සෙනෙහසක් නොලද ඔහු එරෙහි වෙයි මුළු ලොවට

■ චාන්දනී දේවිකා පුංචිහේවා

## විරහව

මන්දාරමේ හිරිකඩත්
තැවුල් දී
ඉකිගසාලන හිත....

කඳුළු සීතල පහස
උණු කෝපි කෝප්පෙට
දියකරමි එකතු කර
වේදනාවේ හැඟුම....

හිරිකඩත් අසාපන්
හිතේ ගිනි නිවාපන්
ගිගුම් දී අකුණු හඬ
හැඬුම් හඬ මකාපන්.....

හිරිකඩට අවදිවෙන
මැරි මැරී මිය ඇදෙන
හඬා නොහඬා හඬන
වේදනාවේ හැඟුම....

"විරහව"
■ නුවන්ති හංසනී උත්පලා
සඳලංකාව

## නොදනිමි

නොදනිමි
කවර නම් අනන්තයක හිඳ
ගලා ඒ දැයි
මේ සීතල සුළං රොද
මේ සුසිනිඳු සුවඳ පොද
හදවතෙහි ගැඹුරුම කොනෙක
මා වත් නොදැන හුන්
කුටි දොරකඩක් වෙත,
නොදනිමි
දැනගත යුතුද නැතිවග හඟිමි
නැති බැවින සීමා මායිම්
අසම්මත පෙමකට
එහිම දැවටුණු
නොකැළැල් සොඳුරු බව  මිස
තබමි මුළු හදවත
සිනාවෙන් හැකිළෙන සොඳුරු
දෙනයන අග
විවර නොකරම
මහද
කුටිදොර...

■ චමිලා සමරසේකර
බදුල්ල

## බිරිඳ....

සුදු වලා කැටි මැදින්
පෑයූ තියවක් සඳේ
ලස්සන නොදකින
ඔබ ළඟ හිඳ
මේ රැයේ
මම
සඳ හා තනිව හිඳිමි

■ චමිලා සමරසේකර - බදුල්ල

## සෙනෙහස අයදිමි

ආදර බස් තෙපලන්නට
කඳුළු කැට පිසලන්නට
නැති මුත් ඔබ අප ළඟ
ඉව අල්ලමින් ගොදුරකට
මුගුරක් අතින් ගත්
හැඩි දැඩි යුවතියක්
බිඳගෙන යදම් පැන ඉදිරියට
දුන් පහරින් දිව ගියා
අර යකුන් සිවු දෙසම
වසා සිටි හිස ජටාව
ඉවත් කළ මේ යුවතිය
බලන් පුත මා දෙස කියා
තුරුලු කරගත් මා සෙනෙහසින්
අනේ මගේ අම්මා කියා
තිගැස්සී ඇහැරුණිද
අම්මා නැති සිහිනයකි මෙය
එනමුත් ඉඳි කඩුල්ල දෙස
බරව පිට තබා උළු අස්සට
ඇස් පිය නොහෙළා එදෙස
බලා සිටිමි අම්මේ

■ කේ. ඩී. කීර්තිරත්න
දාගොන්න - මීගමුව

## තහනම් ගස

නික්මෙන්නට මත්තෙන්
එපා බලන්න සෙවණැලි දෙස සෙනෙහෙන්
සුළඟක අමුණා මේ සුසුම් දුරකට යවා ගමු අපි
රහසින්.....

තරු දිදුළ අහසක
රටා ඇඳගෙන
එකම රාශියක සිරවෙන්න නැහැ හිමිකම්
වෙරළු මල් සුවඳින්
නාය ගිය හිම කන්දෙන්
පෑයූ මේ දේදුන්න
මකමු අපි දැන්
විගසින්.....

ගහක එතිලා මලක් පුබුදන
වැලක් වෙන්නට නොසිතමින්
එතුණ මේ වැල ලෙහාගෙන
බැහැල යමු අපි
මේ තහනම් ගස පාමුලින්

■ වජිර කුමාරසිංහ

# මුහුණු පොත - f බුකිය

■ සංස්කරණය - සවනි ශේෂාදි





























# පොල් තෙලත් පරදන මී තෙල් ගැන ඔබ නොදන්න ඇත්ත

**අපේ මුතුන් මිත්තන් පොල් තෙල් මෙන්ම මීතෙල් භාවිත කළහ. කාලයාගේ ඇවෑමෙන් එය අමතක වී ගොස් පාම්, සෝයා, බඩඉරිඟු වැනි තෙල්වලට අපි හුරුවීමු. මීතෙල් පලදාව පොල් තෙල්වලට වඩා තුන් ගුණයකින්වත් වැඩි වන බව ඉන්දියානු පර්යේෂණ පෙන්වන අතර එහි මේද සංයුතිය ඉතා සෞඛ්‍යයට හිතකරය. සිංහල රජ කාලයේ මී ගස් කැපීම තහනම් කර තිබූ වග සැලකිල්ලට ගත යුතුය.**

මෙම වසර මුල භාගයේ, ගැඹුරින් කරුණු සොයා බැලීමකින් තොරව ජනාධිපතිවරයා විසින් පාම් තෙල් ආනයනය තහනම් කරන ලදී. ඔහුගේ අදහස වූයේ පොල් තෙල් නිෂ්පාදනය මඟින් රටේ තෙල් අවශ්‍යතාව සපුරා ගැනීමය. එපමණක් නොව, දැනට වගා කොට ඇති හෙක්ටයාර් 12,00ක ඇති කටුපොල් වගාවද උදුරා දැමීමය. කට කතා අනුව, ඔහු මේ තීරණයට පොලඹවා අත්තේ පොල් සම්බන්ධ ආයතනයක සභාපතිවරයෙකි. එම සභාපතිවරයා කියා ඇත්තේ පාම් තෙල් කෑමෙන් සිය බිරිය පිළිකා රෝගයෙන් මිය ගිය බවය. මෙවැනි තීරණයක් ගැනීමට පෙර ජනාධිපතිවරයා පොල් පර්යේෂණ ආයතනයෙනුත් සෙසු විද්වතුන්ගෙනුත් උපදෙස් ගතයුතුව තිබිණි. පාම් තෙල් පිළිකා රෝගයට පාදක වේ යැයි පිළිගත හැකි පර්යේෂණ වාර්තා නොමැත.

කෙසේ වෙතත් එම තීරණයෙන් සති කිහිපයකට පසු අප රට මැලේසියානු හා ඉන්දුනීසියානු තානාපතිවරුන්ගේ විරෝධය හමුවේ අදාළ ගැසට් පත ඉල්ලා අස්කර ගැනීමට සිදුවිය. අප පාම් තෙල් ආනයනය කරන්නේ එකී රටවල් දෙකෙන්ය. ලොව භාවිත කෙරෙන ප්‍රධාන එළවළු තෙල පාම් තෙල්ය. ලොව එළවළු තෙල් නිෂ්පාදනයෙන් 47%ක් පමණ පාම් තෙල් වේ.

පාම් තෙල් අප ආර්ථිකයට වැදගත් වන්නේ බේකරි හා වෙනත් බොහෝ නිෂ්පාදනවලට එය බහුලව භාවිත කෙරෙන බැවිනි. ආනයනික පාම් තෙල් අප තෙල් අවශ්‍යතාවෙන් 74%ක් පමණ වන අතර අප පොල් තෙල් නිෂ්පාදනය ඉන් 13%ක් පමණය. එපමණක් නොව, අප තෙල් අවශ්‍යතාවෙන් 11%ක් පමණ ආනයනික පොල් තෙල් වේ. කෙටියෙන් කියතොත් අපේ ජාතික පොල් නිෂ්පාදනය ව්‍යාප්ත වුවද එමඟින් ජාතික තෙල් අවශ්‍යතාව පරිපූර්ණ නොවේ.

ලංකාවේ හදිසි පාම් තෙල් තහනම ගැන සොලිඩැරිඩැඩ් (Solidaridad) නමැති ජාත්‍යන්තර සංගමය ඊට හේතුන් සොයා බැලීමට ඉදිරිපත් විය. එම ආයතනය වූ කලී සාධාරණ වෙළෙඳාම, කෘෂිකාර්මික හා ගොවිජන ප්‍රශ්න ගැන සොයා බලා අවශ්‍ය විසඳුම් නිර්දේශ කරන ආයතනයකි. එය අප තෙල් ප්‍රශ්නය හා එයට විසඳුම් සෙවීම ඇතුළත් වාර්තාවක් (පොතක්) ජාතික හා විදේශීය විශේෂඥයන් ලවා සම්පාදනය කරවා රජයට හා ගොවියාට ඉදිරිපත් කිරීමට යයි. එය ලබන 19 වැනිදා සිදු කෙරෙනු ඇත.



අපේ පොල් වගාව ව්‍යාප්ත කිරීමට ඇති ඉඩම් සම්බන්ධව ගැඹුරු අධ්‍යයනයක් මෙතෙක් සිදු වී නැත. පොල් පර්යේෂණ ආයතනය මඟින් පාංශු සිතියම් යොදාගෙන කර ඇති නොගැඹුරු අධ්‍යයනයකින් පෙනී යන්නේ දැනට ඇති වගා බිම්ද ඇතුළත්ව හෙක්ටයාර් මිලියන 1.8%ක් පමණ ඊට සුදුසු බවය. එහෙත් මෙම බිම් ප්‍රමාණයෙන් අන් වගා හා වෙනත් කටයුතු සඳහා යොදා ගෙන ඇති බිම් හැරුණු විට කෙතරම් ප්‍රමාණයක් පොල් වගාවට වෙන්වී ඇත්දැයි අධ්‍යයනය කර නොමැත. එපමණක් නොව, පොල් සඳහා සුදුසු බිම් තිබුණද ඒවා පොල් වගාවට පමණක් භාවිත කිරීමට අදාළ ඉඩම් අයිතිකරුවන් කැමැතිදැයි ද දැනගත යුතුය. ඒ තබා කාලගුණික විපර්යාසයන් හේතුකොට ගෙන වියළි කලාපයේ ජල හිඟයට අමතරව උෂ්ණත්වය වැඩි වීමත් පොල් පලදාවට බලපා ඇත. එබැවින් වියළි කලාපයේ සමහර පළාත්වල එවැනි උෂ්ණත්වය වැඩි වන කාලවල පරාග ප්‍රරෝහණයේ



සැලකිය යුතු අඩුවීමකුත් ගෙඩි හට ගැනීමේ අඩුවීමකුත් ඇති වන වග පොල් පර්යේෂණ ආයතනය පෙන්වාදී ඇත. කරුණු මෙසේ හෙයින් වියළි කලාපයේ පොල් වගාව ව්‍යාප්ත කිරීමට බාධා ඇති වග පැහැදිලිය.

තෙත් කලාපයේ කුඹුරු බිම් හෙක්ටයාර් 158,000ක් අතුරෙන් 57,000ක් පමණ අද පුරන් වී ඇත. මෙයට හේතුව අඩු පලදාව හා අඩු ආදායමයි. කරුණු මෙසේ හෙයින් එම ඉඩම්වලට අමතරව තෙත් කලාපයේ තවත් කුඹුරු ඉඩම්වලද පොල්, කටුපොල් හා වෙනත් බෝග විවිධාංගීකරණය නුවණට හුරුවේ. තෙත් කලාපයෙන් ලබාගන්නා අස්වැන්න ජාතික වී නිෂ්පාදනයට හා ආහාර සුරක්ෂිතතාවට ඇත්තේ ඉතා සුළු බලපෑමකි. ආහාර සුරක්ෂිතතාව මෙන්ම ගොවියාගේ ආදායමද වැදගත් වේ. එබැවින් හැකි තරම් එම ඉඩම්හි ජලවහනය දියුණු කොට සුදුසු බෝගවලට යෙදිය යුතුය. මෙවැනි ඉඩම් ඉන්දුනීසියාවෙත් 'සෝජාන්' නමැති ක්‍රමය මත පොල් වගාවට යොදා ගෙන ඇති ආකාරය. ක්‍රමවත් ජල වහනය මඟින් බෑවුමේ පහළ කොටසේ විල් තුළ ජලය එකතු කිරීමෙන් මත්ස්‍යයන් ඇති කළ හැකිය. තවද පාම් හෝ පොල් වගාවන් මඟින් වී වගාවට වඩා ගොවීන්ගේ ආදායම වර්ධනය කළ හැකිය.

මීට අමතරව තෙත් කලාපීය තේ ඉඩම්වල ද අතුරු බෝගයක් මෙන්ම සෙවණ සැපයීම සඳහා පොල් වගා කළ හැකිය. දැනටමත් සමහර පළාත් හි මෙය කරනු ලැබේ. කෙසේ වුවද, පොල් සිටුවිය හැක්කේ තේ අලුතින් හෝ නැවත වගා කරන බිම්වලය. නැවත වගාවන් සිදු වන්නේ වසරකට තේ බිම්වලින් සියයට එකක පමණ වන බැවින් හෙක්ටයාර් 2,000ක පමණ ඉඩම් ප්‍රමාණයක් වාර්ෂිකව පොල් වගාවට භාවිත කළ හැකිය.

පසුගිය දශක කිහිපයේ ජනගහනය වැඩිවී ඇතත් පොල් නිෂ්පාදනය වැඩි නොවීය. සාම්ප්‍රදායික පොල්තෙල් නිෂ්පාදනයද ක්‍රමයෙන් අඩුවිය. එහෙත් නැවුම් පොල්තෙල්, දිසිඳි පොල්, පොල් ක්‍රීම්, කිරි හා පොල් 'පවුඩර්' සඳහා ඉල්ලීම වැඩිවෙමින් තිබේ.

මී ගස (Madhuca longifolia) ලංකාවේ වියළි ප්‍රදේශවල වැවෙන්නකි. වෙනත් රටවල එයට 'පැණි ගස' මෙන්ම 'බටර් ගස' කියාද කියති. ඉන්දියාව ඇතුළු ආසියානු කලාපයේ බොහෝ රටවල් ඉන් ආයුර්වේද බෙහෙත් සාදයි. එහි මල් කැස්ස හා ඇස් රෝග සුව කිරීම සඳහා භාවිත කෙරෙයි. කිරි සමඟ මී මල් භාවිතය පුරුෂ ශක්තිය වර්ධනය සඳහා යොදා ගැනේ. මී මල් මද්‍යසාර නිපදවීමට සහ වෙනත් ආහාර වර්ග නිපදවීමට භාවිත කෙරෙයි. කොළ, ඇට සහ කඳෙහි පට්ටය නොයෙක් ඖෂධ සෑදීමට භාවිතවේ. මී ඇට සහ තෙල් කෑමට ගැනෙන අතර මල බද්ධයටද අර්ශස් රෝගයටද ඖෂධයක් වේ.

ඉන්දියාවේ වැඩිපුර වගා කෙරෙන්නේ මදුකා ඉන්දිකා (Madhuca Indica) නමැති මී ගසට ඉතා සමීප ගසකි. එහි ඇට, තෙල් ඖෂධ සඳහා භාවිත කළද ආහාරයට ගනු නොලැබේ. එම තෙල් ඉන්ධනයක් සේ භාවිතයට ගැනීමද වැඩිවෙමින් තිබේ.

අතීතයේ මී තෙල් ආහාරයක් සේ මෙන්ම ඖෂධයක් සේ භාවිතයට ගන්නා ලදී. පහන් දැල්වීමටද පාවිච්චි කර ඇත. මී තෙල්වල මේද සංයුතිය වැඩිය. එහි ඇති සංතෘප්ත මේද ප්‍රමාණය ඔලිව් තෙලට වඩා අඩු වුවද වෙනත් තෙල් වර්ගවලට වඩා වැඩිය. ඉන් ශරීරයෙහි නරක නොහොත් එල්.ඩී.එල් කොලෙස්ටරෝල් (LDL Cholestrol) අඩු කෙරෙයි. හොඳ නොහොත් එච්.ඩී.එල්. කොලෙස්ට්‍රෝල් (HDL Cholesterol) වැඩි කෙරෙයි. මේ අනුව හෘද ආබාධ ඇතිවීමේ ප්‍රවණතාව අඩුකර ගැනීමට මී තෙල් භාවිතය ඉතා යෝග්‍ය විය යුතුය.

■ ආචාර්ය පරාක්‍රම වෛද්‍යනාථ

# ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිනි කේශිලා ජයවර්ධන 2021 වසරේ ඉහළම කාන්තා වෘත්තිකයන් 50 අතරට



ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිනිය වන කේශිලා ජයවර්ධන මහත්මිය සිය සම්මානය ලබා ගන්නා අයුරු වමේ සිට දකුණට-ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් ඩේවිඩ් හෝල් මහතා, හිටපු අමාත්‍ය එරාන් වික්‍රමරත්න මහතා, ජනමාධ්‍ය අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා, ඩේලි එෆ්ටී කර්තෘ නිස්තාර් කාසිම් මහතා

ලෝක බැංකු සමූහයේ සහ ඕස්ට්‍රේලියානු රජයේ සාමාජික අයිඑෆ්සී (IFC) ආයතනය හා ඒකාබද්ධව Women In Management ආයතනය විසින් 11 වන වරට පවත්වන ලද ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනෙහි විවිධ ක්ෂේත්‍රයන්හි ඉහළම කාන්තා වෘත්තිකයන් 50 සඳහා වූ සම්මාන උළෙලේදී බැංකු ක්ෂේත්‍රයේ ඉහළම වෘත්තීමය වනිතා සම්මානය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිනිය, කේශිලා ජයවර්ධන මහත්මිය තෝරා ගනු ලැබිණි. මෙම උත්කර්ෂවත් සම්මාන උළෙල කොළඹ, ෂැන්ග්‍රිලා හෝටල් පරිශ්‍රයේදී පසුගියදා පැවැත්විණි.

ශ්‍රී ලංකාවේ සංවර්ධන බැංකු ද්විත්වයක සභාපතිනිය ලෙස දශකයකට අධික අත්දැකීම් සම්භාරයකට උරුමකම් කියන කේශිලා ජයවර්ධන මහත්මිය, මෙරට බැංකු ක්ෂේත්‍රයෙහි නම් දැරූ ප්‍රචලිත චරිතයකි. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යාව පිළිබඳ උපාධිධාරී ඇය, එම විශ්වවිද්‍යාලයේම දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිලාභිනියකි.

විශ්වවිද්‍යාල ආචාර්යවරියක ලෙස පේරාදෙණිය සරසවියෙන් සිය වෘත්තීය දිවිය ආරම්භ කළ ඇය විසින් මනාප ඡන්ද ක්‍රමය, තෙවන ලෝකයේ රටවල කාන්තාව හා දේශපාලනය සහ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ මැතිවරණ ක්‍රමය ඇතුළු දේශපාලන විද්‍යාව පිළිබඳ සුවිශේෂී විෂයපථයන් ඔස්සේ රචිත ශාස්ත්‍රීය ලිපිලේඛන සිය විශ්වවිද්‍යාල වෘත්තීය ජීවිතය තුළ පළ කරනු ලැබ ඇත. 2009 - 2011 කාල පරිච්ඡේදය තුළ ඇය පළාත් සභික සාමාජිකාවක ලෙස මධ්‍යම පළාත් සභාව නියෝජනය කිරීමද විශේෂයකි.



කේශිලා ජයවර්ධන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිනිය, අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ

දිවයිනෙහි දරිද්‍රතාවය පිටු දැකීම සඳහා ග්‍රාමීය ආර්ථිකය සවිබල ගැන්වීමට නිතැතින්ම දායකත්වය සැපයෙන පරිදි සහනදායි ණය පහසුකම් සැපයීම මඟින් ග්‍රාමීය ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට තුඩු දෙන වැඩසටහන් කිහිපයක් සඳහා මුලපිරීමට ඇය සමත් වී තිබේ.

ජයවර්ධන මහත්මිය, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිනිය ලෙස 2020 ජනවාරි මස 2 වන දින සිය රාජකාරී කටයුතු ඇරඹූ අතර එම වර්ෂය තුළ එහි ඉතිහාසයේ ඉහළම ලාභය හා තැන්පත් සංචලනය වාර්තා කිරීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුව සමත්විය. ලොව පුරා සාමාජයීය හා මූල්‍යමය අංශයන්හි අර්බුද මාලාවක් දියත් කරමින් කොවිඩ් - 19 වසංගතයේ බලපෑම හේතු කොට ගෙන ජනිත වූ අවිනිශ්චිතභාවය උග්‍ර වකවානුවක් හමුවේ වුවද මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳ වැඩි අවධානයක් සහිතව ශක්තිමත් සාර්ථක කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කේශිලා ජයවර්ධන මියගේ නායකත්වය යටතේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවට හැකි විය.

2021 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ 5 වන වටිනා ම සන්නාමය බවට පත් වූ, ජාතික ඉතිරිකිරීමේ බැංකුව දිවයිනේ වඩාත්ම ඇගැයීමට පාත්‍ර ආයතන අතරින් එකක් (Most Admired Companies ) බවට පත්වීමද , මෙරට කාන්තාවන්ට සේවය කිරීමට සුදුසුම සේවා ස්ථාන ( Women Friendly Work Place ) අතරට එක්වීමද සුවිශේෂී ජයග්‍රහණ වේ. ආර්ථික සහාය අවැසි ප්‍රජාවන් හා එක්ව කටයුතු කිරීමෙන් එවන් ජන ප්‍රජාවන් නඟා සිටුවීම කෙරෙහි ජයවර්ධන මහත්මියගේ අවධානය නිතැතින්ම යොමු වන අතර කාන්තා ව්‍යවසායකත්වය සවිබල ගැන්වීමද ඇය විසින් ප්‍රමුඛත්වයෙහිලා සලකන මෙන්ම අතීත අත්දැකීම් අනුව සාර්ථක ප්‍රතිඵල ගෙනදී ඇති අංශයකි.

සාර්ථක වෘත්තීය කාන්තාවක් වන අතරම ඉතාමත් සාර්ථක ගෘහ ජීවිතයක් ගත කරන ජයවර්ධන මිය, දියණියන් දෙදෙනකුගේ ආදරණීය මවකි. දිවිමඟ අතරතුර එල්ල වුණු නොයෙක් බාධා, අභියෝග හමුවේ නොසැලී ඉලක්ක ජයගත් ජයවර්ධන මහත්මිය, ඇයගේ අප්‍රතිහත ධෛර්යය හා කැපවීම හේතු කොට ගෙන මුළු මහත් සමාජයටම පරමාදර්ශී චරිතයකි.

අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විදේශ තානාපතිවරුන්, මහ කොමසාරිස්වරුන්, කාන්තා නියමුවරියන්, පසුගිය සම්මානලාභීන්, විනිශ්චය මණ්ඩල සාමාජිකයන්, ඩබ්.අයි.එම්. (WIM) ආයතනයේ සභාපතිනිය වන ආචාර්ය සුලෝචනා සිගේරා මහත්මිය සහ එම ආයතනයේ සාමාජික සාමාජිකාවන් ඇතුළු සම්භාවනීය අමුත්තෝ රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.


ඇබෑර්තු
වෛද්‍ය සහායක
දෙල්ගොඩ ප්‍රදේශයේ තොග වෙළෙඳාම සහිත සුපිරි වෙළෙඳසලක් සඳහා වෛද්‍ය සහායකයන් අවශ්‍යයි. ආහාර, නවාතැන් සහිතයි.
විමසීම්: 0712 906 222, 0112 402 405

ජලය
පොලවේ අඩි 600 දක්වා ගැඹුරට ස්කෑන් කර නිවැරදි ජල උල්පත් නල ලිං සහ ලිං කැපීමට සොයා දෙමි..
076 398 71 48

වසර 12 අත්දැකීම් තුලින් අතිවිශිෂ්ඨ සේවාවක්....
විවාහය වනතුරුම ලියාපදිංචිය වලංගු වේ
රෝයල් මංගල සේවය Kasade
ROYAL MANGALA SEWAYA
ඔබ, ඔබගේ දුව, පුතා, සහෝදරයා හෝ හිතවතා විවහා අපේක්ෂිතද ?
නොමිලේ ලියාපදිංචි වන්න
මංගල යෝජනා 20,000 ක් අතුරින් ඔබට ගැලපෙන යෝජනා, ජායාරූප හා සියලුම විස්තර සමඟ ඔබගේ ජංගම දුරකථනයට එවනු ලැබේ.
071 32 23 330
076 98 37 098
077 02 21 599
මෙම දුරකථන අංක වලට අමතන්න
රෝයල් මංගල සේවය - මහනුවර
ROYAL MANGALA SEWAYA, KANDY
රජයේ ලියාපදිංචි ආයතනයකි
ශාඛා - පුලතිසිපුර
ලියාපදිංචි අංකය - POL/TKD/ESD/02/02 5560

ඔබ සිතැගි සිහින නිවස භෞතික යථාර්තයක් බවට පත්කිරීම අපගේ මෙහෙවරයි.
- සැටලින් දමා ස්ලැබ් ගැසීම
- නිවාස සැලසුම් සකස් කිරීම
- අඩක් නිම කල නිවාස අංග සම්පූර්ණව නිම කරීම
- පැරණි නිවාස අලුත්වැඩියා කිරීම
- බිත්ති බැඳීම, කපරාදු කිරීම, පින්තාරු කිරීම, ටයිල් ඇල්ලීම, ස්ලැබ්, සිවිලිම, වයරින් කිරීම ඇතුලු ඉදිකිරීම් කටයුතු එකම ආයතනයකින් පහසුවෙන් කරගන්න
ගමගේ කනස්ට්‍රක්ෂන්ස් අතුරුගිරිය
හැමදේම එකම තැනකින් කරගන්න පුළුවන් නිසා කල්පැවැත්ම, ආරක්ෂාව, වගකීම ගැන 100% විශ්වාසයි
දිවයින පුරා කඩිනම් සේවය
ආරම්භයේදී අත්තිකාරම් මුදල අවශ්‍ය නැත
අමානෝ වැහි පීලි/ ෆිනිෂින් වහල/ පැන්ට්‍රි කබඩ්/ අත් වැට/ ජනේල් උළුවහු/ දොරවල්
ඉහල ගුණාත්මයකින් යුත් අමුද්‍රව්‍ය භාවිතයෙන් උසස් නිමාවක් ලබාදෙන්න අපට පුළුවන්
0775 82 89 45 / 0704 22 18 18

ඔබත් අලෙවිකරණයට කැමැත්තක් දක්වන අයෙක්ද?
එසේනම් අප සොයන්නේ ඔබයි
මූලික දීමනාව 40.000/=
- අවම උ/පෙළ සමත්
- කොළඹ අවටින්
- රැකියා පළපුරුද්ද වසර 2ක
- කාන්තා/ පිරිමි දෙපාර්ශ්වයටම.
- වයස 25 - 45 අතර (කොළඹ අවටින්)
දුක -: 071 1822182, 0765267362

රන්ලිය ස්වයං රැකියා
කොරෝනා උවදුරෙන් පීඩා විඳි ඔබට
මසකට රු.40000 ක ආදායමක් උපයා ගන්න.
රන්ලිය රැකියා පියස
077-8306123
SMS කරන්න.

වායු රයිෆල් AIR RIFLE
වසර 75 පළපුරුද්ද
W. තෝමස් සහ පුත්‍රයෝ - කඩවත
වඳුරන්, රිළවුන් සහ දඬුලේනුන් වැනි සතුන් පළවා හැරීමට
වසර දෙකක වගකීමක් සහිතව
ක්ෂණික ඇමතුම - 0777-319250
විමසීම - 011 2972608 / 011 4361961 011 4968626 / 011 5737777
රැස් කප්පරයේ ඇර හෙලන් වලු රයිෆල් රු.20,000 සිට ඉහළට

උගස් රත්තරං
සින්නවීමට යන රං භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කළ ආයතනයට පැමිණ බේරාදී පොරොන්දු වු මිලටම මිලදී ගනු ලැබේ. දිවයින පුරා සේවාව, බොරු වලට නොරැවටෙන්න
පවුම - 125,000
ව්‍යාජ සහ හොර රන් භාණ්ඩ සඳහා නීතිමය කටයුතු ගනු ලැබේ.
076 33 42 114

උස සෙ.මී. 6
පළල සෙ.මී.8 ප්‍රමාණයේ
දැන්වීමක්
රු.4000/=
(සියලු බදු සහිතව)
සියලු විමසීම්
0765 282 432, 0117 566 572

හර්නියා
රෝගීන් සඳහා ශල්‍යකර්මවලින් තොරව ඖෂධීය ප්‍රතිකාර ප්‍රවීණ වෛද්‍යවරයෙක්ගෙන්
සෙත් රෝහල
හෝමාගම
0112748808, 0113031717, 0714282721

හර්නියා
රෝගීන් සඳහා ශල්‍යකර්මවලින් තොරව ඖෂධීය ප්‍රතිකාර ප්‍රවීණ වෛද්‍යවරයෙක්ගෙන්
සක්යා රෝහල, 678 වල්ගම, මාතර
0412244933, 0412244833, 0715159500, 0718819500, 0789097570

උක්වත්තගෙ අශ්වගන්ධ කරල්
100% ස්වභාවිකයි අතුරු අබාධ නොමැත
රුපියල් 500
සීනි රහිත කරල් 60
වියපත් අයටත් තරුණ ජවයක්
034 2255209/ 034 22 07 744
කොළඹදී
සී/ස. එම් ඩී පීරිස් ගබොස් ලේන් 011 2323723
බද්දේගම ස්ටෝර්ස් මල්වත්ත පාර 0112 332663
වී.ඒ.එස්.ටී.එස්. නාඩාර් ගබොස්ලේන් 0112451607/9
සහ දිවයින පුරා ඖෂධ වෙළඳසැල් වලින්
සී/ස උක්වත්තගෙ හෙළ ඔසු (පුද්ගලික සමාගම) දඹර, හොරණ, www.ukwattagehelaosu.com

උකස් රන් භාණ්ඩ
බේරාදී වැඩිම මිලට මිලදී ගනු ලැබේ.
බොරු නැත
කැරට් 20, 18,14, 09. රජයේ ලියාපදිංචි ආයතනයකි.
077 28 49 889

වනපවන නිෂ්පාදන
පුරුෂ ජිව බල තෛලය
ලිංගික දුබලතා සඳහා මහඟු තෛලයකි
තෙල් බිංදු කිහිපයක් යොදා නිල ස්ථාන පිරිමැදීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාදෙයි. අත්දුටුයි. ප්‍රත්‍යක්ෂයි.
බාහිර ආලේපයක් වන මෙය පාරම්පරික හෙළ ඖෂධයකි
ඔසුසල් සහ ෆාමසි වලින් ලබාගත හැක
071 36 25 785
30ml 1100/=
ව්‍යාපාර ලිප අංක WU 14401
385/1/A., Jaya Mavatha, Polpithimukalana, Kandana

වශීගුරුකමකට අපගේ සහන අයකිරීම 4000 යි
ගුරුකම් සඳහා ඔබ දසදහස් ගණන් මුදල් නිකරුණේ වැය කරන්නේ ඇයි?
ඔබව මුලාකර, අසරණකර හැරගිය සැමියා, බිරිඳ, පෙම්වතා, පෙම්වතිය නොදිනකින් ගෙන්වීමට, අවශ්‍ය කෙනෙකුගේ ආදරය ලැබීමට, නුසුදුසු අය වෙන්කිරීමට, සතුරන්ට දේවදඬුවම් හෝ ඕනෑම ගුරුකමකට අපගේ සහන අය කිරීම රු.4000ක් පමණයි. සඳු. බ්‍රහ. හැර සෑම දිනකම උදේ 10 සිට දහවල් 1 දක්වා හමුවිය හැකිය.
රටේ පවතින වත්මන් තත්වය නිසා පීඩාවිඳින දුප්පත්, නැතිබැරි, අසරණ අයට විශේෂ අවම සහන අයකිරීම්.
සහන පියස. වේයන්ගොඩ
077-0450079

පුරුෂ වර්ධන තෛලය
පුරුෂයින්ගේ සියලුම ලිංගික දුබලතා සඳහා විශිෂ්ට තෛලකි. ඉන්ද්‍රිය වර්ධනයට විශේෂයි.
30 ml රු.1315/-
ලලිත දේවී තෛලය
60ml මිල රු.1000/-
මෙම තෙල ගෑමෙන් කාන්තාවන්ගේ කුඩාවූ පියයුරු වර්ධනය වේ. තට්ටම් වර්ධනය වේ. කලවා හා බත් කෙණ්ඩ ආශ්‍රිත මාංශය වර්ධනය වී පිරිපුන් හැඩ සිරුරක් ලබාදේ. අදාල මාංශ පේශීන් වර්ධනය වන සම්භාහන ක්‍රම සහිතව දක්වා ඇත.
සියලුම සිංහල බෙහෙත්සැල් වලින් ලබාගත හැක.
සිද්ධාජීව ආයුර්වේද මධ්‍යස්ථානය 071 2 019 811 077 3 464 688
නො. 500, මීගමු පාර, වත්තල. (Reg.no. W/T/1/6820)
ශාඛා: 57/4D, මිරිස්වත්ත, පිළියන්දල.
වැඩිදුර ප්‍රතිකාර සඳහා මධ්‍යස්ථාන වෙත පැමිණෙන්න.

උස සෙ.මී. 6
පළල සෙ.මී.8 ප්‍රමාණයේ
දැන්වීමක්
රු.4000/=
(සියලු බදු සහිතව)
සියලු විමසීම්
0765 282 432, 0117 566 572

අති ප්‍රබල වශී ගුරුකම්
ඔබ ආදරය කළ තරුණයා තරුණිය මඟහරීද? සැමියා බිරිඳ හැර ගියාද? දින 03ක් තුළ ජීවිත කාලයටම වශී කර දෙපා මුල දණ ගස්වමි. අවශ්‍ය නම් දිනක් තුළ නමට මතුරවා යහන් බන්ධනය කළ සැණින් ඒ මොහොතේම ප්‍රතිඵල අනිවාර්යයෙන්ම ලැබේ. මෙම ගුරුකම 3000 කට වඩා සිදුකර සාර්ථක වී ඇත. මෙතෙක් ඔබ කොතරම් වියදම් කළාද? යන්ත්‍ර රත්කිරීම් ආදී අපහසු කිසිවක් සිදු කිරීමට ලබානොදී හරියාකාරව සිදුකර දෙන අතර ඉඩම්, නිවාස, ආරක්ෂාව ඇතුළු සියලු ගුරුකම් සිදුකර දෙනු ලැබේ. ඔබට පැමිණ හෝ තැපෑලෙන් සිදුකර ගත හැක. කැවීම්, පෙන්නවීම් කිලි නැත.
Tel :- 076 - 4025539
ශ්‍රී නාගසිංහ ගුරු
නො: 347, සතර මහා දේවාලය, වඩුගංගොඩ, රත්නපුර
(රජයේ ලි.ප.අං.EHE/DS/ADM/07/03557)

අඳුන බැලීම
තරුණියනි, ඔබේ පෙම්වතා ඔබ අසරණ කර මගහරියිද, වෙනත් තරුණියන් පසුපස යනවාද? විවාහ වීමට මගහරිනවාද, සැමියා, බිරිඳ අසමගිද? පවුල ආරවුල්ද? ඕනෑම ජගතෙකු ජීවිත කාලයට වශී කර දෙපාමුල දනගස්සවමි.
මා මෙම ගුරුකම් 10,000 කට වඩා සිදුකර සාර්ථක වී ඇත. ගුරුකම් කල සැණින් ප්‍රතිඵල, කැවීම්, පෙන්නවීම්, රත් කිරීම් ආදී අපහසු දේ නැත. කිලිනැත. නිවැරදි වශී ගුරුකම් කල සැනින් ඔහු හෝ ඇයගේ කාමාශාවන් වැඩි වී ඔබට වශීවේ. ඔබේ ගැටළුව අඳුන පරීක්ෂාකර ගුරුකම් සිදුකරන බැවින් 100% ප්‍රතිඵල. සහතිකයි. හොඳ, නරක ඕනෑම ගුරුකමක් බාරගනු ලැබේ. ඔබ දේව වරමක් හිමිනම් මා එය නිවැරදි ලෙස සකස්කර දෙමි. දුර බැහැර අයට තැපැල් මගින් ද කටයුතු කරගත හැකිය.
ලිපිනය : ටී.කේ. සෙනවිරත්න මයා, කාලි දේවාලය, උඩුවින්න
අමතන්න - 0777-282575

සත්‍යමය නිවැරදි ගුරුකම් කර දෙමි
වසර ගණනාවක් නිහඬව සේවය කළෙමි. මගෙන් නිවැරදිව සේවාවන් ලබාගත් අයගේ ඉල්ලීම පරිදි මෙම දැන්වීම පළ කරමි. ඔබ කැමැති කෙනාව වශී කර දීම/මඟහැර ගිය අය ගෙන්වීම/ අයුතු සම්බන්ධ වෙන් කිරීම/සේවා ස්ථානයේ සියලු දෙනා, සැමියා බිරිය ඔබට කීකරු කර දීම/ අවශ්‍ය ගුරුකම් කර දෙමි. (කිලි නැත) කැවීම් පෙන්නවීම් නැත. යන්ත්‍රය රත් කිරීම හෝ ළඟ තබා ගැනීම පමණි. පූජා මුදල් නැත. කළ ගුරුකම් වැරදී නැත. වැරදුණොත් නැවත කර දෙමි.
පැමිණීම අවශ්‍ය නැත. තැපෑලෙන් කර දෙමි. ලංකාවේ සුප්‍රසිද්ධ ගුරු මහතකුගෙන්, ඉගෙන ගතිමි. විවිධ භාෂා කෙටි මන්ත්‍ර මට උගන්වා ඇත. ඒවා සත්‍ය නිවැරදි ඒවාය. අයකිරීම, පුවත්පත් දැන්වීම් සහ මාගේ දැනුම මතුරන මහන්සියට පමණි. මුදල් ගෙන මඟහැරීමක් නැත. වරු 3 බොරුවලට නොරැවටෙන්න.
ගුප්ත විද්‍යාධාරිනි හේමාලි - 077-5184343
ගින්නලිය - උෟරුබොක්ක - දෙණියාය හරහා.

ප්‍රබල වශීගුරුකම්
ප්‍රබල වශී ගුරුකම්, හැරගිය අය ගෙන්වීමට, අභියම් සබඳතා නැවැත්වීමට, ව්‍යාපාර දියුණුවට සහ ඕනෑම ගුරුකමක් ගාස්තුවෙන් කොටසක් ගෙවා ඉතිරිය හරිගිය පසු ගෙවිය හැකි අතර, නිවාස වල වාස්තු දෝෂ පරීක්ෂාව, වාස්තු විද්‍යානුකූලව නිවාස සැලසුම් සැකසීම, විශ්වාසනීයව මැණික් ප්‍රතිකාර කර ගත හැකිය. මළගිය ඥාතීන් මගින් සිදුවන කරදර පීඩා නිවැරදිව ඉවත් කර, දියුණුවට කටයුතු සැලසීම, සියලුම අණවින, කොඩිවින, හදිහූනියම් කපා ඉවත් කිරීම. තැපැල් මගින් ද කර ගත හැකිය.
074-1714615
පාරම්පරික ශාන්තිකර්ම, ගුප්ත විද්‍යා, ජේ‍යාතිර් විද්‍යා ශිරෝමනි, මැණික් උපදේශිකා, දේශමාන්‍ය "තාරක භාස්කර" මහත්මිය "සුව අරණ ගුරු කුලය"

මහා බලගතු රොඩී කුලයේ අභිරහස් ගුරුකම්
ඔබගේ ප්‍රශ්ණයට අවශ්‍ය ස්ථිර විසදුමක්ද?
පිං පිණිසයි!!!!
සැමියාගේ, දරුවාගේ, සොයුරන්ගේ සුරාව සුදුව නවතා දෙමි.
විදෙස්ගත දරුවන් සඳහා 0094-729730016
ජෝතියා ගුරුන්නාන්සේගේ පුත්
ශක්ති ගුරුන්නාන්සේ
හමුවීම : ඉබ්බාගමුව කුඹුක්වැවදී.....
076-2058706
077-1967333
071-0339858


කොළඹ 07, රොස්මිඩ් පෙදෙසේ, අංක 101 හි පිහිටි සීමාසහිත සිලෝන් නිව්ස්පේපර්ස් පෞද්ගලික සමාගම විසින් ජා ඇල, මිනුවන්ගොඩ පාරේ, 302/1/A හි පිහිටි සිය මුද්‍රණාලයේදී මුද්‍රණය කරනු ලැබ ප්‍රසිද්ධ කරන ලදී.

C M Y K